254 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 254 - இல. 6
Volume 254 - No. 6

2017 අගෝස්තු 23වන බදාදා
2017 ஓகஸ்ட் 23, புதன்கிழமை
Wednesday, 23rd August, 2017

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලට ආරක්ෂිත ගේට්ටු සවිකිරීම

**විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**වරප්‍රසාද යෝජනාව:**
පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ ගෞරවයට හානි වන පරිදි හැසිරීම

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
සුකියෝ මහිකරි ශ්‍රී ලංකා (සංස්ථාගත කිරීමේ) -[ගරු කේ.කේ. පියදාස මහතා]- පළමුවන වර කියවන ලදී

**කල්තැබීමේ යෝජනාව:**
නියඟයෙන් පීඩාවට පත් ජනතාවට කඩිනම් සහන


---

# பிரதான உள்ளடக்கம்


**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
பாதுகாப்பற்ற ரயில் கடவைகளில் பாதைத் தடுப்புகளை அமைத்தல்

**அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**சிறப்புரிமைப் பிரேரணை:**
பாராளுமன்ற உறுப்பினர்கள் பாராளுமன்றத்தின் கௌரவத்தைக் களங்கப்படுத்தும் வகையில் நடந்துகொண்டமை

**தனி உறுப்பினர் சட்டமூலம்:**
சுக்யோ மகிகறி சிறிலங்கா ( கூட்டிணைத்தல்) – [மாண்புமிகு கே.கே. பியதாஸ] - முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
வரட்சியினால் பாதிப்புற்ற மக்களுக்குத் துரித நிவாரணம்


---

# PRINCIPAL CONTENTS


SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Safety Gates at Unprotected Rail Crossings

TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL:
Read the First time

PRIVILEGE MOTION:
Unruly Behaviour of Members of Parliament Damaging Dignity of Parliament

PRIVATE MEMBERS' BILLS:
Sukyo Mahikari Sri Lanka (Incorporation) – [Hon. K.K. Piyadasa] – Read the First time

ADJOURNMENT MOTION:
Speedy Relief to People Affected by Drought

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2017 අගෝස්තු 23වන බදාදා*
*2017 ஓகஸ்ட் 23, புதன்கிழமை*
*Wednesday, 23rd August, 2017*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA ] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම සමාජවාදී ජනරජය අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 19 දිනැති අංක 2028/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමය ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014/2015 වර්ෂය සඳහා සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 සහ 2016 වර්ෂ සඳහා සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා;

(ii) 2015 වර්ෂය සඳහා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා සහ ගිණුම්;

(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(v) 2013 සහ 2014 වර්ෂ සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද 2011 වර්ෂය සඳහා සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව සහ 2013/2014, 2014/2015 සහ 2015/2016 වර්ෂ සඳහා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில், தொழிற்சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour, Trade Union Relations and Sabaragamu Development)

ගරු කථානායකතුමනි, රත්නපුර, දොඩම්පේ, කුරුගම්මෝදර යන ලිපිනයෙහි පදිංචි එච්.වී. රෝහිණී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, දංගෙදර, මල්වත්ත පාර, අංක 21/ඒ යන ලිපිනයෙහි පදිංචි එච්.ජී.ටී. දිශාන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හෝමාගම, මාගම්මන, මුණසිංහගම, අංක 306/117 යන ලිපිනයෙහි පදිංචි එම්.ඊ.ඩී. කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -1176/'16- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2016 අය වැය යෝජනා අංක 199: ප්‍රතිලාභ
## 2016 வரவு செலவுத் திட்ட முன்மொழிவு இலக்கம் 199: பிரதிபலன்கள்
## BUDGET PROPOSAL NO. 199 OF 2016: BENEFITS

1414/'16

**4. ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 199ට අනුව, විදේශ ආයෝජනයන් සඳහා වන ඉල්ලුම්පත් සම්පූර්ණ කර දින 50ක් තුළ වැඩ ඇරඹීම සහතික කරන වැඩ පිළිවෙළක් හඳුන්වා දුන් බැවින්, 2016 වර්ෂයේදී එසේ දින 50ක් තුළ වැඩ ආරම්භ කළ විදේශ ආයෝජන කවරේද;

(ii) උක්ත නැවුම් ප්‍රවේශය හේතුවෙන් 2016 වර්ෂය තුළදී රට තුළ ව්‍යාපාර ආරම්භ කළ විදේශ සමාගම් විසින් ශ්‍රී ලංකාවට රැගෙන ආ විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) විදේශීය ආයෝජකයෙකුට දින 50ක් තුළ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීමේ ක්‍රියාවලිය හඳුන්වා දීමේදී සාපේක්ෂව ඇති කළ වෙනස්කම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட முன்மொழிவு இலக்கம் 199 இன் பிரகாரம், வெளிநாட்டு முதலீடுகளுக்கான விண்ணப்பப்படிவங்கள் பூர்த்தி செய்யப்பட்டு 50 நாட்களுக்குள் வேலைகள் ஆரம்பிக்கப்படுவதை உறுதிப்படுத்துவதற்கான வேலைத்திட்டமொன்று அறிமுகப்படுத்தப்பட்டமையால், 2016ஆம் ஆண்டில் அவ்வாறு 50 நாட்களுக்குள் வேலைகள் ஆரம்பிக்கப்பட்ட வெளிநாட்டு முதலீடுகள் யாவையென்பதையும்;

(ii) மேற்படி புதிய அணுகுமுறையின் காரணமாக 2016ஆம் ஆண்டில் நாட்டில் தொழில்முயற்சிகளை ஆரம்பித்த வெளிநாட்டுக் கம்பனிகளினால் இலங்கைக்கு கொண்டுவரப்பட்ட வெளிநாட்டுச் செலாவணியின் அளவு யாதென்பதையும்;

(iii) வெளிநாட்டு முதலீட்டாளர் ஒருவருக்கு 50 நாட்களில் இலங்கையில் கருத்திட்டத்தை ஆரம்பிப்பதற்கு இடமளிக்கும் செயன்முறையை அறிமுகப்படுத்தும்போது ஒப்பீட்டளவில் ஏற்படுத்தப்பட்ட மாற்றங்கள் பற்றிய பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Development Strategies and International Trade:

(a) Will he inform this House -

(i) the foreign investments that commenced work within 50 days in 2016, as an arrangement that assures commencing work within 50 days from filling in the applications for foreign investments was introduced as per budget proposal No.199 of 2016;

(ii) the amount of foreign exchange brought into the country by the foreign companies that commenced business in the country within 2016 as a result of the said fresh approach; and

(iii) whether he would submit the list of changes introduced comparatively in introducing the process to facilitate the commencement of projects in Sri Lanka by a foreign investor within 50 days?

(b) If not, why?

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

Sir, the Answer to Question No. 4 is as follows:

(a) (i) The Agency for Development has not been established as proposed under item No. 199 of 2016 Budget Speech since its law has still not been enacted.

(ii) Not relevant.

(iii) Although the law establishing AFD has not yet been enacted, the following committees have been established in order to accelerate the approval process for BOI projects to ensure that projects take off the ground within the shortest possible period.

- The Project Screening Committee - PSC - of the BOI immediately screens all investment applications jointly with cross-functional departments to grant approval in an expeditious manner.
- Any projects that need further clearance on operational issues will be referred to a higher level of committee such as Single Window Investment Approval Committee - SWIAC - chaired by the Secretary to the Treasury and Investment Approval Facilitation Committee - IAFC - chaired by the Senior Adviser to the Hon. Prime Minister for a speedy approval.
- Any unresolved major issues will be directed to the Official Committee on Economic Management - OCEM - and the Cabinet Committee on Economic Management(CCEM).

(b) Not relevant.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, මෙම අය වැය යෝජනාව අනුව එවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා නැහැ. ඔබතුමා හොඳටම පිළිගන්නවා, මෙම විදේශ ආයෝජකයන් ලංකාවට එන්නේ විශාල ලෙස ලැබෙන බදු අනුග්‍රහයන්, බදු සානුබලයන් නිසාය කියලා. දැන් ඒ දෙන බදු සානුබල වියට්නාමය, මැලේසියාව සහ අනෙක් රටවල දෙන ප්‍රමාණයේ තබා, තිබුණු බදු සහන සියල්ලත් නැති වන ආකාරයෙන් තමයි නව දේශීය ආදායම් පනත කෙටුම්පත් කරලා තිබෙන්නේ. මක්නිසාදයත්, ඒ පනතේ පැහැදිලිව තිබෙනවා ගරු ඇමතිතුමනි, "කවර නීතියක කුමන කරුණක් සඳහන් වුවත් මේ පනතින් නිශ්චිතව කියලා නැත්නම් බදු සහන හිමි වෙන්නේ නැහැ" කියලා. එතකොට වෙන්නේ, BOI Agreement එකක් හෝ තමුන්නාන්සේලා විදේශ ආයෝජකයෙක් එක්ක වෙන බදු සහන ගැන ගිවිසුමක් අත්සන් කළාට, මේ පනත් කෙටුම්පත සම්මත වුණොත් ඒ ගිවිසුමේ තිබෙන සහනය ආයෝජකයාට ලැබෙන්නේ නැහැ. එම නිසා තමුන්නාන්සේ මේ පිළිබඳව විශේෂයෙන්ම බලන්න ඕනෑ වනවා. මොකද, සමස්ත ආයෝජන ටික නතර වෙයි. නව දේශීය ආදායම් පනත් කෙටුම්පතේ බොහොම පැහැදිලිව සඳහන් වනවා, "කවර නීතියක කුමන කරුණක් සඳහන් වුවත්, ඒ සහන ලැබෙන්න නම් මෙම දේශීය ආදායම් පනතේ තිබෙන්න ඕනෑ" කියලා. එතකොට අලුත් ආයෝජකයෙක් එක්ක බදු සහන දීලා ගිවිසුමක් අත්සන් කරන්නත් බැහැ; BOI projectsවලටත් බැහැ. ගරු ඇමතිතුමනි, මේ ගැන ඔබතුමා හිතන්නේ මොකක්ද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියූ කාරණයට මම සම්පූර්ණයෙන් එකඟ වනවා. සිකුරාදාට අපි ඒ පනතට සංශෝධන ඉදිරිපත් කරනවා. අපි මේ කරුණු සියල්ලම සලකා බලා තිබෙනවා. ඒ අනුව අපි සංශෝධන ඉදිරිපත් කරනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණයට මැදිහත් වෙන්න ඕනෑ. මොකද, මේ කාරණය අනික් කර්මාන්තවලටත් බලපානවා; මැණික් සහ විදේශ විනිමය ගෙනන අපනයන සියල්ලට බලපානවා. ඒ නිසා රට වෙනුවෙන් අපෙත් සංශෝධන තිබෙනවා. අපි කවුරුත් පිළිගන්නවා, රටට බදු ආදායම ඕනෑ බව. බදු ආදායම වැඩිවෙන්න ඕනෑ කියන කාරණය ගැන තර්කයක් නැහැ. ඒ නිසා මේ රටට ලැබෙන්න තිබෙන වාසි ටික නැති වෙන එක වළක්වා ගැනීම සඳහා අපිත් සංශෝධන ඉදිරිපත් කරනවා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

දැනටමත් සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ සංශෝධනත් තිබෙනවා නම්, ඒවාත් අපට දෙන්න. එතකොට අදම ඒ අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්.

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම්වල වැලි කැනීම්: විස්තර

இலங்கை மகாவலி அதிகாரசபைக்கு சொந்தமான காணிகளில் மணல் அகழ்வு: விபரம்

SAND MINING IN LANDS BELONGING TO MAHAWELI AUTHORITY OF SRI LANKA: DETAILS

1614/'17

**6. ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage )

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම්වල වැලි කැනීම් කටයුතු සඳහා අවසර ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

(ii) වලව කලාපය තුළ වැලි කැනීම් බලපත්‍රලාභීන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම කලාපය තුළ අනවසර වැලි කැනීම් විශාල ප්‍රමාණයක් සිදුවන බව පිළිගන්නේද;

(iv) එම තත්ත්වය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானரைக் கேட்ட வினா:

(அ) (i ) இலங்கை மகாவலி அதிகாரசபைக்கு சொந்தமான காணிகளில் மணல் அகழ்வு நடவடிக்கைகளுக்கு அனுமதி வழங்கும் முறைமை யாது;

(ii) வளவ வலயத்தில் மணல் அகழ்வு உரிமப்பத்திரம் பெற்றவர்களின் பெயர்ப்பட்டியலைச் சமர்ப்பிப்பாரா;

(iii ) இந்த வலயத்தில் அத்துமீறிய மணல் அகழ்வு பெருமளவில் இடம்பெறுகின்றதென்பதை ஏற்றுக்கொள்கிறாரா;

(iv) இந்த நிலைமையைத் தடுப்பதற்காக இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) the methodology adopted in granting permission for sand mining in lands belonging to Mahaweli Authority of Sri Lanka;

(ii) whether he would present to this House a list of names of those who have been issued with licences for sand mining in Walawe Zone;

(iii) whether he would admit that unauthorized sand mining is taking place in large scale within the aforesaid Zone; and

(iv) the steps that have been taken at present to curb that situation?

(b) If not, why?

**ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 3(1) වගන්තිය යටතේ විශේෂ බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බල ප්‍රදේශයන්, කැලෑ ආඥා පනත ක්‍රියාත්මක කිරීමේ දී, කැලෑ නිෂ්පාදන ලබා ගන්නා ඉඩම හා ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් භෞතික සම්පත් පරිහරණය වෙනුවෙන් ඉඩම් පරිහරණ ගාස්තු අය කිරීම හා අදාළ ඉඩම්වලින් බදු අය කිරීමේ බලය ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 22 වන වගන්තිය හා 13 වන වගන්තීන්වල බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හිමි වන අතර, එම ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමට අවසර ලබා දීමේ දී දැනට අනුගමනය කරන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

සියලුම ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ලැබෙන ඉල්ලීම් අදාළ මහවැලි බලප්‍රදේශයේ කලාපීය භෞතික සැලසුම් කමිටුව සඳහා යොමු කරනු ලබන අතර, එහිදී මූලිකව අදාළ ඉඩම් කොටස් අයත් ප්‍රදේශයේ ඒකක කළමනාකාර / ඉඩම් නිලධාරි විසින් යෝජිත ඉඩම් පිළිබඳ මූලික තොරතුරු ඉඩමේ වර්තමාන තත්ත්වය හා යෝජිත ඉඩමට ආසන්නව පිහිටි ඉඩම් කොටස්වල ඉඩම් පරිහරණය පිළිබඳව පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

- ඉන් අනතුරුව අදාළ මහවැලි බල ප්‍රදේශයේ කලාපීය කමිටු නිර්දේශ ලබා දීම සඳහා යොමු කරවනු ලබන අතර, කලාපයේ තාක්ෂණ සේවා, මානව හා ආයතනික සංවර්ධන, කෘෂි, ඉඩම්, ඉඩම් පරිහරණ සැලසුම්, ව්‍යාපාර සංවර්ධන යන අංශවලට අයත් විෂයය පිළිබඳ දැනුවත් නිලධාරීන් විසින් අදාළ ඉඩම් කොටස් පෞද්ගලිකව පරීක්ෂා කර බලා ඒ ඒ නිර්ණායකයන් පිළිබඳව අධ්‍යයනය කොට ඉල්ලීම් කර ඇති ඉඩම් කොටස ලබා දීම පිළිබඳව ඔවුන්ගේ යෝජනා හා නිර්දේශ ලබා දේ.

- එසේම, මහවැලි බල ප්‍රදේශයේ කලාපීය භෞතික සැලසුම් ශිල්පී විසින් අදාළ බිම් කොටස මූලික සැලසුම්වල වෙන් කර ඇති ඉඩම් පරිහරණය සහ දැනට එහි පවතින යාබද ඉඩම් පරිහරණයට වන අනුකූලතා හා බලපෑම් ආදී තොරතුරු පදනම් කර ගනිමින් අදාළ ඉඩම් කොටස් බැහැර කිරීම පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)ගේ නිර්දේශය ලබා දීම ප්‍රධාන කාර්යාලයේ ඉඩම් පරිහරණ සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි.

(ii) වලව කලාපය තුළ වැලි කැනීම් බලපත්‍රලාභීන්ගේ නාම ලේඛනය ඇමුණුම (01) ලෙස අමුණා ඇත.

මම එම ඇමුණුම **සභාගත*** කරනවා.

(iii) මෙම කලාපය තුළ අනවසර වැලි කැනීම් සිදු වේ.

(iv) වලව කලාපය තුළ සිදුවන අනවසර වැලි කැනීම් පාලනය කිරීම සඳහා අදාළ සියලුම චක්‍රලේඛ හා උපදෙස් අනුව කටයුතු කළ යුතු බවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වලව නේවාසික කළමනාකරු වෙත දන්වා ඇති අතර, නිසි අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම පිළිබඳව ද උපදෙස් නිකුත් කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. අනවසර වැලි කැණීම් සිදු වෙනවා කියන කථාව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් පිළිගත්තා කියා මා හිතනවා. මෙය වලව විශේෂ බල ප්‍රදේශය තුළ අද ඊයේ සිදුවූවක් නොවේ. අවුරුදු ගණනාවක් පුරාවට අඩු-වැඩි වශයෙන් මෙය සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සඳහා සමහර දේශපාලනඥයන්ගේ ඍජු මැදිහත්වීමත් සිදු වෙනවා කියා මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මේ හා සම්බන්ධ සිද්ධියකට අදාළව වලව විශේෂ බල ප්‍රදේශයේ හිටපු නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමා සහ කොට්ඨාස කළමනාකරුවන් කිහිප දෙනකු මේ වන විට වැඩ තහනමට ලක්වෙලා තිබෙන බව. නමුත් මේ ක්‍රියාදාමය නතරවෙලා නැහැ. මේක නතර කරන්න කියලා මේ වන විට නියෝග පනවා තිබෙනවාය කියලා ඔබතුමා කියනවා. නමුත් මේ වන තුරුත් මේ සඳහා නිසි ක්‍රමවේදයක් නැහැ. දැන් වලවේ ගඟ, ගඟ ආශ්‍රිතව සිටින මිනිස්සුන්ගේ ඉඩම් තිබෙන පැත්තට එනවා. මේකට හේතුව නිසි පාලනයක් නැතිවීමයි. බොහොමයක් සිදු වන්නේ වලවේ ගඟේ කණ්ඩිය කැපීම නිසායි. ඒ නිසා මේ වෙනුවෙන් ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගන්න අවශ්‍ය වෙනවා. ඒ වෙනුවෙන් ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා කියන කාරණාව හරි. ඒ පිළිබඳව තර්කයක් නැහැ. අනවසරයෙන් - අවසර ගැනීමකින් තොරව- සිදු වන වැලි කැණීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. 2015දී අපි මේ අමාත්‍යාංශයට පත්වෙලා සංඛ්‍යා ලේඛන බලන කොට හතරෙන් එකක ප්‍රමාණයක් පමණයි බලපත්‍ර ඇතිව මුළු ලංකාව තුළම වැලි සංසරණය වුණේ. අනෙක් සියලු ඒවා විවිධ වූ වක්‍ර මාර්ගවලින් එකතු වුණු වැලි. ඒ නිසා මේ ප්‍රශ්නය සුළු පටු කාරණාවක් නොවෙයි. හැබැයි, ඒ වෙනුවෙන් ගත යුතු සියලු ක්‍රියා මාර්ග අපි මේ වන විට අර ගෙන තිබෙනවා. ඔබතුමාම දන්නවා, මේ වන විට මහවැලි සංවර්ධන අධිකාරියට අයත් වලව කලාපය තුළ හිටපු නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ඉඳලා නිලධාරීන් කිහිප දෙනකුගේ වැඩ තහනම් කර තිබෙන්නේත් ඔබතුමා මතු කළ ඔය කාරණයත් එක්ක බව. ඒ වාගේම පසුගිය කාලයේ දිගටම භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය දිගින් දිගටම වැඩ කළේ වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පමණයි. හැබැයි, දැන් බොහොම පැහැදිලිව ඒ වෙනුවෙන් අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙනවා. අවශ්‍ය නියෝග ලබා දී තිබෙනවා. වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට පමණක් නොවෙයි භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය ඉන්නේ. ගරු ජනාධිපතිතුමා සියලු රැස්වීම්වලදීත් මේ පිළිබඳව බොහොම පැහැදිලිව ඒ කණ්ඩායම් දැනුවත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, බලපත්‍ර නිකුත් කළාට පස්සේ ඒවා සිදු වන්නේ කොහොමද කියන එක පිළිබඳව අධීක්ෂණය කළ යුතුයි. අද වන විට වලව ප්‍රදේශයේ සියයට සියයක් එහෙම නොවෙනවා කියලා මම කියන්නේ නැහැ.

හැබැයි, අද වන විට පැහැදිලිවම පැවතුණු තත්ත්වයට වඩා හොඳ තත්ත්වයකට ගෙනෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා කියන එවැනි ස්ථාන වැරදිලා හෝ තිබෙනවා නම්, විශේෂ නිලධාරීන් කණ්ඩායමක් යවලා ඒ පිළිබඳව පරීක්ෂා කරන්නත් අප කටයුතු කරනවා.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පසු ගිය කාල සීමාව තුළදී වැලි කැණීම් කරන ලද දේශපාලනඥයන් සහ මහා පරිමාණ ව්‍යාපාරිකයින් සම්බන්ධයෙන් සොයා බැලීමට අපේ හිටපු ජනාධිපතිතුමාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වන නෙවිල් මැතිතුමාගේ සභාපතිත්වයෙන් සංගමයක් හැදුවා. කිසිදු ආකාරයකට පොලිස් අණ නොතකා, එහෙමත් නැත්නම් රාජ්‍ය මැදිහත්වීම් සියල්ල ගණන් ගන්නේ නැතිව ලොකු වැලි ව්‍යාපෘතියක් කළ දේශපාලනඥයින් සහ මහා පරිමාණ ව්‍යාපාරිකයින් 64දෙනෙක් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයක් මා සතුව තිබෙනවා. ඒ පිළිබඳව පොලිස්පතිතුමාට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අප දැනුම් දීලා තිබෙනවා. නමුත්, මේ වන තුරු ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. මේ වෙනුවෙන් අමාත්‍යාංශය විධියට මැදිහත් වෙලා කඩිනම් ක්‍රියා මාර්ග ගන්න පුළුවන්. මොකද, රජයට ලැබිය යුතු විශාල ආදායමක් මේ නිසා අහිමි වුණා. සාමාන්‍ය ගමේ මිනිස්සු මේ ව්‍යාපෘති කර ගෙන යාමේ කිසිම වැරැද්දක් නැහැ. අහිංසක මිනිහෙක් ගෙයක් හදන්න වැලි ටිකක් ගොඩ දමා ගන්න එකේ වැරැද්දක් නැහැ. මහා පරිමාණ ව්‍යාපාරිකයන් ධනවතුන් වුණේ මේ රටේ සල්ලි, එහෙම නැතිනම් රජයේ ආදායම අහිමි කරලායි. ඒ වෙනුවෙන් ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද කියා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නයේදී අපට බලපාන්නේ කරන පුද්ගලයා කවුද කියන කාරණාව නොවෙයි. අපට වැදගත් වෙන්නේ, එයට අදාළව අපේ තිබෙන ආයතනවලින් ලබා ගත යුතු බලපත්‍රය ගත්තාද යන්නයි. විශේෂයෙන්ම, මධ්‍යම පරිසර අධිකාරිය අප යටතේ තිබෙනවා. ඒ අනුව, දෙවනුව සලකා බලන්නට ඕනෑ, පරිසරයට හානියක් සිදු වෙන ආකාරයට මේ දේ සිදු වෙනවාද කියන කාරණයයි. ඒ කාරණාවලට පරිබාහිරව කවුරු හරි මේ දේ කරනවා නම්, ඒ කවුද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ, ඒ සියලු දෙනාගේ බලපත්‍ර අහෝසි කරන්න අපි කටයුතු කර තිබෙනවා. ඒක තමයි පළමුවැනි දේ. එවැනි අවසරයකින් තොරව කුමන හෝ තැනක එසේ කටයුතු කර තිබෙනවා නම්,- ඒවා සම්බන්ධයෙන් මේ අවස්ථාවේ මා සතුව ලේඛනයක් නැහැ. හැබැයි, පසුව පෙන්වන්න පුළුවන්. -පළමුවැනි කාරණය ලෙස ඒ සියලු ස්ථාන නතර කරන්න අප කටයුතු කර තිබෙනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුරාධ ජයරත්න මහතා]

ගරු කථානායකතුමනි, ඒ නිසා මට අමාත්‍යාංශය පැත්තෙන් වගකීමෙන් කියන්න පුළුවන් කාරණය තමයි මොනම විධියකින්වත් පරිසරයට හානි වන විධියේ වැඩ කටයුතු අද සිදු කෙරෙන්නේ නැති බව. ඒවාට අවශ්‍ය නීත්‍යනුකූල පියවර අපි අරගෙන තිබෙනවා. හැබැයි, කලින් කැඩුණු ඒවා පිළිබඳව පරීක්ෂා කිරීම කියන කරුණු කාරණා අපේ අමාත්‍යාංශයට පැවරෙන වගකීමක් නොවෙයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 7-1630/'17-(1), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඊයේත් මේ සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් කළා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 1695'/17-(1), ගරු මොහොමඩ් නවවි මහතා.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ග්‍රාම නිලධාරින් බඳවා ගැනීමේ තරග විභාගය: විස්තර

கிராம அலுவலர் ஆட்சேர்ப்புப் போட்டிப் பரீட்சை: விபரம்
COMPETITIVE EXAMINATION TO RECRUIT GRAMA NILADHARIS: DETAILS

1775/'17

**13.ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017.03.31 දිනට ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;
(ii) එම සංඛ්‍යාව, එක් එක් පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) 2017.03.31 දිනට රාජකාරියේ නියුතු ග්‍රාම නිලධාරින් සංඛ්‍යාව කොපමණද;
(iv) එම සංඛ්‍යාව, එක් එක් පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2017.03.31 දිනට පුරප්පාඩු වී ඇති ග්‍රාම නිලධාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;
(ii) එම සංඛ්‍යාව, එක් එක් පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ග්‍රාම නිලධාරින් බඳවා ගැනීමට තරග විභාගයක් පවත්වා තිබේද;
(iv) එසේ නම්, විභාගය පැවැත්වූ වර්ෂය සහ ඒ සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;
(v) විභාගයෙන් වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබේද;
(vi) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;
(vii) ග්‍රාම නිලධාරි තනතුරු සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;
(viii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.03.31ஆம் திகதியன்று உள்ளவாறு இலங்கையிலுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) அந்த எண்ணிக்கை ஒவ்வொரு மாகாணம், மாவட்டம் மற்றும் பிரதேச செயலாளர் பிரிவு வாரியாக தனித்தனியாக யாது என்பதையும்;
(iii) 2017.03.31ஆம் திகதியன்று உள்ளவாறு கடமையில் ஈடுபட்டுள்ள கிராம அலுவலர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அந்த எண்ணிக்கை ஒவ்வொரு மாகாணம், மாவட்டம் மற்றும் பிரதேச செயலாளர் பிரிவு வாரியாக தனித்தனியாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ)(i) 2017.03.31ஆம் திகதியன்று உள்ளவாறு வெற்றிடமாக உள்ள கிராம அலுவலர் பதவிகளின் எண்ணிக்கை யாது என்பதையும்:

(ii) அந்த எண்ணிக்கை ஒவ்வொரு மாகாணம், மாவட்டம், பிரதேச செயலாளர் பிரிவு மற்றும் கிராம அலுவலர் பிரிவு வாரியாக தனித்தனியாக யாது என்பதையும்;

(iii) குறித்த வெற்றிடங்களைப் பூர்த்தி செய்வதற்காக கிராம அலுவலர்களை ஆட்சேர்ப்பு செய்யும் போட்டிப் பரீட்சையொன்று நடத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனின், பரீட்சை நடாத்தப்பட்ட ஆண்டு மற்றும் பரீட்சைக்குத் தோற்றிய விண்ணப்பதாரிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) பரீட்சையில் அதிக புள்ளிகளைப் பெற்ற விண்ணப்பதாரிகளுக்கு நேர்முகப் பரீட்சை நடத்தப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனின், குறித்த நேர்முகப் பரீட்சைக்கு தோற்றிய விண்ணப்பதாரிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(vii) கிராம அலுவலர் பதவிக்காக தகுதி பெற்றுள்ள விண்ணப்பதாரிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(viii) இவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) the number of Grama Niladhari Divisions available in Sri Lanka as at 31.03.2017;

(ii) separately, the aforesaid number as per each province, district and Divisional Secretary's Division;

(iii) the number of Grama Niladharis deployed in service as at 31.03.2017;

(iv) separately, the aforesaid number as per each province, district and Divisional Secretary's Division?

(b) Will he also inform this House-

(i) the number of vacant GN positions as at 31.03.2017;

(ii) separately, the aforesaid number as per each province, district and Divisional Secretary's Division;

(iii) whether a competitive examination has been held to recruit Grama Niladharis to fill the aforesaid vacancies;

(iv) if so, the year in which the particular examination was held and the number of applicants who sat for the examination;

(v) whether an interview has been conducted for those who obtained the highest marks at the examination;

(vi) if so, the number of applicants who appeared for the interview;

(vii) the number of applicants who got qualified for the GN appointments; and

(viii) their names and addresses?

(c) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 14,022.

(ii)

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 13 | 558 |
| | ගම්පහ | 13 | 1177 |
| | කළුතර | 14 | 762 |
| දකුණ | ගාල්ල | 19 | 896 |
| | මාතර | 16 | 650 |
| | හම්බන්තොට | 12 | 576 |
| සබරගමුව | කෑගල්ල | 11 | 573 |
| | රත්නපුරය | 17 | 575 |
| වයඹ | කුරුණෑගල | 30 | 1610 |
| | පුත්තලම | 16 | 548 |
| උතුර | යාපනය | 15 | 435 |
| | මන්නාරම | 5 | 153 |
| | වවුනියාව | 4 | 102 |
| | මුලතිව් | 5 | 127 |
| | කිලිනොච්චිය | 4 | 95 |
| උතුරු මැද | අනුරාධපුරය | 23 | 702 |
| | පොලොන්නරුව | 7 | 295 |
| මධ්‍යම | මහනුවර | 20 | 1188 |
| | මාතලේ | 11 | 545 |
| | නුවරඑළිය | 5 | 491 |
| නැගෙනහිර | මඩකලපුව | 14 | 345 |
| | අම්පාර | 20 | 503 |
| | ත්‍රිකුණාමලය | 11 | 230 |
| ඌව | බදුල්ල | 15 | 567 |
| | මොනරාගල | 11 | 319 |

(iii) 12,207

[ගරු වජිර අබේවර්ධන මහතා]

(iv) ඇමුණුම I මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම I **සභාගත*** කරමි.

(ආ) (i) 1,815

(ii) ඇමුණුම IIහි සඳහන්ව ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) ඔව්.

(iv) එක් ලක්ෂ විසිදහසකි. (2016 වර්ෂයේ අයදුම්කරුවන් 120,000ක් සිටී.)

(v) නැත.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(viii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා කිව්වා තරග විභාගයක් පැවැත්වූවා කියලා. ඉන් පසුව අසන ලද ප්‍රශ්නවලට එතුමා කියන්නේ "අදාළ නොවේ" කියලා. ඒ තරග විභාගයෙන් වැඩිම ලකුණු ලබාගත් අය සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබෙනවා නේද?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, දැනට ප්‍රතිඵල නිකුත් කර තිබෙනවා. වැඩිම ලකුණු ගත් අයදුම්කරුවන් 4,000ගේ ප්‍රතිඵල නිකුත් කර තිබෙනවා. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 30කට, 40කට ආසන්න ප්‍රමාණයක් පත් කරමින් සිටිනවා. නියඟය සහ ගංවතුර නිසා සම්මුඛ පරීක්ෂණ පවත්වන නිලධාරින් සම්බන්ධව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් අපි ඉදිරි මාස කිහිපය තුළ සම්මුඛ පරීක්ෂණ පවත්වලා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමාගේ පිළිතුර පරිදිම ග්‍රාම නිලධාරි පුරප්පාඩු 1,815ක් තිබෙනවා. 2016දී තමයි මේ තරග විභාගය පැවැත්වූවේ. ඒ විභාගය පවත්වලා අවුරුද්දකට වැඩි කාලයක් වෙනවා. ඒ සඳහා එක් ලක්ෂ ගණනක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අනුව, පුරප්පාඩුත් තිබෙනවා; විභාගය පවත්වලාත් තිබෙනවා. එසේ තිබියදී, මේ තරග විභාගයෙන් වැඩිම ලකුණු ගත් අයදුම්කරුවන් 4,000කගේ සම්මුඛ පරීක්ෂණ කල් දාලා, බඳවා නොගැනීම සාධාරණයි, සුදුසුයි කියලා ඔබතුමා විශ්වාස කරනවාද?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, කිසිම කල් දැමීමක් සිදු කර නැහැ. 2017 වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න කීපයකට අපි මුහුණ දීලා තිබෙනවා. එකක් තමයි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332න්, 95ක් ගංවතුරට මුහුණ දීම. ඒ එක්කම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 116ක් නියඟයට මුහුණ දීලා තිබෙනවා. ග්‍රාම නිලධාරි වසම් 5,540ක් පමණ ගංවතුරට මුහුණ දුන්නා. නැවත ග්‍රාම නිලධාරි වසම් 4,000කට ආසන්න ප්‍රමාණයක් නියඟයට මුහුණ දීලා තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක අපි ඒකට ගැළපෙන පරිදි විශ්‍රාම ලත් අය නැවත සේවයේ පිහිටුවා තිබෙනවා. තරග විභාගයෙන් වැඩිම ලකුණු ලත් අය සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගෙන සේවයට වාර්තා කරනවාත් සමඟ නැවත සේවයේ පිහිටු වූ විශ්‍රාම ලත් අයගේ සේවය අහෝසි වනවා. ඊට අමතරව අපි රාජ්‍ය සේවා කොමිසම සමඟ මේ සම්බන්ධයෙන් යම් කිසි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, මේ දිනවල විශ්‍රාම යන නිලධාරියෙකු ඉන්නවා නම්, ප්‍රාදේශීය ලේකම්වරයා සහ දිසාපතිවරයා නිර්දේශ කරලා එවවාම අලුත් නිලධාරියා පැමිණෙන තුරු ඔහු තව දුරටත් කොන්ත්‍රාත් පදනම මත සිටිය යුතුයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්න දෙක අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

තව එක් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

## කොටස් වෙළඳ පොළෙහි ලැයිස්තුගත සමාගම්: විදේශ ආයෝජන
## கொழும்பு பங்குச்சந்தையில் பட்டியலிடப்பட்டுள்ள கம்பனிகள்: வெளிநாட்டு முதலீடுகள்
## COMPANIES LISTED IN COLOMBO STOCK EXCHANGE: FOREIGN INVESTMENTS

1415/'16

**15. ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 199ට අනුව, විදේශීය සමාගම් ලැයිස්තුගත කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ලාභාංශ යනාදිය ආදායම් බද්දෙන් නිදහස් කළ බැවින්, 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල විදේශ ආයෝජන ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 2009 යුද ගැටුම් අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි ඇති වූ උපනතීන් පිළිබඳ (සම්මත දර්ශකයන්ට අනුව) වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) 2015 සහ 2016 වර්ෂවල විදේශිකයන් ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙන් ඉවත් කරගත් ආයෝජන ප්‍රමාණය කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි පුනර්ජීවනය සඳහා යෝජිත වෙනස්කම් සහ රාජ්‍ය මූල්‍ය සහ බදු සානුබලයන් කවරේද;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(v) 2016 අය වැයෙන් යෝජිත ප්‍රග්ධන ලාභ බද්ද අනාගතයේදී කොටස් හුවමාරුවටද හඳුන්වාදීමේ අදහසක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு-செலவுத்திட்டப் பிரேரணை இலக்கம் 199 இன் பிரகாரம், வெளிநாட்டுக் கம்பனிகள் பட்டியலிடப்பட்ட பங்குகளில் முதலீடு செய்வதிலிருந்து கிடைக்கப்பெறும் பங்கிலாபம் போன்றவை வருமான வரியிலிருந்து விடுவிக்கப்பட்டமையினால் 2016ஆம் ஆண்டில் இலங்கை பங்குச் சந்தையில் பட்டியலிடப்பட்டுள்ள கம்பனிகளின் வெளிநாட்டு முதலீடுகளின் அளவு எவ்வளவென்பதையும்;

(ii) 2009ஆம் ஆண்டில் யுத்தம் முடிவடைந்த பின்னர் இலங்கை பங்குச் சந்தையில் ஏற்பட்ட போக்குகள் பற்றிய (அங்கீகரிக்கப்பட்ட சுட்டெண்களின்படி) அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் வெளிநாட்டவர்கள் இலங்கை பங்குச் சந்தையிலிருந்து அகற்றிக்கொண்டுள்ள முதலீடுகளின் அளவு எவ்வளவென்பதையும்,

(iv) இலங்கை பங்குச் சந்தையின் புத்தெழுச்சிக்காக முன்மொழியப்பட்ட மாற்றங்களும் அரச நிதி மற்றும் வரி ஊக்குவிப்புகளும் யாவையென்பதையும்;

(v) 2016 வரவுசெலவுத்திட்டத்தில் பிரேரிக்கப்பட்டுள்ள மூலதன வரியை எதிர்காலத்தில் பங்குப் பரிவர்த்தனைக்கு அறிமுகப்படுத்தும் நோக்கமொன்று உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the amount of foreign investments made by the companies listed in the Colombo Stock Exchange in the year 2016 since the income from dividends on investments in listed shares by foreign companies was exempted from the income tax as per Proposal No.199 of the 2016 Budget;

(ii) whether he will submit a report on the trends (as per standard indices) in the share market of Sri Lanka following the conclusion of the armed conflict in the year 2009;

(iii) the amount of investments withdrawn by foreigners from the share market of Sri Lanka in the years 2015 and 2016;

(iv) the proposed changes and financial and tax incentives for the revival of the share market of Sri Lanka;

(v) whether there is a plan to introduce the Capital Gains Tax proposed from the 2016 Budget to the share market in future?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වසර 2016 දී ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල විදේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 74.5කි.

ගරු මන්ත්‍රීතුමනි, ඒ විදේශීය මිලදී ගැනීම්.

(ii) වසර 2009දී යුද ගැටුම අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ ඇති වූ උපනතීන් සම්මත දර්ශකයන්ට අනුව:

| වසර | සමස්ත මිල දර්ශකයෙහි වර්ධනය (%) |
|---|---|
| 2010 | 96.0 |
| 2011 | සෘණ 8.5 |
| 2012 | සෘණ 7.1 |
| 2013 | 4.8 |
| 2014 | 23.4 |
| 2015 | සෘණ 5.5 |
| 2016 | සෘණ 9.7 |
| 2017 (අගෝස්තු 11 දක්වා) | 4.2 |

(iii) වසර 2015දී විදේශ ආයෝජකයන් රුපියල් බිලියන 5.3ක වටිනාකමක මුදල් කොටස් වෙළෙඳ පොළෙන් ඉවත් කරගෙන ඇත. එහෙත්, 2016 වර්ෂයේදී විදේශ ආයෝජකයන් විසින් රුපියල් මිලියන 383ක වටිනාකමක් ශුද්ධ වශයෙන් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කර ඇත. එය රට තුළට මුදල් ගලා ඒමකි.

ගරු කථානායකතුමනි, මා ඉතාම සන්තෝෂයෙන් ඔබතුමාට දැනුම් දෙන්න කැමැතියි, 2017 අගෝස්තු 11වන දින වන විට විදේශ ආයෝජකයන් විසින් ශුද්ධ වශයෙන් රට තුළට ගෙනැවිත් ඇති ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 26.7ක් බව. එය කොටස් වෙළෙඳ පොළ ඉතිහාසයේ වසරක් තුළ වාර්තා වී ඇති දෙවන ඉහළම ශුද්ධ විදේශීය ගලා ඒමේ ප්‍රමාණයයි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

(iv) ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳ පොළෙහි පුනර්ජීවය සඳහා යෝජිත ප්‍රධාන වෙනස්කම් වන්නේ,

ප්‍රාග්ධන වෙළෙඳ පොළ නියාමනය යාවත්කාලීන කිරීම උදෙසා වසර 2017 තුළදී නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සම්මත කර ගැනීම.

අපි එය තව මාස එකහමාරකින්-දෙකකින් ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා.

ඉහළ කාර්යක්ෂමතාවක් උදෙසා කොටස් වෙළෙඳ පොළ අසාමූහීකරණය කිරීම. That is to demutualize the Stock Exchange.

අවදානම් කළමනාකරණය උදෙසා DVP ක්‍රමය හඳුන්වා දී (කොටස් නිෂ්කාශනය/ මුදල් ගෙවීම සහ ගනුදෙනු එකවර සිදු කිරීම) ඉන් පසුව මධ්‍යම ප්‍රතිපාර්ශ්ව ආයතනයක් පිහිටුවීම. That is to create a central counterparty.

රජය සතු හඳුනාගත් සමහර සමාගම් කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීම තුළින් කොටස් වෙළෙඳ පොළේ විශාලත්වය සහ ද්‍රවශීලතාව ඉහළ නැංවීම. That is to increase liquidity.

සුළු පරිමාණ ආයෝජකයින් අතර ඒකක භාර ආයෝජන ප්‍රචලිත කිරීම - Unit trust.

ප්‍රාග්ධන වෙළෙඳ පොළ පිළිබඳව මහජනයා, ආයෝජකයන්, පාසල් සිසුන්, ගුරු භවතුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු සියලුම පාර්ශ්ව තුළ ඇති දැනුවත්භාවය ඉහළ දැමීම.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳ පොළ නියාමනය තවදුරටත් වර්ධනය කිරීම උදෙසා පවත්නා නීති රීති (ලැයිස්තුගත කිරීමේ නීති, කොටස් තැරැව්කාර නීති, ගනුදෙනු පද්ධති නීති ඇතුළු සියල්ල) යාවත්කාලීන කිරීම.

(v) 2016 අය වැයෙන් යෝජිත ප්‍රාග්ධන ලාභ බද්ද අනාගතයේදී කොටස් හුවමාරුවට හඳුන්වා දීමේ අදහසක් නැත.

(ආ) අදාළ නොවේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2016 අය වැය යෝජනාවට අනුව, විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන අය හා විදේශීය සමාගම් විසින් ලැයිස්තුගත කොටස්වල ආයෝජනයන්ගෙන් ලැබෙන ලාභාංශ ආදිය ආදායම් බද්දෙන් නිදහස් කිරීමට කටයුතු කරනවා. 2015, 2016 වර්ෂවල අය වැයට අදාළව යෝජනා ඉදිරිපත් කර තිබෙනවා, "ලාභාංශ බද්දෙන් නිදහස් කරනවා; ආදායම් බදුවලින් නිදහස් කරනවා; මේ බදු පනවනවා; මේ බදු ඉවත් කරනවා" කියලා. නමුත්, මේ ගරු සභාවට බදු සංශෝධනයක් සඳහා වන කිසිම යෝජනාවක් ගෙනැල්ලා නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියනවාද ලාභාංශ යනාදිය බද්දෙන් නිදහස් කිරීම සඳහා යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පනතක් සංශෝධනය කළාද, නැද්ද කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, යම්කිසි පනතක් සංශෝධනය කරන්න මේ පාර්ලිමේන්තුවට ගෙනාවා නම් ඔබතුමා එය දැනගෙන ඉන්න ඕනෑ. ඔබතුමා කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ ඉඳලා දැන් මගෙන් අහන්න එපා, "සංශෝධන ගෙනාවාද?" කියලා.

අනෙක් කාරණය තමයි, පනතක් සංශෝධනය කරන්නේ නැතුව අපට නීතිය වෙනස් කරන්න බැහැ කියලා ඔබතුමාත් දන්නවා. පනත සංශෝධනය වෙලා නැත්නම්, පාර්ලිමේන්තුවට යෝජනා ඉදිරිපත් කරලාත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා දැන් පිළිගත්තා, පනතේ නිශ්චිත වශයෙන් දක්වා තිබෙන බදු සහන හැර අනෙක් කිසිම බදු සහනයක් ලාභාංශවලට හෝ විදේශ ආයෝජනවලට හෝ වෙනත් ආයෝජන දිරිගැන්වීම්වලට ලැබෙන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතකොට කොටස් වෙළෙඳ පොළ ගැන කථා කරනවා නම්, මෙහි ලාභාංශ යනාදියට තිබෙන බදු නිදහස නැති වනවා නම් ඒ පිළිබඳව සංවාදයක් ඇති කරලා, එය පනතට ඇතුළු කර ගන්න තමුන්නාන්සේලාට යුතුකමක් සහ වග කීමක් තිබෙනවා.

මගෙන් ප්‍රශ්න අහන එක නොවෙයි, කළ යුත්තේ. ආණ්ඩුව කටයුතු කරන විධියට මේ තිබෙන එකත් කඩාගෙන වැටෙන එක නතර කර ගන්න. ලංකා ඉතිහාසයේ 2015 වර්ෂයේ මහ බැංකුවේ ඇති වුණු මහා මං කොල්ලයෙන් පසුව ආයෝජකයන් රජයේ සුරැකුම්පත්වල, භාණ්ඩාගාර බිල්පත්වල, කොටස්වල වෙළෙඳ පොළේ ආයෝජනය කළ ඔක්කොම සල්ලි ටික ආපසු අරගෙන ගියා කියන එක තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ. රුපියල් බිලියන දෙකකට වඩා අරගෙන ගියා. ඒ පාඩුව තමයි තවම දරා ගන්න බැරි වෙලා තිබෙන්නේ. එම නිසා මේ අලුත් පනතෙන් කරන්න යන එක ගැනත් බලන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, එතුමා මට ලොකු චෝදනාවක් කළා. මා ඒකට පිළිතුරු දෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ වන විට ලංකා ඉතිහාසයේ දෙවැනි වතාවට රුපියල් බිලියන 26.7ක අලුත් ආයෝජන ඇවිත් තිබෙනවා කියලා මෙතුමාට මතක් කරන්න කැමැතියි. මෙතුමා කියනවා අරගෙන යනවා කියලා. මම මෙතුමාට අභියෝග කරනවා, මෙතුමාට ගණන් පැටලිලා කියලා. මොකද, අරගෙන යනවා නොවෙයි, ආයෝජන අරගෙන එනවා. අලුත් විදේශ ආයෝජන හැටියට රුපියල් බිලියන 26.7ක් කොටස් වෙළෙඳ පොළට ගලාගෙන ඇවිත් තිබෙනවා. මෙතැනින් එළියට ගිහින් නොවෙයි.

ගරු කථානායකතුමනි, එතුමාත්, මමත් හොඳට දන්නවා ඒ කාලයේ උස්සලා අත හරිනවා කිව්වා නේ. Pump and dump

කරලා British Virgin Islands වාගේ තැන්වලින් ගෙනැවිත්, කොටස් වෙළෙඳ පොළේ රුපියල් 35ට තිබුණු කුකුළු කොටු රුපියල් 250ට අරගෙන, රුපියල් 187ට සේවක අර්ථ සාධක අරමුදලට අත හැරියා. ඒ කාලය අපට අමතක වෙලා නැහැ. ඔය කළු සල්ලිවලින් තමයි බදු අය නොකළේ. නමුත් රටක් හැටියට අපට සාධාරණ බදු ප්‍රතිපත්තියක් තිබිය යුතු නිසා ඔය වාගේ කළු සල්ලිකාරයන්ගේ සල්ලිවලින් බදු අය කරනවා. නමුත්, සාමාන්‍ය ජනතාවගේ ඉතිරි කිරීම්වලින්, ඔවුන්ගේ කුඩා ව්‍යාපාරවලින් අය කරන බදු ප්‍රමාණය අඩු කරනවා.

ඉතින් ඒක තමයි අප රජයේ ජනතා සාධාරණීකරණ බදු ප්‍රතිපත්තිය. ඒක ගැන අපට සිකුරාදාට තර්ක කරන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දෙවන වටය.

ප්‍රශ්න අංක 1 - 112/'15 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 - 1199/'16 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1595/'17 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම : විස්තර

வரையறுக்கப்பட்ட லங்கா நிலக்கரி (தனியார்) கம்பனி: விபரம்

LANKA COAL COMPANY PRIVATE LIMITED: DETAILS

1635/'17

**8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Nalin Bandara Jayamaha)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (Lanka Coal Company (Pvt.) Limited) පිහිටුවන ලද දිනය කවරේද;
(ii) එකී සමාගමේ ගිණුම් වාර්ෂිකව විගණනය කර තිබේද;
(iii) එසේ නම්, ඒ කවර ආයතනයක් විසින්ද;
(iv) ගිණුම් විගණනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;
(v) එම සමාගම විසින් ගිණුම්කරණය පිළිබඳ නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යන බව සහතික කළ හැකිද;
(vi) එකී සමාගම ගිණුම්කරණය පිළිබඳ නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත්නම්, ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட லங்கா நிலக்கரி (தனியார்) கம்பனி (Lanka Coal Company (Pvt.) Ltd.) தாபிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

[ගරු බුද්ධික පතිරණ මහතා]

( ii ) மேற்படி கம்பனியின் கணக்குகள் வருடாந்தம் கணக்காய்வு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

( iii ) ஆமெனில், அது எந்நிறுவனத் தினால் என்பதையும்;

( iv ) கணக்குகள் கணக்காய்வு செய்யப் படவில்லையெனின் அதற்கான காரணம் யாதென்பதையும்;

( v ) மேற்படி கம்பனியினால் கணக்கீடு தொடர்பாக உரிய தரநியமங்கள் பேணிவரப் படுகின்றதென்பதை உறுதிப்படுத்த முடியுமா என்பதையும்;

( vi ) மேற்படி கம்பனி கணக்கீடு தொடர்பாக உரிய தரநியமங்களை பேணிவருவதற்கு தவறியிருப்பின், அதற்கு பொறுப் புக்கூறவேண்டிய உத்தியோகத் தர்கள் சம்பந்தமாக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy :

(a) Will he inform this House -

(i) the date on which Lanka Coal Company (Pvt.) Limited was established;

(ii) whether the accounts of the aforesaid company have been audited, annually;

(iii) if so, by which firm;

(iv) the reasons led, if the accounts have not been audited;

(v) whether it can be guaranteed that the aforesaid company maintains proper accounting standards; and

(vi) if the aforesaid company has failed in maintaining proper accounting standards, of the steps that would be taken against the responsible officers ?

(b) If not why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අමාත්‍ය මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී ගනු ලැබූ තීරණයක් මත 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම ලෙස 2008 ජනවාරි මස 23 වන දින පිහිටුවා ඇත.

(ii) ගිණුම් වාර්ෂිකව විගණනය කර තිබේ.

(iii) 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඇටිකෝ ඇසෝසියේෂන් වරලත් ගණකාධිකාරී ආයතනය, 2013-2014 වර්ෂ ලෙස දක්වා ගිණුම් බී.ආර්. ද සිල්වා වරලත් ගණකාධිකාරිවරුන් ද විගණනය කර ඇත.

2015 වර්ෂයට අදාළ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විගණනය කර ඇති අතර 2016 වර්ෂයට අදාළ විගණන කටයුතු විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරමින් පවතී.

(iv) විගණනය කර තිබේ.

(v) ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

(vi) අවශ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන ගොස් ඇති නිසා එවැන්නක් අවශ්‍ය නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9- 1641/'17 - (1), ගරු වමින්ද විජේසිරි මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කින්නියා රෝහලට ඇතුළත් කරන ලද ඩෙංගු රෝගීන්: විස්තර

## கிண்ணியா வைத்தியசாலையில் அனுமதிக்கப்பட்ட டெங்கு நோயாளிகள்: விபரம்

DENGUE PATIENTS ADMITTED TO KINNIYA HOSPITAL: DETAILS

1712/'17

**11.ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Vasudeva Nanayakkara)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017 වර්ෂයේ මේ දක්වා කින්නියා රෝහලට ඇතුළත් කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කවරේද;

(ii) ප්‍රතිකාර ලබමින් සිටියදී ඒ අතරින් කී දෙනෙකු මියගියේද;

(iii) ඩෙංගු වසංගතය හේතුවෙන් කින්නියා රෝහලේ වෛද්‍යවරුන්, කාර්යමණ්ඩලය, ඇඳන් සහ ඉඩකඩ පිළිබඳ බරපතල හිඟයක් ඇතිවී තිබේද;

(iv) මෙම තත්ත්වය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) කින්නියා රෝහලේ පවතින වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් රෝගීන් ත්‍රිකුණාමලය රෝහලට මාරුකිරීම සිදුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017 ஆம் ஆண்டு முதல் இன்று வரை கிண்ணியா வைத்தியசாலையில் அனுமதிக்கப்பட்ட டெங்கு நோயாளிகள் எத்தனை பேர் என்பதையும்;

(ii) அவர்களில் சிகிச்சை பெற்றுக்கொண்டிருக்கும் போது மரணமடைந்தவர்கள் எத்தனை பேர் என்பதையும்;

(iii) டெங்குத் தொற்று காரணமாக கிண்ணியா வைத்தியசாலையில் வைத்தியர்கள், பணியாட்டொகுதியினர், கட்டில்கள் மற்றும் இடவசதிகளுக்கான பாரிய தட்டுப்பாடு நிலவுகின்றதா என்பதையும்;

(iv) இந்த நிலைமையை நிவர்த்தி செய்வதற்காக மேற்கொள்ளப்படவிருக்கும் நடவடிக்கைகளையும்;

(v) கிண்ணியா வைத்தியசாலையில் நிலவும் வைத்தியர்களுக்கான தட்டுப்பாடானது நோயாளிகளை திருகோணமலை வைத்தியசாலைக்கு மாற்றுவதை கட்டாயப்படுத்தியுள்ளது என்பதையும்;

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) how many dengue patients have been admitted to the Kinniya Hospital in the year 2017 up to now;

(ii) how many of them died while being under treatment;

(iii) is there a serious shortage of doctors, staff, beds and space in the Kinniya Hospital as a result of the dengue epidemic;

(iv) the steps will be taken to relieve this situation; and

(v) the fact that the shortage of doctors in the Kinniya Hospital compelling the transfer of patients to the Trincomalee Hospital?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1574කි. (එක්දහස් පන්සිය හැත්තෑ හතරක්)

(ii) 13කි.

(iii) නැත.

(iv) පැන නොනඟී.

(v) නැත.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 12 - 1732/'17 - (1), ගරු සෙයියිඩ් අලී සාහීර් මවුලානා මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු සෙයියිඩ් අලී සාහීර් මවුලානා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වාරිමාර්ග සහ ගොවිබිම් : මන්නාරම දිස්ත්‍රික්කය

நீர்ப்பாசன முறைமைகள் மற்றும் பயிரிட்ட நிலங்கள்: மன்னார் மாவட்டம்

IRRIGATION SYSTEMS AND CULTIVATED LANDS: MANNAR DISTRICT

1200/'16

**14.ගරු ජයන්ත සමරවීර මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜயந்த சமரவீர - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Jayantha Samaraweera on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

[ගරු ජයන්ත සමරවීර මහතා]

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1983 ஆண்டளவில் மன்னார் மாவட்டத்தினுள் காணப்பட்ட,

(i) நீர்ப்பாசனங்களின் எண்ணிக்கை;

(ii) சிறு குளங்கள், அணைக்கட்டுகள், கால்வாய்களின் எண்ணிக்கை;

(iii) அவற்றின்மூலம் பயிர்செய்கை மேற்கொள்ளப்பட்ட விவசாய நிலங்களின் அளவு;

எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) 1983 முதல் 2009 ஆம் ஆண்டில் யுத்தம் முடிவடையும் வரை நீர்ப்பாசனங்கள், குளங்கள், அணைக்கட்டுகள், கால்வாய்களை புனரமைப்பதற்காக ஒதுக்கப்பட்ட பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(ii) யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015 ஆம் ஆண்டு வரை ஒட்டுமொத்த நீர்ப்பாசனங்கள், குளங்கள், அணைக்கட்டுகள், கால்வாய்களின் புனரமைப்புக்காக அரசாங்கத்தினால் ஒதுக்கப்பட்ட பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he inform this House in relation to the Mannar District by the year 1983 -

(i) the number of irrigation systems that had existed;

(ii) the number of small-scale tanks, anicuts and canals that had existed; and

(iii) the extent of lands that had been brought under cultivation?

(b) Will he also inform this House -

(i) separately on a per year basis from year 1983 until the war situation had ended in 2009 the amount of money that had been allocated for restoration of irrigation schemes, tanks, anicuts and canals; and

(ii) separately on a per year basis from the time the war situation ended until year 2015 the total amount of money the government had allocated for the restoration of irrigation systems, tanks, anicuts and canals?

(c) If not, why?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1983 වර්ෂයට පෙර තොරතුරු සොයා ගැනීමට නොහැක. නමුත්, මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වාරිමාර්ග 03ක් පාලනය වේ.

(ii) කුඩා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය නොවන අතර, උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

(iii) 1983 වර්ෂය වන තවිට තිබූ තොරතුරු සොයාගත නොහැකි අතර, 2015 වර්ෂය වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වගා කරනු ලැබූ අක්කර ප්‍රමාණය 30199කි.

(ආ) (i) තොරතුරු සොයා ගැනීමට නොහැක.

(ii) මුළු මුදල රු.253,358,380.47 (රු.මිලියන 253.4) කි. වර්ෂයන්ට අදාළව වෙන් කළ මුදල් ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | වෙන් කළ මුදල (රු.) |
|---|---|
| 2011 | 74,601,659.93 |
| 2012 | 81,349,273.00 |
| 2013 | 26,916,744.02 |
| 2014 | 31,236,254.79 |
| 2015 | 39,254,448.73 |
| එකතුව | 253,358,380.47 |

(ඇ) අදාළ නොවේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, point of Order එක මොකක්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ඔබතුමා අපට ඊයේ දැනුම් දුන්නා, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ සංශෝධන ටික අපට අද දිනයේදී ඉදිරිපත් කරනවා කියලා. දැනට එය ලැබිලා නැහැ. ගරු සභානායකතුමනි, ඒ පිළිබඳ තත්ත්වය මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යතුමාත් සභාවට ඇවිල්ලා හිටියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා එය සකස් කරමින් යනවා. මොකද, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ එක්තරා විධියක් තිබෙනවා. අනික, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා එක්ක ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා ඒ ගැන කතා කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා දැන් පැමිණෙනවා. එතුමාට පුළුවන් උත්තර දෙන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම සංශෝධනවල කෙටුම්පත මේ වන විට නීතිපතිතුමාට යොමු කර තිබෙනවා. අද හැන්දෑව වන විට ඔබතුමන්ලාට එය ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සංශෝධන කෙටුම්පතද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔව්. සංශෝධනවල කෙටුම්පත නීතිපතිතුමාට යවා තිබෙනවා, එතුමාගේ අනුමැතිය ලබා ගන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සභාවේ වැඩ කටයුතු අවසන් වෙන්න කලින් අපට එය ලබා දෙනවා නේද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
අනිවාර්යයෙන්ම ලබා දෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
අලුත් පළාත් පාලන කොට්ඨාස සීමා නිර්ණය කිරීම පිළිබඳ ගැසට් පත්‍රයක් නිකුත් කර තිබෙනවා. නමුත් ගරු මන්ත්‍රීවරුන් හැටියට අපට තවම එය ලැබී නැහැ. ඒ සම්බන්ධයෙන් විවාදය පවත්වන්න කලින් ඒ ගැසට් පත්‍රය අපට ලබා දෙනවාද කියා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඒක ගැසට් කරලායි තිබෙන්නේ. ඔබතුමා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට ආවා නම් ඔබතුමාට ගැසට් පත්‍රයක් ලබා දෙන්න කටයුතු කරන්නම්. හැබැයි සියලුම මන්ත්‍රීවරුන්ට ලබාදීම සඳහා ගැසට් පත්‍ර 225ක් ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කළේ නැහැ. නමුත් එම ගැසට් පත්‍රය දැනට නිකුත් කර තිබෙන නිසා ඔබතුමාට එය ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම ගැසට් පත්‍රයේ පිටපත් ගන්න බැරි ද? මන්ත්‍රීවරුන්ට අවශ්‍ය නම් ඒ ගැසට් පත්‍ර ලබා දෙන්න පුළුවන් නේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මට ඒ ගැසට් පත්‍රයේ පිටපත් 225ක් ලබා ගන්න සිදු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනට පිටපත් කීයක් තිබෙනවාද? අඩු ගණනේ ගැසට් පත්‍ර එකක් හෝ දෙකක් හෝ පාර්ලිමේන්තුවේ library එකේ තැබුවොත් ප්‍රයෝජනයට ගන්න පුළුවන් නේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Library එකට පිටපත් 2ක් මා ලබා දෙන්න කටයුතු සලස්වන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මමත් දැකපු විධියට ඒ ගැසට් පත්‍රය විශාල එකක්. එම නිසා මා හිතන හැටියට වඩාත් යෝග්‍ය වන්නේ, ඔබතුමාට පුළුවන් නම් ඒ ඒ දිස්ත්‍රික්ක නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ඒ ඒ දිස්ත්‍රික්කයට අදාළ කොටස ලබාදීමයි. එහෙම ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් නම් වඩා හොඳයි. ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ගාල්ල දිස්ත්‍රික්කයේ සීමා නිර්ණය, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට කොළඹ දිස්ත්‍රික්කයේ සීමා නිර්ණය, ඒ විධියට ලබා දෙනවා නම්, එය වඩාත් ප්‍රායෝගික වෙයි කියලා මා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට අමතරව library එකේ ගැසට් පත්‍ර තුනක් හෝ හතරක් තැබුවොත් හොඳයි, ගරු ඇමතිතුමනි.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

අනුර දිසානායක මන්ත්‍රීතුමනි, සෑම දේශපාලන පක්ෂයකටම පිටපත් ලබා දෙන්න මා කටයුතු කරන්නම්. ඒක ඊට වඩා ප්‍රායෝගිකයි කියලා මා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පුස්තකාලයේත් තබන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ටත් පිටපතක් යවන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, library එකේත් තබනවා නම් හොඳයි නේද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එක් එක් දිස්ත්‍රික්ක නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට එතුමන්ලාට අදාළ දිස්ත්‍රික්කයේ කොටස ලබාදෙන්න ගරු ඇමතිතුමාට පුළුවන් නම්, එතුමන්ලා ළඟ ඒ කොටස තිබෙන නිසා වඩාත් පහසු වෙයි කියලායි මා කිව්වේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මා ඒ කටයුත්තත් කරන්න බලන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සීඩී පටයක දමා දුන්නා නම් පහසුයි නේ. එතකොට කාටත් පහසුයි. එහෙම නම් සීඩී පටයකට දමලා දෙන්න.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

සීඩී පටයකට දමලා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගමන්ම library එකට ගැසට් පත්‍ර දෙකක් ගෙනැවිත් දෙන්න. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, සීඩී පටයකට දමලා දුන්නාම හොඳයි නේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු කථානායකතුමනි, ඔබතුමා කියන පරිදි කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලට ආරක්ෂිත ගේට්ටු සවිකිරීම
### பாதுகாப்பற்ற ரயில் கடவைகளில் பாதைத் தடுப்புகளை அமைத்தல்
### SAFETY GATES AT UNPROTECTED RAIL CROSSINGS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர் கௌரவ நிமல் சிறிபால த சில்வா அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி.

சுமார் 26 வருடங்களாக வவுனியா வரையில் மட்டுப்படுத்தப்பட்டிருந்த வடக்கிற்கான ரயில் சேவையானது, 2009ஆம் ஆண்டு யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டதை அடுத்து, 27.05.2011இல் வவுனியாவிலிருந்து ஓமந்தை வரையான சேவையாக ஆரம்பிக்கப்பட்டு, பின்னர் அது படிப்படியாக நீடிக்கப்பட்டு, 02.01.2015இல் காங்கேசன்துறை வரையிலான சேவையாக நிறைவுபெற்றதுடன், 14.03.2015இல் தலைமன்னார் பியர் வரையிலான சேவையாக முழுமைபெற்றுள்ளது.

நாட்டில் பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள் பல இருக்கின்ற நிலையில், தென்பகுதியிலிருந்து வடக்கு நோக்கிய ரயில் பாதையில் காணப்படுகின்ற பாதுகாப்பற்ற கடவைகளின் ஊடான விபத்துக்கள் நாளுக்குநாள் அதிகரித்து வருகின்றன. அந்த வகையில், அனுராதபுரம் ரயில்வே அத்தியட்சகரின் கீழான மாவட்டங்களில் கடந்த 2014ஆம் ஆண்டிலிருந்து 2017.07.31ஆம் திகதி வரையிலான காலப்பகுதிக்குள் ரயில் விபத்துக்கள் காரணமாகச் சுமார் 95 பேர் கொல்லப்பட்டுள்ளதாகவும் சுமார் 102 பேர் காயமடைந்துள்ளதாகவும் 134 வாகனங்கள் சேதமாகியுள்ளதாகவும் தெரியவருகின்றது. இந்நிலையில் பாதுகாப்பற்ற ரயில் கடவைகளின் ஊடான மரணங்கள் வடக்கில் தொடர்ந்து இடம்பெறுவதும் குறிப்பிடத்தக்கது.

பாதுகாப்பற்ற ரயில் கடவைகளில் மின் விளக்குச் சமிக்ஞைகள் பொருத்தப்பட்டுள்ளதாகக் கூறப்படும் நிலையில், அவை செயற்பாட்டுக்கு உகந்ததல்ல என்று இந்தியாவில் பாவனையிலிருந்து அப்புறப்படுத்தப்பட்ட மின் விளக்குச் சமிக்ஞைகளாக இருப்பதாகவும் கூறப்படுகின்றது. அதற்கேற்றவாறு, இங்கே என்னிடமுள்ள இன்றைய பத்திரிகைச் செய்தியொன்றின்படி, நேற்று முன்தினம் வவுனியா தாண்டிக்குளம் புகையிரதக் கடவையில் நாலு மணித்தியாலங்களாக மின் விளக்கின் சிவப்புச் சமிக்ஞை எரிந்து கொண்டிருந்ததால் போக்குவரத்துத் தடைப்பட்டதாகவும் பிறகு பொலிஸார் அங்கு வந்துதான் போக்குவரத்து நடவடிக்கைகளை ஒழுங்குசெய்ததாகவும் அறியவருகின்றது.

**வடக்கின் பாதுகாப்பற்ற ரயில் கடவைகளின் ஊடாக அதிகரித்து வருகின்ற விபத்துக்களைக் கட்டுப்படுத்தும் வகையில், பாதுகாப்புக் கடவைகளை அமைப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா?**

அதேநேரம், நாடளாவிய ரீதியில் பாதுகாப்பற்ற ரயில் கடவை ஊழியர்களாகச் சுமார் 3,628 பேர் கடமையாற்றி வருவதாகவும் இவர்களில் சுமார் 1,230 பேர் வடக்கு, கிழக்கு மாகாணங்களில் கடந்த 4 வருடங்களுக்கு மேலாகப் பணியாற்றி வருவதாகவும் இவர்கள் அரச, தனியார், தற்காலிக போன்ற எவ்விதமான தொழில் அந்தஸ்துகளும் இன்றி, அடிப்படைத் தொழில் சட்டத்திற்கு முரணான வகையில் பணியில் அமர்த்தப்பட்டுள்ளதாகவும் நாளொன்றுக்கு 8 மணி நேரம் பணியாற்றும் இவர்களுக்கு 250 ரூபாய் வீதம் மாதாந்தம் 7,500 ரூபாய் மாத்திரமே ஊதியம் வழங்கப்படுவதாகவும் விடுமுறைகள் எதுவும் வழங்கப்படுவதில்லை என்றும் தெரியவருகின்றது.

நாட்டிலுள்ள சுமார் 688 பாதுகாப்பற்ற ரயில் கடவைகளில் பாதுகாப்புக் கடமைகளில் ஈடுபடுவதற்கெனப் பொலிஸ் திணைக்களத்தினால் கடந்த 2013ஆம் ஆண்டு யூலை மாதம் 17ஆம் திகதி 2,064 பேர் இணைத்துக் கொள்ளப்பட்டுள்ளனர் என்றும் தெரியவருகின்றது.

**மேற்படி நபர்களை இலங்கைப் புகையிரதத் திணைக்கள சேவையில் இணைத்துக்கொள்வதற்கான வாய்ப்புக்கள் உண்டா?**

**இல்லையெனில், இவர்களது பணிகளுக்கான அந்தஸ்தினைப் பெறவும் அப்பணியாளர்களது வாழ்க்கையை முன்னெடுத்துச் செல்வதற்குப் போதுமான ஊதிய நிர்ணயம் மற்றும் தொழில் உரிமைகளைப் பெறவும் ஏற்புடைய மாற்று ஏற்பாடுகள் யாவை?**

மேற்படி கேள்விகளுக்கான பதிலை கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவார் என எதிர்பார்க்கின்றேன். நன்றி.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය මතුකිරීම පිළිබඳව මම ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ප්‍රශ්නයට සෑහෙන දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. ඒ කියන්නේ, අනාරක්ෂිත දුම්රිය ගේට්ටු පිළිබඳව දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. දුම්රිය මාර්ග සකස් කිරීමේදී බොහෝ විට ඒ විධියේ අනාරක්ෂිත දුම්රිය ගේට්ටු හරහා ගම්වලට යන්න අපි අවසර දීලා තිබෙනවා. කාලයක් ඒ තැන්වලට බම්බු ගේට්ටු දාලා, බම්බු ගේට්ටුකරුවන් පත්කරලා තිබුණා. බම්බු ගේට්ටුකරුවන් ඒ කාර්ය සම්බන්ධයෙන් යම් වෘත්තිමය ක්‍රියා මාර්ගයක් ගත්තා. සමහර දුම්රිය ගේට්ටුවලට "Bell and Light" කියන තාක්ෂණික ක්‍රමය සහිතව සකස් කර තිබෙනවා. සියලුම ගේට්ටුවලට Bell and Light ක්‍රමය නැහැ. නමුත්, ලෝකයේ සෑම දියුණු රටකම වාගේ Bell and Light සවිකිරීම තමයි කරන්නේ. Bell and Light සවිකළත්, ගේට්ටු සවිකළත්, රථ වාහන පදවන අය ගේට්ටු තිබියදීත් ඒවා අතරින් වාහන දානවා. Bell and Light කොච්චර වැදුණත්, ඒක ගැන අවධානයක් නැතුව දුම්රිය මාර්ග හරහා යනවා. ඒ නිසා මම එවැනි අවස්ථාවන් සඳහා වන දඩ මුදල වැඩි කිරීම සඳහා අවශ්‍ය නීති සකස් කරගෙන යනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දඩ මුදල කීයක් විතර වැඩි කරනවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

දඩ මුදල රුපියල් 25,000 දක්වා වැඩි කරන්න කටයුතු කරනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

එහෙම කරන්න ඕනෑ. එතකොට හරියනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ඒකත් කරන අතරේ, දුම්රිය පැත්තෙන් අපට ගැටලු කිහිපයක් ඇතිවුණු නිසා පොලීසිය මඟින් සිවිල් ආරක්ෂක කමිටු එකතු කිරීම කළා. පසුව එම ආරක්ෂක කමිටු සාමාජිකයන් "ගරු සේවයක්" හැටියට එම ගේට්ටු මුරකරන්න ඉදිරිපත් වුණා.

සිවිල් ආරක්ෂක කමිටු මඟින් ඒක කළා. සිවිල් ආරක්ෂක කමිටු සාමාජිකයන් පොලීසියත් සමඟ එකතු වෙලා ස්වේච්ඡාවෙන් තමයි "අපි මේ ගේට්ටු මුර කරන්නම්." කියලා ඉදිරිපත් වුණේ. මේ අය ස්වේච්ඡාවෙන්ම ඇවිල්ලා ටික දවසක් යනකොට දීමනා ඉල්ලන්න පටන් ගත්තා. හැබැයි, දීමනාව ගෙවන්නේ, දුම්රිය දෙපාර්තමේන්තුව නොවෙයි, පොලීසියෙනුයි. ගරු කථානායකතුමනි, ඒ වගකීම පොලීසිය තමයි භාරගත්තේ. මේ අය ගරු සේවයක් කළත් පොඩි දීමනාවක් දෙන්න කියලා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 49ක ප්‍රතිපාදනයක් පොලීසියට ලබා දුන්නා. ඒ අනුව එක් අයෙකුට රුපියල් 7,500ක්. ඒ කියන්නේ, මේක shifts 3ක් කරන්න ඕනෑ. ඒ අනුව එක් ගේට්ටුවකට රුපියල් 22,500ක්.

මම මේ පිළිබඳව ඉන්දියාවේ පවතින තත්ත්වය සොයා බැලුවා. ඉන්දියාවේ එය භාර දෙන්නේ එක පවුලකටයි. මොකද, සමහර වෙලාවට අපේ කෝච්චියක් යන්නේ පැය පහකට වතාවක්. ඉතින්, කුඹුරේ වැඩ සහ අනෙකුත් වැඩත් කරලා කෝච්චිය යන වෙලාව බලලා එතැනට ඇවිල්ලා මෙම ගේට්ටුව වහන, අරින කටයුත්ත කරනවා මිසක්, ස්ථිරවම එක තැනක -පැය 8ක් හෝ පැය 24ක් හෝ- ඉන්න දෙයක් නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි මේ ගොල්ලන් ස්වේච්ඡාවෙන් එකඟ වුණේ. නමුත්, වෘත්තීය සමිති හදාගෙන ස්වේච්ඡාවෙන් වැඩ කරපු සියලුම දෙනා රස්සාවන් ස්ථිර කරන්න කියා ඉල්ලනවා. ඒක අපට කරන්න පුළුවන්කමක් නැහැ. ඒක ප්‍රායෝගික නැහැ. සහනයක් වශයෙන් මම මේ පිළිබඳව කැබිනට් මණ්ඩලයේ අවධානයට යොමු කළා. මේ පිළිබඳ නිර්දේශයන් ලබා දෙන්න කියලා මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, භාණ්ඩාගාරය නියෝජනය කරන සී. ජයසූරිය මහත්මයා, දුම්රිය සාමාන්‍යාධිකාරීතුමා, කම්කරු කොමසාරිස් ජනරාල් නියෝජනය කරන නීති නිලධාරියෙකු, Commander සී. මීගහපොළ, සාමාජික අධ්‍යක්ෂ මෙහෙයුම් - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, සහකාර ආයතන අධ්‍යක්ෂ - වීරසේකර මහත්මිය, රථවාහන අධ්‍යක්ෂ චන්දන මහත්මයා යනාදී අයගෙන් යුක්ත නිලධාරී කමිටුවක් පත් කළා. ඒ කමිටුවට මේ ගේට්ටුකරුවන්ගේ සංගමයේ අයට එන්න අවස්ථාවක් සලසා දීලා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ඉන්දියාවේ සිදුවන ක්‍රම පිළිබඳ සොයා බලා එතැනදී අපි කිව්වා, "හොඳයි, අපි පවුලකට රුපියල් 22,500ක් දෙන්නම්." කියලා. එතකොට පවුලේ සාමාජිකයෝ ටික එකතු වෙලා හෝ තනියම හෝ එහෙම නැත්නම් සියලු දෙනාට හෝ බලා ගන්න පුළුවන් කියලා. අපි ඒ නිර්දේශය දැන් ක්‍රියාත්මක කරනවා. නමුත් මේ අයට රජයේ ස්ථිර රැකියා දෙන්නට පුළුවන්කමක් නැහැ. එම නිසා අපි ඉතා සාධාරණ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. සමහර වෙලාවට මේ ස්ථානවල කෙනෙක් හිටියේ නැති වුණොත්, එහෙමත් ප්‍රශ්න ඇති වෙන්නට පුළුවන්. මේ අය මේ වැඩය භාර ගත්තාට සමහර අය මේ වැඩය කරන්නේ නැතිව ගිහින් කුඹුරේ වැඩ කරනවා. එම නිසා තාක්ෂණික වශයෙන් අපට ලැබුණු උපදෙස තමයි "පුළුවන් තරම් ඉක්මනට මේ හැම තැනටම Bell and Light සවි කරන්න" කියන එක. ඒ අනුව අවුරුදු තුනක් ඇතුළතදී මේ සියලුම ගේට්ටු සඳහා Bell and Light සවි කරන්න භාණ්ඩාගාරයෙන් මුදල් දී තිබෙනවා. දැනටමත් මේ සඳහා එක ටෙන්ඩරයක් ප්‍රදානය කර ගේට්ටු 200ක් සඳහා Bell and Light සවි කිරීමට කටයුතු කර ගෙන යනවා. තවත් ගේට්ටු 200කට Bell and Light සවි කිරීම සඳහා දැන් ටෙන්ඩර් කැඳවා ගෙන යනවා.එතකොට 400යි. තව දෙවරක් මේ විධියට Bell and Light සවි කිරීමට කටයුතු කිරීමෙන් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරස් මාර්ග කොච්චර තිබෙනවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
හරස් මාර්ග සියල්ලම 876ක් තිබෙනවා. එතකෙට අපිට සියලුම මාර්ග සඳහා තව වර්ෂ එකහමාරක් දෙකක් ඇතුළතදී Bell and Light සවි කර අවසාන කරන්නට පුළුවන්. [බාධා කිරීමක්] gate එකක් නැහැ, Bell and Light විතරයි. දැන් ලෝකයේ හැම තැනම එහෙමයි තිබෙන්නේ. ඉන්දියාවේ සමහර තැන්වල ඒ විධියට තිබෙනවා. නමුත් දියුණු සෑම රටක්ම Bell and Light එකට පුරුදු වෙන්නට ඕනෑ. එහෙම නැතිව ගරු කථානායකතුමනි, හැම වෙලාවේම ගේට්ටු වහ වහා, ඇර ඇර ඉන්නත් බැහැ. සමහර වෙලාවට ගේට්ටු වහන අයගේ අවධානයක් යොමු වී තිබුණේ නැත්නම් ඒක කරන්නත් බැහැ. එම නිසා මේ ප්‍රශ්නය සඳහා තිරසාර විසඳුමක් මම ලබා දී තිබෙනවා. හැබැයි ඒකට එක්තරා කාලයක් යනවා.

අවුරුදු දෙකක් වාගේ කාලයක් ඇතුළතදී මේ සියලුම කටයුතු කරන අතරම විශේෂයෙන් වාහන පදවන අයට මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්නට වෙනවා. මම ඒ සඳහාත් දැන් වැඩ පිළිවෙළක් යොදා ගෙන තිබෙනවා, දුම්රිය ගේට්ටුවට යාර සියයක් තිබියදී board ගහලා මේ පිළිබඳව දැනුවත් කරන්න; ඒ වාගේම ඒ පාරේ සමහර තැන්වල bumpers දාන්නත්, එකපාරටම කඩා ගෙන එන්න බැරි වෙන්න. මේ මොනවා කළත් ඔබතුමා දන්නවා, බොහෝ විට බීමත්ව ඇවිත් මේවා කිසි දෙයක් බලන්නේ නැතිව යනවා කියලා. සමහරවිට Cotta Road එකේ තිබෙන රේල් ගේට්ටුව ළඟදී ඔබතුමා දකින්නට ඇති; අපිත් දැක තිබෙනවා, රේල් ගේට්ටුව වසා තිබෙනවා, නමුත් ඇතුළෙන් බයිසිකල් දමාගෙන යනවා. ගේට්ටුව වසා තිබෙන වෙලාවේත් ඇතුළෙන් බයිසිකල් දා ගෙන යනවා. ඒ විධියට අනවධානයෙන් වැඩ කරන අයගේ ජීවිත ආරක්ෂා කරන්න පුළුවන් කමක් අපට නැහැ. ඒ නිසා විශේෂයෙන් වාහන පදවන අයටත් මේ පිළිබඳව දැනුමක් ලබා දෙන්නට ඕනෑ. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can have only a clarification. We cannot have an argument on this.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ அமைச்சர் அவர்களே, Bell and Light என்று நீங்கள் சொல்கின்ற விடயம் வடக்கைப் பொறுத்தவரையிலே சரியாகச் செயற்படவில்லை. நேற்றுக்கூட தாண்டிக்குளம் புகையிரதக் கடவையிலே நான்கு மணித்தியாலங்களுக்கு மேல் சிவப்பு சமிக்ஞை விளக்கு எரிந்துகொண்டிருந்தது. அப்பொழுது அங்கு புகையிரதப் போக்குவரத்து இருக்கவில்லை. கடைசியாக அதை அறிந்த பொலிஸார் அங்கு வந்துதான் மக்களைப் போகவிட்டார்கள். அதேநேரம் இந்தியாவில் பழுதாகியிருந்த பழைய Light களை இங்கு கொண்டுவந்து பொருத்தியதாக ஒரு பேச்சு இருக்கின்றது.

அடுத்தது, வட மாகாணத்தைப் பொறுத்தவரையில் பொலிசார் காசு தருவதாக அதாவது மூவாயிரத்திலிருந்து ஆறாயிரம் ரூபாய் வரை மாதக் கொடுப்பனவு தருவதாகக் கூறித்தான் சம்பந்தப்பட்டவர்களை அங்கு சேவைக்கு அழைத்திருந்தார்கள். இருந்தபோதிலும் 22,500 ரூபாய் கொடுப்பனவு வழங்குகின்ற உங்களுடைய திட்டம் வரவேற்கக்கூடிய நல்ல விடயம். ஆனபடியால் தயவுசெய்து இதைக் கருத்தில் எடுத்துக்கொள்ளும்படி வேண்டுகிறேன்.. நன்றி.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
I will certainly look into your complaint.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමා මතු කරන එක කාරණයක් පැහැදිලි කරන්න ඔබතුමා කැමැතිද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
කමක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය පැහැදිලි කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අනුරාධපුරයේ සිට කන්කසන්තුරේට දුම්රිය ස්ථාන 27කට මේ දුම්රිය හරස් ගේට්ටු සවි කිරීම වෙනුවෙන් ඩොලර් මිලියන 84ක් වැය කළා. ආසන්න වශයෙන් ගත්තොත් එක ස්ථානයකට වැය වෙලා තිබෙනවා, ඩොලර් මිලියන 3.1ක්. ඒ කොන්ත්‍රාත්තුව ලබා ගත්තේ ඉන්දියානු IRCON සමාගම. ඒ සමාගම විසින් subcontracts දුන්නා. අනුරාධපුර, සාලිය පුර, මැදවච්චිය, පරසන්ගස්වැව, වවුනියාව, ඕමන්තේ කියන දුම්රිය ස්ථාන හයම උප කොන්ත්‍රාත් දුන්නේ ඩොලර් මිලියන1.5ට. අපි එකක් දී තිබෙන්නේ, ඩොලර් මිලියන 3.1ට. මේ පිළිබඳ සවිස්තරාත්මකව - ඔබතුමාත් දන්නවා,- ප්‍රියාල් සිල්වා කමිටු වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. එම නිසා ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමුකරයි කියා මා හිතනවා. ඒ කටයුත්ත දැන් අඩපණ වෙලා තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඒ ගැන පරීක්ෂණ කර ගෙන යනවා. ඒ පිළිබඳව පැමිණිලි ඇවිල්ලා, පරීක්ෂණ කරගෙන යනවා. ඒ ගැන මම අත ගහන්නේ නැහැ. ඒ පරීක්ෂණ ඒ ආකාරයෙන් කර ගෙන යනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම. අග්‍රාමාත්‍යතුමා, සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත
### அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம்
### TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2017 සැප්තැම්බර් මස 06වන බදාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2017 செப்ரெம்பர் 06, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Wednesday, 06th September, 2017 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament and the motion agreed to by Parliament on 08.03.2016, the hours of sittings of Parliament on this day shall be 1.00 p.m. to 6.30 p.m. At 2.00 p.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනාව
## சிறப்புரிமைப் பிரேரணை
## PRIVILEGE MOTION

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ ගෞරවයට හානි වන පරිදි හැසිරීම
### பாராளுமன்ற உறுப்பினர்கள் பாராளுமன்றத்தின் கௌரவத்தைக் களங்கப்படுத்தும் வகையில் நடந்துகொண்டமை
### UNRULY BEHAVIOUR OF MEMBERS OF PARLIAMENT DAMAGING DIGNITY OF PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the question of privilege arising out of the matter raised by the Hon. Ajith P. Perera, M.P on 11th August, 2017 in Parliament to the effect that his privileges have been infringed, be referred to the Committee on Privileges under Standing Order No. 127 of the Parliament."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### සුකියෝ මහිකරි ශ්‍රී ලංකා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### சுக்யோ மகிகறி சிறிலங்கா (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SUKYO MAHIKARI SRI LANKA (INCORPORATION) BILL

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"සුකියෝ මහිකරි ශ්‍රී ලංකා සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs for report.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කල් තැබීමේ යෝජනාව, ගරු අනුර කුමාර දිසානායක මහතා.

### නියඟයෙන් පීඩාවට පත් ජනතාවට කඩිනම් සහන
### வரட்சியினால் பாதிப்புற்ற மக்களுக்குத் துரித நிவாரணம்
### SPEEDY RELIEF TO PEOPLE AFFECTED BY DROUGHT

[අ.භා. 1.51]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මේ වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 19ක පවුල් 340,000ක ප්‍රමාණයක් කියා මා ඇත්තටම සඳහන් කර තිබුණත්, ගොවි පවුල් විතරක් 517,825ක ප්‍රමාණයක් දැඩි නියඟයෙන් පීඩා විඳිමින් සිටී. නියඟය දැඩි ලෙස බලපා ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ 163,000කට වැඩි ජනතාවක් ද, පුත්තලම දිස්ත්‍රික්කයේ 139,000කට වැඩි ජනතාවක් ද නියඟයෙන් මේ වන විට පීඩාවට පත් වී ඇත. උතුර, උතුරු මැද, නැගෙනහිර, ඌව, මධ්‍යම පළාත්වල දිස්ත්‍රික්ක වැඩි ප්‍රමාණයක් නියඟයේ බලපෑමට ලක්ව තිබේ.

ජනතාවට තම වගා බිම් සඳහා පමණක් නොව බීමට පවා ජලය සොයාගැනීම විශාල ගැටලුවක් බවට පත්වෙමින් ඇති අතර, වාරි මාර්ග දෙපාර්තමේන්තුව පවසා ඇත්තේ පවතින ජල ධාරිතාව සියයට 15 දක්වා පහත බැස ඇති බවය. එසේම ප්‍රමාණවත් වැසි ඉදිරියේදී අපේක්ෂා කළ නොහැකි තත්ත්වයක් ද වාර්තා වී ඇත.

මේ තත්ත්වය තුළ ජනතාව තවදුරටත් පීඩාකාරී තත්ත්වයකට ලක්වීමට පෙර ඔවුන්ගේ මෙම ජල ගැටලුවට විසඳුම් ලබා දිය යුතුව තිබේ. ඒ සඳහා කඩිනමින් සහන සහ ඔවුන්ගේ හානි වූ වගාවන් වෙනුවෙන් වන්දි ලබා දීමට පියවර ගත යුතුව ඇතැයි මෙම සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, මම හිතන විධියට දීර්ඝ කාලයක් තිස්සේ මෙම නියං තත්ත්වය පැතිරෙමින් තිබෙනවා. ගරු කථානායකතුමනි, සමහර පළාත්වල කන්න තුනක් වගා කෙරිලා නැහැ. උදාහරණයක් හැටියට ගත්තොත්, මහවැලි "එච්" කලාපයේ පසු ගිය යල කන්නයත්, පසු ගිය මහ කන්නයත්, දැනට වගා කර තිබෙන යල කන්නයත් කියන කන්න තුනේම වගා කිරීම් සිදු නොවුණු ප්‍රදේශ තිබෙනවා. ගරු කථානායකතුමනි, සමහර ප්‍රදේශ තිබෙනවා, කන්න දෙකක් මුළුමනින්ම වගා කරලා නැහැ. සමහර ප්‍රදේශ තිබෙනවා, මෙවර මහ කන්නය පමණක් වගා නොකරන ලද. ඒ නිසා ගරු කථානායකතුමනි, මෙම තත්ත්වය එක් එක් දිස්ත්‍රික්කවල, එක් එක් පළාත්වල විවිධාකාරයෙන් තමයි පැතිරී තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙතැන හඳුනා ගත යුතු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, තමන්ගේ වගා බිම් මුළුමනින්ම වගා නොකරන ලද ගොවි පිරිස්. ඒ ගොල්ලන් කන්න තුනක් වගා කළේ නැහැ. කන්න තුන වගා නොකරපු ගොවීන් ඉන්නවා, කන්න දෙක වගා නොකරපු ගොවීන් ඉන්නවා, එක් කන්නයක් වගා නොකරපු ගොවීන් ඉන්නවා. ඒ වාගේම තව ගොවීන් පිරිසක් ඉන්නවා; ඔවුන් වගා කළා, නමුත් ඔවුන්ගේ වගා විනාශයට පත් වුණා. මොකද, ජලය තිබෙනවාය කියන විශ්වාසයෙන් යුතුව ඒ මොහොතේ ඔවුන් වගා කළත්, ඒ වගා කිරීම්වලින් නිසි අස්වැන්නක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ජලය සැපයීමට නොහැකි වීම හේතුකොටගෙන වගා විනාශ වෙලා තිබෙනවා.

අනුරාධපුර, පොළොන්නරුව, විශේෂයෙන්ම මොණරාගල, හම්බන්තොට හා අම්පාර වැනි ප්‍රදේශවල තව හේන් ගොවීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා ගරු කථානායකතුමනි. ඔවුන් වැවකින් හෝ, ගඟකින් හෝ විධිමත් වාරිමාර්ග රටාවකට අනුව වතුර ලැබෙන පිරිස් නොවෙයි. ඔවුන් හේන් ගොවිතැන් කරනවා, වර්ෂාව අපේක්ෂා කරමින්. එතකොට එසේ වගා කරන ලද හේන් ගොවිතැන් අහිමි වුණු, විනාශ වුණු ගොවීන් සංඛ්‍යාවකුත් ඉන්නවා.

ගරු කථානායකතුමනි, මේ සමස්ත පළාත්වලම ආර්ථිකයේ විශාල පංගුවක් ඇති වෙන්නේ කෘෂි කාර්මික නිෂ්පාදන මතයි. ඒ අනුව තමයි කඩේට business එකක් තිබෙන්නේ; හෝටලයකට business එකක් තිබෙන්නේ; hardware එකකට business එකක් තිබෙන්නේ; රෙදි කඩයකට business එකක් තිබෙන්නේ. ඒ නිසා කෘෂි කර්මාන්තය මත පදනම් වුණු ආර්ථිකයක් තමයි අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මොණරාගල, අම්පාර, පුත්තලමේ ආනමඩුව පැත්තට බර වෙන්න සහ හම්බන්තොට කියන මේ ප්‍රදේශ ගණනාවකම තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

මෑතකදී මම අනුරාධපුරයේ ව්‍යාපාරික මහත්වරුන් කණ්ඩායමක් හමු වුණු වෙලාවේදී ඔවුන් කිව්වා, පසුගිය ජනවාරි මාසයේ ඉඳලා ඔවුන්ගේ business විශාල ලෙස කඩා වැටෙන්න පටන් ගත්තාය කියලා.

ඔහු රෙදි ව්‍යාපාරිකයෙක්. දැන් වන විට ඔවුන්ගේ business සියයට 75කට වඩා වැඩි ප්‍රමාණයකින් කඩා වැටිලා තිබෙනවාය කිව්වා. ගරු කථානායකතුමනි, ගොවි ජනතාවගේ මුළු ආර්ථිකයම කඩා වැටුණාම, ඒ තුළින් සමස්ත පළාතකටම දැඩි බලපෑමක් ඇති වෙලා තිබෙනවා. ඒ අනුව, මෙම නියඟය නිසා ගොවි ජනතාවට හෝ ගොවිතැනෙහි නිරතවූ පිරිසට පමණක් නොවෙයි, එම පළාතටම විශාල බලපෑමක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසාම සමස්ත ආර්ථිකයේ කඩා වැටීමක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම, අලුත් ඉදි කිරීම් සිද්ධ වෙන්නේ නැහැ. ඒ කියන්නේ, කන්නයක් කපලා අස්වැන්න ආවාට පස්සේ තමයි ගොවි මහත්මයෙක් කාමරයක් හදා ගන්න උත්සාහ කරන්නේ; සමහර අය අත්තිවාරමක් දමනවා; සමහර අය තමන්ගේ ගේ කපරාරු කරනවා. දැන් ඒ කිසිවක් සිදු වෙන්නේ නැහැ. ඒ නිසා වඩු කාර්මිකයෙකුටවත්, මේසන් කාර්මිකයෙකුටවත්, දෛනිකව කුලී වැඩ කරලා ජීවත් වන කෙනෙකුටවත් රැකියාවන් නැහැ. ඒ නිසා මේක සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, හදිසියේ ගංවතුරක් ඇති වෙලා ඇති වෙච්ච විනාශයක් නම්, මාස දෙක, තුනක් ඇතුළත එතැන යළි තිබුණු තත්ත්වයට පත් කරන්න පුළුවන්. දැන් වන විට අවුරුදු එකහමාරකට ආසන්න කාලයක් දිගු ලෙස පවතින දැඩි නියං තත්ත්වය හේතු කොට ගෙන, ආර්ථික වශයෙන් එම පළාතට ඇති කොට තිබෙන බලපෑම විශාලයි. ආර්ථික වශයෙන් පමණක් නොවෙයි, ගරු කථානායකතුමනි, මෙය සමාජයීය ප්‍රශ්නයක් බවට අද වර්ධනය වෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද අපේ රටේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය පාසලේ අධ්‍යාපනය මත පමණක් රඳා පවතින්නේ නැති බව අපි දන්නවා. දරුවෝ පළමුවැනි පන්තියට භාර දෙන කොටම, ඒ දරුවා පෞද්ගලික පන්තියටත් භාර දෙන්න දෙමව්පියන් පෙළඹෙනවා. හැබැයි, ඒ අධ්‍යාපන කටයුතු සඳහා මුදල් වෙන් කිරීමේ හැකියාවක් අද එම පවුල්වලට නැහැ. ඒ වාගේම, ඔවුන්ගේ අසනීප තත්ත්වයන්ට ප්‍රතිකාර ගැනීමට පුළුවන් තත්ත්වයක් ඔවුන්ට නිර්මාණය වෙලා නැහැ. ඒ නිසා, මේ නියංකාරී තත්ත්වය එම පළාත්වල සමස්ත ජන ජීවිතය, ආර්ථික සහ සමාජයීය ජීවිතය මුළුමනින්ම බිඳ වට්ටලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, සමහර මාධ්‍ය ආයතනවල මේ තත්ත්වය යම් ප්‍රමාණයකට වාර්තා කරලා සමාජයේ පෙළඹීමක් හැදිලා තිබුණත් අවාසනාවකට, අපේ මාධ්‍ය අද වැඩිපුර පෙළඹිලා තිබෙන්නේ එදිනෙදා සටන් ජවනිකා ඉදිරිපත් කරන්නයි.

පසුගිය පුවත් පත් ගණනාවක් අපි හොයලා බැලුවොත් ගරු කථානායකතුමනි, ඒ පුවත් පත්වල ප්‍රධාන ශීර්ෂ පාඨය බවට පත් වෙලා තිබුණේ, රවි කරුණානායක අමාත්‍යවරයා ඇමති ධුරයේ ඉදියිද, නැද්ද, යයිද කියන කාරණයයි. මෑත කාලයේ පුවත් පත් විශාල ප්‍රමාණයක් අපි අවුස්සලා බැලුවොත්, ඒවායේ ප්‍රධානම ශීර්ෂ පාඨය බවට පත් වෙලා තිබෙන්නේ, විජයදාස රාජපක්ෂ අමාත්‍යවරයාට කවර ඉරණමක් අත් වෙයිද කියන කාරණයයි. මෙවැනි උඩ තලයේ සිද්ධ වෙන කුඩා, කුඩා දේශපාලන කැළඹිලි විසින් ඇත්ත සමාජ ජීවිතයේ ජනතාව මුහුණ දී තිබෙන ගැටලු යටපත් කරමින් තිබෙනවා. ඒ නිසාම තමයි ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුව තුළවත් මේ පිළිබඳ විධිමත් සංවාදයක් -සාකච්ඡාවක්- ආරම්භ කරන්නට මම උත්සාහ කළේ.

මොකද, අපටත් මහවැලියේ කුඹුරු තමයි තිබුණේ. අදත් මහවැලියේ කුඹුරුවලින් ලැබෙන වී ප්‍රමාණයෙන් තමයි අපේ ගෙදරටත් හාල් සපයා ගන්නේ. නමුත් දැන් කන්න තුනක් අපට වී නැහැ. මේක තමයි ඇත්තම කථාව. ගරු කථානායකතුමනි, මේ තත්ත්වය සමස්ත ජනතාවගේ ආර්ථික සහ සමාජ ජීවිතය කඩා වට්ටලා තිබෙනවා. ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා ගිහිල්ලා බැලුවොත් මීගලෑව පැත්තේ, එහෙම නැත්නම් ගල්ගමුවේ, නැත්නම් ගිරිබාවේ ගොවි ජනතාවගේ ජීවිත මුළුමනින්ම ව්‍යසනයට පත්වෙලා තිබෙන බව දකින්න පුළුවන්. ඒ නිසා රජයක් හැටියට මේ පිළිබඳව විධිමත් අවධානය යොමු කරලා වහාම එම ජනතාවගේ ආර්ථික ජීවිතයත්, සමාජ ජීවිතයත් සහ එම කලාපයේ ආර්ථික තත්ත්වයත් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය මතු වෙනකොටම පසුගිය මාර්තු මාසයේ ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා, මාස හතරක් -අප්‍රේල්, මැයි, ජූනි, ජූලි කියන මාස හතරේ- ගොවි පවුලකට රුපියල් 10,000 බැගින් ලබා දෙනවාය කියලා. ගරු කථානායකතුමනි, මම පළමුව කථා කරන්නේ කෘෂිකර්මාන්තයේ යෙදුණ අය ගැනයි; එහි අතුරු කණ්ඩායම් ගැන නොවෙයි. ගොවි පවුලකට රුපියල් 10,000 බැගින් ලබා දෙනවාය කිව්වා. ඒ අනුව ත්‍රිකුණාමලයේ කන්තලේ ප්‍රදේශයේ ගොවි පවුල් සඳහා රුපියල් 10,000 පළමු වාරික මුදල කියලා රුපියල් 8,650ක් දුන්නා. වෙන කොහේවත් දුන්නේ නැහැ. එයත් රුපියල් 10,000ක් කිව්වාට ගොවි පවුලක් අතට ලැබුණේ රුපියල් 8,650යි. මම දන්නේ නැහැ, ගරු කථානායකතුමනි, රක්ෂණයකට කියලා රුපියල් 1,350ක් කපාගෙන ඉතුරු ගණනයි දුන්නේ. ඒක මොන රක්ෂණයක්ද? විපතින් විනාශ වුණු ගොවි පවුලකට රජයේ භාණ්ඩාගාරයෙන් මුදල් ආධාරයක් දෙනවා නම්, ඒක රක්ෂණයකින් දීපු මුදලක්ද? රුපියල් 10,000ක් දෙනවාය කියලා එකහතාවට ඇවිල්ලා රක්ෂණයට රුපියල් 1,350ක් කපලා රුපියල් 8,650ක් ගොවි පවුලක් වෙත ලබා දෙනු ලැබුවා. හැබැයි, ඒක ලබා දුන්නේත් අප්‍රේල් මාසයේ, ත්‍රිකුණාමලයේ සහ කන්තලේ ගොවි ජනතාවට විතරයි. ඊට පසුව මැයි මාසයේ හෝ, ජූනි මාසයේ හෝ ජූලි මාසයේ හෝ ඒ ගොවි ජනතාවට එම ආධාර මුදල ලැබුණේ නැහැ. එක වාරයයි ලැබුණේ. ඊට පසුව මෙම රුපියල් 10,000 මුදල පසු ගිය ජූලි මාසය වෙනුවෙන් -අගෝස්තු මාසයේ 09වැනි දින- ගොවි පවුල් 65,000ක් සඳහා රුපියල් 10,000 මුදල ලබා දී තිබුණා. ඒකත් අර රුපියල් 1,350 කපාගෙනයි දී තිබෙන්නේ. රුපියල් 10,000 බැගින් මාස හතරකට දෙනවා කියලායි කිව්වේ. මේක ජනාධිපතිතුමා පොළොන්නරුවේදී කිව්වා; ත්‍රිකුණාමලයේදී කිව්වා. අවස්ථා ගණනාවකදී ජනාධිපතිවරයා ප්‍රකාශ කළා, ගොවි පවුලකට රුපියල් 10,000 බැගින් මාස හතරක් ලබා දෙන බව.

[ගරු අනුර දිසානායක මහතා]

හැබැයි, අප්‍රේල් මාසයේ කන්තලේ සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ගොවීන්ට රුපියල් දහදාහ බැගින් ලබා දුන්නාට, අනික් අයට ජූලි සහ අගෝස්තු මාසවල එක් වාරිකයක් පමණක් ලබා දී තිබෙනවා. ඒ අනුව මසකට රුපියල් දහදාහ බැගින් ලබා දෙනවාය කියන වාරිකය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරු මේ ගරු සභාවේ ඉන්නවා. ඒ නිසා මම එතුමන්ලාගෙන් දැනගන්න කැමතියි, ජනාධිපතිතුමා එවැනි ප්‍රකාශයක් කරනකොට, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව ඊයේ කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා වුණා. එක වර රුපියල් දහදාහක් දෙනවාය කියපු එක ඇත්ත. Sir, it is a once and for all payment. එක වර රුපියල් දහදාහක් දෙන්න ඊයේ කැබිනට් මණ්ඩලයේදී පොරොන්දු වුණා. මාස හතරේ කථාව සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම අපැහැදිලි චිත්‍රයක් තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි, හරි. මම ඒ පිළිබඳව කියන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කැබිනට් මණ්ඩලයේදී මේ ගැන සාකච්ඡා වුණාම එකඟ වුණේ මාසයකට රුපියල් දහදාහ බැගින් ලබා දෙන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්වදේශ කටයුතු ඇමතිතුමාට මේ කාරණය ගැන පැහැදිලි කරන්න අවස්ථාවක් ඕනෑද?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
මම හිතන්නේ සභානායකතුමා කියපු කාරණය හරි. රුපියල් දහදාහක මුදලක් දෙන ගමන් තීන්දුව වෙනස් පැත්තකට ගමන් කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දෙවැනි තීරණය ගැන මම කියන්නම්.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ඒ තීන්දුව අනුව, වියළි ආහාර සලාක සහ අනික් දේවල් ලබා දෙමින් අනික් පැත්තට ඒ කටයුත්ත අපි ක්‍රියාත්මක කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාට මම දෙවැනි තීරණය කියන්නම්. ඊයේ කැබිනට් මණ්ඩලයේදී කරපු ප්‍රකාශය අපි දන්නේ නැහැ. මොකද, අපි කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් නොවෙයි නේ. හැබැයි, අපි දැන ගන්නේ ජනාධිපතිවරයා විසින් ගොවි ජනතාව අමතා කරන ලද ප්‍රකාශයෙන්. ඒ ප්‍රකාශය මා ළඟ තිබෙනවා. එතුමා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, "රුපියල් දහදාහ බැගින් ඉදිරි මාස හතරක කාලය තුළ ලබා දෙනවා"ය කියලා. එතුමා මාස හතර හැදුවේ යල කන්නයේ අස්වැන්න ලැබේවි කියන බලාපොරොත්තුවෙනුයි. ඒ මාස හතර තමයි, අප්‍රේල්, මැයි, ජූනි, ජූලි කියන මාස හතර. ජූලි මාසයේ අග වන කොට යල කන්නයේ අස්වැන්න ලැබෙනවා. නමුත් මේ වතාවේ යල කන්නයේ වගා වුණේත් නැහැ. ඒක තමයි ඊළඟ ප්‍රශ්නය. නමුත් එතුමා ඉතා පැහැදිලිව එදා කිව්වා, "මාස හතරක් එක දිගට මේ රුපියල් දහදාහ ලබා දෙනවා"ය කියා. නමුත් ඒ රුපියල් දහදාහ ලබා දුන්නේ නැහැ. ඔබතුමන්ලා එක් වාරිකයක් ලබා දෙනවාය කියලා කිව්වාට එක් වාරිකයෙනුත් රුපියල් දහදාහක් ලැබුණේ නැහැ. එක වාරිකයෙනුත් ලැබුණේ රුපියල් 8,650යි. ඒ වාරිකයෙනුත් රුපියල් 1,350ක් කපා ගත්තා.

ගරු කථානායකතුමනි, සමහර පළාත්වල කන්න තුනම වගා කරලා නැහැ. සමහර පළාත්වල කන්න දෙකක් හෝ එක් කන්නයක් වගා නොකරන ලද විශාල ප්‍රදේශයක් තිබෙනවා. ඔවුන්ගේ මුළු ජීවන පැවැත්මම රැඳී තිබෙන්නේ කෘෂි කර්මාන්තය තුළින් තමන්ට ලැබෙන ආදායම මතයි. කන්න තුනක් එම ආදායම අහිමි වී තිබෙනවා නම්, ඔවුන්ට වෙනත් ජීවන මාර්ග නැත්නම්, ඔවුන්ට ජීවත් වීමේ වෙනත් ක්‍රමවේදයක් නැත්නම් ඔවුන්ට ජීවත් වීම සඳහා ආධාර මුදලක් අපි ලබා දීම යුක්ති සහගතයි. ඒ නිසා මෙම ගොවි පවුල් සඳහා ලබා දෙන මේ ආධාරය අනිවාර්යයෙන්ම ලබා දෙන්න කටයුතු කරන්න කියලා මා යෝජනා කරනවා. මොකද, ජනාධිපතිවරයා එකඟතාවකට ආවා. ගොවි ජනතාවගේ විශාල නොසන්සුන්තාවක් මතු වී තිබුණා. ඒ ගොවි ජනතාවගේ නොසන්සුන්තාව, ඒ එකඟතාව හේතු කොටගෙන නතර වුණා. ඊයේ කැබිනට් මණ්ඩලයේදී කථා කළේ ගොවි ජනතාවට මාසයකට රුපියල් දහදාහක් ලබා දෙන්නයි කියා කිව්වාම එය සාධාරණ නැහැ, ගරු කථානායකතුමනි.

ඊළඟට, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා මතු කළ ප්‍රශ්නය ගැන බලමු. ගරු කථානායකතුමනි, මේ රුපියල් 10,000 කථාව ආවේ ගොවි පවුල් ඒකක සඳහායි. නමුත් මේ නියඟයෙන් විපතට පත් වෙලා තිබෙන්නේ එම පළාත්වල කෘෂි කර්මාන්තයේ යෙදෙන පවුල් ඒකක විතරක් නොවෙයි. ඒ පළාත්වල අනෙකුත් සියලු පවුල් ඒකකත් යම් විපත්තිදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එම නිසා ගොවි ජනතාවට විශේෂ ආධාර වැඩ පිළිවෙළක් හදන අතර පොදු ජනතාව ඉලක්ක කර ගත්ත ආධාර වැඩ පිළිවෙළක අවශ්‍යතාවත් තිබෙනවා. අන්න ඒ අවශ්‍යතාව තමයි දැන් ප්‍රාදේශීය ලේකම් මට්ටමින් -දැන් රාජ්‍ය පරිපාලන ඇමතිතුමා කියපු දේ- ක්‍රියාත්මක වෙන්නේ, සති දෙකකට රුපියල් 2,500ක බඩු මල්ලක් ලබා දීම මඟින්. ඒක නේද? සති දෙකකට රුපියල් 2,500ක බඩු මල්ලක් ලබාදීම.

ගරු කථානායකතුමනි, මා ළඟ තිබෙනවා මේ බඩු මල්ලට අයත් ද්‍රව්‍ය ලැයිස්තුව. පිටි කිලෝ 8.25යි. ඒ කියන්නේ පිටි කිලෝ 8කුත් තව ග්‍රෑම් 250ක්. සීනි කිලෝග්‍රෑම් 2යි, කව්පි කිලෝග්‍රෑම් 1යි, පරිප්පු කිලෝග්‍රෑම් 1යි, තේ කුඩු ග්‍රෑම් 200යි, ලුණු කැට කිලෝග්‍රෑම් 1යි, මිරිස් කුඩු ග්‍රෑම් 250යි, කහ කුඩු ග්‍රෑම් 100යි, ගම්මිරිස් කුඩු ග්‍රෑම් 100යි, තුනපහ කුඩු ග්‍රෑම් 100යි, සෝයාමීට් ග්‍රෑම් 250යි, ටින් මාළු 2යි, පැනඩෝල් 2යි. මේ බඩුවල වටිනාකම රුපියල් 2,502යි. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ඇමතිතුමනි, හරි නේද? ඔබතුමා එවපු චක්‍රලේඛනයේ මේවා නේද තිබෙන්නේ? [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඒ කියන්නේ සති දෙකෙන් දෙකට පිටි කිලෝ 8යි, ග්‍රෑම් 250යි. මා කලින් කිව්වා වාගේ සීනි කිලෝග්‍රෑම් 2යි, කව්පි කිලෝග්‍රෑම් 1යි, පරිප්පු කිලෝග්‍රෑම් 1යි, තේ කුඩු ග්‍රෑම් 200යි, ලුණු කැට කිලෝග්‍රෑම් 1යි,

මිරිස් කුඩු ග්‍රෑම් 250යි, කහ කුඩු 100යි, ගම්මිරිස් කුඩු ග්‍රෑම් 100යි, තුනපහ කුඩු ග්‍රෑම් 100යි, සෝයාමීට් ග්‍රෑම් 250යි, ටින් මාළු 2යි, පැනඩෝල් 2යි. -රුපියල් 1.50ක් දාලා තිබෙනවා ඒකට- එතකොට මේ බඩුවල එකතුව රුපියල් 2,502යි. රුපියල් 2,502ක ආහාර මල්ලක් ලබා දෙන්න තමයි ඔබතුමන්ලා දැන් මේ චක්‍රලේඛය යවා තිබෙන්නේ. හැබැයි මේ රුපියල් 2,502 ආහාර මල්ල ලබා ගැනීමට ඒ අය අවම වශයෙන් දින පහක වරු පහක් පොදු කාර්යයක යෙදෙන්න ඕනෑ. එක්කෝ පාර හදන්න ඕනෑ, එක්කෝ කනත්ත ශුද්ධ කර ගන්න ඕනෑ. එක්කෝ ඇළ වේලි බැඳ ගන්න ඕනෑ. ඉස්සරත් ඒ ක්‍රමය තිබුණා. ඉස්සරත් ආධාරයක් දෙනවා නම් පොදු වැඩ කරවා ගත්තා. නමුත් දැන් කියන්නේ දින පහක වරු පහක් වැඩ කළ යුතු බවයි. මේ සහන මල්ල ලැබෙන්නේ වරු පහක් වැඩ කළොත්. වරු පහක් කියන්නේ මොකක්ද? ආසන්න වශයෙන් සාමාන්‍ය කුලී කම්කරුවෙකුට දැන් දවසකට රුපියල් 2,000ක් ගෙවනවා. උදේ වරුවට ගණන වැඩියි. එතකොට වරුවක් කියන්නේ රුපියල් 1,000ක්. ඒ අනුව වරු පහක් කියන්නේ රුපියල් 5,000ක්. උදේ සහ දවල් කෑම දීලා තමයි ගම්වල කුලී කම්කරුවෙකුගෙන් වැඩ ගන්නේ. දැන් තමුන්නාන්සේලා වරු පහක් වැඩ ගන්නවා. ඒ වරුවකට රුපියල් 1,000 ගණනේ බැලුවත් වරු පහට රුපියල් 5,000ක් එන්න ඕනෑ. නමුත් තමුන්නාන්සේලා දෙන්නේ රුපියල් 2,500ක බඩු මල්ලක්. එතකොට ඒක සාධාරණද? මම මේ කියන්නේ ඒ අයගෙන් ගන්න වැඩ ප්‍රමාණය මීට වඩා අඩු කරන්න කියන එක නොවෙයි.

ඔබතුමන්ලා විශ්වාස කරනවාද, ගොවි පවුලකට මේකෙන් ජීවත් වන්න පුළුවන් කියලා? ගරු කථානායකතුමනි, ගොවි පවුලක් කිව්වාට දැන් ඒ ගෙවල්වලත් වී නැහැ. ඔවුන් හාල් ගන්නේත් කඩෙන්. දැන් හාල් කිලෝ එකක් රුපියල් 110ක්, රුපියල් 100ක් වාගේ වෙනවා. දැන් ඔබතුමන්ලා මේ කියන්නේ පාන් පිටි කන්න කියලා. ගරු කථානායකතුමනි, අනුරාධපුරයේ, පොළොන්නරුවේ මිනිසුන්ට තුන් වේලටම පාන් පිටි කන පුරුද්දක් නැහැ. ඒ ගොල්ලන් තුන් වේල බත් කන මිනිස්සු. ඒකයි මා මේ ඇත්ත කථාව කියන්නේ.

මට තේරෙන්නේ නැහැ, මේක කරන්න ප්‍රීමා සමාගමෙන් මොකක් හරි කොන්ත්‍රාත් එකක් හම්බ වෙලාද කියලා. මට මේ සම්බන්ධයෙන් ඒ තරම් සැකයක් හිතෙනවා. මොකද, හැම ගෙදරකටම පිටි කිලෝ 8යි, ග්‍රෑම් 250කුයි ගන්න කිව්වාම ඒක ප්‍රීමා සමාගමට හොඳ business එකක් නේ. මේක අස්සේ ප්‍රීමා මුදලාලිගේ මොකක් හරි joint එකක් තිබෙනවාද කියලා බලන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, පිටි කිලෝග්‍රෑම් 8ක් දුන්නාම, ඒ මිනිස්සු දිනපතා පිටි කන්නද? මේ ලැයිස්තුවේ කහ ග්‍රෑම් 100යි, ගම්මිරිස් ග්‍රෑම් 100යි කියලාත් තිබෙනවා. තමුන්නාන්සේලා මේ බලු කපුටු දානයක් දෙනවාද? අපි තමුන්නාන්සේලාගෙන් අහන්නේ ඒකයි. මේ දේවල් දෙන්නේ මිනිසුන්ට නේ. [බාධා කිරීමක්] දැන් පොල් ගස් කඩා වැටිලා. පිටි දෙනවා, පොල් නැතිව රොටි කන්න කියලා. තමුන්නාන්සේලාට පොල් ගෙඩියක්වත් දෙන්න බැහැ නේ. මම කියන්නේ මේකයි. මේ මිනිසුන්ට වෙන ආදායම් මාර්ග නැහැ. තමුන්නාන්සේලා මේ අයගෙන් වරුවක වැඩ ගන්න. හැබැයි, සාධාරණව ජීවත් වන්න පුළුවන් ප්‍රමාණයට යමක් ඒ අයට දෙන්න.

හැරිසන් ඇමතිතුමනි, මිහින්තලයේ ගොවි ජනතාවගේ තත්ත්වය මොකක්ද කියලා ඔබතුමා දන්නවා. මිහින්තලයේ ගොවි ජනතාවගේ තත්ත්වය මොකක්ද? ඒ මිනිසුන්ගේ එකම ජීවනෝපාය මාර්ගය ගොවිතැන් කිරීම විතරයි. ඒ ගොල්ලන්ගේ නිවසට තිබුණු එකම ආදායම ඒක. මේ වනකොට ඒ ජනතාවට කන්න තුනකට වඩා වැඩි ප්‍රමාණයක් නැති වෙලා තිබෙනවා. ඔවුන් හැම තැනටම ණය තුරුස් වෙලා. ඔවුන් මේ වනකොට රත්තරන් බඩු ටික උකස් තියලා; ඉඩම උකස් තියලා; බයිසිකලය උකස් තියලා; වතුර මෝටරය උකස් තියලා; නගුල උකස් තියලා. දැන් ඔවුන්ගේ මුළු ආර්ථිකයම කඩා වැටිලා. දැන් ඔවුන්ගේ ගෙවල්වලට බැංකුවලින් ලියුම් එනවා, රත්තරන් බඩු ටික සින්න වෙන්න යන්නේ ඉක්මනින් බේරා ගන්න කියලා. ඒ වෙනුවට ආණ්ඩුවෙන් පිටි කිලෝ 8ක් දෙනවා! බැංකුවලින් ලියුම් එනවා, ඉක්මනට වතුර පොම්පය අරගෙන යන්න, නැත්නම් ඒක සින්න වනවා කියලා. ආණ්ඩුවෙන් ඒකට දෙනවා, පිටි කිලෝ 8ක්! මේක සමාජ ඛේදවාචකයක්. ඒ නිසා තමුන්නාන්සේලාට මම කියන්නේ මේ ජනතාවගේ ජීවිතවලට ඇතුළු වෙලා මෙම ඛේදවාචකය මනින්න කියලායි. තමුන්නාන්සේලා මෙම ඛේදවාචකයට උත්තර හොයන්න. අඩුම තරමින් අනුරාධපුරයෙන්, පොළොන්නරුවෙන්, අම්පාරෙන්, මොණරාගලින් ආපු මන්ත්‍රීවරු ටික කැඳවන්න. ඔවුන් කැඳවා මේ මිනිස්සු වෙනුවෙන් සාධාරණ විසඳුමක් හොයන්න.

ගරු කථානායකතුමනි, මේ රුපියල් 2500 භාණ්ඩ ලැයිස්තුවේ ගණන් හැදුවාම අන්තිමට රුපියලක අඩුවක් තිබෙනවා. රුපියල් 2,499ට තමයි මේ ලැයිස්තුව හැදිලා තිබෙන්නේ. ඊට පස්සේ මේ ලැයිස්තුවේ යටින්ම දමනවා, පැනඩෝල් පෙති දෙකකුත් දෙනවා කියලා. එතකොට රුපියල් 2,502ක් වෙනවා. ගරු කථානායකතුමනි, මේ පැනඩෝල් පෙති දෙක දෙන්නේ මොකක් වෙනුවෙන්ද? භාණ්ඩ ලැයිස්තුවේ ඔක්කොම එකතු වුණාම අවසන් ගණන හැටියට ආවේ රුපියල් 2,499යි. ඊට පස්සේ පැනඩෝල් පෙති දෙක් දැම්මා. එතකොට දැන් ශත 50ක් වැඩිත් වෙලා! මම කියන්නේ එක කාරණයයි. ඔබතුමන්ලා මේ ජනතාවගේ ජීවන තත්ත්වය පිළිබඳව අවබෝධයකට ඇවිල්ලා ඒ ගොල්ලන්ගේ ජීවිතය නඟා සිටුවන්න වැඩ පිළිවෙළක් හදන්න. ඒ, පළමු කරුණ. මේ කාරණය සරල නැහැ, ගරු කථානායකතුමනි.

නියඟය නිසා හානි වූ ගොවි පවුල්වල සංඛ්‍යා මේ ආණ්ඩුවේ වාර්තාවම අරගෙන මම දැන් කියන්නම්. අම්පාරේ පවුල් 19,321යි; අනුරාධපුරයේ 109,442යි; බදුල්ලේ 10,549යි; මඩකළපුවේ 25,083යි; ගාල්ලේ 37යි; ගම්පහ 9,537යි; හම්බන්තොට 22,790යි; යාපනයේ 18,569යි; කළුතර 135යි; මහනුවර 4,409යි; කෑගල්ල 9,619යි; කිලිනොච්චියේ 8,441යි; කුරුණෑගල 101,447යි; මන්නාරමේ 8,505යි; මාතලේ 7,084යි; මාතර 393යි; මොනරාගල 48,957යි; මුලතිව් 17,081යි; නුවරඑළියේ 83යි; පොළොන්නරුවේ 19,177යි; පුත්තලමේ 16,877යි; රත්නපුරයේ 3,073යි; ත්‍රිකුණාමලයේ 20,378යි; වවුනියාවේ 15,188යි. මුළු එකතුව 496,272යි. ගොවි පවුල් 496,272ක් කියන්නේ, ආසන්න වශයෙන් ගත්තොත් ලක්ෂ 20ක - මිලියන දෙකක- ජනතාවක්. ගරු කථානායකතුමනි, මේ ලේඛනයේ සඳහන් වන්නේ ගොවි පවුල් ගැන විතරයි. හැබැයි, ඒ පළාත්වල ඉන්න ඔක්කොම ගොවිතැන් කරන අය නොවෙයි. මේ ගැන මම කලිනුත් කිව්වා. මේ පළාත්වල මේසන් බාස්ලා ඉන්නවා; වඩු බාස්ලා ඉන්නවා; කුලී වැඩ කරන අය ඉන්නවා; අත් වැඩ දෙන අය ඉන්නවා; hardware store එකක වැඩ කරන අය ඉන්නවා; රෙදි කඩයක වැඩ කරන අය ඉන්නවා. මෙහෙම තමයි ගමක් සකස් වෙලා තිබෙන්නේ. ඒ අයගේ පවුල් ඒකකත් ගත්තොත් මීටත් වඩා මේ ගණන විශාලයි. එම නිසා මේ නියඟයෙන් ඇතිවී තිබෙන බලපෑමට සාපේක්ෂව ආණ්ඩුවක් ලෙස තමුන්නාන්සේලා ඒ පිළිබඳව දක්වා තිබෙන අවධානය හෝ මැදිහත්වීම ප්‍රමාණවත් නැහැ. ඒ නිසා, සති දෙකකට දෙන මේ රුපියල් 2,499ක සහ පැනඩෝල් පෙති දෙකේ බඩු මල්ල නම් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළට ගන්න කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. අද අපි අනුරාධපුර නගරයේ හැම කඩයකටම ගිහින් ඇහුවොත් ඒ අය කියන්නේ මොකක්ද? ඒ අයගේ ව්‍යාපාර කඩා වැටිලා කියන

[ගරු අනුර දිසානායක මහතා]

එකයි. හැබැයි, ඒ අයගේ ව්‍යාපාර කඩා වැටුණාය කියා ඒ කඩේ වැඩ කළ සේවකයෝ අයින් කරන්න බැහැ; ඒ අය අඩු කරන්න බැහැ. ඒ හෝටලේ වැඩ කළ සේවකයෝ අඩු කරන්න බැහැ. ඒ අයගේ පඩි ගෙවාගෙන ව්‍යාපාරය ගෙන යන්නත් ඕනෑ. හැබැයි, ඒ ව්‍යාපාර - business එක - ජනවාරි මාසයේ තිබුණාට වඩා සියයට 75න් මේ වෙන කොට කඩා වැටිලා තිබෙන්නේ. අනුරාධපුර නගරයේ මේ සිංහල අලුත් අවුරුද්ද තමයි ඉතිහාසයේ අඩුවෙන්ම business තිබුණු අවුරුද්ද වුණේ. මේක හරි ඛේදවාචකයක්. ඒ නිසා ඒ ව්‍යාපාරිකයන්ගේ ප්‍රශ්නයට තමුන්නාන්සේලා හොයන විසඳුම මොකක්ද? ඔවුන්ගේ ව්‍යාපාර වෙනුවෙන් බැංකුවලින් ණය අරගෙන තිබෙනවා. අඩුම තරමින් ඒ ණයවල පොලියට යම් සහනයක් ලබාදෙනවාද? ඒ අයගේ සේවකයන්ට යම් ප්‍රමාණයකට දායකත්වයක් ආණ්ඩුවෙන් ලබාදෙන්න පුළුවන්ද? මේවා කරන්න පුළුවන් යෝජනා. ඒ ව්‍යාපාරිකයන් මුහුණ දී තිබෙන ගැටලුව පිළිබඳවත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරලා, විසඳුමක් සොයාගන්න ඕනෑකම තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය තමයි සෞඛ්‍ය පද්ධතියේ බිඳ වැටීම. අපි කවුරුත් දන්නවා, අද අපේ රටේ සෞඛ්‍ය සේවයේ තත්ත්වය ගැන. ආණ්ඩුවේ ඉස්පිරිතාලය තිබුණාට, දොස්තර මහත්මයා ඉස්පිරිතාලේ හිටියාට, අනෙක් ඔක්කෝම ගන්න වෙලා තිබෙන්නේ එළියෙන්; බෙහෙත් ගන්න වෙන්නේ එළියෙන්. අපි ඉස්පිරිතාලෙට ගියාම දොස්තර මහත්මයා දැන් තුණ්ඩු දෙකක් දෙනවා. ඉස්පිරිතාලෙන් බෙහෙත් ගන්න කියලා එක තුණ්ඩුවක් දෙනවා. එළියෙන් බෙහෙත් ගන්න කියලා දෙවන තුණ්ඩුව දෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොන ඉස්පිරිතාලෙද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොණරාගල.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එහෙම නම් මම වහාම අධ්‍යක්ෂවරයාට විරුද්ධව ක්‍රියා කරනවා. ඉස්පිරිතාලවල කිසිම විධියකින් එහෙම කරන්න බැහැ. එහෙම නම් මම අදම මොණරාගල රෝහලේ අධ්‍යක්ෂවරයාගෙන් නිදහසට කරුණු ඉල්ලනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
තංගල්ලේ ඉස්පිරිතාලයේත් එහෙමයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, තංගල්ලේත් එහෙමයි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
හම්බන්තොට දිස්ත්‍රික්කයේම එහෙමයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
බොරු කියන්න එපා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම බොරු කියන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එක්කෝ ඔබතුමා බොරු කියන්න ඕනෑ. නැත්නම් ඒ අධ්‍යක්ෂවරයා බොරු කියන්න ඕනෑ. දෙන්නාගෙන් එක් කෙනෙක් බොරු කියන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා, පොඞ්ඩක් ඉන්න. වාඩි වෙන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
බොරු කියන්නේ කවුද කියලා මම හොයලා බලන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ගැන සොයා බලන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා, දැන් හරිද? ඔබතුමා වාඩි වෙන්න. මම කියන්නම්. [බාධා කිරීමක්] මම කියන දේ හරියට කියන්නම්. ඔබතුමා වාඩි වෙන්න.

ගරු කථානායකතුමනි, රජිත සේනාරත්න සෞඛ්‍ය අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී කියනවා, ඕනෑම රෝහලකට බෙහෙත් ගන්න ගියාම සියලු බෙහෙත් ලබා දීම සහ සියලු පරීක්ෂණ කටයුතු රෝහල්වලින් කෙරෙනවා කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාද හරි, මමද හරි කියලා ජනතාව තේරුම් ගනීවි. ගරු කථානායකතුමනි, සෑම ඉස්පිරිතාලයක් ඉදිරියේම pharmacies වැහි වැහැලා. හැම ඉස්පිරිතාලයක් ඉස්සරහම පරීක්ෂණ ආයතන වැහි වැහැලා. ඉස්පිරිතාලේ බෙහෙත් තිබෙනවා නම්, ඉස්පිරිතාලේ ඉස්සරහ pharmacies පිරෙන්නේ නැහැ. ඉස්පිරිතාලෙන් පරීක්ෂණ කෙරෙනවා නම්, ඉස්පිරිතාලේ ඉස්සරහ පරීක්ෂණ ආයතන ගොඩ ගැහෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඉස්සර ඉස්පිරිතාලයක් ඉස්සරහ තිබුණේ මිනී පෙට්ටි සාප්පුවක් විතරයි. මොකද, ඉස්පිරිතාලෙන් මිනී පෙට්ටිය දුන්නේ නැති නිසා. ගරු කථානායකතුමනි, අද හැම ඉස්පිරිතාලයක් ඉස්සරහම pharmacies තිබෙනවා. ඔබතුමා ගමේ ඉස්පිරිතාලෙට ගිහිල්ලා බලන්න. ගරු කථානායකතුමනි, මෙතුමා මේ මොනවාද කියන්නේ? මෙහෙමද, සෞඛ්‍ය ප්‍රතිපත්ති හදන්නේ? ඕක තමයි හදන සෞඛ්‍ය ප්‍රතිපත්තිය. [බාධා කිරීම්] මේක ඔළුවේ තියාගෙන තමයි සෞඛ්‍ය ප්‍රතිපත්ති හදන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. ගරු ඇමතිතුමා මේ ගැන සොයා බලා පියවර ගන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, රටේ සෞඛ්‍ය සේවය හොඳයි නම් රටේ සෞඛ්‍ය ඇමති බෙහෙත් ගන්න සිංගප්පූරුවට යනවාද? රටේ සෞඛ්‍ය සේවය පිළිබඳව විශ්වාසයක් තිබෙනවා නම්, ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 100ක් අරගෙන සෞඛ්‍ය ඇමතිවරයා බෙහෙත් ගන්න සිංගප්පූරුවට යනවාද? [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, රටේ සෞඛ්‍ය සේවය විශ්වාස නම් සෞඛ්‍ය ඇමති ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 100ක් අරගෙන බෙහෙත් ගන්න සිංගප්පූරුවට යනවාද? [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම නම් මෙතුමා ජාතික රෝහලෙන් operation එක කර ගන්න එපායැ. ජාතික රෝහලෙන් බෙහෙත් ටික අර ගන්න එපායැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේ බොරු කියන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොරු? [බාධා කිරීම්] ජාතික රෝහලෙන් බෙහෙත් ටික ගන්න එපායැ. ජාතික රෝහලෙන් operation එක කර ගන්න එපායැ. [බාධා කිරීම්] මොකටද, ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 100ක් අරගෙන සෞඛ්‍ය ඇමති සිංගප්පූරුවේ මවුන්ට් එලිසබත් රෝහලට ගියේ? [බාධා කිරීම්] ජාතික රෝහලෙන් operation එක කර ගන්න තිබුණා නේ. ඇයි, සිංගප්පූරුවේ මවුන්ට් එලිසබත් රෝහලට ගියේ? [බාධා කිරීම්] ඇයි, ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 100ක් ගත්තේ? [බාධා කිරීම්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ ගියේ ආරක්ෂාවට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලයත් අවසානයි. So, get back to your speech.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා පැන්නා නේ. එතුමාට කථාව නතර කරන්න කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි 6ක් තිබෙනවා. ඔබතුමා කථාව කරගෙන යන්න. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා කථා කරන එක නතර කරවන්න. - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා,- [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම නිශ්චිත ප්‍රශ්නයක් ගැන කියන්නේ. - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න. ගරු ඇමතිතුමා, ඒ ගැන පරීක්ෂා කරලා බලන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉවරද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉවරද? [බාධා කිරීම්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වරද? වාඩි වෙන්න. දැන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉවරද? ගරු කථානායකතුමනි, එතුමා ජනාධිපති අරමුදලින් ලක්ෂ 100ක් අරගෙන. ලජ්ජා වෙන්න ඕනෑ. ලජ්ජා වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, දුප්පත් මිනිහෙකුට හදවත operation කර ගන්න ජනාධිපති අරමුදලින් ලක්ෂ 1½ක් ගන්න දොස්තරගේ සහතිකය ඕනෑ; ග්‍රාම නිලධාරිගේ සහතිකය ඕනෑ; ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ඕනෑ. මෙතුමාට ලක්ෂ 100ක්. මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථාව කරගෙන යන්න. ඔබතුමාට තව විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි අහන්නේ, මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලායි. මොකක්ද, මේ කියන්න එන්නේ? [බාධා කිරීම්] මම ඔබතුමා ගැන කථා කරන්නේ නැහැ. [බාධා කිරීම්] ඔබතුමාගේ විස්තරේ මම කියන්නම්. මේ, ඔබතුමා කවුද? [බාධා කිරීම්] ඔබතුමා මොකක්ද මේ කියන්නේ? කවුද මේ? මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! සභාවේ කටයුතුවලට යමු. [බාධා කිරීම්] කරුණාකර වාඩි වෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා මොකක්ද මේ කියන්නේ? දැන් මෙතුමා ඇහුවේ- [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මෙතුමා වාඩි වෙන්නේ නැහැ නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථාව කරන්න. තව විනාඩි හතරයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ කථාව. වාඩි කර වන්න ඕනෑ, එතුමාව.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඔබතුමා වාඩි කර වන්න ඕනෑ එතුමාව. නැත්නම් ජනාධිපතිට කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමාව වාඩි කර වන්න. [බාධා කිරීම්] ඇමතිතුමනි, ඔබතුමා වාඩි වෙන්න. එතකොට මම කියන්නම්. හැබැයි, හොරකම් කරපුවා නොවෙයි; ජනාධිපති අරමුදලේ සල්ලි ගැන නොවෙයි. [බාධා කිරීම්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, එතුමාව වාඩි කරවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කරන්නම්, මගේ job එක.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෝදර ධීවර වරාය බදු දුන්නේ- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, වාඩි වෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෝදර ධීවර වරාය මාස 300කට බදු දුන්නේ 1,25,000කට. රජයේ තක්සේරුව ලක්ෂ 17යි. ඒ ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණය තිබුණා. මෙතුමා කොමිසමට දෙපාරක් ගියා. මෙතුමාට නඩු දමයි කියා ජනාධිපති මූණ ගැහිලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ව මාරු කෙරෙව්වා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] දැන් එනවා, අපට කථා කරන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, සභාවේ වැඩ කටයුතු කර ගෙන යමු.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා අපට කියන්න එනවා;

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මෙතුමා කවුද? අපි දන්නේ නැද්ද, මෙතුමා ගැන. ආයුර්වේද ඖෂධ සංස්ථාවට මස්සිනා දා ගත්තා. පත්වීම් දෙන්නේ නෝනා. නෝනා පත්වීම් දෙන්නේ මොනවාගෙන්ද? නෝනා ලියුම යවනවා පත්වීම් දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි විෂයට යමු. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආයතනයේ පත්වීම් නැහැ. අපට කථා කරන්න එන්නේ, මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ? ඒවාට එන්න එපා. කවුද මේ? මෙතුමා කවුද? ඒ ගැන පරීක්ෂණ කරන්න. [බාධා කිරීම්] ජනාධිපති අරමුදලින් ලක්ෂ 100ක් අරගෙන. [බාධා කිරීම්] මගෙන් අහගන්න එපා. [බාධා කිරීම්] ලජ්ජා වෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු කථානායකතුමනි, ආණ්ඩුවත් එක්ක business කරලා මන්ත්‍රීකම නැති වෙලා තිබුණා. ලංකාවේ නඩු තීන්දුවක් අනුව මන්ත්‍රීකම නැති වෙච්ච එකම මනුස්සයායි අපට මේ හොරකම් ගැන කියන්න එන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපි වැඩ කටයුතුවලට යමු. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නඩු තීන්දුවෙන් මන්ත්‍රීකමත් නැතුව ගියා. රනිල් වික්‍රමසිංහ මහත්තයාට දණ ගහලා වඳින්න ඕනෑ. මොකද, මන්ත්‍රීකම නැති වුණාට පස්සේ ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීකම දුන්නා. ඔන්න කට්ටිය. අපිත් එක්ක එන්න එපා ඒවා ගැන කථා කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි තුනයි තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමාව වාඩි කරවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා වාඩි වුණා. ඔබතුමා කථාව කරගෙන යන්න. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට කාලය ඕනෑ. එතුමා නේ බාධා කළේ. ගරු කථානායකතුමනි, මම කියන්නේ සෞඛ්‍ය සේවයේ බිඳ වැටීමක් තිබෙනවා කියලායි. ගමේ මිනිහෙකුට හදවත් රෝගයක් ඇති වුණොත්, දැනට පවතින නියඟය නිසා ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වය මත ඔහුට operation එකක් කර ගන්න සල්ලි නැහැ. ගරු කථානායකතුමනි, ජනාධිපති අරමුදලෙන් ඔහුට ආධාරයක් වශයෙන් රුපියල් 175,000යි දෙන්නේ. ඒක ලබා ගන්නත් ඔහුට ආදායම් මාර්ග නැති බවට ග්‍රාම නිලධාරිගේ සහතිකයක් තිබෙන්න ඕනෑ. එම සහතිකය සත්‍ය බවට ප්‍රාදේශීය ලේකම් සහතික කරන්න ඕනෑ. මෙම පුද්ගලයාට operation එකක් කළ යුතු බවට වෛද්‍යවරයාගේ වාර්තාවක් තිබෙන්න ඕනෑ. හැබැයි, රටේ සෞඛ්‍ය ඇමැතිට ජනාධිපති අරමුදලෙන් ලක්ෂ 100ක් දෙනවා, බෙහෙත් ගන්න. [බාධා කිරීම්] ඒ සෞඛ්‍ය ඇමැති මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා මම අහනවා. [බාධා කිරීම්] මම අහන්නේ ඒකයි. මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ සෞඛ්‍ය ඇමැති. [බාධා කිරීම්] මම අහන්නේ ඒක. ගරු කථානායකතුමනි, එතුමාට ලක්ෂ සියයක්. එම නිසා මේ සෞඛ්‍ය සේවයේ ඇතිවී තිබෙන බිඳ වැටීම- [බාධා කිරීම්] පිළිබඳව සැලකිල්ලට ලක් කොට, එම ජනතාවට විශේෂ ආධාර මුදලක් ලබා දෙන්න ඕනෑකම තිබෙනවා. විශේෂයෙන්ම මේ පළාත වකුගඩු රෝගය පැතිරිලා තිබෙන පළාතක්. විජයදාස රාජපක්ෂ හිටපු අමාත්‍යතුමාත් වකුගඩු රෝගය ගැන ගොඩක් දේවල් කියලා තිබෙනවා, මම දැක්කා. වකුගඩු රෝගය විශාල ලෙස පැතිරෙමින් යනවා. ඒ වගේම පිළිකා රෝගයත් පැතිරිලා තිබෙනවා. එම රෝගවලට දිනපතා බෙහෙත් ගන්න ඕනෑ. අද කෘෂි කර්මාන්තය මුළුමනින්ම බිඳ වැටිලායි තිබෙන්නේ. ඇමැතිවරයාට බෙහෙත් ගන්න ජනාධිපති අරමුදලෙන් ලක්ෂ සියයක් දුන්නා වාගේ එම ගොවි ජනතාවට බෙහෙත් ගන්න ලක්ෂ සියයක් දෙන්නේ නැහැ. එම නිසා තමුන්නාන්සේලා වකුගඩු රෝගයෙන් පෙළෙන ගොවි ජනතාව ගැන කල්පනා කරලා; වකුගඩු රෝගයට දිනපතා බෙහෙත් ගන්න සිදු වෙලා තිබෙන ගොවි ජනතාව මේ නියඟයත් එක්ක පත්වෙලා තිබෙන ආපදා තත්ත්වය ගැන කල්පනා කරලා ඒ අයට සෞඛ්‍ය සේවා දීමනාවක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම - [බාධා කිරීම්] මේ බලන්න,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් වේලාව අවසානයි. යෝජනාව ස්ථිර කරන්න. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා, කථාව අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, කථාව කරන්න බැරි වුණා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට එක පැත්තකට දොස් කියන්න බැහැ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා කෝප වුණාට, විරසක වුණාට මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. බලන්න කෝ ඉතින්. ගරු කථානායකතුමනි, අපේ ගෙදර ටොමියා ඇවිස්සෙන්නේ මෙහෙම මෙහෙම කරනකොට. [බාධා කිරීම්] නමුත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇවිස්සෙන්නේ මෙහෙම කරනකොට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් ඔබතුමා කථාව අවසන් කරන්න. යෝජනාව ස්ථිර කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

මම කිව්වේ එක දෙයයි. මේ පළාත්වල වකුගඩු රෝගය වැළඳුණු රෝගීන් සිටිනවා. ඒ අය දිනපතා බෙහෙත් ගන්න ඕනෑ. රුපියල් 2,500ක ආහාර මල්ලෙන් පමණක් ඒ අයට යැපීමට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියන එකයි මගේ තර්කය වුණේ. ඒක තමයි තර්කය වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා ඔබතුමන්ලා මේ ප්‍රදේශවල ජනතාවගේ ජන ජීවිතය ඉදිරියට ගෙනෙන කොට ඒ අයගේ සෞඛ්‍ය තත්ත්වය ගැනත් කල්පනා කරලා, ඒ අයගේ ලෙඩ රෝග ගැනත් කල්පනා කරලා විශේෂ දීමනාවක් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒකයි මගේ යෝජනාව. බොහොම ස්තුතියි, ගරු කථානාකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා.

[අ.භා. 2.23]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ සභාවේ ඉතා රසවත් විධියට කරුණු කාරණා ඉදිරිපත් වුණා. අපි මේ කථා කරන්නේ ඉතා වැදගත් මාතෘකාවක් ගැනයි කියා මං හිතනවා. ජනතා විමුක්ති පෙරමුණේ නායක ගරු අනුර දිසානායක මැතිතුමා කරුණු කිහිපයක් පිළිබඳව සඳහන් කළා. අපි පිළිගන්නවා, මේක මානුෂික ප්‍රශ්නයක් බව. ඒ ගැන තර්කයක් නැහැ. නියඟය පවතින තත්ත්වය තුළ- [බාධා කිරීමක්] ඔබතුමා අහක යන කුණු ගොඩක් අවුස්සා ගන්න හදනවා. [බාධා කිරීමක්] කුණු ගොඩක් කර ගන්න එපා.[බාධා කිරීමක්] ඔව්, ඒක තමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි.

ගරු කථානායකතුමනි, මම වාරිමාර්ග ඇමතිවරයා විධියට කටයුතු කර තිබෙනවා. මහවැලි කලාපය ගැන කථා කරද්දී, අද තඹුත්තේගම ප්‍රදේශයේ තිබෙන වතුර නාස්තිය ගැනත් කියන්න ඕනෑ. සියයට හතළිහක් ජලය අපතේ යවනවා. මට ඒක ඔප්පු කරන්න පුළුවන්. ගොවීනුත් සහ නිලධාරීනුත් මේ වරද කරනවා. ඒ ප්‍රදේශයේ ජලය ලබා ගන්න අඩි අටක් ගැඹුර අවශ්‍ය වන්නේ නැහැ. අඩි හතරක ගැඹුරින් මම ජලය ලබා ගෙන තිබෙනවා. ඒ නිසා මහා ජලාශ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී දේශපාලනඥයන්ට විතරක් දෝෂාරෝපණය කරලා වැඩක් නැහැ. නිලධාරින් සහ ගොවීනුත් වතුර විනාශ කරනවා. ඒ කියන්නේ, මහා ජලාශවල වතුර. කුඩා වැව්වල නොවෙයි. කුඩා වැව්වලත් සොරොව්ව ඇරලා වතුර ඇරියා. ඒකෙනුත් විපතක් වුණා.

දෙවැනි කාරණය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා ඒ ගොවි පවුල් ශක්තිමත් කළ යුතුයි කියලා. මම පිළිගන්නවා, අනුරාධපුරයේ විතරක් නොවෙයි, අපේ පළාත්වල වුණත් ගොවිතැන් කරන ප්‍රදේශවල මහා නියඟයක් ආවොත් ඒ ගෙවිතැන් කටයුතු සිදු වන්නේ නැහැ කියන එක. ගොවියාට අස්වැන්න ලැබිලා ආර්ථිකය දියුණු වුණොත් තමයි ඒ අනෙකුත් ව්‍යාපාරත් දියුණු වෙන්නේ. යන්ත්‍රෝපකරණ විකිණෙන්නේ; රෙදි ටික විකිණෙන්නේ ඔවුනගේ ආර්ථිකය දියුණු වුණොත් විතරයි. ඒ නිසා රජයක් විධියට ඒ අයට සහනාධාර ලබා දීම ගැන ඉදිරියේදී කැබිනට් මණ්ඩලය තුළ අපට සලකා බලන්න වෙනවා. එපමණක් නොවෙයි, මේ වෙලාවේ ඔවුන් කරන ණය ගැනීම් තාවකාලිකව නැවැත්විය යුතුයි. බැංකුවලින් ණය ගැනීම, mortgage කිරීම අපි තාවකාලිකව නතර කළ යුතුයි. මා ඇමතිවරයකු විධියට මේ ගැන රජයට පැහැදිලි කළා. ව්‍යාපාරික සමාගම්, finance සමාගම්, mortgage කරන අය, සමුපකාර බැංකුවලින් ණය දීම තාවකාලිකව නතර කළ යුතුයි කියලා. ඒවා වහාම නැවැත්විය යුතුයි කියන එක අපි ප්‍රතිපත්තියක් විධියට පිළිගෙන ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරන්න තීරණය කර තිබෙනවා.

ඊළඟට, නියඟය නිසා විපතට පත් වූ ගොවීන්ට සහන ලබා දීම සඳහාත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. තව මාස එකහමාරකින් මාස් කන්නයේ වැස්ස එනවා. ඒ වැස්ස එද්දී ඒ අයට තමන්ගේ ගොවිතැන් දියුණු කරන ගන්න පුළුවන්. අද ඒ අයගේ ආර්ථිකය බිඳ වැටිලා. අපි රක්ෂණ ක්‍රමයක් මඟින් සහන ලබා දීම විතරක් නොවෙයි, ඒ අයට අවශ්‍ය බීජ, ආම්පන්න ලබා දීලා නැවතත් ඒ ගොවි පවුල්වලට නැඟිටින්න අවශ්‍ය ශක්තිය ලබා දීලා තිබෙනවා. ඔවුන්ට මීට පෙර කිසි දිනක ලැබී නැති විධියේ සහන ලබා දෙන්න අපේ රජය කටයුතු කරලා තිබෙනවා. බදු බර තිබුණාට, පිට රටවලට ණය ගෙවන්න තිබුණාට එවැනි තත්ත්වයක් තුළත් අපි ඒ අවශ්‍ය පියවර ගන්නවාය කියන එක මා පැහැදිලිව කියනවා.

ඊළඟට, එම ගොවීන්ට බැංකු හරහා අඩු පොලියට ණය ලබා දීමේ සහන ක්‍රමයක් අපි යෝජනා කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා වගකීමක් ඇතිවයි එය කියන්නේ. අද රජය සමුපකාර බැංකු හරහා විශාල මුදලක් ස්වයං ව්‍යාපාරවලට නිදහස් කරලා තිබෙනවා. මොකද, මේ ගොවි පවුල්වල ආර්ථිකය නඟා සිටුවන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ඊළඟ කැබිනට් මණ්ඩල රැස්වීමට මමත් යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඒ අයගේ වගාව දියුණු කර ගැනීමට, ආර්ථිකය දියුණු කර ගැනීමට අපි රජයක් විධියට බැංකු සහ විවිධ ක්ෂේත්‍ර හරහා සහන ලබා දෙන්න කටයුතු කළ යුතුයි. කෘෂිකර්මය වෙන්න පුළුවන්; වෙනත් කර්මාන්තයක් වෙන්න පුළුවන්, ඒ සෑම කර්මාන්තයකටම ඒ ආකාරයට සහන ලබා දෙන්න කටයුතු කළ යුතුයි කියලා මා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "විනාශ වූ පවුල්වලට රුපියල් 10,000ක් දෙනවාය කිව්වා, ඒ මුදලින් රක්ෂණය සඳහා රුපියල් 1,350ක මුදලක් කපා ගත්තා"යි කියලා අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා දැන් කිව්වා. ඒ ප්‍රශ්නය හරිහැටි මතු වුණේ නැහැ. ඒ ප්‍රශ්නය මතු කරලා, ඒ ගැනත් අපට කථා කරන්න පුළුවන්. ඊයේ අඟහරුවාදා කැබිනට් මණ්ඩලයේදී අපි මේ ගැන කථා කළා. රක්ෂණය සඳහා කැපුවාය කියන රුපියල් 1,350 ගැනත් අවධානය යොමු කරලා, කැබිනට් මණ්ඩලයේදී ඒ සම්බන්ධයෙන් සාධාරණයක් කරන්න සාකච්ඡා කළා.

අපේ ආපදා කළමනාකරණ ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ඒ පවුල්වලට ලබා දෙන ආහාර ද්‍රව්‍ය ගැන අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 5,000ක් දෙන වැඩ පිළිවෙළ තුළ අපි එක්තරා ප්‍රමාණයකට පිටි දෙනවා. සහල් හිඟයක් තිබෙන නිසා අපේ රිසාඩ් බදියුදීන් ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා, ඒ මුදලට ඇතුළත්ව හාල් කිලෝ 5ක් හෝ ලබාදීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්ද කියලා බලන්නම්. රජයට වැය බරක් තිබුණත් අපි ඒ පවුල් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ අයගේ ආර්ථිකය, ජීවන රටාව අපි ආරක්ෂා කරන්න ඕනෑ. එදිනෙදා ජීවිතය ගෙනයන්න පවුලකට මාසයකට අඩු වශයෙන් හාල් කිලෝ 5ක් දීලා, සති දෙකකට වරක් රුපියල් 2,500 බැගින් රුපියල් 5,000ක් සඳහා අනික් බඩු ද්‍රව්‍ය ලබාදීමේ ක්‍රමය ගැනත් අවධානය යොමු කරන්න පුළුවන්. යම් යම් ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් තොරතුරු එකතු කරලා තමයි මේ මුදල් දෙන්නේ. එහෙම මුදල් දීමේදී අඩු පාඩු සිද්ධ වෙලා ඇති. ග්‍රාම නිලධාරි මාර්ගයෙන්, ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන්, දිසා ලේකම් මාර්ගයෙන් ඒ අවශ්‍ය මුදල් භාණ්ඩාරයෙන් නිදහස් කරනවා. ඒ මුදල් භාණ්ඩාගාරයෙන් නිදහස් කර ලබාදීමේ වැඩ පිළිවෙළේදී දේශපාලන වශයෙන් සියලුදෙනාම වග කීමක් ගන්න ඕනෑ.

අපේ රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. අපේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. මේ පැවිල්ලෙන් බඩ ගින්නේ දුක් විඳින්නේ මිනිසුන් විතරක් නොවෙයි. සතා සිවුපාවාත් බඩගින්නේ ඉන්නවා. අද අලියාට වතුර නැතිව ගමට යනවා. එහෙම ගිහින් ළිංවල වැටෙනවා, මැරෙනවා, පිපාසයේ මැරෙනවා, බඩ ගින්නේ මැරෙනවා. අපේ රාජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ඉතා හොඳ වැඩක් කරන බව මා කියන්නම්. වාරිමාර්ග රාජ්‍ය ඇමති විධියට එතුමා තඹුත්තේගම ප්‍රදේශයේ කැලෑවල්වලට වතුර දීම, වැව් හැරීම කරනවා. ලංකාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මා අගය කරනවා. අන්න ඒකයි සංහිඳියාව කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැඩි නියඟය නිසා පීඩාවට පත් වුණු පවුල් දිස්ත්‍රික්ක 8ක් තුළ ඉන්නවා. මේ වන කල් අපි රුපියල් බිලියන 1.46ක් ගෙවලා තිබෙනවා, නියං සහනාධාර සඳහා. අපි ඉදිරියටත් ඒ සහනාධාර දෙනවා. මේ පැවිල්ලෙන් පීඩාවට පත්වුණු පවුල් 5,99,800ක් පමණ දිස්ත්‍රික්ක 9ක ඉන්නවා. ඒ සියලු දෙනාටම සහනාධාර දෙනවා. අපේ ආපදා කළමනාකරණ ඇමතිතුමා ගම්වලට බවුසර් 6,000ක් පමණ දැනට දීලා තිබෙනවා. මගේ අමාත්‍යාංශය -මා- ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන්

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

බවුසර්, ටිපර් 10ක් ඉල්ලුවා. ඒ මොකටද? කැලෑ ගිනි ගන්නවා. සතුන්ට වතුර දෙන්න ඕනෑ. ඒ කැලෑ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිතිද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිතිද කියලා නැහැ, ගින්නක් ආවොත් ඒ ගින්න නිවන්න ඕනෑ. ගමට ඕනෑ නම් අපි ඒවාත් දෙන්නම්. අපි එහෙමයි, සංහිඳියාව ඇති කරන්නේ. අපි ඒ විධියට ක්‍රියා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට අනිද්දා වැස්ස එනකොට ආපදාවට ලක්වන ප්‍රදේශවල ඉන්න අයට අත දෙන්නේ කොහොමද කියන එක ගැන අපි හිතන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වනවා. එක පවුලක්වත් බඩ ගින්නේ මැරෙන්න දෙන්නේ නැහැ. උතුරේද, දකුණේද, නැඟෙනහිරද කියලා නැහැ, අපි ඒ පවුල් ආරක්ෂා කරන්න ඕනෑ. දැනුත් එක්තරා ප්‍රමාණයකට වැස්ස ලැබෙනවා.

අපට තිබෙන තවත් ප්‍රශ්නයක් ඊයේ කැබිනට් මණ්ඩලයේදීත් සාකච්ඡා කළා. වාරිමාර්ග හා ජල කළමනාකරණ ඇමති හැටියට මා 2002දී machineriesවලින් tube wells හදන එක ගැන ප්‍රතිපත්තියක් ගෙනාවා.

එක එක පෞද්ගලික සමාගම් ගිහිල්ලා ළිංවල tube wells සවි කරනවා. ඊට පස්සේ අල්ලපු ඉඩමේත් සවි කරනවා. එතකොට වතුර සම්පූර්ණයෙන්ම හිඳෙනවා. ඊට පස්සේ ළිං අයිතිකරුවෝ පැමිණිලි කරනවා. ගරු රවුෆ් හකීම් ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇති ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත්, ජාතික ජල සම්පත් මණ්ඩලයත් සහතික කරන ස්ථානවල පමණක් එම tube wells සවි කර එහි පාලනයක් ඇති කිරීමට රජය තීරණය කර තිබෙනවා. ඉඩමෙන් ඉඩමට නළ ළිං හාරන්න ගියොත් ඔක්කෝම ජලය විනාශ වෙනවා.

ඊළඟට, මොකද වෙන්නේ? ලුණු වතුර එනවා. ඊට පස්සේ kidney සම්බන්ධ අසනීප තත්ත්වයන් එනවා. මෙවැනි ප්‍රශ්න ඇති වන නිසා අපි tube wells සවිකිරීම පාලනය නොකළොත් සියලුම ජනතාව ලෙඩ්ඩු බවට පත්වෙනවා වාගේම පොළොවත් වේළෙනවා. එම නිසා ඊයේ කැබිනට් මණ්ඩලය දැඩි ලෙස සාකච්ඡා කර එහි පාලනයක් ඇති කළ යුතුයි කියා තීරණයක් ගත්තා. අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කිව්වා, "2002 වර්ෂයේ වාරිමාර්ග ඇමති විධියට ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා ගෙනාපු චක්‍රලේඛය තමයි හරි" කියලා. මම එදා තීරණය කළා, එහි පාලනයක් නොකළොත් අපේ සියලුම ජල උල්පත් විනාශ වෙනවා කියලා. ඊට පස්සේ ළිංවලට ලුණු වතුර ඇදෙනවා, kidney සම්බන්ධව අසනීප ඇතිවෙනවා. ඒ නිසා මේක සිදුකිරීම ඉතාම වැදගත්, අපි ඒ විධියට ක්‍රියා කරනවා.

මේ නියඟයත් එක්ක ඊළඟට ගංවතුර එන්න පුළුවන්. ගංවතුර වැළැක්වීම සඳහාත් අප සියලුමදෙනා වගකීම් ගන්න ඕනෑ. අපි ඔක්කෝම එකතුවෙලා ගංවතුරෙන් බේරෙන්න රජයක් විධියට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ලැහැස්ති විය යුතුව තිබෙනවා. මට මතකයි, මීට පෙර පස් අවුරුදු පැවිල්ලක් ඇතිවුණා. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නවලට මම උත්තර දුන්නා. ඒ වෙලාවේ ඔබතුමා එළියට ගිහින් හිටියේ. ඔබතුමා අපි අගය කරන අදහස් කිහිපයක් දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඇමතිතුමාට ලබා දුන් කාලය නම් දැන් අවසන්වෙලායි තිබෙන්නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ පැවිල්ල ඇතිවුණු 1970-1977 කාලයේ ජනතාව දුක් විඳපු හැටි මම දැක්කා. එවැනි යුගයක් අපට නැවත ප්‍රාර්ථනා කරන්න බැහැ. කෙහෙල් බඩ කාපු හැටි මට මතකයි. 1972 දී කලාවැව මැතිවරණ කටයුතුවලට ගිය වෙලාවේ මම දැක්කා, ඒ පැවිල්ල නිසා ඒ පැත්තේ ජනතාව දුක් විඳපු හැටි. ඒ ඡන්දයට ගිහිල්ලා අන්තිමට මමත් අසනීප වෙලායි ආපහු ආවේ. ඒ නිසා ඔක්කෝටම වැඩිය ජනතාව ලොකුයි, ඒ වාගේම ගහ කොළ සතාත් ලොකුයි. මේ නියඟයට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළට සම්පූර්ණ සහාය දීමට මේ රජය ලැහැස්තියි. ඒ ප්‍රදේශ සංවර්ධන කිරීමටත්, නියං ආධාර ලබා දීමටත්, නියඟයෙන් පීඩාවට පත් ජනතාවට නැවත ගොඩඒම සඳහා බැංකු වැනි ක්ෂේත්‍රවල සහාය ලබා ගැනීමටත් ඊළඟ කැබිනට් මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරන්න කැබිනට් මණ්ඩලය ඔක්කෝම ඉන්නවා. අපි මේ ප්‍රශ්න ටික පැහැදිලිවම සාකච්ඡා කරලා දැඩි තීරණ ගන්නවා. මොකද, ජනතාව උකස් කළ රන් භාණ්ඩ වෙන්දේසි කරන්න දෙන්න බැහැ. ඒ ජනතාව අහිංසකයි. ඒ නිසා අපි ඒක තාවකාලිකව නවත්වන්න ඕනෑ. 2015 ජනවාරි 8වැනිදා මැතිවරණයට පෙර අපි සහතිකයක් දුන්නා, පසුගිය රජය කාලයේ ජනතාව උකස් කර සින්න වෙන්න යන රන් භාණ්ඩ බේරලා දෙනවා කියලා. අපි ඒවා බේරලා දුන්නා. මම යෝජනා කරනවා, අපි ඒ වැඩ පිළිවෙළ නැවතත් ක්‍රියාත්මක කරලා එම අහිංසක ජනතාවගේ පවුල්වල ආර්ථිකය දියුණු වෙනකල් ඒවා ආරක්ෂා කර දෙන්න කටයුතු කරන්නය කියා.

කාලවේලාව අවසන් බව ගරු නියෝජ්‍ය කථානායකතුමා දැනුම් දුන්නා. රජයක් විධියට අපි සෑම දිස්ත්‍රික්කයකම සිටින ජනතාව වෙනුවෙන් නියං ආධාර වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. The next speaker is the Hon. Gnanamuthu Srineshan, but he is not present. The Hon. Douglas Devananda can speak next.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ටීඑන්ඒ පක්ෂය වෙනුවෙන් මමත් කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කථික ලැයිස්තුව එවලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාට පස්සේ ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා කථා කරන්නේ. එතුමාට පස්සේ ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්] Is it okay with you?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
එහෙම නම් අද මට කථා කරන්න වෙලාව එපා. මගේ වෙලාවත් එතුමාටම දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That has to be informed by the Party Leader. The Hon. Douglas Devananda, please.

[பி.ப. 2.36]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இலங்கையில் 20 மாவட்டங்களில் ஏற்பட்ட கடுமையான வரட்சி காரணமாக 2017ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் 22ஆம் திகதி வரையிலும் 137 பிரதேச செயலகப் பிரிவுகளில் 3,69,354 குடும்பங்களைச் சேர்ந்த 12,70,673 பேர் பாதிக்கப்பட்டுள்ளதாக அனர்த்த முகாமைத்துவ மத்திய நிலையத்தின் அறிக்கைகள் கூறுகின்றன. மேலும் 2016ஆம் ஆண்டு டிசம்பர் 19ஆம் திகதி முதல் 2017ஆம் ஆண்டு ஆகஸ்ட் 22ஆம் திகதி வரையிலான காலப்பகுதியிலேயே மேற்குறிப்பிட்ட எண்ணிக்கையானோர் பாதிக்கப்பட்டனர். இதேவேளையில் ஆகக்குறைவாகக் கண்டி மாவட்டத்திலேயே 870 குடும்பங்களைச் சேர்ந்த 2,680 பேர் பாதிக்கப்பட்டுள்ளனர் என்றும் நுவரெலியா, களுத்துறை, கொழும்பு, மாத்தறை, காலி ஆகிய 5 மாவட்டங்களும் வரட்சியினால் பாதிக்கப்படவில்லை என்றும் அனர்த்த முகாமைத்துவ நிலையம் மேலும் அறிவித்துள்ளது. இப்புள்ளிவிபரங்கள் தேசிய மட்ட வரட்சிப் பாதிப்புப் பற்றிய சுருக்கமான தகவல்கள் ஆகும். இங்கு வரட்சி பற்றிய விவாதத்தில் நாம் பங்குகொள்ளும்போது சில மாவட்டங்களில் மழை பெய்யவும் ஆரம்பித்துள்ளது. இந்த நிலையில், உள்ளூராட்சி மன்றப் பிரதேசங்களிலும் வனவிலங்குகள் பாதுகாப்புப் பிரதேசங்களிலும் மக்களுக்கும் விவசாயச் செய்கைகளுக்கும் விலங்குகளுக்கும் ஏனைய உட்கட்டமைப்புகளுக்கும் வரட்சியினால் ஏற்பட்ட சேத விபரங்களை இச்சபைக்கு விளக்குமாறு அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

ஓசோன் படையில் ஓட்டை விழுந்து பூகோளம் வெப்பமடைவதனால் ஏற்படுகின்ற காலநிலை மாற்றத்தினாலான அதிக மழை வீழ்ச்சி காரணமாகத் திடீர் வெள்ளம் ஏற்படுவதனாலும் நீண்டகால வரட்சி காரணமாகவும் பல்வேறு வாழ்க்கைப் பிரச்சனைகளுக்கு மக்கள் முகம்கொடுக்க நேரிடுகின்றது. தென்னிலங்கையில் ஏற்பட்ட திடீர் வெள்ளம் மற்றும் மண்சரிவு நிகழ்வுகள் மக்களுக்குச் சொல்லொணாத் துயரத்தையும், நிவாரணம் வழங்கவேண்டிய காரணத்தால் அரசுக்கு அதிக செலவினத்தையும் ஏற்படுத்தியது. அதேபோன்று கடந்த ஆறு மாதங்களுக்கும் மேலாக இலங்கையின் 20 மாவட்டங்களில் நிலவும் கடும் வரட்சி காரணமாக 12 இலட்சத்திற்கும் மேற்பட்டோர் பாதிக்கப்பட்டதோடு, நெற்பயிர் உட்பட விவசாயப் பயிர்கள் நாசமடைந்தன. பயன்தரு வீட்டு மிருகங்களும் பறவைகளும் செத்து மடிந்தன. ஆறுகளும் குளங்களும் கிணறுகளும் ஏனைய நீர் ஊற்றுக்களும் வரண்டுபோயின. மொத்தத்தில் மக்கள் அனைவரும் வாழ்வின் மூலாதாரங்களை இழந்து கைசேதப்படும் நிலைக்குத் தள்ளப்பட்டுள்ளனர். தற்பொழுது விலங்குகளுடன் சேர்ந்து மனிதர்களும் 'தண்ணீர் தண்ணீர்' என்று தாகத்தோடு அலைகின்றனர். இந்தச்சந்தர்ப்பத்தில் தென்னிந்திய பிரபல சினிமா டைரக்டர் கே. பாலச்சந்தர் அவர்கள் மூன்று தசாப்தங்களுக்கு முன்னர் 'தண்ணீர் தண்ணீர்' என்ற பெயரில் ஒரு திரைப்படத்தை வெளியிட்டுத் தண்ணீரின் முக்கியத்துவத்தையும் தேவையையும் மக்களுக்கு உணர்வுபூர்வமாக வெளிப்படுத்தியது இப்பொழுது என் ஞாபகத்திற்கு வருகின்றது.

இயற்கையின் தாக்கத்தினால் பாதிக்கப்பட்டுள்ள மக்களுக்கு உடனடியாக மத்தியகால, நீண்டகால நிவாரணங்களை வழங்கி, மக்களை வழமையான நாளாந்த வாழ்க்கைக்குத் திருப்பவேண்டியது அரசாங்கத்தின் தலையாய கடமையாகும். இருந்தபோதிலும், கடந்த இரண்டு வருடங்களாக இவ்வாறான இயற்கையின் தாக்கத்திற்கு மக்கள் உட்படும்பொழுது ஆட்சியாளர்களைத் திட்டுவது அவர்களின் உணர்ச்சி வழிப்பயணத்தின் ஒரு தோற்றப்பாடாகும். இதனை வைத்து அரசியல்வாதிகள் சுயலாப அரசியல் செய்யக்கூடாது என்பதே எமது நிலைப்பாடாகும். எனவே, அனர்த்த முகாமைத்துவ அமைச்சும் ஏனைய சம்பந்தப்பட்ட அமைச்சுக்களும் திணைக்களங்களும் அதிகாரசபைகளும் மக்களுக்கு உடனடியாக நிவாரணம் வழங்கவேண்டும். முதலில் மக்களுக்குக் குடிதண்ணீர் வழங்குவதற்குத் தாங்கிகளையும் 'பவுசர்' மூலம் தண்ணீரையும் கிராம மட்டத்திற்குக் கொண்டுசென்று வழங்குவதற்கான வசதிகளைச் செய்ய வேண்டும். நிவாரணச் சேவைகள் பற்றி மக்களுக்கு முன்னறிவித்தல் கொடுக்க வேண்டும். வரட்சியினால் வற்றிப்போன நீர் மூலங்களைத் தூர்வாரி ஆழப்படுத்துவதற்கும் நீரோடைகள், ஆறுகள், கிணறுகளைத் துப்புரவு செய்வதற்கும் வரட்சியினால் வாழ்வாதார மூலங்களை இழந்துநிற்கும் மக்களுக்குப் புனர்ஜீவனம் அளிப்பதற்கான திட்டங்களைத் தீட்டி கிராம, பிரதேச, மாகாண சபை மட்டங்களில் கலந்துரையாடி, உடனடியாகச் செய்ய வேண்டிய திட்டங்களை நடைமுறைப்படுத்துவதற்கும் களத்தில் இறங்க வேண்டும். இதற்கு அரசாங்கம் நிதி வழங்கவேண்டும். அதைவிடுத்து, அரசாங்க அதிகாரிகள் மக்களை வேறு திசையில் திருப்புமுகமாகக் கூட்டங்களை மட்டும் நடத்திப் போக்குக்காட்டி, குண்டுச் சட்டிக்குள் குதிரை ஓட்டக்கூடாது.

இச்சந்தர்ப்பத்தில் கௌரவ நிதி அமைச்சர் அவர்களிடம் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். இறக்குமதி செய்யப்படும் ஜப்பான் மோட்டார் சைக்கிள்களுக்கும் இணையச் சேவைகளுக்கும் வரிச்சலுகையை அளித்தமையைப் பாராட்ட விரும்புகின்றேன். ஆனால், அமைச்சர் அவர்கள் நாட்டில் வரட்சியாலும் வெள்ளத்தாலும் பாதிக்கப்பட்ட மக்களுக்கு தண்ணீர் விநியோகம் செய்யும் 'பவுசர்'களுக்கும் பால் சேகரிக்கும் 'பவுசர்'களுக்கும் இறக்குமதிச் சலுகை அளித்து 'பவுசர்'களுக்கு நாட்டில் நிலவுகின்ற தட்டுப்பாட்டையும் குறைத்திருக்க வேண்டும். எனவே, 'பவுசர்'களுக்கும் இறக்குமதிச் சலுகை அளிப்பதோடு, உள்நாட்டில் தயாரிக்கக்கூடிய 'பவுசர்' தாங்கிகளுக்கும் வரிச்சலுகை அளிக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

அத்துடன் விதைநெல், சேதனப்பசளை, நடுகைப்பொருட்கள், களைகொல்லிகள் போன்ற விவசாய உள்ளீடுகளை மானியத் திட்டத்தின்கீழ் சகாய விலையில் அல்லது முடியுமானால் இலவசமாக வரட்சியினாலும் வெள்ளத்தினாலும் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு உடனடியாக வழங்க வேண்டும். தற்பொழுது பயன்தரு வீட்டு விலங்குகளான ஆடு, மாடு, கோழி வளர்ப்போர் தண்ணீர் தேடிப் பல மைல் தூரம் தமது பட்டிகளைச் சாய்த்துக்கொண்டு நீருக்காகவும் உணவுக்காகவும் அலைந்து திரிகின்றார்கள். எனவே, பயன்தரு விலங்குகளையும் பறவைகளையும் பாதுகாக்க வேண்டும். இதற்காக மழை நீரைச் சேமித்துப் பயன்படுத்த மக்களுக்கு விழிப்புணர்வு ஊட்ட வேண்டும்.

மேய்ச்சல் நிலங்களில் புற்றரைகள் வரட்சியினால் வரண்டு மடிந்துள்ளன. இதனால், பால் தரும் கறவைப் பசுக்களுக்கு புல்லை வெட்டி யூரியா, சீனி, உப்புக் கலவை சேர்த்து சத்துணவான silage செய்து உணவளிக்க இயலாதுள்ளதால், பால் உற்பத்தியை அதிகரிக்க முடியாமல் உள்ளது. பால் பற்றாக்குறையானது பாலுணவு தேவைப்படும் குழந்தைகளையும் கர்ப்பிணித் தாய்மார்களையும் பாதிக்கும்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

எனவே, வட மாகாணத்தின் அனைத்து மாவட்டங்களிலும் சீமைக் கிளுவை, பூவரசு, அகத்தி, முருங்கை, வாழை போன்ற தாவரங்களின் நடுகைப் பொருட்களை மக்களுக்கு இலவசமாக விநியோகிக்க வேண்டும். அதுமட்டுமல்லாமல், கால்நடைகளுக்குத் தேவையான புண்ணாக்கு, சோளக்கலவை போன்ற அடர் தீவனங்களைக் குறைந்த தீர்வையில் இறக்குமதி செய்து, சகாய விலையில் கூட்டுறவுக் கடைகள்மூலம் மக்களுக்கு விநியோகிக்க வேண்டும். சமகாலத்தில் விலங்குகளுக்கான அடர்தீவனங்களின் உள்நாட்டு உற்பத்தியையும் அதிகரிக்க நடவடிக்கை எடுக்கவேண்டும்.

இலங்கையில் இவ்வாண்டில் ஏற்பட்ட வரட்சியானது, கடந்த பத்து மாதங்களில் விவசாயப் பயிர்களையும் விலங்குகளையும் பாரிய அழிவுக்கு உட்படுத்தியுள்ளது. இவ்வரட்சி கடந்த நாற்பது ஆண்டுகளில் ஏற்பட்ட வரட்சிகளில் கடுமையானது என்று ஐக்கிய நாடுகள் உணவு மற்றும் விவசாய நிறுவனத்தின் - UNFAO- அறிக்கைகள் கூறுகின்றன. இவ்வரட்சியின் காரணத்தினால் இவ்வாண்டில் நெல் விளைச்சல் கடந்த ஆண்டிலும் பார்க்க நாற்பது வீதம் குறையும் என்றும் கடந்த ஐந்து ஆண்டுகளின் சராசரி விளைச்சல் மகசூல்களுடன் ஒப்பிடும்போது 35 வீதத்தால் குறையும் என்றும் இது 2004ஆம் ஆண்டின் பின்னர் கிடைக்கப்பெறும் குறைந்த விளைச்சல் ஆகும் என்றும் எதிர்வு கூறப்பட்டுள்ளது. இலங்கையின் தொழிற்படையில் - labour force- அண்ணளவாக 25 வீதமானோர் விவசாயத்தில் ஈடுபட்டுள்ளமையால் இலங்கையின் பொருளாதாரத்துக்கு விவசாயத்துறையினால் வழங்கப்படும் பங்களிப்பு பாரிய தாக்கத்துக்குள்ளாகும் என்று கூறப்படுகின்றது. நமது பொருளாதாரத்தில் விவசாயமானது மொத்தத் தேசிய உற்பத்தியின் 08 சதவீதமளவுக்குப் பங்களிப்புச் செய்கின்றது என்பது இங்கு குறிப்பிடத்தக்கது.

இலங்கையின் வரலாற்றில் ஆதிவாசிகளின் காலம், ஆரிய-திராவிடர் காலம், போத்துக்கேயர் காலம், ஒல்லாந்தர் காலம், ஆங்கிலேயர் காலம் என்று வரலாற்றுக் காலகட்டங்கள் விளக்கப்படுகின்றன. ஆனால், நாம் இப்பொழுது சீனர்களும் இந்தியர்களும் அடங்கிய 'சின்டியா'வின் காலத்தில் வாழ்ந்துகொண்டிருக்கின்றோம். இது தவிர்க்க முடியாததாகும். காரணம் என்னவென்றால், இவ்விரு நாடுகளும் ஆசியாவின் வளர்ச்சிக்காகப் பாரிய பங்களிப்பைச் செய்வதோடு, 21ஆம் நூற்றாண்டை ஆசியாவின் நூற்றாண்டாக மாற்றும் என்றும் பொருளியலாளர்கள் எதிர்வு கூறுகின்றனர்.

நாட்டின் பொருளாதார வளர்ச்சியை நல்லாட்சி அரசாங்கத்தின் பொருளாதாரத் திட்டங்களின்படி உயிர்ப்பித்து ஊக்கப்படுத்த வேண்டும். எனவே, நல்லாட்சி அரசாங்கம் சந்திரமண்டலத்தில் இருந்தேனும் மூலதனங்களைத் தேடிப்பிடித்து இவ்வரசாங்கத்தின் ஆட்சிக்காலத்துக்குள் மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டும். இச்சபையில் விவாதங்களை வெல்லுவது முக்கியமல்ல, உடனடியாகத் தொழிற்பட களத்தில் இறங்குவதே முக்கியமாகும். இது அரசாங்கத்தின் தலையாய கடமையுமாகும். இந்நாட்டு மக்களுக்கு அளிக்கப்பட்ட நல்லாட்சி அரசின் வாக்குறுதிகளைத் துரிதமாகச் செயற்படுத்த வேண்டியதே காலத்தின் கட்டாய தேவையாகும்.

அதேநேரம், வட மாகாணத்திலுள்ள கிராமத்து மண்ணின் மைந்தர்கள் தொழில் தேடி நகரங்களை நோக்கியும் மத்திய கிழக்கு நாடுகளுக்கும் செல்லும் இக்கட்டான நிலைமைக்குத் தள்ளப்பட்டுள்ளார்கள். இவ்வாறு எமது இளைஞர்களும் யுவதிகளும் தொழில் தேடிப் புலம்பெயரும்பொழுது தொழிலாளர்கள் பற்றாக்குறை நாட்டில் ஏற்படுகிறது. ஏற்கெனவே விவசாயம் மற்றும் கட்டிட நிர்மாணத்துறையில் தொழிலாளர்களுக்கான பாரிய பற்றாக்குறை நிலவுகின்றது. இந்த நிலையில் உள்நாட்டுத் தொழிலாளர்களைப் போதியளவு நாம் உருவாக்காதுவிட்டால், 'சின்டியா'விலிருந்து தொழிலாளர்களை இறக்குமதி செய்யவேண்டிய சங்கடமான நிலைக்கு எமது நாடு தள்ளப்படும் என்று எதிர்வுகூறவேண்டியுள்ளது.

அரசாங்கம் வரட்சியினாலும் வெள்ளத்தினாலும் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்குவதற்கு 109 பில்லியன் ரூபாய் தேவைப்படுவதாக மதிப்பிட்டுள்ளதென அறியவருகிறது. அதற்கு நிதியிடுவதற்காக அமைச்சுக்களின் பாதீடுகளிலிருந்து 10 வீதத்தை வெட்டி, 65 பில்லியன் ரூபாயைப் பெறமுடியும் என்றும் மேலதிகமாகத் தேவைப்படும் தொகையான 44 பில்லியன் ரூபாயைக் கடன்மூலம் பெற்று நிவாரணங்களையும் நட்டஈடுகளையும் வழங்க அரசாங்கம் நடவடிக்கை எடுக்கவுள்ளதாகவும் அறிகின்றோம். இதைச் செய்வதற்காக சகல அமைச்சர்களும் ஒத்துழைப்பை வழங்குவதோடு, அதிகாரிகளும் விரைவான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். மக்கள் பயனடையக்கூடியதாக இதை அரசாங்கம் செய்ய வேண்டுமென்று நாம் எதிர்பார்க்கின்றோம். மேலும், இம்முயற்சிக்கு உலக உணவு விவசாய நிறுவனம், USAID, JICA போன்ற சர்வதேச நிறுவனங்களிடமிருந்தும் அவசியமான தொழில்நுட்ப ஆலோசனைகளையும் ஏனைய உதவிகளையும் பெற்று, ஏழை விவசாயிகளுக்குப் பயன்தரு விவசாயத் திட்டங்களைச் செயற்படுத்தவேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன்.

இம்மாதம் 20ஆம் திகதி ஞாயிற்றுக்கிழமை வெளியான "Ceylon Today" வாரப் பத்திரிகையில் ஆசிரியத் தலையங்கத்திற்குத் "தண்ணீர்" என்று தலைப்பிட்டு, தற்போதைய வரட்சியைப் பற்றியும் அரசாங்கம் எடுக்க வேண்டிய நடவடிக்கை பற்றியும் அதன் ஆசிரியர் எழுதியுள்ளார். இதில் பல கருத்துக்கள் அடங்கியுள்ளதால் அரசாங்க அதிகாரிகளுக்கும் கொள்கை திட்டமிடுபவர்களுக்கும் பிரயோசனமாக இருக்கும் என்று கருதி அந்த ஆசிரியத் தலையங்கம் அடங்கிய பக்கத்தைச் சபாபீடத்தில் *சமர்ப்பிக்கின்றேன். Sunday's "Ceylon Today" ஆசிரியருக்கு எனது பாராட்டுக்கள்!

நான் இச்சபையில் தெரிவித்துள்ள கருத்துகள் தொடர்பாக ஜனாதிபதி, பிரதம அமைச்சர் மட்டத்தில் செயற்படும் அனர்த்த நிவாரணச் செயலணி கவனத்தில் எடுத்து நிவாரணத் திட்டங்களை விரைவாக மக்களுக்கு வழங்குமாறும் மக்களின் பிரச்சினைகளைத் தீர்க்குமாறும் கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவுசெய்துகொள்கின்றேன். நன்றி.

[අ.භා. 2.50]

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් ඒ වාගේම මහ ජනතාවට බලපාන ප්‍රධාන කාරණයක් සම්බන්ධයෙන් තමයි අද සභාව කල් තබන අවස්ථාවේ විවාදය පැවැත්වෙන්නේ. ඇත්ත

වශයෙන්ම කිව්වොත්, මේ වර්ෂය තුළ ප්‍රශ්න දෙකකට රජය මුහුණ දීලා තිබෙනවා. එකක් ප්‍රධාන වශයෙන් ඇති වූ ගංවතුර තත්ත්වය. ගංවතුර ආරම්භ වුණේ මැයි මාසයේ 25වෙනි දා මධ්‍යම රාත්‍රී 12.00න් පසුවයි. ජුනි මාසයේ 05 දක්වා දැවැන්ත ගංවතුර තත්ත්වයකට රජය මුහුණ දුන්නා. ඒ වාගේම ඊට ප්‍රථම සිට පවතින නියඟය සම්බන්ධ විශාල ප්‍රශ්නයටත් රජයක් හැටියට මුහුණ දීලා තිබෙනවා.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 95ක්, ග්‍රාම නිලධාරි වසම් 5,550කට ආසන්න ප්‍රමාණයක් ඒ ඇති වූ ගංවතුර තත්ත්වයට මුහුණ දුන්නා. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය ප්‍රධානකොට තවත් දිස්ත්‍රික්ක ගණනාවක ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් අප රජය හැටියට මුහුණ දුන්නා. ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තොත්, එහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක් ගංවතුර තත්ත්වයට මුහුණ දුන්නා. ඒ වාගේම කෑගල්ල, කොළඹ සහ අනික් ප්‍රදේශ කිහිපයක් ද ගංවතුර තත්ත්වයට මුහුණ දුන්නා. ඒ එක්කම එක පැත්තක මෙසේ මහ ගංවතුර තියෙද්දී, අනික් ප්‍රදේශ නියඟයට මුහුණ දෙමින් සිටියා. මගේ මතකයේ හැටියට ගංවතුර ප්‍රශ්නයෙන් අවතැන් වූ පවුල් 535,000ක් පමණ යථා තත්ත්වයට පත් කරන්න රජය හැටියට අවශ්‍ය පියවර ගනිමින් සිටියා. ඒ අතර, නියඟය නිසා ලංකාවේ තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 144ක අර්බුදයකට අපට මුහුණ පාන්න සිදු වුණා. දිස්ත්‍රික්ක වශයෙන් බැලුවොත් මඩකළපුව, වවුනියාව, කෑගල්ල, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, පුත්තලම, යාපනය, ත්‍රිකුණාමලය, මොණරාගල, පොළොන්නරුව, අනුරාධපුරය, කුරුණෑගල සහ හම්බන්තොට කියන දිස්ත්‍රික්ක මුල් කරගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 144ක්, ඒ එක්කම ග්‍රාම නිලධාරි වසම් 6,000කට ආසන්න ප්‍රමාණයකට බලපෑ ඒ අර්බුදය වෙනුවෙනුත් රජය හැටියට අපි මේ වර්ෂය තුළ මුහුණ දීලා තිබෙනවා.

එක පැත්තකින් ගංවතුර තත්ත්වයටත් අනික් පැත්තෙන් නියඟයටත් රජය මුහුණ දීලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේත්, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් මැදිහත් වීමෙන් මේ තත්ත්වයන් යථා තත්ත්වයට පත් කරන්න අපට හැකි වුණා. ඒ වාගේම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, රජයේ සියලු දෙපාර්තමේන්තු සහ ආයතන සියල්ලම එක් තැන්වෙලා එක පැත්තකින් ගංවතුරින් ඇති වූ තත්ත්වය යථා තත්ත්වයට පත් කරමින්, අනික් පැත්තෙන් නියඟයට මුහුණ දීපු සමාජය යථා තත්ත්වයට පත් කරන්නේ කොහොමද කියලා සොයා බලනවා. නියඟය ඇති වූ දිස්ත්‍රික්කවල නිවාස 565,000ක් පමණ මේ අර්බුදයට මුහුණ දුන්නා. නමුත් අපේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා නිවාස හාරලක්ෂ ගණනක් කියා සඳහන් කළා මම අහගෙන හිටියා. නමුත් රජයේ සංඛ්‍යා ලේඛන අනුව නිවාස 565,000කට ආසන්න ප්‍රමාණයක් මම කලින් සඳහන් කළ දිස්ත්‍රික්ක ගණනාවේ ඇති වූ නියං තත්ත්වයට මුහුණ දීලා තිබෙනවා. දැන් රජය මැදිහත් වෙලා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් ඉන්නවා. ඒ අතර, අපි ලබා දෙන දීමනාව රුපියල් 2,500යි, රුපියල් 10,000යි වශයෙන් කියමින් නොයෙකුත් කරුණු කාරණා මතු කරන්න පුළුවන්. නමුත් රජය හැටියට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහන ලබාදීමේදී කටයුතු කළ ආකාරය ගැනත් සඳහන් කරන්න ඕනෑ. උදාහරණයක් හැටියට ඒ සහන ලබාදෙන අයට සමෘද්ධි දීමනාව තිබුණා නම්, වෙනත් රජයේ දීමනා තිබුණා නම්, ඒ සියලු දීමනා දෙන අතරේ තමයි රජය වර්තමානයේ ගත් අනික් තීන්දු තීරණ ක්‍රියාත්මක කළේ කියන එක මම මේ වෙලාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමාට මතක් කරන්න කැමැතියි.

ඇත්ත වශයෙන්ම අඩු පාඩු තිබෙනවා නම්, ඒ සඳහා සාධාරණ අදහස් හා යෝජනා ඉදිරිපත් කළොත් ඒවා සැලකිල්ලට අරගෙන ඒවා ගැන සොයා බලා මේ වැඩසටහන ශක්තිමත් කරන්න අපට පුළුවන්කම තිබෙනවා. මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අපි කාරණා දෙකකින් මේ ප්‍රශ්නය දිහා බැලුවා. එකක්, වර්තමානයේ තිබෙන තත්ත්වයට මුහුණ දීම. අනෙක් එක, අනාගතයේ මෙවැනි තත්ත්වයන් ඇති වුණොත් මුහුණ දීමට රජය හැටියට ස්ථාවර වැඩ පිළිවෙළක් ඇති කිරීම. මේ නියං තත්ත්වයන් ඇති වීම ලංකාවේ සිද්ධ වුණේ ඉතිහාසයේ පළමුවෙනි වතාවට නොවෙයි. ලංකා ඉතිහාසයේ විවිධ අවස්ථාවල නියං තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. ඒ නියං ඇති වුණු අවස්ථාවල අධාර ලබා දීම් මේ කියන ආකාරයට වඩා අඩු ආකාරයකට සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ඒවා සංසන්දනය කිරීමට වඩා රජය හැටියට මහජනතාවගේ පැත්තෙන් මෙම ආරක්ෂාව ලබා දෙන්නේ කොහොමද කියලායි අපි බැලුවේ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ජනාධිපති කාර්යාලය මැදිහත් වෙලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට බෙදා හැරීම සඳහා අලුතෙන්ම ජල බවුසර් 100ක් අපේ අමාත්‍යාංශයට එව්වා. අපි වෙනම අලුත් ජල බවුසර් 100ක් ජලය බෙදා හැරීම සඳහා ඔය කියපු දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ අලුත් ජල බවුසර් 100ත් එක්ක ඊට අමතරව තව ජල බවුසර් 326කට ආසන්න ප්‍රමාණයක් මම කියපු දිස්ත්‍රික්කවල පානීය ජලය බෙදා හැරීම සඳහා පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යොදවලා තිබෙනවා. ඒ අතරේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් මේ සඳහා චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. ඒ චක්‍රලේඛවල ක්‍රියාදාමයන් පිළිබඳ යම් ප්‍රශ්න තිබෙනවා නම්, ඒවා සාකච්ඡා කරලා නිවැරදි කරගෙන මේ වැඩසටහන තවත් ශක්තිමත් කරන්න අපට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේ මේ ගරු සභාවේ සිටින සියලු දෙනාටම මතක් කරන්න කැමැතියි, ගං වතුරෙනුත්, නියඟයෙනුත් විපතට පත් ජනතාව වෙනුවෙන් රජය හැටියට මේ වන විට රුපියල් බිලියන 100කට ආසන්න අතිරේක මුදලක් පාවිච්චි කරමින් සිටින බව. අපි දැනට රුපියල් බිලියන 60ක මුදලක් ගං වතුරෙන් හානියට පත් වූ අය සඳහා බෙදා හැරලා තිබෙනවා. දැන් අපට ඕනෑ කර තිබෙනවා, තවත් රුපියල් බිලියන 60ක්. දැනට අග්‍රාමාත්‍යතුමා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සියලු දෙනා සමඟ සාකච්ඡා කරලා රුපියල් බිලියන 60ක් මුදා හැරියා. ඒ මුදල් ඔක්කෝම-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමා, මේක ප්‍රකාශයට පත් කළා නම් හොඳයි නේද?

**ගරු වජිර අබේවර්ධන මහතා**

(மாண்புமிகு வஜிர அபேவர்தன)

(The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට අපි ඒ රුපියල් බිලියන 60ම විපතට පත් ජනතාව අතරට යවා තිබෙනවා. තව රුපියල් බිලියන 60ක් ඕනෑ කරලා තිබෙනවා. නියඟයෙන් විපතට පත් ජනතාව සඳහා අපට තව රුපියල් බිලියන 80ක පමණ මුදලක් ඕනෑ කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු නොවූ විධියේ නියඟයකටත්, ගං වතුරකටත් මුහුණ දීලා මහජනතාවගේ ප්‍රශ්න අවම කරමින් අපි මේ කටයුත්ත මෙහෙයවමින් ඉන්නවා. ඒ වැඩසටහන තවත් ශක්තිමත්ව නිවැරදිව කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනා ඉදිරිපත් කරනවා නම් වඩාත් යෝග්‍යයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මන්ත්‍රීතුමන්ලා වාද-විවාද කරනකොට අවසානයේ bypass operation එකේ තැනට

[ගරු වජිර අබේවර්ධන මහතා]

තල්ලු වෙන්න සිද්ධ වුණා. ඇත්ත වශයෙන්ම, මම ඒ ගැන කනගාටු වෙනවා. මීට ප්‍රථමත් මේ පාර්ලිමේන්තුවේ හිටපු අගමැතිවරුන්ට, මේ පාර්ලිමේන්තුවේ හිටපු සභානායකවරුන්ට, මේ පාර්ලිමේන්තුවේ හිටපු ඇමතිවරුන්ට එවැනි සැත්කම් කර තිබෙනවා. මේ, අපේ කැබිනට් මණ්ඩලයේ bypass සැත්කම කළ පළමුවෙනි ඇමතිවරයා නොවෙයි. සමහර අග්‍රාමාත්‍යවරුන්ට ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ හාර පන්සියය වියදම් කරලා තිබෙනවා. මේ විවාදය ඒ ඇමතිතුමාගේ bypass operation එක ගැන සඳහන් කරන තත්ත්වයට පත් කර ගැනීම ගැන මම කනගාටු වෙනවා. ඇත්ත වශයෙන්ම මේ ගරු සභාවේ ඉන්න කවුරුන් හෝ යම් කිසි අපහසුතාවකට පත් වෙනවා නම්, ඒ හැම කෙනෙක්ම ආරක්ෂා කිරීම සඳහා අපේ මේ සභාවම බැඳී ඉන්නවා. ඒ නිසා මම කැමැතියි-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තේරුණේ නැහැ.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
මන්ත්‍රීතුමා, මම කිව්වේ අපේ විවාදය අපරාදේ වෙන පැත්තකට ගියා කියලා; bypass සැත්කමේ තැනට ගමන් කළා කියලා. අපේ සමහර හිටපු ඇමතිවරුන්ට, අනික් අයට bypass සැත්කම් සඳහා ඇමෙරිකාවේ සමහර රෝහල්වලට රුපියල් ලක්ෂ හාර පන්සියය ගෙවලා තිබෙනවා. හැබැයි, අපි ඒවා මේ විවාදයට එකතු කර ගන්නා තත්ත්වයට පත් වෙන්න හොඳ නැහැ. මේ විවාදයේ ප්‍රයෝජනයක් ගැනීම සඳහා අවශ්‍ය කරන තැනට පත්වීම ඊට වැඩිය හොඳයි කියන එකයි මම කිව්වේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් මේ විවාදය අලුත් විවාදයක් බවට පත්වෙනවා.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
නැහැ. අපි දෙන්නා අතර විවාදයක් නැහැ. මොනවා හරි කියන්න තිබෙනවා නම් කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කලිනුත් කිව්වා, ඒ පළාත්වල මේ නියඟය ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා කියලා. ඒ ජනතාවට වෙනත් ආදායම් මාර්ග නැහැ. ඒ ප්‍රදේශවල ජීවත්වන සමහර අයට පිළිකා, වකුගඩු වාගේ රෝග තිබෙනවා; දිනපතා ඒවාට ඖෂධ ගත යුතුව තිබෙනවා. නියඟය නිසා ඒ අයගේ ආර්ථිකය කඩා වැටුණාට පසුව, රුපියල් 2,500 ආහාර මල්ලෙන් පමණක් ඒ ජීවිත නඟා සිටුවන්න බැහැ. ඒ නිසා ඒ අයගේ යම් සංගණනයක් කරලා ඒ අයට බෙහෙත් ලබා ගැනීම සඳහා යම් ආධාරයක් ලබා දිය යුතු බව තමයි මගේ යෝජනාව වුණේ. නමුත්, ඒකට සෞඛ්‍ය ඇමතිතුමා කලබල වුණාට මට කරන්න දෙයක් නැහැ.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම වැදගත්. ඒ ප්‍රදේශවල ජීවත් වෙන ජනතාව පීඩාවට පත් වෙලා තිබෙනවා. මම උදාහරණයක් කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තිහයි තිබෙන්නේ; පසුගිය මාස දෙකේ එයින් දහසයකට මම ගිහින් තිබෙනවා. පුත්තලම, ආනමඩුව හා මහ කුඹුක්කඩවල ඇතුළු ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටම ගිහින්, ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් කාර්යාල ඒකාබද්ධ වෙලා ගම් මට්ටමෙන් මහජනතාවත් සමඟ සම්බන්ධ වී මේ ප්‍රශ්නය දෙස අප බලා තිබෙනවා. මේ මොහොත වෙනවිට පොළොන්නරුව දිස්ත්‍රික්කයට වැහැලා තිබෙනවා. හැබැයි ඒත්, ගරු මන්ත්‍රීතුමා කියන්නා වාගේ අතීතයේ තිබුණු තත්ත්වය එයින් විසඳෙන්නේ නැහැ. ඒ ප්‍රදේශයට වැහැලා දැන් යථා තත්ත්වයට පත් වෙමින් තිබෙනවා. උදාහරණයක් හැටියට කියනවා නම් නොච්චියාගම සහ අනෙක් ප්‍රදේශවලටත් ගිය සතියේ සුළු වැසි කිහිපයක් වැහැලා යථා තත්ත්වයට පත් වෙමින් තිබෙනවා.

රජයක් හැටියට ඉතාම අමාරු තත්ත්වයක සිටියත් මේ වර්ෂය තුළ අතිරේකව රුපියල් බිලියන එක සියපණහකට ආසන්න මුදලක් මේ සඳහා වැය වෙයි. තවමත් සියල්ල ඇස්තමේන්තු කර අවසාන නැහැ. පෙරේදාත් අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මේ ගැන වෙනම සාකච්ඡාවක් පැවැත්වුණා. ගරු මන්ත්‍රීතුමා කිව්ව චක්‍රලේඛය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය නිකුත් කර තිබෙනවා. ඒ ගැන මම ආපසු සාකච්ඡා කර බලන්නම්, මොනවාද ඒකේ කරන්න ඕනෑ වෙනස්කම් කියා. ඒ යෝජනා අපට වෙනස් කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය හැටියට ඉතාමත් අසීරු තත්ත්වයක ඉඳගෙන මහජනතාව ඉතාමත් ආරක්ෂිතව රැක බලා ගැනීම සඳහා අවශ්‍ය කෙටිකාලීන පියවර සහ දීර්ඝකාලීන පියවර අපි දැනට අරගෙන තිබෙනවා. ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් තවත් වැදගත් යෝජනා ඉදිරිපත් වුණොත් ඒවා සියල්ලක්ම ගැන අපි රජය හැටියට අවධානය යොමු කර ක්‍රියා කරන්නට බලාපොරොත්තු වෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු එස්.එම්. චන්ද්‍රසේන මන්ත්‍රීතුමා.

ඔබතුමා කථාව කරන්න කලින් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Please commence your speech, Hon. Member.

[අ.භා. 3.02]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු දෙකක පමණ කාලයක් පවතින නියඟය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. මේ නියං තත්ත්වය නිසා අපේ රටේ දිස්ත්‍රික්ක දහඅටක, විස්සක පමණ ජනතාව මේ වන විට පීඩාවට පත් වෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කය ගැන කථා කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මෙම නියඟය නිසා ජනතාවට කන්න පහක් ගොවිතැන් කරන්නට නොහැකි වීම නිසා ඉතාම දුෂ්කර තත්ත්වයෙනුයි ඉන්නේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විශාල ප්‍රමාණයක ජනතාවට අද ජීවත් වෙන්න ආහාර පමණක් නොවෙයි, බීමට ජලයත් නැතිව දුක් විඳිනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉතාම බරපතළ ලෙස නියඟයට අසු වෙලා තිබෙන ප්‍රදේශයක් තමයි මහවිලච්චිය ප්‍රදේශය. ඒ ප්‍රදේශයේ ජනතාවට බීමට ජලය නැහැ; ස්නානය කරන්න ජලය නැහැ. ඒ ප්‍රදේශයේ ජනතාවට ආහාර කෙසේ වෙතත් බීමට හා නෑමට ජලය නැති තත්ත්වයට අද පත්වෙලා තිබෙනවා. මේ සඳහා රජය මීට වඩා පහසුකම් ලබා දීම කළ යුතුයි. ජනතාව අපිත් සමඟ කියනවා, මේ සඳහා ආණ්ඩුවෙන් ලැබෙන අනුග්‍රහය ඉතාම මදියි කියා.

එක අවස්ථාවක ඒ ප්‍රදේශයේ ගොවි මහත්වරු වගා ළිඳක් හාරන්න යන කොට, වනජීවී දෙපාර්තමේන්තුවේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇවිත් ඒ වගා ළිඳ කපන්න අවසරය දුන්නේ නැහැ. පස්සේ, මම විලච්චියේ ප්‍රාදේශීය ලේකම්තුමාට කිව්වා, "මේ මිනිසුන්ට බොන්න සහ නා ගන්න වතුර ටිකක් ගන්නයි මේ ළිං හාරන්නේ. ඒ සඳහාවත් අවසරය දෙන්න" කියලා. ඒ නිසා නිලධාරීන් මේ ජනතාවගේ පීඩාව පිළිබඳව මීට වඩා නම්‍යශීලී වෙන්න ඕනෑ. ඒ සඳහා ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලාගේ වගකීම මීට වඩා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම සහනාධාර ලබා දීම ගැන ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ලැයිස්තුවක් කියෙව්වා. ඒක චක්‍රලේඛවල තිබෙන ලැයිස්තුව වෙන්න ඇති. මම මේ ආධාර ලබන අයගේ ලැයිස්තුවක් ගත්තා. ඒ ලැයිස්තුවට අනුව දෙදෙනෙකු සිටින පවුලකට ලැබෙන්නේ, පිටි කිලෝ 10යි, සීනි කිලෝ එකයි, කඩල කිලෝ එකයි, තේ කුඩු ග්‍රෑම් 200යි, සැමන් ටින් එකයි, මිරිස් කුඩු ග්‍රෑම් 200යි, පරිප්පු කිලෝ එකයි, පැනඩෝල් පෙති දෙකයි. ඒ වාගේම පස් දෙනෙකු සිටින පවුලකට ලැබෙන්නේ, පිටි කිලෝ 10යි, සීනි කිලෝ එකයි, කඩල කිලෝ එකහමාරයි, තේ කුඩු ග්‍රෑම් 200යි, සැමන් ටින් එකයි, මිරිස් කුඩු ග්‍රෑම් 200යි, පරිප්පු කිලෝ එකහමාරයි, පැනඩෝල් පෙති දෙකයි. දවස් පහකට රුපියල් 2,500ක ආධාර ලබා දුන්නාට, ඒ මුදලට සරිලන විධියට භාණ්ඩ ලැබෙන්නේ නැහැ කියන එක සඳහන් කරන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි. මේ සහනාධාර ලබන අය ගණන් හදා බලා තිබෙනවා. රුපියල් 2,500ක වටිනාකමට අදාළ භාණ්ඩ කිව්වාට, ලැබෙන්නේ රුපියල් 1,600ක විතර වටිනාකමකින් යුතු භාණ්ඩ කියලා ඒ ගොල්ලන් වෙළෙඳ පොළේ තිබෙන වටිනාකමට අනුව කියනවා. ඒ නිසා මේ ගොල්ලන්ට භාණ්ඩ ලබා දෙනවාට වඩා මුදල් ලබා දුන්නා නම්, මීට වඩා සහනයක් ලැබෙනවාය කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සහනාධාර දෙන කොට, සුදුසුකම් ලබන සියලු දෙනාටමත් ඒවා ලැබෙන්නේ නැහැ. මම උදාහරණයක් කියන්නම්. මහවිලච්චිය 368 තුලානේ පවුල් 621ක් ඉන්නවා. ඒකෙන් සහනාධාරවලට සුදුසුකම් ලබා තිබෙන්නේ පවුල් 384යි. එයිනුත් දැනට සහනාධාර ලැබෙන්නේ පවුල් 171ට. පවුල් 621ක් සිටින තැනක ඒ විධියට තමයි ලැබෙන්නේ.

විශේෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු වකුගඩු රෝගීන් වැඩිපුර සිටින ප්‍රදේශවල ජනතාව පිළිබඳවත් වැඩියෙන් අවධානය යොමු කරන්න අවශ්‍ය වෙනවා. වකුගඩු රෝගියෙකු සිටින ගෙදරක කෙනෙකු ඇඟලුම් කර්මාන්තයේ යෙදී ඉන්නවා නම්, ඒ අයටත් මේ සහනාධාරය ලැබෙන්නේ නැහැ. ඒ වාගේම, වඩු කර්මාන්තයේ දවස් පහළොවක් යෙදී සිටියොත්, ඒ අයටත් සහනාධාර ලැබෙන්නේ නැහැ. ඒ අනුව බලාගෙන ගියාම ඒ සහනාධාර ලබා දීමේදී විශාල කප්පාදුවක් සිදු වෙනවා. මම උදාහරණයක් හැටියට ගත්තේ මහ විලච්චියේ 368 තුලානේ. එහි පවුල් 621ක් ඉන්නවා. ඒකෙන් සහනාධාර ලබන්න සුදුසුකම් ලබා තිබෙනවා, පවුල් 384ක්. ඒ පවුල් 384ටත් සහනාධාර ලැබිලා නැහැ. පවුල් 171කට පමණයි ලැබිලා තිබෙන්නේ. එතකොට පවුල් හාරසිය ගණනකට සහනාධාර ලැබෙන්නේ නැහැ. ඒ පවුල් අතර ආදායම් ලබන අය, ලොකු ධනපතීන් -සල්ලිකාරයන්- නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, වගා වන්දි දෙන්න එකඟතාවකට ආවා නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වගා වන්දි දැන් දෙන්නේම නැහැ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
"නියං ආධාර" කියන එක තමයි දැන් තිබෙන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් අර වගාවලට වුණු හානි, ගොවීන්ට වුණු හානි ගැන කිසිම සැලකිල්ලක් නැහැ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, දැන් ඒවා නැහැ.

මේ වනවිට හතර වතාවක් ඉල්ලුම් පත්‍ර පුරවා තිබෙනවා, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සහ ඒ අදාළ ආයතනවලින්. කොච්චරවත් ඉල්ලුම් පත්‍ර පුරවනවා. චක්‍රලේඛ වෙනස් කරනවා කියන එක තමයි කියන්නේ. ඒ අයට කිසිම ආධාරයක් ලැබිලා නැහැ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම නියඟයෙන් පීඩාවට පත් වී සිටින වියළි කලාපයේ ජනතාවගේ දුක්ගැනවිලි බැලීම සඳහා තමුන්නාන්සේලා පොඩ්ඩක් ඒ ගම්වලට යන්න. ඔවුන් ඉතාම අමාරුවෙන් ජීවත් වෙන්නේ. අද ඒ ජනතාවට ජීවත් වෙන්න විධියක් නැතුව වහ බොන තත්ත්වයට පත් වෙලා සිටිනවා.

මේ දෙන සහනාධාරයත් හරියට දෙන්නේ නැහැ. බඩු දෙන්න ගියාම තවත් නොයෙකුත් දූෂණ වංචා ඇති වෙන්න පුළුවන් නිසා ඒ අය කියන්නේ මුදලින් දෙන්න කියලායි.

මේ නියඟය දිගින් දිගටම පවතින බව අපි දන්නවා. ගොවි ජනතාවට වගා කටයුතු කරන්න අද කිසිම දෙයක් ඉතිරිවෙලා නැහැ. ඔවුන්ගේ හැම දෙයක්ම බැංකුවල, පෞද්ගලික තැන්වල උකස් කරලා ආර්ථික වශයෙන් විශාල අමාරුවක වැටිලා ඉන්න වෙලාවක්. ඉස්සරහට එන්නේ මාස් කන්නය. මාස් කන්නයේ වර්ෂාව ඇවිල්ලා වගා කරන්න ජලය ලබා ගන්න පුළුවන් වුණත්, ගොවිතැන් කරන්න ඒ අයට හයියක් නැහැ. ඒ නිසා අපි කලින්ම කියා සිටින්නේ මේ අයට සහන ලබා දෙන්න කටයුතු කරන්න කියලායි. රජයක් පිහිටුවා ගෙන තිබෙන්නේ ජනතාව අපහසුතාවට පත් වුණු වෙලාවට සහන සලසන්නයි. ගංවතුරක්, සුළි සුළඟක්, නියඟයක් ඇති වෙලා ජනතාව අපහසුතාවට පත් වුණු වෙලාවට සහන සලසන්න ඕනෑ. මේවා ශුභ සාධන ආණ්ඩු. ඒ නිසා පීඩාවට පත් වුණු ජනතාව දිහා බලන්නේ නැතිව ඉන්න එපා. මේ ආකාරයට ජනතාව පීඩාවට පත් වන තත්ත්වය දිහා බල බලා ඉන්න එපා කියලා අපි විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

අපේ ඇමතිතුමා කිව්වා වතුර බවුසර් වගයක් ගෙනාවා කියලා. නමුත් සමහරවිට වතුර ගන්න තැන් නැහැ. වැව්වල වතුර නැහැ. මේ ළඟදී පොඩි වර්ෂාවක් ලැබුණාට වැව්වලට තවම වතුර ඇවිල්ලා නැහැ; ළිංවලට වතුර ඇවිල්ලා නැහැ. සමහර අය කියනවා, කුඩා දරුවෙක් නාවා ගන්න වතුර ටිකක් නැහැයි කියලා. මේක ඒ තරමම තද නියඟයක්. මෑත ඉතිහාසය තුළ ඇති වුණු තදම නියඟය මේ දිස්ත්‍රික්ක කිහිපයට ඇති වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂ කාර්ය සාධන බළකායක් හෝ හදලා රජය හැටියට තමුන්නාන්සේලා මේ සඳහා දැඩි අවධානය යොමු කරන්න ඕනෑ. එහෙම නැතිව, ඒ පළාත්වල මිනිස්සු නියඟයට හසුවෙලා ඉන්න කොට මෙහේ ඉඳගෙන වෙනත් කතන්දර කියලා හරියන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔව්, බයිලා ගහලා වැඩක් නැහැ. තමුන්නාන්සේලා දෙන සොච්චමවත් ඒ සියලු දෙනාටම ලැබෙන්නේ නැහැ නේ. ඒ නිසා මේ ගැන හරියට බලන්න ඕනෑ. ග්‍රාම නිලධාරි මහත්වරු සහනාධාර ලබන අය තෝරන කොට අවශ්‍ය අය තෝරලා නැහැ. ඒ වාගේම, වකුගඩු රෝගය තිබෙන අයට විශේෂයෙන් සලකන්න ඕනෑ. පවුලේ කෙනෙක් ඇඟලුම් කර්මාන්තශාලාවල රක්ෂාවට ගියාය කියලා ඒකෙන් ජීවත් වෙන්න බැහැ නේ. ඒවා ගොවිතැන් කරන ප්‍රදේශ; කෘෂිකාර්මික ප්‍රදේශ. ඒ අය කාටවත් අතපාලා ජීවත් වුණු අය නොවෙයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මට තව මිනිත්තුවක් දෙන්න.

විශේෂයෙන්ම නියඟයට හසුවෙලා තිබෙන්නේ කෘෂිකාර්මික ප්‍රදේශ. ඒ ප්‍රදේශවල ජනතාව තමයි රටටම ආහාර සපයන්නේ. ඒ අය දුර්වල වුණොත්, මානසික වශයෙන් ඒ අයගේ ශක්තිය බිඳ වැටුණොත් ඒක රටටම බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා විශේෂයෙන්ම අපි ඒ අයට සහන දෙන්න, සහනාධාර ලබා දෙන්න ඉදිරි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. සති දෙකකට රුපියල් 2,500ක බඩු දෙනවාය කියලා රුපියල් 1,600ක බඩු දීලා හරියන්නේ නැහැ. ඒකෙන් ජීවත් වෙන්න බැහැ. ඒ දෙන භාණ්ඩ ටික දිහා බැලුවාම එක දවසක් ජීවත් වෙන්නත් බැහැ. දැන් පවුලකට ජීවත් වෙන්න යන වියදම තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා රජයක් හැටියට මේ පිළිබඳව සොයලා බලලා, ඒ අවශ්‍ය සහන ලබා දීලා, ඒ ගොවි ජනතාව මේ පීඩාවෙන් මුදා ගන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.13]

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නියඟය සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී උතුරු මැද පළාත නියෝජනය කරන මහජන නියෝජිතවරියක් හැටියට, රටේ සමස්ත ජනතාව වෙනුවෙන්, විශේෂයෙන්ම අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේ රජය පැත්තෙන් අපි මේ සඳහා ගෙන තිබෙන ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මට ප්‍රථම අපේ දිස්ත්‍රික්කයම නියෝජනය කරන ගරු එස්.එම්. චන්ද්‍රසේන මන්ත්‍රීතුමා කථා කළා. දැනට තිබෙන අඩු පාඩුකම් ගැනත් එතුමා කිව්වා. සහනාධාර දෙන්න තෝරාගෙන තිබෙන විධිය ගැනත් එතුමා කිව්වා. මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මොකද, පසුගිය කාලවල අපේ ජනතාවට වුණු අසාධාරණකම් අපට මතක නිසා. ඒ පිළිබඳව මම මේ අවස්ථාවේදී විවාදයකට යන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

සමස්තයක් හැටියට ගත්තාම දිස්ත්‍රික්ක කිහිපයක ජනතාවට අද මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. එම දිස්ත්‍රික්ක අතරින් අනුරාධපුර දිස්ත්‍රික්කයට නියඟය තදින්ම බලපාලා තිබෙනවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම, අපේ දිස්ත්‍රික්කයේ ලක්ෂ 9ක විතර ජනතාවක් ජීවත් වනවා. මෙහි ප්‍රධාන ගංගා තුනක් තිබෙනවා. වැව් ගත්තාම, විශාල වැව් 13ක් විතර තිබෙනවා. කුඩා වැව් 2,569කට ආසන්න

ප්‍රමාණයක් තිබෙනවා. නියඟය හේතුවෙන් ඒ සියලු තැන්වල ජල මූලාශ්‍ර සිඳී යාම තුළ අපේ ජනතාව අද ලොකු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඒ ජනතාව අතරින් 124,000ක විතර පිරිසක් තදින්ම ඒ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. මේ වෙනුවෙන් රජය හැටියට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ආරම්භ කර තිබෙනවාය කියා මතක් කරන්නට ඕනෑ. කොයිම රජයකටවත් සියයට සියයක් මේ සියලු දේවල් සම්පූර්ණ කරමින් කටයුතු කරන්න අමාරුයි කියලා මා හිතනවා. ඒ වුණත්, මේ අවස්ථාවේ ජනතාවගේ පැත්තෙන් සොයා බලා, අවශ්‍ය දේවල් ජනතාවට ලබා දීමේ කටයුතු මේ වන කොට අපි ආරම්භ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ජනතාව මුහුණ දී තිබෙන ජල ප්‍රශ්නය වෙනුවෙන්, ග්‍රාම නිලධාරි වසම් 126ක් සඳහා මේ වන කොට ලොරි, ට්‍රැක්ටර් බවුසර් මඟින් පානීය ජලය ලබා දීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. සමස්තයක් හැටියට ගත්තාම, අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක පවුල් 24,037කට පානීය ජලය ලබා දීමේ කටයුතු ආරම්භ කිරීමට හැකි වෙලා තිබෙනවා. පුද්ගලයන් වශයෙන් ගත්තාම, 80,441ක් වෙනුවෙන් මේ වන කොට එම කටයුතු ආරම්භ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වේලාවේදී තවත් කරුණක් මතක් කරන්නට ඕනෑ. වගා විනාශයට ලක් වුණු ගොවි ජනතාව වෙනුවෙන්, අමාත්‍යාංශ කිහිපයක් ඒක රාශි වෙමින් ගොවීන්ට වන්දි මුදල් ලබා දීමේ වැඩ පිළිවෙළක් මේ වන කොට අපි ආරම්භ කරලා තිබෙනවා. මෙහිදී විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, මේ ආකාරයෙන් වගා හානි වූ ගොවි පවුල් 30,805කට මේ වන කොට වන්දි මුදල් ලබා දී තිබෙන බව. වගා කිරීමට නොහැකි වූ ගොවීන් 69,380කටත් මුදල් ලබා දී තිබෙනවා. ඒ වාගේම, උස් බිම් වගා කර හානි වූ ගොවීන් 15,295කට අවශ්‍ය වන්දි මුදල් ලබා දීමට කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන්ම, රජය හරහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන්, නියඟයට මුහුණ දුන් ජනතාවගේ පවුල් වෙත සහල් ලබා දීමේ වැඩ පිළිවෙළක් ද අපි ක්‍රියාත්මක කර තිබෙනවා. එතැනදීත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 ගත්තාම, ඒ හරහා සහල් මිටි 58,116ක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව, පවුල් 56,222කට මේ ප්‍රතිලාභය ලබා දීමට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝක ආහාර වැඩසටහන යටතේ රුපියල් මිලියන 20ක මුලා ප්‍රතිපාදන හරහා, පදවිය, මහවිලච්චිය, පලාගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ආධාර ලබා දීමේ වැඩසටහන් මේ වන කොට ආරම්භ කර ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

මේ නියං ප්‍රශ්නය හේතු කොට ගෙන එයට මුහුණ දුන් පවුල් වෙනුවෙන් පවා සහනාධාර ලබා දීමේ කටයුතු අප ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, සමස්තයක් හැටියට පවුල් 157,503කට වියළි සහනාධාර ලබා දෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඊයේත් ගල්නෑව ප්‍රදේශයෙන් මට කථා කරලා කිව්වා, ඒ සහනාධාරවල යම් යම් අඩු පාඩුකම් තිබෙනවාය කියලා.

ඒ අවස්ථාවේදී අපි දිසාපතිතුමාට කථා කරලා ඒ තත්ත්වය නිවැරදි කරන්න කියා දැනුම් දුන්නා. ඒ වෙනුවෙන් අප අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. දේශගුණික වාගේම කාලගුණික විපර්යාසයන්ට අප මුහුණ දුන්නේ අද-ඊයේ සිට නොවන බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මෑතකදී ගංවතුර සහ නායයෑම් ගණනාවකට මුහුණ දෙන්න අපට සිදු වුණා. මම හිතන විදියට මේ තත්ත්වය සෑම වර්ෂයක් පාසාම අප අත් විඳපු දෙයක්. වර්තමාන රජය ඒ වෙනුවෙන් ක්ෂණිකව ක්‍රියා මාර්ග ගැනීම සතුටට කරුණක් බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මොකද, නියඟය ආරම්භ වූ අවස්ථාවේ සිටම අතිගරු ජනාධිපතිතුමාත්,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார)
(The Hon. (Mrs.) Chandrani Bandara)
හොඳයි. මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නියඟය ආරම්භ වූ අවස්ථාවේ සිටම අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් අදාළ විෂය භාර අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය සමඟ සාකච්ඡා කරලා ඒ වෙනුවෙන් ක්ෂණිකව වැඩ කටයුතු ආරම්භ කිරීමට පියවර ගත්තා. ඒ තුළින් ඉදිරියේදී මේ පානීය ජල ප්‍රශ්නය අවම කර ගන්න හැකි වෙයි කියා බලාපොරොත්තු වෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ අවසන් කරගන්න බැරි වුණු මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් කටයුතු මේ වනකොට අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම මත ආරම්භ කරලා තිබෙනවා. ඒ හරහා ඉදිරියේදී අපේ දිස්ත්‍රික්කවල ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳා ගැනීමට හැකි වෙයි කියලා බලාපොරොත්තු වනවා. මොරගහකන්ද ජලාශය ඉදිකිරීමේ වැඩ කටයුතු දැන් අවසන් වෙමින් තිබෙනවා. මොරගහකන්ද ජලාශය හරහා ජලය ලැබෙන කොට පානීය ජල ප්‍රශ්නයට විසඳුම් ලැබෙනවා.

ඒ වාගේම මල්වතුඔය ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතියත් අද හෙටම ආරම්භ කරන්න අවශ්‍ය සියලු කටයුතු දැන් සූදානම් කර තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයට බලපාන පානීය ජල ප්‍රශ්නයට මේ කෙටි කාලය තුළදී ක්ෂණිකව විසඳුම් ලබා දීමට පුළුවන් වීම ගැන මා විශේෂයෙන්ම සතුටු වනවා. වර්තමාන රජය මේ කෙටි කාලය තුළදී අනවශ්‍ය වියදම් නතර කරලා, විශාල වැඩ කොටසක් කර තිබෙනවා කියන කාරණයත් මා මතක් කරන්න කැමැතියි. මේ වෙනුවෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත් වුණා. තවත් හොඳ යෝජනා ඉදිරිපත් කරමින් ඉදිරියේදී අපේ ගොවි ජනතාවගේ ජීවිත සාර්ථක කර ගැනීමට, ආරක්ෂා කර ගැනීමට වාගේම ඔවුන් ශක්තිමත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළවල් කරන්න හැකි වේවි කියලා අප විශ්වාස කරනවා. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.22]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மக்கள் விடுதலை முன்னணியின் தலைவரும் பாராளுமன்ற உறுப்பினருமான அநுரகுமார திஸாநாயக்க அவர்கள் எங்களுடைய நாட்டு மக்கள் இன்று எதிர்நோக்குகின்ற வரட்சி சம்பந்தமான ஓர் ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்தமைக்காக அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நாட்டில் பலரின்மீதும் பலவிதமான ஊழல் குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டு வருகின்றது. இவ்வேளையில், ஒருசில மாவட்டங்களைத் தவிர அநேகமான மாவட்டங்களில் வரட்சியின் நிமித்தம் மக்கள் தங்களுடைய விவசாயத்தை இழந்து பசியுடன் வாழ்ந்துவருகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, வரட்சியால் வாடுகின்ற இந்த மக்களுக்கு உடனடி நிவாரணம் வழங்கும் முகமாக, இந்த

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

அமர்வின் பின்னர் அரசாங்கம் முக்கிய முடிவுகளை எடுத்து, அந்த மக்களுக்கு நன்மை பயக்கும் விதத்தில் வழிவகை செய்ய வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வன்னி தேர்தல் மாவட்டத்தில் அடங்குகின்ற மூன்று மாவட்டங்களிலும் இன்று வரட்சி நிலைமை காணப்படுகின்றது. இதனால் அங்கு விவசாயிகள் மற்றும் நன்னீர் மீன்பிடி மீனவர்கள் உட்பட, பல குடும்பங்களைச் சார்ந்த மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அந்த வகையில் இந்த வரட்சியால் மன்னார் மாவட்டத்தில் 23,207 குடும்பங்களைக் கொண்ட 81,451 அங்கத்தவர்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; முல்லைத்தீவு மாவட்டத்தில் 35,730 குடும்பங்களைச் சேர்ந்த 1,15,308 பேர் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இது 2016ஆம் ஆண்டினதும் 2017ஆம் ஆண்டினதும் கணக்கீடாகும். அதேபோல் வவுனியா மாவட்டத்தில் 28,612 குடும்பங்களைச் சார்ந்த 1,01,914 பேர் இந்த வரட்சியால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். உண்மையில் இந்த வரட்சி என்பது எங்களுடைய விவசாயிகள் எதிர்பாராத விதமாக எதிர்நோக்கிய முக்கிய பிரச்சினை என்பதால், ஒவ்வொரு விவசாயியையும் ஒவ்வொரு மனிதனையும் இந்த வரட்சியிலிருந்து காப்பாற்ற வேண்டியது அரசாங்கத்தினுடைய பொறுப்பும் கடமையுமாகும். அந்த வகையில் உடனடியாக இவர்களுக்கு வரட்சி நிவாரணங்கள் வழங்கப்பட வேண்டும்.

மேதகு ஜனாதிபதி அவர்கள் குறிப்பிட்ட ஒரு விடயம் தொடர்பில் கௌரவ அநுரகுமார திஸாநாயக்க அவர்கள் இங்கு தெரிவித்தார். அந்த விடயமானது, விவசாயிகளுக்கு வரட்சி நிவாரணமாக 10,000 ரூபாய் வீதம் நான்கு மாதங்களுக்கு வழங்கப்படும் என்பதாகும். ஆனால், விவசாயி ஒருவருக்கு வரட்சி நிவாரணமாக 8,650 ரூபாயாகக் குறைத்து, அதுவும் ஒரு மாதம் மட்டுமே வழங்கப்பட்டிருக்கின்றது. மிகுதி மூன்று மாதங்களும் வழங்கப்படவில்லை. அதேநேரம், இந்த 10,000 ரூபாய், பின்னர் எப்படி 8,650 ரூபாயானது? என்பது கேள்விக்குறியாக இருக்கின்றது. அதேநேரத்தில், "10,000 ரூபாய் வரட்சி நிவாரணம்" என்று அறிவிக்கப்பட்ட பின்பு எப்படி 8,650 ரூபாய் கொடுக்கப்பட்டது? என்பதும் கேள்விக்குறியாகத்தான் இருக்கின்றது. அதாவது, ஒரு விவசாயக் குடும்பத்துக்கு 1,350 ரூபாய் வீதம் குறைத்துத்தான் கொடுப்பனவுகள் கொடுக்கப்பட்டுள்ளன. அவர்களுக்கு 8,650 ரூபாய்தான் கொடுக்கலாம் என்று தீர்மானித்துக் கொடுத்திருந்தால் பரவாயில்லை. ஆனால், இந்த நாட்டினுடைய அதிபர் விவசாயிகளுக்கு நிவாரணமாக 10,000 ரூபாய் வழங்கப்படும் என்றும் அதுவும் தொடர்ந்து 4 மாதங்களுக்கு வழங்கப்படும் என்றும் மக்களுக்கு உறுதிமொழி வழங்கியிருந்தார். அந்தவகையில், மிகுதி 3 மாத நிவாரணங்களும் விவசாயிகளுக்கு இன்னமும் கிடைக் கப்பெறவில்லை.

ஆனால், தற்பொழுது உள்நாட்டலுவல்கள் அமைச்சால் 2 வாரங்களுக்கு 2,500 ரூபாய் வீதம் வரட்சி நிவாரணம் வழங்கப்படுகின்றது. உண்மையில் 2 வாரங்களுக்கு 2,500 ரூபாய் என்பது மிகவும் சிறிய தொகையாகத்தான் காணப்படுகின்றது. ஏனென்றால், ஒரு நாளைக்கு ஒரு விவசாயி அல்லது ஒரு கூலித்தொழிலாளி 1,500 ரூபாய் முதல் 2,000 ரூபாய் வரை சம்பளம் பெற்றால்தான் அவருடைய குடும்பத்தின் சாதாரண செலவுகளைச் சமாளிக்கமுடியும். அந்தவகையில், 2 வாரங்களுக்கு 2,500 ரூபாய் என்பது மிகவும் சொற்ப தொகையாகத்தான் இருக்கின்றது. அது அவர்களுக்குப் போதாமலிருக்கின்றது. எனவே, அந்தத் தொகையைத் தயவுசெய்து அதிகரித்துக் கொடுக்கவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன். அதேநேரத்தில், நான் நினைக்கின்றேன், 2 வாரத்தில் 2,500 ரூபாய் பெறுகின்ற அந்த மக்கள் அந்தப் பிரதேசத்தின் அதிகாரிகளால் 4-5 நாட்கள் சிரமதானப் பணிக்கு அழைக்கப்படுகின்றார்கள் என்று. அவர்கள் தங்களுடைய குடும்ப வேலைகளை அல்லது அவர்கள் செய்யவேண்டிய வேலைகளை விட்டுவிட்டு அந்த 4 -5 நாட்களும் அங்கு சென்று ஒரு நாளைக்கு 3 அல்லது 4 மணித்தியாலங்கள் இந்த வேலையைச் செய்வதில் மிகவும் சிரமப்படுகின்றார்கள். உண்மையில் 2,500 ரூபாய் கொடுத்துவிட்டு அவர்களை 4-5 நாட்கள் வேலைக்கு அழைப்பது ஏற்றுக்கொள்ள முடியாத விடயம்.

நேற்று மன்னார் மாவட்டத்திலிருந்து தாயொருவர் என்னைத் தொலைபேசிமூலம் தொடர்புகொண்டு, கிராமசேவகர் தன்னை வேலைக்கு அழைக்கின்றார் என்று கூறியதோடு, தனது கணவனுக்குச் சுகவீனம் என்றும் தனக்கு 3 பிள்ளைகள் இருக்கின்றார்கள் என்றும் தான் எவ்வாறு தனது 3 பிள்ளைகளையும் விட்டுவிட்டு அங்கு சென்று வேலை செய்வதென்றும் கேட்டார். நான் அந்தப் பிரதேசத்திற்குரிய பிரதேச செயலாளரைத் தொடர்புகொண்டு கேட்டபோது, தங்களுக்கு உள்நாட்டலுவல்கள் அமைச் சிலிருந்து வந்த எழுத்துமூல அறிவிப்பில் அந்த விடயம் குறிப்பிடப்பட்டிருக்கின்றபடியினால், அதனைமீறித் தங்களால் எந்தவித நடவடிக்கையும் செய்ய முடியாது என்றும் அது அமைச்சினுடைய உத்தரவு என்றும் அவர் குறிப்பிட்டிருந்தார். எனவே, உள்நாட்டலுவல்கள் அமைச்சர் தற்போது இந்தச் சபையில் இல்லாவிட்டாலும் அவர் இதைக் கருத்திலெடுக்க வேண்டும். அவர்களை 4-5 நாட்கள் வேலைக்கு அழைப்பது என்பது ஏற்றுக்கொள்ள முடியாத விடயம். ஆகவே, அதனையும் பரிசீலித்து அவர்களுக்கு வழங்கப்படும் தொகையையும் அதிகரித்துக் கொடுக்கவேண்டும். அத்துடன், அந்த மக்களை அழைத்து வேலை செய்விப்பது, நடைமுறையில் அவர்களை மிகவும் சிரமத்துக்குள்ளாக் குகின்ற விடயம் என்பதால், அதையும் பரிசீலனை செய்யும்படி கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரத்தில், மன்னார் மாவட்டத்திலுள்ள விவசாயிகள் நீர் பற்றாக்குறையால் தங்களுடைய வாழ்வாதாரத்தை ஈட்டிக்கொள்ள முடியாது தவிக்கின்றார்கள். நான் நினைக்கின்றேன், ஒவ்வொரு வருடமும் விவசாயிகளுக்குக் கொடுப்பதற்காக கிட்டத்தட்ட 250 ஏக்கர் நிலங்களில் விதைநெல் இடுவது வழமை. அந்த விதைநெல்லை விளைவிப்பதற்குக்கூட அங்கு நீர்ப் பற்றாக்குறை காணப்படுகின்றது. இப்படியான சூழ்நிலையில், எங்களுடைய மாவட்டத்தில் இருக்கின்ற மக்கள் ஒவ்வொரு நிமிடமும் எப்போது மழை பெய்யும்?எப்போது இந்த அரசாங்கம் வரட்சி நிவாரணம் வழங்கும்? என்று ஏங்கியவண்ணம் இருக்கிறார்கள். இதனை இந்த அரசாங்கம் கவனத்தில் எடுக்கவேண்டும்.

மன்னார் மாவட்டத்தில் விவசாயிகள் மட்டுமல்ல, நன்னீர் மீன்பிடி மீனவர்கள்கூட இவ்வாறு பாதிக்கப்பட்டிருக் கிறார்கள். அங்கு 14 நன்னீர் மீன்பிடிச் சங்கங்கள் இருக்கின்றன. இம்மீனவர்கள் சிறிய குளங்களில் அல்லது கட்டுக்கரைக்குளத்தில்தான் மீன்களைப் பிடிப்பது வழமை. தற்பொழுது அங்கு நீரும் இல்லை, மீனும் இல்லை. இப்படியான சூழ்நிலையில் அந்த மீனவர்கள் எப்படித் தங்களுடைய குடும்பங்களைக் கொண்டுநடத்துவது? தற்பொழுது, மன்னார் மாவட்டத்தில் மட்டும் 14 சங்கங்களைச் சேர்ந்த 764 மீனவர்கள் இருக்கிறார்கள். அதேபோன்று

முத்தையன்கட்டுக் குளத்தில் மீன்பிடிக்கின்ற நன்னீர் மீன்பிடி மீனவர்களும் பாரிய சிரமங்களுக்கு உள்ளாகியிருக்கிறார்கள். ஆகவே, இந்த நன்னீர் மீன்பிடி மீனவர்களுக்கும் வரட்சி நிவாரணங்கள் வழங்கப்பட வேண்டும். ஏனென்றால், அந்தக் குளங்களில், நீர்த்தேக்கங்களில் நீர் இல்லாத காரணத்தினால், அதிலுள்ள மீனினங்கள் முற்றுமுழுதாக அழிந்துவிட்டன. எனவே, அவர்கள் தங்களுடைய வாழ்க்கையைக் கொண் டுநடத்துவதற்கு வரட்சி நிவாரணங்கள் கிடைக்கப்பெற வேண்டும். எதிர்காலத்தில் அவர்களுக்கு நவீன வசதிகளைக் கொண்ட மீன்பிடி உபகரணங்களை -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
தயவுசெய்து இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

நவீன வசதிகளைக்கொண்ட மீன்பிடி உபகரணங்களை அவர்களுக்கு வழங்கவேண்டுமென்று கேட்டுக்கொள் கின்றேன். அதேநேரத்தில், கால்நடைகளும் குடிப்பதற்கு நீர் இல்லாமல் மிகவும் சிரமப்படுகின்றன. கால்நடை வளர்ப்பின்மூலமும் தங்களுடைய வாழ்க்கையைக் கொண்டு நடத்துகின்றவர்கள் பலர் இருக்கின்றனர். ஒவ்வொரு கால்நடைக்கும் ஜீவன் இருக்கிறது. அந்த ஜீவன் நீர் இல்லாமல் அலைந்து திரிந்ததை நான் என்னுடைய கண்களால் கண்டேன். ஆகவே, இந்தக் கால்நடைகளுக்கு குடிப்பதற்கு நீரை வழங்குவதற்குரிய ஒழுங்குகளையும் இந்த அரசாங்கம் செய்யவேண்டும்.

அதேநேரத்தில், நான் இன்னுமொரு விடயத்தையும் இங்கு குறிப்பிடவேண்டும். இன்று எனக்குப் பேசுவதற்கான சந்தர்ப்பம் இதற்கு முன்னர் வழங்கப்பட்டிருக்க வேண்டும். ஆனால், கௌரவ பிரதிச் சபாநாயகர் அவர்கள் எனக்கு அந்தச் சந்தர்ப்பத்தைத் தரவில்லை என்பதையும் தெரிவித்துக் கொண்டு, வாய்ப்புக்கு நன்றிகூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 3.35]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළාත් කිහිපයක පවතින දැඩි නියඟ තත්ත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ විවාදයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය භාරව සිටින අමාත්‍යවරයා වශයෙන් මට වගකීමක් තිබෙනවා, පානීය ජලය සම්බන්ධයෙන් එක් එක් පළාත්වල සිදු කර තිබෙන වැඩ පිළිවෙළ පිළිබඳව සඳහන් කරන්නට. මේ නියඟ තත්ත්වය සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් තමන්ගේ කාලය කැප කරලා වෙහෙස මහන්සිවෙලා, කැපවීමෙන් වැඩ කිරීම සම්බන්ධයෙන් මුලින්ම මාගේ ස්තුතිය පුද කර සිටිනවා. ඒ සමඟම විශේෂයෙන්ම උතුරු මැද, උතුර, වයඹ, ඌව, දකුණ යන පළාත්වල මේ ප්‍රශ්නය උග්‍ර ලෙස පවතින බැවින් ජල පාරිභෝගිකයන්ගේ පානීය ජල අවශ්‍යතා සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා අපි සෑම පියවරක්ම අරගෙන තිබෙනවා. කෙසේ නමුත් මම කියා සිටිය යුතුයි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව හා මහව ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රමාණවත් ධාරිතාවක් නොමැති වීම නිසා දිනක් හැර දිනක් බවුසර් මඟින් ජලය සැපයීමට කටයුතු කර තිබෙන බව. සමස්තයක් වශයෙන් සාමාන්‍ය පරිදි පාරිභෝගික ජල අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය පහසුකම් අපි පවත්වාගෙන යන බවත් මම කියා සිටිය යුතුයි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එක් එක් ප්‍රදේශවල ජනතාවට ජල ටැංකි යොදා බවුසර් මඟින් පානීය ජලය සැපයීමට කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව දැනට නියඟය බල පැවැත්වෙන ප්‍රදේශවල ජල ටැංකි 340ක් රඳවා බවුසර් 38ක් මඟින් ඒවාට ජලය බෙදා හැරීමේ කටයුතු අපි කරලා තිබෙනවා. නැඟෙනහිර පළාතට බවුසර් 7ක්, උතුරු පළාතට බවුසර් 10ක්, වයඹ පළාතට බවුසර් 3ක්, දකුණු පළාතට බවුසර් 7ක්, ඌව පළාතට බවුසර් 5ක්, උතුරු මැද පළාතට බවුසර් 6ක් වශයෙන් අපි බවුසර් සැපයීමේ කටයුතු කරලා තිබෙනවා.

ඊට අමතරව අපි දකිනවා, අනෙකුත් අමාත්‍යාංශවලින්, විශේෂයෙන්ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහාත් අපට මේ වැඩ කටයුත්ත සඳහා සහාය ලබාදීලා තිබෙනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන, දිවුලපිටිය වැනි ප්‍රදේශ සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ලබා දුන් ට්‍රැක්ටර් බවුසර් දෙකකින් සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ බවුසර් දෙකකින් පානීය ජලය සැපයීමට කටයුතු කරන බවත් මා කියා සිටිය යුතුයි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අක්‍රියව ඇති නළ ළිං, අත් පොම්ප සියල්ල කල් වේලා ඇතිව පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කර තිබෙන අතර, ඒ අනුව අත් පොම්ප 1,469ක් පුනරුත්ථාපනය කර තිබෙන බවත් මම සඳහන් කරන්නට ඕනෑ. එම වැඩ පිළිවෙළ යටතේ නියඟය බල පැවැත්වෙන ප්‍රදේශවල නිෂ්පාදන ළිං 270ක් අලුතෙන් ඉදි කර ඇති අතර, පැරණි ළිං 717ක් ශුද්ධ පවිත්‍ර කර බීමට සුදුසු පරිදි අලුත්වැඩියා කර තිබෙන බවත් මම සඳහන් කළ යුතුයි. මීට අමතරව ලීටර 1,000 ධාරිතාවකින් යුතු ජල ටැංකි 1,225ක් UNICEF එක හා ඒකාබද්ධව දිස්ත්‍රික්ක 15ක් තුළ බෙදා හැරලා තිබෙනවා.

පසුගිය සඳුදා ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ගත් තීරණයක් පරිදි බවුසර් මඟින් පානීය ජලය බෙදා හැරීමේ කටයුතු දිවා කාලයට සීමා නොවී අවශ්‍යතා අනුව රාත්‍රී කාලයේද සැපයීමට සූදානම් කරලා, ඒ කටයුතු කර ගෙන යනවා.

මීට අමතරව ප්‍රාදේශීය ලේකම්වරුන් හා ත්‍රිවිධ හමුදාව ප්‍රාදේශීය සභා මඟින් ජල සැපයීම කරගෙන යන අතර, ඒ සඳහා අවශ්‍ය ජලය ජල පවිත්‍රාගාර මඟින් නොමිලේ සැපයීමට අප කටයුතු කර තිබෙනවා.

වකුගඩු රෝගය නිවාරණය පිණිස පානීය ජල පහසුකම් සැපයීම සඳහා වවුනියාව, මුලතිව්, පොළොන්නරුව, අනුරාධපුරය, අම්පාර, පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්කවලට ප්‍රති ආශ්‍රැතික ජල පෙරණ යන්ත්‍ර 69ක් ලබා දෙන්න අප කටයුතු කරගෙන යනවා. නියඟය හේතුවෙන් පානීය ජල ගැටලුවට මුහුණ පා සිටින මේ වාගේ ප්‍රදේශවල ජනතාවට අපට පුළුවන් ආකාරයට උපරිම දායකත්වය ලබා දෙන බව මා ඔබතුමාට සඳහන් කරන්න

[ගරු රවුෆ් හකීම් මහතා]

කැමතියි. ඒ සමඟම අප මෑත කාලයේදී මුහුණ දුන් විශාලම ප්‍රශ්නයක් තමයි, උමා ඔය ව්‍යාපෘතිය සමඟ -උමඟ සෑදීමත් එක්ක- ඇති වුණු ව්‍යාකූල තත්ත්වය. නාය යෑම්, ගෙවල් අනතුරට ලක් වීම් වාගේම ළිං සිඳී යෑමේ විශාල අනතුරක් විශේෂයෙන්ම බණ්ඩාරවෙල වාගේ නගර ආශ්‍රිත නොයෙකුත් ප්‍රදේශවල සිදු වෙලා තිබෙනවා. උමා ඔය ව්‍යාපෘතිය සමඟ ඇති වුණු ආපදාවට මුහුණ දීම සඳහා අප අමාත්‍යාංශයට අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයක් පරිදි රුපියල් මිලියන 250ක විතර මුදලක් භාණ්ඩාගාරයෙන් ලබා දුන්නා.

ඒ තුළින් ඒ පළාතේ ජනතාවට නොමිලේ ජල සම්බන්ධතා ලබා දීමේ කටයුතු කර ගෙන යන බවත්, ඒකෙන් සෑහෙන කොටසක් දැන් අපි නිම කර තිබෙන බවත් මා සඳහන් කළ යුතුයි. වයඹ පළාත පමණක් නොව බස්නාහිර පළාත, දකුණු පළාත වාගේ පළාත්වලත් මින් ඉදිරියට ජල වුවමනාවන් සඳහාම ආවේණික වූ ජලාශ ඇති කිරීමේ අවශ්‍යතාව පැන නැඟී තිබෙන බවත් මා මතක් කළ යුතුයි. ගංවතුර ගලා යෑම නිසා දකුණු පළාතේ නිල්වලා ගඟ, මැණික් ගඟ වැනි ඒ ගංගා නිම්නයන් විශාල ලෙස හානියට පත් වන අවස්ථා අප දැක තිබෙනවා. එබැවින්, ඒ සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මෙහිදී අවශ්‍ය පරිදි ජලාශ ඉදි කරලා ඒ තුළින් හම්බන්තොට දිස්ත්‍රික්කයට පවා ඒ ජලය හරවා දිය හැකියි කියන කරුණත් මා මතක් කළ යුතුයි. ඒ පිළිබඳව අපේ රජය මුළුමනින්ම අවධානය යොමු කර ඒ සඳහා වූ ශක්‍යතා වාර්තා සකස් කර ගෙන "ගිං - නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය" කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අපි ඉදිරිපත් වී සිටින බවත් මේ අවස්ථාවේදී මා කිව යුතුයි. ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට මුදල් ලබා ගැනීම සඳහා අතිගරු අග්‍රාමාත්‍යතුමන් විශේෂයෙන් තමන්ගේ අවධානය යොමු කර තිබෙන බවත් මා කියා සිටිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ඊට වඩා කරුණු කියන්න තිබුණත්, කාල වේලාව මදි නිසා විශේෂයෙන්ම පානීය ජල ගැටලුව සම්බන්ධයෙන් නියඟ කාල සීමාව තුළදී අපේ අමාත්‍යාංශය ඉටු කරපු වැඩ පිළිවෙළ පිළිබඳව කෙටියෙන් හෝ පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව සමාප්ත කරනවා. ස්තුතියි.

[பி.ப. 3.43]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையில் முக்கிய பேசுபொருளாக இருக்கின்ற வரட்சி பற்றிய விடயத்தில் சில அம்சங்களைக் குறிப்பிடலாம் என்று நினைக்கின்றேன். அந்த வகையில், மக்களுக்கு மிகவும் அத்தியாவசிய தேவைப் பொருளாக இருப்பது குடிநீர். குடிநீர் இல்லாத இடங்களில் மக்கள் பல்வேறுபட்ட நரக வேதனைகளை அனுபவித்துக்கொண்டிருக்கிறார்கள். இன்று நாட்டில் குறிப்பிடத்தக்க சில பிரதேசங்களில், இன்னும் குறிப்பாகச் சொல்லப்போனால் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள பல பிரதேசங்களில், வரட்சி நிலை அதிகமாகக் காணப்படுகின்றது. இந்த வரட்சியின் காரணமாக மக்கள் குடிநீரைப் பெறுவதில் பல்வேறுபட்ட சிரமங்களை அனுபவித்து வருகின்றார்கள். இந்த நிலையில், வரட்சியினால் பாதிக்கப்படுகின்ற பிரதேசங்கள் என்று அடையாளப்படுத்தப்பட்ட பகுதிகளை மையமாகக்கொண்டு ஒரு முன்மொழிவினை, சிரேஷ்ட அமைச்சரான கௌரவ றவூப் ஹக்கீம் அவர்களிடம் நான் கொடுத்திருக்கிறேன். அதாவது, மட்டக்களப்பு மாவட்டத்தில் உன்னிச்சை என்னும் பிரதான குளமொன்று காணப்படுகின்றது. இந்தக் குளத்திலிருந்து நீர் சுத்திகரிப்புச் செய்யப்பட்டு, 50-60 கிலோமீற்றருக்கு அப்பாற்பட்ட பிரதேசங்களுக்கு எல்லாம் குடிநீர் விநியோகம் செய்யப்படுகின்றது. நாங்கள் அதனைப் பாராட்டுகின்றோம். ஆனால், மிகவும் குறைபாடான விடயமொன்று இருக்கின்றது. அதாவது, உன்னிச்சைக் குளத்திலிருந்து வெளிப்படுகின்ற குடிநீரானது, உன்னிச்சைக் கிராமத்துக்குக்கூட கிடைக்கப்பெறாத ஒரு நிலைமை காணப்படுகின்றது. குறிப்பாக, உன்னிச்சை, ஆயித்தியமலை, நெல்லூர், மணிபுரம், கரடியனாறு, வரப்பாலம், இலுப்படிச்சேனை, மகிழவெட்டுவான் போன்ற கிராமங்களிலுள்ள மக்கள் குடிநீர் இல்லாமல் திண்டாடிக்கொண்டிருக்கிறார்கள். எனவே, உங்களிடம் மிகவும் விநயமாக -

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் அவர்களின் அனுமதியுடன் எனது கருத்தைத் தெரிவிக்க விரும்புகின்றேன். உன்னிச்சைக் குளத்தைச் சூழ இருக்கின்ற கரடியனாறு போன்ற பிரதேசங்களுக்கு, அதாவது நீங்கள் குறிப்பிட்ட அந்தப் பிரதேசங்களுக்கு இந்த உன்னிச்சைக் குளத்திலிருந்து குடிநீர் வழங்காமல், தூர இடங்களுக்கு அதாவது வாழைச்சேனை போன்ற பிரதேசங்களுக்குக் குடிநீரைக் கொண்டுசெல்கின்ற நோக்கம் எங்களுடைய அமைச்சுக்குக் கிடையாது என்பதை நான் தெளிவுபடுத்த விரும்புகின்றேன். அண்மையிலே இது சம்பந்தமாக ஒரு கலந்துரையாடல் நடைபெற்றபோது, உன்னிச்சைக் குளத்தைச் சூழ இருக்கின்ற, அதாவது நீங்கள் குறிப்பிட்ட எல்லாக் கிராமங்களுக்கும் குடிநீர் வழங்கும் வகையில் இந்த நீர் விநியோகத் தொகுதியை மாற்றியமைப்பதற்கான அனைத்து ஏற்பாடுகளையும் நாங்கள் செய்துவருகின்றோம். மிக விரைவில் அதற்கான கடனுதவியைப் பெற்று, இந்த வருடப் பிற்பகுதியில், இல்லையென்றால் அடுத்த வருட முற்பகுதியில் நாங்கள் அந்த வாழைச்சேனைக் குடிநீர்த் திட்டத்தை ஆரம்பிப்போம். ஆனால், வாழைச்சேனையிலிருந்து பாசிக்குடா வரையுள்ள பிரதேசங்களுக்கு நீரைக் கொண்டுசெல்ல முயற்சிக்கின்ற அதேவேளையில், உன்னிச்சைக்குளத்தைச் சூழ இருக்கின்ற எல்லாப் பகுதிகளுக்கும் குடிநீரைக் கொண்டுசெல்வதற்கான முயற்சியை நாங்கள் கைவிடவில்லை. நிச்சயமாக அதைச் செய்வோம் என நான் இங்கு வாக்குறுதியளிக்கின்றேன்.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ அமைச்சர் அவர்களே, நன்றி! குறிப்பாக, நான் சொல்கின்ற விடயம் என்னவென்றால், யுத்தம் இடம்பெற்ற காலத்தில் உன்னிச்சை சார்ந்த பிரதேசம் விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டில் இருந்தது. யுத்தத்தின் பின்னர் அங்கு வடிவமைத்திருந்த நீர்த்தாங்கியை ஆயித்திய மலையில் அமைத்திருந்தால், அங்கிருந்து நான் குறிப்பிடுகின்ற இடங்களுக்கெல்லாம் நீர் சுத்திகரிப்புச் செய்து கொண்டுசெல்வது இலகுவாக இருந்திருக்கும். ஆனால், அந்தக் காலத்தில் விடப்பட்ட ஒரு தவறு என்னவென்றால், உன்னிச்சைக் குளத்திலிருந்து ஏறத்தாழ 15 - 20 கிலோமீற்றர் தூரத்தில் அதாவது நகருக்கு அண்டியிருக்கின்ற ஒரு பிரதேசத்தில் நீர் சுத்திகரிப்புப் பிரதான நிலையத்தை அமைத்திருக்கின்றார்கள். அது நடைபெற்றது உங்களுடைய காலத்திலென்று நான் சொல்லவில்லை. அவ்வாறு அமைத்ததன் காரணமாக வவுணதீவு என்ற இடத்திலிருந்து நீர் நகரப் பகுதிகளை அண்டிய பகுதிகளுக்குக் கொண்டுசெல்

லப்படுகின்றது. ஆனால், உன்னிச்சை சார்ந்த இடங்களுக்கு நீர் வழங்காதது அந்த மக்களுக்கு மிகவும் ஒரு வேதனையான விடயமாக இருக்கின்றது.

இந்த விடயம் சம்பந்தமாக நான் அடிக்கடி சுட்டிக்காட்டியிருக்கின்றேன். மட்டக்களப்பு மாவட்ட நீர் வழங்கல் வடிகாலமைப்புச் சபைப் பிராந்திய முகாமையாளர் பிரகாஷ் அவர்களினால் தயாரிக்கப்பட்ட 330 மில்லியன் ரூபாய் மதிப்பீடுகொண்ட proposal ஒன்றினை உங்களுடைய கையில் தந்திருக்கின்றேன். அங்குள்ள மக்கள் குடிநீரை எதிர்பார்த்துக்கொண்டிருக்கின்றார்கள். சிலவேளைகளில் சுத்தமான குடிநீர் இல்லாமல் அசுத்தமான குடிநீரை அருந்துவதன்மூலமாக அந்த மக்கள் பல்வேறுபட்ட வியாதிகளுக்கு உள்ளாகலாம். எனவே, 30 வருட காலம் யுத்தத்தின் கஷ்டங்களை முழுமையாக அனுபவித்த அந்த மக்களுக்கு நல்லாட்சியின்போது குடிநீரையாவது நாங்கள் வழங்குவதன்மூலமாக எங்கள்மீது அவர்கள் நம்பிக்கை கொள்வதற்கு வாய்ப்பிருக்கின்றது. இந்த நல்லாட்சி அரசு ஆரம்பிக்கப்பட்டு இரண்டரை வருடங்கள் கடந்திருக்கின்றன. மேதகு ஜனாதிபதி அவர்கள் ஆட்சியைப் பொறுப்பேற்று 3 வருடங்கள் கடந்திருக்கின்றன. இப்படியான நிலையில், அவர்கள் அந்தக் குடிநீரை எதிர்ப்பார்ப்பதென்பது எந்தவகையிலும் ஒரு தவறான விடயமாக இருக்கமுடியாது. எனவே, கௌரவ அமைச்சர் அவர்களே, இந்த ஆண்டுக்குள்ளே குடிநீர்த்தாங்கி நிலையத்தை ஆயித்தியமலையில் மிக விரைவாக அமைப்பதன்மூலமாக நான் குறிப்பிடுகின்ற பிரதேசங்களுக்கு இலகுவாகக் குடிநீரை வழங்கக்கூடிய வாய்ப்பிருக்கின்றது. ஆனால், வாழைச்சேனை சார்ந்த பகுதிகள் உன்னிச்சைக்குளத்திலிருந்து மிகத் தொலைவில் இருக்கின்றபடியால், அங்கு அதனை அமைக்கின்ற வாய்ப்பு குறைவாக இருக்கின்றது என்பதை இந்த இடத்தில் நான் சுட்டிக்காட்டுகின்றேன்.

இதேபோன்றுதான், வரட்சி நிலவுகின்ற நாட்டின் எல்லா இடங்களுக்கும் குடிநீரை வழங்கவேண்டிய தார்மீகப் பொறுப்பு குடிநீர் விநியோகம் சார்ந்த அமைச்சு, அனர்த்த நிவாரணம் சார்ந்த அமைச்சு மற்றும் மீள்குடியேற்ற அமைச்சு ஆகியவற்றுக்கும் உள்ளது. கௌரவ மீள்குடியேற்ற அமைச்சர் சுவாமிநாதன் ஐயா அவர்களிடமும் நான் இந்த விடயம் சம்பந்தமாக ஒரு proposal கொடுத்து, அது சம்பந்தமாகக் கதைத்துமிருக்கின்றேன். எனவே, இந்தக் குடிநீர் வழங்குகின்ற விடயத்தில் நீங்கள் கூடுதலான கவனமெடுத்து, அந்த மக்களின் தவிப்பைத் தீர்த்து வைப்பீர்கள் என்ற நம்பிக்கை எங்களுக்கிருக்கின்றது. எதிர்வரும் காலத்தில் இந்த இடைவெளிகள் நிரப்பப்படுவதன்மூலமாக நல்லாட்சி என்பதற்கு நாங்களும் சான்றிதழ் கொடுக்கக்கூடிய ஒரு நிலைமை இருக்கும். தற்போது எங்களுடைய நீர் வழங்கல் வடிகாலமைப்பு அமைச்சர் அவர்கள் வாழைச்சேனையில் அதற்குரிய நீர்த்தாங்கியை அமைத்து நீர் வழங்குவது பற்றிக் குறிப்பிட்டிருந்தார். அந்த வகையில், உன்னிச்சையில் இருக்கின்ற நீர் உன்னிச்சை மக்களுக்குக் கிடைக்காமலிருப்பது என்பது ஒரு வகையில் ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாக இருக்கின்றது. இந்த விடயத்தில் பிரதானமான வகிபாகம் நீர் வழங்கல் அமைச்சரைச் சார்ந்திருக்கின்றது. அடுத்த கட்டப் பொறுப்பில் அனர்த்த முகாமைக்குப் பொறுப்பான அமைச்சர் அவர்களும் அதற்கு அடுத்தபடியாக மீள்குடியேற்ற அமைச்சர் அவர்களும் இருக்கின்றார்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்களே! எங்களுடைய மக்களின் தவிர்ப்புக்குத் தீர்வு காணக்கூடிய சரியான பதில் உங்கள் மூலமாகவே கிடைக்க வேண்டும் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம்; கிடைக்கும் என்று நிச்சயமாக நம்புகின்றோம்.

தற்போது வரட்சியின் காரணமாகக் குடிநீர் மாத்திரமல்லாமல், ஏனைய மனித பாவனைக்குரிய நீர் இல்லாத நிலைமையும் பல இடங்களில் காணப்படுகின்றது. அந்த வகையில் வரட்சியின் காரணமாகப் பயிர்ச்செய்கையில் ஈடுபட்டவர்கள்கூடப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இப்படிப்பட்டவர்களுக்கு உரிய பரிகாரம் அல்லது நிவாரணம் வழங்க வேண்டிய தேவை இந்த நல்லாட்சி அரசுக்கு இருக்கின்றது. எனவே, எதிர்காலத்தில் இந்த விடயங்களைக் கவனத்தில் எடுத்து மேலும் காலத்தை இழுத்தடிக்காமல் - தாமதிக்காமல் இந்த மக்களுக்குரிய நீர் வசதியை வழங்குகின்ற செயற்பாட்டில் தீவிரம் காட்ட வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

இன்னுமொரு விடயத்தையும் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது, தற்போது நகர அபிவிருத்தி என்ற விடயம் நடைமுறைப்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்றது; அதுவும் தேவைதான். ஆனால், இதில் இரண்டு வகையான தேவைகள் இருக்கின்றன என்று நான் நினைக்கின்றேன். ஒன்று அத்தியாவசியத் தேவை; அடுத்தது ஆடம்பரத் தேவை. அத்தியாவசியத் தேவையை முழுமையாக நிறைவேற்றியதன் பின்னர்தான் ஆடம்பரம் சார்ந்த தேவைக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும். மாறாக, நகரத்தைச் சோடிக்கின்ற அல்லது அதனை உல்லாசப் பயணத்துறைக்கு உகந்த கவர்ச்சிகரமான இடமாக மாற்றுகின்ற அதேவேளை, அங்கு பெரும்பகுதியான மக்கள் குடிநீர் இல்லாமல் இருப்பது என்பது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். ஆகவே, நகர அபிவிருத்தியைவிட முதலில் செய்ய வேண்டியது - முன்னிலைப்படுத்தப்பட வேண்டியது குடிநீர் வழங்குகின்ற விடயமாகும். எனவேதான் குடிநீர் பற்றி நாங்கள் இரண்டு வருடங்களாகப் பேசிக் கொண்டிருக்கின்றோம். சில இடங்களில் ஆங்காங்கே வழங்கல்கள் நடைபெற்றிருக்கின்றன. இருந்தாலும் பெரும்பாலும் இந்த வழங்கல்கள் பற்றாக்குறையாகத்தான் காணப்படுகின்றன.

இந்தச் சந்தர்ப்பத்தில் மட்டக்களப்பு மாவட்டத்தில் வரட்சி நிலவுகின்ற இடங்களைப் பற்றிக் குறிப்பிட விரும்புகின்றேன். அவையாவன, வெல்லாவெளிப் பிரதேச செயலகப் பிரிவு, பட்டிப்பளைப் பிரதேச செயலகப் பிரிவு, வவுணதீவுப் பிரதேச செயலகப் பிரிவு, ஏறாவூர்ப்பற்றுப் பிரதேச செயலகப் பிரிவு, வாகரை சார்ந்த பிரதேச செயலகப் பிரிவுகள், கிரான் பிரதேச செயலகப் பிரிவு என்பனவாகும். இவ்வாறான இடங்களிலேயே வரட்சி அனர்த்தம் அதிகமாகக் காணப்படுகின்றது. எனவே, அந்த இடங்களை அடையாளம் கண்டு, அங்கு தற்காலிகமான முறையிலாவது குடிநீரை வழங்கக்கூடிய விதத்தில் நீரைக் கொண்டுசெல்லக்கூடிய 'பவுசர்' எனப்படுகின்ற நீர் வழங்கல் வாகனங்களைக் கொடுக்கவேண்டிய பொறுப்பு அனர்த்த முகாமைத்துவ அமைச்சுக்கு இருக்கின்றது. கடந்த காலத்தில் மட்டக்களப்பில் இப்படியான 'பவுசர்'கள் வழங்கப்பட்டிருந்தன. இருந்தாலும் அங்கு வெல்லாவெளி சார்ந்த பிரதேசம், வவுணதீவு சார்ந்த பிரதேசம், கிரான் சார்ந்த பிரதேசம் மற்றும் பட்டிப்பளை சார்ந்த பிரதேசங்களுக்கு நீர் வழங்குவதற்கு மேலும் 'பவுசர்'களை வழங்க வேண்டும். அதனோடு இன்னொரு விடயமும் அமுல்படுத்தப்பட வேண்டும். அதாவது, பல்வேறு இடங்களிலும் நீரில்லாமல் அலைகின்ற மக்களுக்கு நீரை வழங்கக்கூடிய வகையில் அந்தக் கிராமங்களிலுள்ள சந்திகளில் 'பிளாஸ்ரிக்' நீர்த் தாங்கிகளை வைக்க வேண்டும். இதன்மூலம் இந்த வரட்சியினால் பாதிக்கப்பட்ட மக்களுக்குத் தற்காலிகமாகவேனும் குடிநீரை வழங்கக்கூடிய ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்க முடியும். எனவே, வரட்சி நிலவுகின்ற இந்தக் காலப்பகுதியில் மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலைப் பிரதேசங்கள் மற்றும் வடபுலத்தைச் சார்ந்த

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

பிரதேசங்களில் மட்டுமல்ல, நாட்டின் ஏனைய பாகங்களிலும் தற்காலிகமாகவேனும் குடிநீரைப் பெற்றுக்கொள்வதற்குரிய ஏற்பாட்டைச் செய்துகொடுப்பது பயனுறுதிவாய்ந்ததாக இருக்கும். அனர்த்த முகாமைத்துவ அமைச்சர் அவர்களை இன்று நான் இங்கு காணவில்லை. இருந்தாலும் சம்பந்தப்பட்ட அதிகாரிகள் இங்கு சமுகமாகிருப்பார்கள் என்று நினைக்கின்றேன். அந்த வகையில், அனர்த்த முகாமைத்துவம் சார்ந்த துறைக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சின் செயலாளர்கள் மற்றும் அதிகாரிகள் இதில் அக்கறை காட்ட வேண்டும்.

அனர்த்தத்தோடு சம்பந்தப்பட்ட இன்னுமொரு விடயத்தையும் இங்கே சொல்ல வேண்டும். அதாவது, வரட்சி சார்ந்த அனர்த்தம் ஒரு பக்கம் இருக்க, இன்னுமோர் அனர்த்தமும் ஏற்படுவதுண்டு. மாரி காலத்தில் மழை பெய்கின்ற வேளையில் அளவுக்கதிகமாக வெள்ள நீர் தேங்குவதனாலும் அனர்த்தம் ஏற்படுகின்ற நிலைமை இருக்கின்றது. குறிப்பாக, சில பிரதேசங்களில் வடிகால் அமைப்புக்கள் ஒழுங்காக அமைக்கப்படாததன் காரணமாக வெள்ளம் ஏற்படுவதனாலும் அனர்த்தங்கள் ஏற்படுகின்றன. குறிப்பாக, மட்டக்களப்பின் நகரப் பகுதியில் வடிகால் அமைப்புக்கள் ஒழுங்காக அமைக்கப்பட்டு, மக்களுக்கு அனர்த்தங்கள் ஏற்படாத விதத்தில் பாதுகாக்கக்கூடிய ஒரு பொறிமுறையை ஏற்படுத்தவேண்டிய தேவை இருக்கிறது. அந்த வகையில், மட்டக்களப்பில் புதிதாகக் குடியேற்றம் நடந்த பூம்புகார் என்ற சதுப்புநிலப் பிரதேசத்தில் வடிகால் அமைப்புகள் ஒழுங்காக இல்லை. இதன் காரணமாக அங்கு வெள்ளப் பெருக்குகள் ஏற்பட்டு அந்த மக்கள் பல அனர்த்தங்களைச் சந்திக்கவேண்டிய நிலைமை காணப்படுகின்றது. எனவே, வரட்சி, வெள்ளம் போன்ற அனர்த்தங்கள் ஏற்படுகின்றபோது, நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சு, அனர்த்த முகாமைத்துவ அமைச்சு போன்றவை அவற்றின் பணிகளை மிகவும் செம்மையான முறையில் செய்வதற்கு ஏற்றவிதத்தில், நான் முன்னர் குறிப்பிட்டதுபோன்று அந்த மக்களுக்கு நீர்த் தாங்கிகளை நிரந்தரமாக அமைத்துக்கொடுத்தல், தற்காலிகமான முறையில் "பௌசர்"கள் மூலமாக குடிநீர் கிடைப்பதற்கு ஆவன செய்தல், நீர் வடிந்தோடக்கூடிய விதத்தில் வடிகால் அமைப்புக்களை அமைத்துக்கொடுப்பதன்மூலமாக விபத்துக்கள், அனர்த்தங்கள் ஏற்படுவதைத் தவிர்த்தல், அதனோடு சில பாலங்களையும் அமைத்து மக்களது பயணங்களைச் சுலபமாக்குதல் ஆகிய விடயங்களில் கவனம் செலுத்தவேண்டும் என்று இந்த இடத்தில் இறுதியாகக் குறிப்பிட்டு, எனது உரையினை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 3.58]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පුත්තලම් දිස්ත්‍රික්කය ප්‍රමුඛ දිස්ත්‍රික්ක ගණනාවක මේ වන විට ඇති වෙලා තිබෙන නියං තත්ත්වය පිළිබඳව පැවැත්වෙන කල් තැබීමේ විවාදයට සහභාගි වීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මෙම නියං තත්ත්වය දැන් මාස ගණනාවක ඉඳලා පවතිනවා. අපේ ජීවිත කාලය තුළ මීට පෙර දැක නැති විධියට ජනතාව පීඩාවට පත් කරමින් එය විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. වග කිව යුතු රජයක් හැටියට අපි අපේ රාජ්‍ය යන්ත්‍රණය තුළ මේ සඳහා සහනදායී, දීර්ඝ කාලීන සැලැස්මක් සකස් කරලා, මේ වන විට එය ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපි දන්නවා, මේ වන විට ලෝකයේ දේශගුණය වෙනස් වෙලා තිබෙන බව. දේශගුණය වෙනස්වීම නිසා අපේ රටේ ජනතාවට පමණක් නොවෙයි, ලෝකයේ සියලුම ජනතාවට පීඩා විඳින්න සිදු වෙනවාය කියලා, ඒ පිළිබඳ විශේෂඥයන් ඉතාම දීර්ඝ කාලයක සිට අනතුරු හඟවා තිබුණා. ශ්‍රී ලංකාවටත් අද මේ දේශගුණ විපර්යාසයෙන් බේරෙන්නට බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ සිදු වුණු පරිසර විනාශය, ඒ වාගේම ජනගහනය වැඩි වීම වැනි කරුණු කාරණා මේ ප්‍රශ්නය උග්‍ර කිරීමට හේතු පාදක වෙලා තිබෙනවා.

අනෙක් දිස්ත්‍රික්කවලට වඩා මා නියෝජනය කරන පුත්තලම් දිස්ත්‍රික්කයේ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කයේත් විශාල පවුල් සංඛ්‍යාවක් මේ වන විට මේ නියඟයෙන් පීඩාවට පත් වෙලා සිටිනවා. කෘෂිකර්මය සඳහා, අනෙකුත් ජල අවශ්‍යතා සඳහා පමණක් නොවෙයි, බීමට පවා ජලය නැති වීම නිසා රජයෙන් ජලය සැපයිය යුතු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. තරමක වැසි ලැබුණත් ගංගාවල, වැව්වල ජල ප්‍රමාණය එන්න එන්නම අඩු වෙලා, වැව් විශාල සංඛ්‍යාවක ජලය නැත්තටම නැති වෙලා තිබෙනවා. සාමාන්‍ය නියඟයෙනුත්_බැට කන ඒ ප්‍රදේශ අද වන විට මුළුමනින්ම විනාශ වෙලා තිබෙනවා. මේ නියං තත්ත්වය හේතුවෙන් ජනතාවට අත් වුණු පීඩාව අවම කිරීම සඳහා මේ රජය මැදිහත් වෙලා කටයුතු කරනවා. අද වන විට මේ රජය ඒ වගකීම භාර අරගෙන ඒ සඳහා වැඩ පිළිවෙළක් දියත් කරගෙන යන බව මා මේ අවස්ථාවේදී අවධාරණය කරනවා.

විශේෂයෙන්ම මූලික අවශ්‍යතාවක් වන පානීය ජලය සැපයීම සඳහා අපේ දිස්ත්‍රික් කමිටුවල, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල නිලධාරින් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, ඔවුන් සමඟ එක්කාසු වෙලා කටයුතු කරනවා. ඒ වාගේම අපේ අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ නියෝග මත අපේ ආපදා කළමනාකරණ ඇමතිතුමා ඇතුළු අප සියලු දෙනාම දැනටමත් අපේ ප්‍රදේශවල සහනදායී, පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඇති වෙන්නට ගිය විශාල විනාශයක්, විශාල පීඩනයක් ඒ තුළින් අවම කරන්නට අපට හැකි වුණා කියලා මා හිතනවා. නමුත් මේ දේශගුණික තත්ත්වය එන්න එන්නම අපට අවාසි ලෙස තව අවුරුදු ගණනාවක් ඉදිරියට මේ විධියටම තිබෙයි කියලා මා හිතනවා.

එම නිසා මේ සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් රජයක් හැටියට අපට ක්‍රියාත්මක කරන්න සිද්ධ වනවා. වැව් හිඳුණාම නැත්නම් ළිං හිඳුණාම ජනතාවට කෙටි කාලීනව ජීවත් වන්න පුළුවන් වුණත්, දීර්ඝ කාලීනව ජීවත් විය නොහැකි සමහර ප්‍රදේශ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairman of Committees)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**

(மாண்புமிகு நிரோஷன் பெரேரா)

(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මිනිත්තුවක් දෙන්න.

එම නිසා දීර්ඝ කාලීන සැලැස්මක් අනුව ඒ ප්‍රදේශවලට විදුලිබලය ලබා දීම සඳහා, ඒ වාගේම මාර්ග තැනීම සඳහා විශාල මුදලක් අපි වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම එම ප්‍රදේශවලට නළ ජලය ලබා දීම සඳහාත් රජයක් හැටියට අපි විශේෂ උනන්දුවක් අරගෙන ඉදිරියේදී ඒ වැඩ කරනවාය කියන කරුණත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ ජනතාවට ලබා දෙන සහනාධාර, ඒ වාගේම වගා හානිවලට වන්දි ලබාදීමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට රජයේ සියලුම නිලධාරින් කටයුතු කරනවාය කියන කරුණත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.05]

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැති වුණත්, අද අපට මේ මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙනුත්, ඒ වාගේම මේ රටේ ජනතාවට ඉතා සංවේදී වාගේම, විශේෂයෙන්ම දේශපාලනඥයෝ විධියට මේ ගැන අවධානයෙන් බැලිය යුතු මාතෘකාවක්; අවධානය යොමු කළ යුතු මාතෘකාවක් අද සභාව කල් තැබීමේ යෝජනාව විධියට එතුමා ගෙන ඒම පිළිබඳවත් මුලින්ම එතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

අද අපට මේ ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ කුමක් නිසාද කියලා විශේෂයෙන්ම මා කියන්න ඕනෑ. "මේ නියඟයෙන් විපතට පත් වූ ජනතාව වෙනුවෙන් ලබා දෙන සහන ප්‍රමාණය මදි, තවත් සහන ලබා දෙන්න කටයුතු කරපියව්" කියලා විපක්ෂයේ සමහර කණ්ඩායම් මගිනුත්, අනුර කුමාර දිසානායක මැතිතුමාත් ආණ්ඩුවට දැනුම් දුන් ආකාරය අපි දැක්කා. අන්තවාදී විධියට මේ ගැන බලන; හැම වෙලාවේම ආණ්ඩුව දිහා වපර ඇහෙන් බලන; හැම වෙලාවේම ආණ්ඩුව විවේචනය කරන කණ්ඩායම් මේකට වෙන වෙන අර්ථ කථන දීලා කථා කරනවාත් අපි දැක්කා.

හැබැයි, ආණ්ඩුව විධියට අපි මෑතකාලීන අත්දැකීම් අරගෙන බලමු. මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය ඇතුළු ප්‍රදේශ කීපයක 2004 වර්ෂයේ මහා ගංවතුර තත්ත්වයක් ඇති වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ මහා ගංවතුර පැමිණි වෙලාවේ ඒ මිනිසුන්ගේ ගෙවල් දොරවල් ඔක්කොම වතුරට යට වුණා. එහිදී ඔවුන්ට රුපියල් ලක්ෂයක මුදලක් දුන්නා, නැවත තැනක් හොයාගෙන පදිංචි වෙන්න; ඒ අවශ්‍ය කටයුතු කරගන්න. ඊට පසුව ඒ ගැන සොයා බැලුවේ නැහැ. නැවත 2004දී අපට තවත් අත්දැකීමක් තිබෙනවා; ජනතාවට අවබෝධයක් තිබෙනවා සුනාමි ව්‍යසනය ගැන. එය මේ රටේ මුහුදුබඩ ප්‍රදේශ රාශියකට බලපෑවා. ඒ වෙලාවේ එවකට තිබුණු රජය ක්‍රියා කළේ කොහොමද කියලා මේ රටේ ජනතාව දන්නවා.

එදා සුනාමිය ආපු වෙලාවේ අපේ රටට සහ එය බලපෑ අනිකුත් රටවලට ජාත්‍යන්තරයෙන් විශාල සහයෝගයක් ලැබුණා. ඒ අවස්ථාවේදී අපේ රටට ලැබුණු ඒ ආධාර ප්‍රමාණය, අපේ රටට ඒ ආධාර කරන්න ඉදිරිපත් වූ ප්‍රමාණය අපි හරියට කළමනාකරණය කළා නම්, ඒ වාගේ ව්‍යසනයක් තුළින් විපතට පත් වුණු ජනතාවට සහ සහන සැලසිය යුතු තවත් දුප්පත් අහිංසක මිනිසුන් සිටියා නම් ඔවුන්ටත් සහන සලසන්න තිබුණා. ඒ තරම් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් මේ රටට ගලාගෙන ආවා. හැබැයි, අවසානයේ මොකක්ද වුණේ?

අවසානයේදී ඒ ලැබුණු ප්‍රතිපාදන කළමනාකරණය කරගන්න බැරි වුණා; ඒ ලැබුණු ආධාර මුදල් අපට හරියට හසුරුවා ගන්න බැරි වුණා. ජාත්‍යන්තරයෙන් ලැබුණු ඒ සහයෝගය අපට නිවැරදි විධියට ලබාගන්න බැරි වුණා. දේශපාලන අවශ්‍යතා මත, සුනාමි කාලයේ සිදු වූ "Helping Hambantota" ගිණුම වැනි විශාල වංචා, කොල්ල කෑම් සිදු වෙලා ඒ අහිංසක මිනිසුන්ට ලැබුණු ආධාර ටිකත් සාක්කුවේ දමාගැනීම නිසා, මේ රටට යම් විපතක්, ගංවතුරක්, නියඟයක් ආපු වෙලාවකදී ආධාරයක්, සහයෝගයක් දෙන්න කවුරුවත් ඉදිරිපත් වන්නේ නැති තරමටම කටයුතු සිද්ධ වුණා. එදා තිබුණු රජය මේ රටේ ජනතාවට ලැබෙන ආධාර මුදල සාක්කුවට දමා ගන්නවාය කියා මිනිසුන් අතර, ජාත්‍යන්තරය තුළ මතයක් ගියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගංවතුරින් විශාල හානියක් වුණු දිස්ත්‍රික්කයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මට කියන්න තිබෙන්නේ මෙපමණයි. අපට දැන් තිබෙන්නේ ආධාර දීලා මේ ජනතාව නඟා සිටුවන එක නොවෙයි. ඉදිරි අනාගතය තුළ මෙවැනි වටපිටාවක් නිර්මාණය නොවෙන්න, ගංවතුරක් ආවාට ඒක මහා ලොකුවට ජනතාවට නොදැනෙන්න, නාය යෑම් වුණාට ඒවාට අපේ ජනතාව හසු නොවෙන්න ක්‍රියා මාර්ග ගැනීමයි අප කළ යුත්තේ. ඒ නිසා ඉතා ඉක්මනින්, සුදුසු තැන්වලින් ඒ ජනතාවට ඉඩම් ලබාදෙන්න කියා අපි යෝජනා කර තිබෙනවා. ඒ වාගේම අනවසර ඉඩම්වල ඉන්න කට්ටිය ඒ ස්ථානවලින් ඉවත් කරන්න ඕනෑ. එහෙම නොකර මේ ප්‍රශ්නයට විකල්ප සොයන්න බැහැ.

මේ යහ පාලන රජය තුළින් මිනිසුන්ට මේ වන විට රුපියල් ලක්ෂ 4ක් මුදා හැරලා තවත් ලක්ෂ 12ක් දක්වා ලබාදෙන්න පොරොන්දු වෙලා, නිවැරදි තැනකට ජනතාව අරගෙන එන්න කටයුතු කර තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයට අපේ ගෞරවය පුද කරනවා. විශේෂයෙන්ම ආපදාවට ලක්වන දිස්ත්‍රික්කයක් වන රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට වාගේම රටේම ජනතාවටත් උපරිම සහන සලසන්න රජයක් විධියට අපි කටයුතු කරනවා.

මේ රටේ අහිංසක මිනිසුන්ට ලැබුණු ඒ ආධාර මුදල් සාක්කුවට දමාගත්ත මිනිසුන්ට අද රත්නපුර වැනි දිස්ත්‍රික්කවල සිටින අහිංසක ජනතාවට ලැබෙන ආධාර මුදල් ගැන මේ පාර්ලිමේන්තුවේ පාරම් බාන්න බැහැ. ඔවුන් මේ රටේ අහිංසක මිනිසුන්ට ලැබුණ ආධාර මුදලත් සාක්කුවට දමාගත් කණ්ඩායමක් නිසා, මේ වෙලාවේ සදාචාරාත්මක අයිතියක් නැහැ මේ ජනතාවගේ කර පිටින් ඔවුන්ගේ දේශපාලන ගමන යන්න.

මේ ව්‍යසනය අවස්ථාවේ ජනතාවට සහන ලබා දීම සඳහා කැබිනට් මණ්ඩලය ලබාදුන් සහයෝගය හා ශක්තිය අගය කරමින්, ඉදිරියටත් ඉතා ඉක්මනින් මේ සහන සැලසීමේ කටයුතු කරන්න හැකියාව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම වැදගත් යෝජනාවක් ගැන සාකච්ඡා වන මොහොතක් මේක.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to take the Chair?

**ගරු තාරානාත් බස්නායක මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Tharanath Basnayaka - Deputy Minister of Telecommunication and Digital Infrastructure)

Sir, I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[අ.භා. 4.11]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සතුටට පත් වෙනවා, සභාව කල් තබන අවස්ථාවේ විවාදයට කරුණු කීපයක් එකතු කරන්න අවස්ථාව ලැබීම ගැන. ඒ වාගේම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාව දිහා බැලුවාම මට එක්තරා විධියක සංවේගයකුත් තිබෙනවා. මොකද, අද සභාව කල් තැබීමේ යෝජනාව ගෙනැල්ලා, මහ හයියෙන් මේ යෝජනාව ගැන කථා කරලා, සෞඛ්‍ය ඇමතිතුමාත් ඒකට පටලවා ගෙන, මාධ්‍යට ඕනෑ ටික කියලා මහ ඝෝෂාවක් කරපු ජනතා විමුක්ති පෙරමුණේ එක සමාජිකයෙක්වත් දැන් මේ ගරු සභාවේ නැති එක ගැන. ඒ ගොල්ලෝත් නියඟයට අහු වෙලාද කියලා මට සැකයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලයට පත් වුණ ගමන් අපේ රජයට රටේ කාලගුණික හා දේශගුණික වශයෙන් ඇති වුණු යම් යම් උපද්‍රවවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. එම උපද්‍රව තත්ත්වයන්ට මුහුණ දෙන්න බැරිව ආණ්ඩුව "ඇන ගනීවි" කියලා බොහෝ අය බලාපොරොත්තු වුණා. ඒක තමයි ඇත්තම කථාව. නමුත්, ඒ හැම උපද්‍රව අවස්ථාවකදීම රජයක් හැටියට එයට ශක්තිමත්ව මුහුණ දෙන්න අපට පුළුවන් වුණා. එම තත්ත්වයන්ට මුහුණ දීලා, ජනතාව පීඩාවට පත් වෙලා හිටියා නම්, ජනතාව ඒ පීඩාවෙන් මුදවා ගන්න අපට හැකියාව ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා වාගේම ගංවතුර උවදුරට මුහුණ දීපු ප්‍රදේශයක ජීවත් වන මහජන නියෝජිතයෙක් මම. මෙය රටේ දිස්ත්‍රික්ක කීපයකට බලපා ඇති නියඟය ගැන කථා කරන අවස්ථාව වුවත්, ගංවතුර උවදුරෙන් පීඩාවට පත් වුණු, ගාලු දිස්ත්‍රික්කයේ ගිං ගඟ මිටියාවතේ ජීවත් වන කෙනෙකු විධියට මම මෙය අවස්ථාවක් කර ගන්නවා, අපේ ගාලු දිස්ත්‍රික්කයේ ජනතාව ලොකු පීඩාවකට පත් වුණු අවස්ථාවේ දිය හැකි උපරිම සහන ලබා දෙන්න ජනාධිපතිතුමාගේ ආශිර්වාදය ඇතිව ගරු අග්‍රාමාත්‍යතුමාගේ විශේෂ මැදිහත් වීමෙන් අපේ රජය කළ කටයුතු ගැන ස්තුති කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකලාපය ගැන මට යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ජනතාවට මොනවා හෝ දෙන්න ගියාම ඒක "මදි, මදි" කියලා තමයි එතුමන්ලා හැම විටම සටන් පාඨ කියන්නේ. "මදි, මදි" කියලා ජනතාවත් එක්ක උද්ඝෝෂණය කරනවා. ගොවීන්ට සහනාධාරයක් දෙන්න ගියත් එතැන බෝඩ් එකක් අල්ලනවා. නියං සහනාධාර දෙන්න ගියත්, එතැනදීත් බෝඩ් එක අල්ලනවා. ගංවතුර බැහැගෙන යන කොට අපේ ප්‍රදේශවල ජනතාව අතරට ගිහිල්ලා, ගංවතුරෙන් පස්සේ පීඩාවට පත් වුණු සංවිධානය කියලා මොකක් දෝ එකක් අටවා ගෙන ජනතාව සංවිධානය කළා, "ආධාර දුන්නා මදි, දුන්නා මදි" කියලා. ආධාර දෙන ගමන් එම ජනතාව සක්‍රියව ඒ ප්‍රදේශයේම සංවර්ධන කටයුත්තකට යොදවා ගන්න ගියාම දැන් කියනවා, "ආධාර දෙන ගමන් මේ මිනිසුන්ගෙන් වැඩ ගන්නවා" කියලා. මම කනගාටු වනවා, සමාජවාදය ගැන කථා කරන දේශපාලන ව්‍යාපාරයක් මේ විධියට හැසිරීම ගැන. ජනතාවගෙන් කිසිදු වැඩක්පළක් ගන්නේ නැතුව, ජනතාවගෙන් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැතුව, ජනතාව ඵලදායි දෙයකට යොදවා ගන්නේ නැතුව, සහනාධාර මුදල් නිකම්ම ජනතාවගේ අතට දෙන එක ඒ අය අනුමත කරනවාද? ඒකද ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිය කියලා අපි අහන්න කැමැතියි. මම කියන්නේ නැහැ, ජනතාවට පීඩාවට පත් වන අයුරින් හා වයසක උදවිය, රෝගාබාධාවලට ලක් වුණු උදවිය වැඩපළවල යෙදවිය යුතුයි කියලා. නමුත් ගංවතුරෙන් හානියට පත් වුණු ප්‍රදේශයක ඉන්න පුද්ගලයකු හැටියට මම අවංකව මේ කාරණය කියනවා. ගංවතුරෙන් පස්සේ දීපු සහනාධාර නිසා සහනාධාර මත යැපෙන, ඒ මත ජීවත් වන මානසිකත්වයකටත් සමහර උදවිය පත් වුණා. "සහනාධාරම ඕනෑ" කියන මානසිකත්වයකට පත් වුණා. කෙටියෙන් කිව්වොත්, තමන්ගේ ගෙදර දොර වැඩපළ ඔක්කෝම අමතක කරලා, කර්මාන්තශාලවේ, තේ ඉඩමේ, කුරුඳු ඉඩමේ වැඩ පැත්තකට දමලා, මල්ලත් අරගෙන පාරට වෙලා ඉන්න තැනට සමහර උදවිය පත් වුණා. ජනතා විමුක්ති පෙරමුණ ආශා කරන්නේ ජනතාව එවැනි තත්ත්වයකට පත් කරන්නද? එහෙම නැත්නම්, යම්කිසි ආධාරයක් දෙන ගමන්, ඒ දෙන ආධාරයට කිසියම් වූ වටිනාකමක් දෙන්න තමන්ගේම ප්‍රදේශයේ වැව හෝ පාර හෝ කෘෂි වේල්ල හෝ කුමක් හෝ අදාළ දෙයක් සංවර්ධනය කරගෙන මේ නියඟය අවසන් වුණාට පස්සේ ඊළඟට මහා වැසි ඇද හැළෙන කොට ප්‍රයෝජනයට ගන්න පුළුවන් යමක් තමන්ගේ ගමට ඉතුරු කරගන්න කටයුතු කරන එක නොවේද වැදගත් කියලා මම අහන්න කැමැතියි. මහජන නියෝජිතයකු විධියට මම නම් විශ්වාස කරන්නේ, ජනතාව පීඩාවට පත් වුණු අවස්ථාවේ අපි උදවු කළ යුතු බවයි. ඒ උදවු කරනවාත් එක්කම අපේ ජනතාවට හැඟීමක් දිය යුතුයි, ආකල්පයක් දිය යුතුයි, "රජය කියන්නේ අපිමයි, රජය ගෙවන හැම ශතයක්ම අපේම සල්ලි; අපේම සල්ලි අපට ලැබෙනවා නම් ඒ හැම රුපියලකටම අපි වටිනාකමක් දිය යුතුයි; මේ මහ පොළවට වටිනාකමක් දිය යුතුයි" කියලා. ඒ ආකල්පය හා හැඟීම ජනතාව තුළ ඇති කළ යුතුයි කියන එකයි මගේ හැඟීම.

සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සමහර කාරණාවලට මම එකඟ වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ ගිං ගඟ පිටාර ගැලීම නිසා එම ප්‍රදේශයේ ජනතාව විපතට පත් වුණා. එවැනි ප්‍රදේශයක ජීවත් වන කෙනෙක් හැටියට මම කියන්න

කැමැතියි, ගං වතුරෙන් හානි වුණු නිවාසවලට ලබා දිය හැකි උපරිම වන්දි මුදල මේ වන විට තක්සේරු කර පූර්ණ නිවාස හානිවලට රුපියල් ලක්ෂ 25 දක්වා මුදල් ආධාර ලබා දීමට ක්‍රියා කරලා තිබෙනවා කියලා. අපේ හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාත් ඒ ගැන බොහොම පැහැදිලිව සඳහන් කළා. ඒ වාගේම ගෙයක් හදා ගන්නා තෙක් මාසික නිවාස කුලියක් ගෙවීමටත් කටයුතු කරනවා. ක්ෂණික ආධාර, සලාක දීමනා ආදී හැම දෙයක්ම ලබා දීලා තිබෙනවා. මුළුතැන්ගෙයි උපකරණ කට්ටලයේ සිට ලබා දීලා තිබෙනවා. මේ හැම දීමනාවක්ම ගං වතුරෙන් විපතට පත් වුණු අයට අද වන විට ලබා දීලා තිබෙනවා. නියඟයෙන් විපතට පත් වුණු අයටත් එම සහනයම ලබා දීලා තිබෙනවා.

මම හිතන විධියට මෙහෙම සහනාධාර ලබා දුන් ආණ්ඩුවක් පිළිබඳ අපේ ලංකා ඉතිහාසයේ සටහන් වෙන්නේ නැහැ. හැබැයි, එක දෙයක් ඉතිහාසයේ සටහන් වෙලා තිබෙනවා. ඒ මොකක්ද? අපේ පළාත්වලට සුනාමි ආපු වේලාවේ විදේශ රටවලින් ලැබුණු ආධාර තමන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වල දමා ගත් බව නම් ඉතිහාසයේ සටහන් වෙලා තිබෙනවා. ඒවා හොරා කාපු බව ඉතිහාසයේ සටහන් වෙලා තිබෙනවා. එම කටයුතුවලට දායක වුණු, ඒවාට නායකත්වය දුන්නු උදවිය අද මේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරනවා. සමහරු නියඟයෙන් ගොඩ යන්න බලාගෙන හිටියා; සමහරු ගං වතුරෙන් ගොඩ යන්න බලාගෙන හිටියා. මේ ආණ්ඩුව, නියඟයට වැඩ කළේ නැහැ, ගං වතුරට වැඩ කළේ නැහැ කියලා දේශපාලන මතවාද හදන්න බලාපොරොත්තුවෙන් හිටියා. අද ඒ අයගේ සිහින බොඳ වෙලා ගිහින් තිබෙනවා. "දෙවො වස්සතු කාලෙන - සස්ස සම්පත්ති හොතු ච ...." කියන ගාථාව කට පාඩම් කරගෙන හිටියා, දැන් රටේ සිදු වෙන්නේ මෙන්න මේ වාගේ කාරණා කියලා කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යෝජනා ඉදිරිපත් කරන එක හොඳයි. හැබැයි, මේ හැම යෝජනාවක්ම සද්භාවයෙන් ඉදිරිපත් කරන ඒවා වෙන්න ඕනෑ. හුදෙක් බෝඩ් අල්ලන එක, සටන් පාඨ කියන එක, ජනතාව උසිගන්වන එක, ඒ ඒ ආයතනවලින් "දෙන එක මදි, දෙන එක මදි, තව දියව් දියව්" කියන එක ඕනෑම දේශපාලන ව්‍යාපාරයකට, ඕනෑම පුද්ගලයෙකුට කළ හැකියි. හැබැයි, මේ කටයුතු සඳහා මුදල් සොයන්න බදු පනවන්න ගියොත්, ඒ සඳහා මොනවා හරි උපාය මාර්ග සොයන්න ගියොත් ඒවාටත් විරුද්ධ වෙන එක තමයි මේ ඇතැම් කණ්ඩායම්වල දේශපාලන පිළිවෙත බවට පත් වෙලා තිබෙන්නේ. එහෙම නැතිව සාධාරණව රට ගැන හිතලා, රටේ ප්‍රශ්නවලදී මීට වඩා සැලකිල්ලෙන් කටයුතු කළ යුතුයි. රතු තරුව ගිහින් කුණුකසළ ටිකක් සුද්ධ කළාය; කාණු ටිකක් සුද්ධ කළාය; පාරවල් ටිකක් සුද්ධ කළාය; මොනවා හරි කළාය කියලා ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. "රතු තරුව" කියන බෝඩ් එකයි, දැන්වීමයි, ප්‍රචාරය වෙනවා; ප්‍රවෘත්තිවලට පෙනෙනවා. එමඟින් මොනවා හරි ප්‍රචාරයක් ගන්න පුළුවන්. නමුත් ඒකෙන් සම්පූර්ණ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. හැබැයි, ඒ ශබ්දයට අපේ අවශ්‍යතා සම්පූර්ණ වෙනවා කියලා මම හිතන්නේ නැහැ. නියඟය වේවා, ගං වතුර වේවා ජනතාව පීඩනයට පත් වුණු හැම අවස්ථාවකදීම රජය ගත් ක්ෂණික ක්‍රියා මාර්ග සහ මේ හැම අවස්ථාවකම ජනතාව එම කටයුතුවල කොටස්කරුවන් කර ගැනීම, මාධ්‍ය ඉදිරියේ යම් යම් සංදර්ශන දමන සුළුතරයගේ හැර, බොහෝ දෙනෙකුගේ ප්‍රශංසාවට ලක් වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්ත. අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ අපේ අදහස් එසේ ඉදිරිපත් කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

[අ.භා. 4.20]

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියඟය හේතුවෙන් ඇතිවූ වියළි කාලගුණ තත්ත්වය තුළ පීඩාවට පත් ජනතාව සම්බන්ධයෙන් අද දින ඉදිරිපත් කළ කල් තැබීමේ යෝජනාව පිළිබඳව විවාදයේ දී කථා කිරීමට මටත් අවස්ථාව ලැබීම ගැන බෙහෙවින්ම සතුටු වෙනවා. ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවකට මේ තත්ත්වය බලපාලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය වසර කිහිපය තුළ අප රටට මෙන්ම ඉන්දියාව ඇතුළු රටවල් ගණනාවකට මෙම අයහපත් කාලගුණ තත්ත්වය බලපෑවා. මෙම අයහපත් කාලගුණ තත්ත්වය නිසා ලංකාව තුළ ජීවත් වෙන, එහෙම නැත්නම් ගොවිතැන් කරන ජනතාවට විශාල පාඩුවක් සිදු වුණා. ඒ වාගේම කන්න කිහිපයකදී ඔවුන්ගේ ජීවන මාර්ගය ඇණ හිටලා තිබෙනවා. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ යෝජනාව අද දින ගෙනාවත් රජයක් හැටියට අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන ලබා දීමට කඩිනමින් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

2017.07.31 දින කැබිනට් මණ්ඩලයේ අනුමත කර, නියඟයට පත් වුණු ජනතාවට සහන ලබා දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එක් එක් දිස්ත්‍රික්කවල පවුල් වශයෙන් ගත්තාම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවුල් හයදහස් එකසිය අසූදෙකකුත්, මඩකලපුව දිස්ත්‍රික්කයේ පවුල් දහනවදහස් ගණනකුත්, කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තොත් වැඩිම පවුල් සංඛ්‍යාවක් වන පවුල් හැත්තෑදහස් තුන්සිය අනූහතරක් නියඟය නිසා පීඩාවට පත් වෙලා තිබෙනවා.

පුද්ගලයන් හැටියට ගත්තාම එම දිස්ත්‍රික්කයේ දෙලක්ෂ තිස්එක්දහසක් විතර ප්‍රමාණයක් නියඟයෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කය ගත්තාම පවුල් වශයෙන් හතළිස්හයදහස් පන්සිය තිස්එකකුත්, ජනතාව හැටියට ගත්තොත් එක්ලක්ෂ හතළිස් හතරදහස් හැටතුනකුත් පීඩාවට පත් වෙලා සිටිනවා. මේ ලැයිස්තුව අනුව බැලුවාම, අපේ වයඹ පළාතේ දිස්ත්‍රික්කවල ගොවි ජනතාවට තමයි පසු ගිය වසර දෙක තුළ මේ නියඟය නිසා වැඩිම හානියක් සිදු වෙලා තිබෙන්නේ. එක පැත්තකින් තමන්ගේ වගාවන්වලට හානි වුණා වාගේම පානීය ජලය ලබා ගැනීම පැත්තෙනුත් විශාල අපහසුතා ගණනාවකට මේ ජනතාව මේ වෙන කොට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා රජය ගත් තීන්දුව අනුව, මේ ලැයිස්තු ගත කර තිබෙන එක් එක් දිස්ත්‍රික්කවල පුද්ගලයින් හැටියට දොළොස්ලක්ෂ හැත්තෑදහස් හයසිය හැත්තෑතුන්දෙනකුටත්, පවුල් වශයෙන් තුන්ලක්ෂ හැටනවදහස් තුන්සිය පණස් හතරදෙනකුටත් ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න රජය අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

මෙහිදී තව එක කාරණයක් පිළිබඳව මා මතක් කරන්න ඕනෑ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබෙන චක්‍රලේඛය අනුව මේ වෙන් කර තිබෙන මුදල් ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබා දීමේදී සමහර අය යම් යම් අපහසුතාවන්ට මුහුණ දීලා තිබෙනවා. ඒ ගැනත් මතක් කරන්න වෙනවා. මොකද, අපේ ප්‍රදේශය තුළ ගොවිතැන් කරන උදවිය වෙනත් රැකියාවලත් නිරත වෙලා ඉන්නවා. සමහර විට වඩු බාස් කෙනකු වෙන්න පුළුවන්, මේසන් බාස් කෙනකු වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් ත්‍රිරෝද රථ රියදුරකු වෙන්න පුළුවන්, ගොවිතැන් කරන ගමන් මෙවැනි ස්වයං රැකියාවලත් ඒ අය යෙදෙනවා. ඒ අය ගොවිතැනට විතරක් සීමා වෙලා කටයුතු

[ගරු ජේ. සී. අලවතුවල මහතා]

කරන්නේ නැහැ. ඒ නිසා චක්‍රලේඛනයටම කොටු වෙන්නේ නැතිව ඒ ගැනත් අපි සොයා බලා කටයුතු කළ යුතුයි.

විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න වෙනවා. මෙවැනි ස්වයං රැකියාවල යෙදිලා ඉන්න උදවියටත් මේ නියඟය නිසා අලාභ හානි සිදු වෙලා තිබෙනවා. ඒ අයටත් මේ සහනාධාර අපි ලබා දෙන්න ඕනෑයි කියන එක අපි මතක් කරනවා. මොකද, ආපදාවන්ට ලක් වුණු සියලු දෙනාටම සහනාධාර ලබා දෙන්න කැබිනට් මණ්ඩලය විසින් එම අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එහෙම නම්, එම ප්‍රතිපාදන වෙන් කිරීම තුළ වෙනත් ස්වයං රැකියාවක් කරන අයටත්, ඒ හැම කෙනාටම සහනාධාර ලබා දිය යුතුයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ඇති වුණු ආපදා ගණනාවකට අප රජයට මුහුණ දෙන්න සිදු වුණා. එක පැත්තකින් ජල ගැලීම් ඇති වුණා. එයින් හානි වුණු උදවියටත් විශාල මුදලක් ලබා දීලා තිබෙනවා. අපට මතකයි ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කළා, ජලගැලීම්වලට ලක් වුණු ප්‍රදේශවල උදවියට ඉදිරියේදී නිවාස සකස් කර දීම ඇතුළු අනෙකුත් කටයුතු සඳහා රුපියල් බිලියන 100කට වැඩි මුදලක් වෙන් කර තිබෙනවා කියලා. පීඩාවට පත් වුණු ජනතාව වෙනුවෙන් අප රජය මෙවැනි ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ හැම කෙනාටම මේ ආධාර උපකාර නිසි ලෙස බෙදී යන ආකාරයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එම කටයුතු ක්‍රියාත්මක වෙනවා නම් ඉතාමත් හොඳයි කියන එකත් මතක් කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට දවසේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න තිබෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන සංශෝධන අද දහවල් 12.00ට පෙර අපේ අතට ලැබෙන්න සලස්වනවා කියා ගරු කථානායකතුමා පොරොන්දු වුණා. දැන් වෙලාව පස් වරු 4.30යි. අපට ඒවා නොලැබීම තුළින් හෙට දවස තුළ අපි මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්නේ කොහොමද? ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමාත් දැනුවත් කරලා අද දවසේ ඉතා ඉක්මනින් අපට ඒ සංශෝධන ලැබෙන්න සලස්වන්නය කියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ගරු ඇමතිතුමා පොරොන්දු වුණා, අද දවසේ සභාවේ කටයුතු අවසන් වීමට පෙර සංශෝධන දෙනවාය කියලා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා යොමු කළ කරුණ කෙරෙහි නැවතත් ඔබතුමාගේ අවධානය මා යොමු කරනවා. අද දහවල් 12.00ට සංශෝධන දෙනවාය කිව්වා. දැන් වෙලාව සවස 4.30යි. නමුත් තවම ඒ සංශෝධන දුන්නේ නැහැ. අපි ඒ සංශෝධන අධ්‍යයනය කරලා යම්කිසි අදහසක් ගත යුතු වනවා. මුලින් කථානායකතුමා කිව්වා, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඡන්දය ගන්නේ නැහැයි කියලා. ඊට පැයකට පස්සේ සභානායකතුමා කිව්වා, "නැහැ, අපි ඡන්දය ගන්නවා"යි කියලා. ඔබතුමාට මේ සම්බන්ධයෙන් ස්ථිරව ප්‍රකාශයක් කළ නොහැකි නම් සභානායකතුමා විමසා හෝ මේ සංශෝධන නොදී තිබෙන තත්ත්වය තුළ හෙට දවසේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව ඡන්ද විමසීමට යනවාද, ඒ පනත් කෙටුම්පත විවාදයට ගන්නවා නම් ඒ සංශෝධන ලබා දෙන්නේ කුමන වෙලාවේදීද කියන එක සම්බන්ධයෙන් ඉක්මනින් ප්‍රකාශයක් ලබාදෙන්න. එතකොට අපට සූදානම් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරලා මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්නම්.

ඊළඟට ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.28]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියඟය සම්බන්ධයෙන් මේ රජය විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාවලිය පිළිබඳව අද දින ඉදිරිපත් කළ කල් තැබීමේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මා සතුටු වනවා. මේ වනකොට අපේ රටේ තුනෙන් එකක ප්‍රදේශයක් දරුණු නියඟයකට හසුවෙලා තිබෙනවා. හැබැයි මේක මේ රටේ නියඟයන් ඇතිවුණු පළමුවන අවස්ථාවවත්, අවසාන අවස්ථාවවත් වන එකක් නැහැ. ඒ වාගේම අපේ රටේ ගංවතුර ආපදා, ස්වාභාවික ආපදා රාශියක් මේ කාල පරිච්ඡේදය තුළ සිදු වුණා. ඒවාත් අවසාන අවස්ථාව වාගේම ප්‍රථම අවස්ථාව බවට පත් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණා සම්බන්ධයෙන් රජයේ වගකීම කොතෙක් දුරට ඉටුවෙලා තිබෙනවාද කියන කාරණාව පිළිබඳව අපි දැඩි විවේචනයක ඉන්නවා. ඒකට හේතුව මෙයයි. අද වනකොට මා නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කන්න හතරක් විනාශ වෙලා තිබෙනවා, දරුණු නියඟය නිසා. හැබැයි ඒ කන්න හතරෙන් කන්න දෙකක්

විනාශයට පත් වුණේ, කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන්, විශේෂයෙන්ම වී වගාව සම්බන්ධයෙන් මේ රජය ගත් අදූරදර්ශී ක්‍රියා පිළිවෙත නිසායි. ඒ කියන්නේ ජලය තිබුණු කාල පරිච්ඡේදය තුළත් රජය තීරණයක් ගත්තා, මේ රටේ වී වගාව හෙක්ටයාර ලක්ෂයකින් -අක්කර 2,50,000කින්- අඩු කරන්න ඕනෑය කියලා. එහෙම තීරණයක් මේ රජය ගත්තාට පස්සේ කන්න දෙකක් ජලය තිබුණා, හැබැයි ගොවීන්ට වගා කරන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ. අනික් පැත්තෙන් කන්න දෙකක් සම්පූර්ණයෙන් නියඟයකට හසු වුණා. එම නිසා වර්තමානයේ ඇතිවෙලා තිබෙන මේ තත්ත්වයට, ගොවියා අසරණ වීමට එක පැත්තකින් රජයේ වැරැදි තීන්දු තීරණ බලපෑවා වාගේම ස්වභාව ධර්මයත් ඊට හරස්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සහනාධාර ලබාදීමේ වැඩ පිළිවෙළ මේ වනකොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. හැබැයි මේ සහනාධාර ලබාදීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතින කාල පරිච්ඡේදයේදී ජනතාවට රජය ලබා දෙන සහනය පිළිබඳව අපේ එතරම් සතුටක් නැහැ, ජනතාව තුළ සතුටක් නැහැ. එයට හේතුව මෙයයි. අපූරුවට තුන් වේල බත් කාලා හිටපු රටක්, අපූරුවට තුන් වේල බත් කන්න පුරුදුවෙලා හිටපු රටක් නැවත පිටි කන යුගයකට ගෙන යනවා. එම නිසා මා හිතනවා, රජය මේ සම්බන්ධයෙන් මීට වඩා කල්පනාකාරී විය යුතුයි කියලා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අදත් මේ ගරු සභාව තුළ ඒ ගැන කථා කළා. එක මාසයකට රුපියල් 10,000 බැගින් වූ වන්දි මුදලක් මාස හතරකට ලබා දෙනවාය කියලා තමයි අතිගරු ජනාධිපතිතුමා අනුරාධපුරයේදී ප්‍රකාශ කළේ. එක මාසයකට රුපියල් 10,000ක් බැගින් මාස 4ක් දෙනවා. ඒ වාගේම එතුමා නියෝග ලබා දුන්නා, සිංහල අවුරුදු කාලයට පෙර රුපියල් 10,000ක මුදලක් එක පවුලකට ලබා දෙන්නය කියලා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සහනාධාර මේ වන කල් ලැබිලා නැහැ. මේ වන කල් ලැබී තිබෙන්නේ ඉතාමත් තෝරා ගත් පිරිසකට රුපියල් 8,650ක් පමණයි. රුපියල් 8,650ක සහනාධාරයක් දේශපාලන වශයෙන් තෝරා ගත් පිරිසකට එක මාසයකට ලබා දීලා තිබෙනවා. එතකොට ඉතිරි මාස තුනට මොකද වුණේ? ඒක ක්‍රියාත්මක නොකර පසු ගිය දා රජය නැවත නිවේදනය කරනවා, සහනාධාර හැටියට එක පවුලකට මාසයකට රුපියල් 5,000ක මුදලක් ලබා දෙනවාය කියලා. ඒකත් මාස දෙකකට ක්‍රියාත්මක කරන්නයි. ඒ සඳහා පවුල් 25,000ක් නම් කරනවා. මේ පවුල් 25,000 තෝරා ගන්නේ කොහොමද?

මුළු රටෙන් තුනෙන් එකක් නියඟයෙන් හානිවෙලා. අනෙක් පැත්තෙන් ලබා දෙනවාය කියපු සහනාධාර දෙන්නේ නැතුව, නැවත අලුත් සහනාධාරයක් ලබා දෙන්න රජය පොරොන්දු වෙනවා. හැබැයි, මේ බැරෑරුම් ප්‍රශ්නය සම්බන්ධයෙන් රජය ඉතාම සැහැල්ලුවෙන් කටයුතු කිරීම තමයි අපට තිබෙන ප්‍රශ්නය. රජය ඉතාම සැහැල්ලුවෙන් කටයුතු කරන්නේ. වගකීම් විරහිත විධියට තමයි රජය මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ. ඒ නිසා අද අපේ ප්‍රදේශවල ජනතාව දිළිඳු බවින් මිරිකිලා ඉන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජීවත් වෙන්න ක්‍රමවේදයක් නැහැ. වේල් තුනක් කාපු පවුලක් දැන් වේල් දෙකයි කන්නේ. ළමයින්ට වේල් දෙකක් කන්න දීලා දෙමව්පියෝ එක වේලයි කන්නේ. එහෙම තත්ත්වයක් තිබියදී තෝරාගත් එක්තරා දේශපාලන පක්ෂයක කණ්ඩායමක් සඳහා පමණක් සහනාධාර ලබාදීම ඉතාම අසාධාරණ ක්‍රියාවලියක්. මොකද, මේ නියඟයේ බලපෑමත්, එහෙම නැත්නම් රජය වී වගාව නතර කිරීම සඳහා කරපු බලපෑමත් එල්ලවී තිබෙන්නේ එක පක්ෂයකට විතරක් නොවෙයි. සමස්ත ගොවි ජනතාවටම මේ අර්බුදය තිබෙනවා. ඒ නිසා මේ ආකාරයට කටයුතු කරන්න එපාය කියා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

අද ඉතාම වැදගත් විවාදයක් පවත්වන අවස්ථාවක මේ රටේ කෘෂිකර්ම ඇමතිතුමා මේ පාර්ලිමේන්තුව තුළ සිටිය යුතුයි. එතුමා මේ ගරු සභාවේ ඉඳලා මේ කාරණය සම්බන්ධයෙන් සහ මේ රටේ දිළිඳු ජනතාව සම්බන්ධයෙන් මීට වඩා ලොකු අවධානයක් යොමු කළ යුතුයි. එතුමාත් අනුරාධපුර දිස්ත්‍රික්කය -රජරට ප්‍රදේශය- නියෝජනය කරන්නේ. හැබැයි, මේ රජය ජනතාව කෙරෙහි කොතෙක් දුරට කටයුතු කරනවාද කියලා මේකෙන්ම තේරෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ජනතාවට තිබෙන ප්‍රශ්නය තමයි, මේ රජය ලබාදුන් පොරොන්දු දිගින් දිගටම කඩකරමින් සිටීම. පසුගිය රජයට දිගින් දිගටම චෝදනා කරපු මේ රජය, 2014 වෙද්දී සහල් අතිරික්තයක් තිබුණු මේ රටට අද වෙනකොට රටවල් 4කින් සහල් ආනයනය කරන තැනට තල්ලු කරලා තිබෙනවා. සහල් ආනයනය කරද්දී, එක පැත්තකින් ආණ්ඩුව පොහොර සහනාධාරය නැවැත්තුවා. පොහොර සහනාධාරය නවත්වනවා කියලා ආණ්ඩුව කිව්වේ නැහැ. හැබැයි, උපක්‍රමශීලීව ඒක නැවැත්තුවා. "කන්න දෙකක් වගාකරන්න රුපියල් 25,000ක් ලබාදෙනවා, එක කන්නයකට රුපියල් 12,500යි" කියලා කිව්වා. හැබැයි, රුපියල් 350ට ලබාදුන් පොහොර මිටිය රුපියල් 2,500 දක්වා ඉහළ යනවා. එහෙම වෙද්දී රජය කිව්වා, ගුණාත්මක භාවයෙන් ඉහළ පොහොර ලබා ගැනීම සඳහා තමයි මේ කර්තව්‍ය කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් ගෙන ගිය ප්‍රතිපත්තිය තුළ අද සමස්ත කෘෂි කර්මාන්තයම කඩා වැටීම තමයි අපට තිබෙන ප්‍රශ්නය. සමස්ත කෘෂි කර්මාන්තයම කඩාවැටිලා තිබෙන කොට මේ රටේ නිෂ්පාදය ඉහළ යන්නේ නැහැ. ඒ නිසා තමයි අපේ රටේ ඉන්න වෙළෙන්දෝ අද දරුණු අවපාතයකට හසුවෙලා ඉන්නේ. උදේ කිව්වා වගේ, මේ වෙනකොට හැම නගරයකම වෙළෙඳ සැල් එකින් එක වැසීගෙන යනවා.

සිංහල - දෙමළ අලුත් අවුරුද්ද කාලයේ තමයි බොහොමයක් වෙළෙඳ සැල් තමන්ගේ ණය ගෙවලා, අලුතින් ආදායමක් ලබාගෙන -ලාභයක් ලබාගෙන- තමන්ගේ ජීවිතය ඉස්සරහට ගෙනයන්නේ. හැබැයි, දැන් තිබෙන දරුණු ආර්ථික අවපාතය තුළ සහ කෘෂි කර්මාන්තයේ සිදුවී තිබෙන දැවැන්ත කඩාවැටීම තුළ මෙවර සිංහල - දෙමළ අලුත් අවුරුදු කාලයේ වෙළෙන්දන්ට තමන්ගේ ණය තුරුස් ගෙවාගන්නත් බැරි වුණා, අනෙක් පැත්තෙන් ණය ප්‍රමාණයත් වැඩි වුණා. ඒ නිසා මේ රජයේ ඉලක්කය මොකක්ද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මෙවැනි නියඟයක් ඇවිල්ලා තිබියදී, ජනතාව සහනාධාර බලාපොරොත්තු වෙද්දී අහක බලාගෙන ඉඳලා හරියන්නේ නැහැ. ඒ සඳහා විසඳුමක් ලබාදිය යුතුයි. වර්ෂාව ලබාදීම රජයට කළ හැකි දෙයක් නොවෙයි. හැබැයි, වර්ෂාව නොලැබීමෙන් අගතියට පත්වන පාර්ශ්වයන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් නිවැරදි කළමනාකරණයක් කළ යුතුයි. අපි කියන්නේ නැහැ, ආණ්ඩුවට වැස්ස වස්සන්න පුළුවන් කියලා. හැබැයි, ආණ්ඩුවට පුළුවන් යම් වැඩ පිළිවෙළක් හදලා, නිවැරදි කළමනාකරණයක් කරලා කබෙලන් ළිපට වැටුණු ජනතාව නැවත නඟා සිටුවීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ අවස්ථාවේ පක්ෂ පාට භේදයකින් කටයුතු කරන්න එපා, තමන්ගේ පාට කණ්ණාඩිවලින් බලන්න එපා කියලා අපි මේ රජයෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මේ නියඟය අවස්ථාවේ කොළ පාටට එක විධියකටත්, නිල් පාටට තව විධියකටත්, වෙනත් පාටවලට තවත් විධියකටත් සලකන්න එපා. ඒ නිසා මේ රටේ ඇති වී තිබෙන මෙම ස්වභාවික උවදුර අවස්ථාවේ වර්තමාන රජය ජනතාව දෙස බැලීමේදී සහ සහන සැලසීමේදී ඉතාම අක්‍රමවත් වැඩ පිළිවෙළක්

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

තමයි ක්‍රියාත්මක කරගෙන යන්නේ. එක දවසක් ජනතාවගේ පීඩනය එද්දී, එක පොරොන්දුවක් ලබා දෙනවා. "අපි මාසයකට රුපියල් 10,000ක් ලබාදෙනවා" කියනවා. ඊළඟට ඒක ලබා නොදී කියනවා, "නැහැ, අපි දැන් රුපියල් 5,000ක බඩු මල්ලක් ලබාදෙන්න අවශ්‍ය කටයුතු කරනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියඟය සම්බන්ධයෙන් විතරක් නොවෙයි, මේ වාගේ ස්වභාවික උවදුරු අවස්ථාවන්වලදී, එක පැත්තකින් ගංවතුරින් අවතැන් වූ ජනතාවට සහන සැලසීමේදී රජයේ මැදිහත් වීමක් අදටත් නිවැරදිව සිදුවෙලා නැහැ. ඒ ජනතාව නඟා සිටුවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා නැහැ. කෑගල්ලේ ඇති වූ නායයෑමෙන් අවතැන් වූ ජනතාවට සහන සැලසීමේදීත් මෙවැනිම උදාසීන ප්‍රතිපත්තියක් තමයි රජය අනුගමනය කළේ. රජය ඊට අදාළ පිළිතුරු ලබාදුන්නේ නැහැ. ජනතාවට සහන ලබා දුන්නේ නැහැ.

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, point of Order එක මොකක්ද?

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තාම ඒ අවශ්‍ය කටයුතු සෑහෙන දුරට අවසන් කරලා තිබෙනවා. ඔබතුමා කෑගල්ලට ඇවිල්ලා බලන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ කථාවේදී පැහැදිලි කිරීමක් කරන්න. හැබැයි, කුඩාරම්වල ඉන්න ජනතාව අදටත් තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ යටතේ තමයි කුඩාරම්වල ඉන්නේ කියලා ඔබතුමා කියනවා නම්, තමුන්නාන්සේලාට සතුටු වෙන්න පුළුවන්. අපි කියන්නේ, සිදු නොවෙච්ච කාර්ය භාරය තමුන්නාන්සේලා අතින් සිදු විය යුතුයි කියලායි. හැබැයි, තමුන්නාන්සේලා රජයේ වගකීම ඉටු කරන්නේ නැතිව රජයේ වගකීම නිවැරදිව ඉටු කළා කියලා කියනවා නම්, ඒකෙන් තමුන්නාන්සේලාට හිත හදා ගෙන ඉන්න පුළුවන්. හැබැයි, රටේ සමස්ත ජනතාව ඒක පිළිගන්නේ නැහැ.

තමුන්නාන්සේලාගේ රජය නියෝජනය කරන කණ්ඩායම කියනවා, "ඔව්, අපි ජනතාවට සහන සැලසුවා. ජනතාවට කිසිම ප්‍රශ්නයක් නැහැ. ජනතාව ඉතා සතුටින් ජීවත් වෙනවා." කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය කියන කාරණය අදාළ වෙන්නේ මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට විතරයි. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ජනතාවගේ දුක තේරෙන්නේ නැහැ. මොකද, ඔවුන් බලයට ආවේ මේ රට සදාකල්ම පාලනය කරන්නයි කියලා හිතාගෙන ඉන්නවා. දේශපාලන කෝණයකින් බලන්නේ නැතිව, මේ රටේ සමස්ත ජනතාවට -නියඟයට හසුවෙච්ච තුනෙන් එකක් වෙච්ච දිස්ත්‍රික්කවල ජනතාවට- මේ පහසුකම් ටික ලබා දිය යුතුයි.

අවසාන වශයෙන් කියන්න ඕනෑ, ඊළඟ කන්නය වගා කිරීමේ ගැටලුවක් අද තිබෙන බව. වර්ෂාව ලැබුණත්, ඊළඟ කන්නය වගා කිරීමේ ගැටලුවක් ගොවි ජනතාවට තිබෙනවා. හේතුව? කොහේද තිබෙන්නේ, බිත්තර වී ටික? කොහේද තිබෙන්නේ, පොහොර සහනාධාරය? කෝ, අනෙකුත් ලබා දෙන සහනාධාර ටික? කෝ, මෙවැනි අවස්ථාවන්වලදී ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ? නියඟය අවස්ථාවේ දී අක්‍රමවත් විධියට අද වන තුරු රජය කටයුතු කළා වාගේම, වර්ෂාව ලැබුණහොත් ඊළඟ කන්නය සාර්ථක කර ගැනීම සඳහාත් වැඩ පිළිවෙළක් නැහැ. නිවැරදි උපදෙසක් ලබා දීමේ ක්‍රමවේදයක් ඒ නිලධාරින්ට නැහැ. වර්තමාන රජය ඉතාම නිර්ලජ්ජිත ආකාරයට ඇවිල්ලා ජනතාව ඉදිරියේ කියනවා නම්, "අපි ජනතාවට සහන සලසා තිබෙනවා." කියලා; අපි කියනවා තමුන්නාන්සේලාට මහ පොළොවේ පය ගහලා ජීවත් වෙන්න විධියක් නැහැ කියලා. තමුන්නාන්සේලා මහ පොළොවේ අද තත්ත්වය දන්නේ නැහැ. දන්නේ නැති නිසා තමයි දිගින් දිගටම කියන්නේ, "මේ රජයේ ක්‍රියාකාරීත්වය හොඳයි." කියලා. හෘදය සාක්ෂියට එකඟව තමුන්නාන්සේගේ හදවතට තට්ටු කරලා බලන්න. මේ හොඳයි කියන මන්ත්‍රීවරු; නිවැරදි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවායි කියන මැති-ඇමතිවරු තමන්ගේ හෘද සාක්ෂියට කථා කරලා බලන්න තමන්ට ඡන්දය දීපු ජනතාවට සාධාරණයක් තමන්ගේ රජය තුළින් ඉටු වෙලා තිබෙනවාද කියලා. ඒ සාධාරණය රජය තුළින් ජනතාව බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම මේ වාගේ ආපදා අවස්ථාවකදී රජය තුළින් සාධාරණය වැඩි වැඩියෙන් ජනතාව බලාපොරොත්තු වනවා. ඒ නිසා ආපදාවලට ලක්වුණු ජනතාව නගා සිටුවීම සඳහා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතුයි. අපි කියන්නේ, එක පැත්තකින් වගා කරපු ගොවියන්ට විතරක් සහනාධාර දීලා හරියන්නේ නැහැ කියලායි. අනෙක් පැත්තෙන් ඒ ගොවි ජනතාව පමණක් ඉලක්ක කර ගෙන සහනාධාර දීලා හරියන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගොවි ජනතාව වෙනත් වෘත්තීන්වලත් යෙදෙනවා. හැබැයි, අද ඔවුන්ට ජීවායෙහි යෙදෙන්න ක්‍රමවේදයක් නැහැ. අද, කම්කරුවන්ගේ රැකියාව අහිමි වෙලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් යම් වෘත්තීයක යෙදෙන සියලුම කණ්ඩායම්වලට තමන්ගේ රැකියා අහිමි වෙලා තිබෙනවා. අපි මෙවැනි අවස්ථාවකදී කනගාටු වෙනවා. රජය කියනවා නම්, රජය පාර්ශ්වයෙන් ජනතාවට ඉටු විය යුතු කාරණාව ඉටු වුණා කියලා ඒක ඉතාම වගකීම් විරහිත ප්‍රකාශයක් ලෙස අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් පරක්කු වැඩියි. රජයේ අවධානය යොමු කළ යුතු කාලය දැඩි සේ පරක්කු වෙලා. හැබැයි, පරක්කුවෙලා හරි මේ රටේ ජනතාව තුන්වේල කාලා සිටිය යුතුයි කියන පදනම අමතක කරන්න එපා. දෙමව්පියෝ තමන්ගේ දූ-දරුවන් එක්ක සතුටින් තම පවුල් ජීවිත ගත කරන්න ඕනෑ කියන පදනම අමතක කරන්න එපා. දරුවෝ පාසලට ගිහිල්ලා තමන්ගේ අධ්‍යාපන කටයුතු කරන්න ඕනෑ. අනාගතයට තමන්ගේ දරුවා අරගෙන යන්න ඕනෑ. එය ඇහිරෙන තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි රජයෙන් ඉල්ලන්නේ, මීට වඩා වගකීමකින් කටයුතු කරන්න කියලායි. කරුණාකර මැති-ඇමතිවරු තමන්ගේ දේශපාලන ප්‍රදේශයන්වලට; තමන්ගේ මැතිවරණ ආසනවලට යන්න. ගිහිල්ලා බලන්න, අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ප්‍රදේශවල බොන්න වතුර නැහැ. අපි ඒ සම්බන්ධයෙන්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර 30ක් දෙන්න.

මම ඒ සම්බන්ධව ආපදා කළමනාකරණ ඇමතිතුමාගේ අවධානය යොමු කළා. එතුමා අදාළ නිලධාරින්ට උපදෙස් දුන්නා කියලා දැනුම් දුන්නා. හැබැයි, අද වන තුරු අපේ ප්‍රදේශවල ඒ කටයුත්ත ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේක අසීරු කාලයක්. අසීරු කාලය තුළ තමයි වැඩි වැඩියෙන් රජය මැදිහත් විය යුත්තේ. එවැනි තත්ත්වයක් යටතේ රජයේ මැදිහත් වීම ඉතාම අවම මට්ටමින් තිබෙනවා විතරක් නොවෙයි,

නිලධාරින්ට තමනේග් රාජකාරි ඉටු කිරීම සඳහා නිවැරදි උපදෙස් පත්‍රිකාවක් ලබාදීමත් රජය මඟ හැර තිබෙනවා. නිලධාරින්ට ඕනෑ නම් මේ කටයුතු කරන්න, ඕනෑ නැත්නම් කරන්න එපා කියන පදනම උඩ කටයුතු කරනවා. හැබැයි, ඔවුන්ට තිබෙන ප්‍රශ්නය මෙයයි. මේ නිලධාරින් සානුකම්පිකව ජනතාව දෙස බලා සානුකම්පිකව ඒ ජනතාවට අවශ්‍ය සහන දෙන්න කටයුතු කළොත් නැවත නීතියේ රැහැනට හසු කර ගනීවිද කියා ඔවුන්ට භයක් තිබෙනවා. ඔවුන්ට ආරක්ෂාවක් දෙන්න කණ්ඩායමක් නැහැ. රජයේ මැති ඇමතිවරුනුත් මේ කාරණය මඟ හරිනවා. නිලධාරින්ට තමන්ගේ රාජකාරිය ඉටු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාව ලබා දීමත් මඟ හැර තිබෙනවා. එම නිසා මෙවැනි අවස්ථාවක වර්තමාන රජය ඉතාම පහසු ආකාරයෙන් මේ කාරණයට මැදිහත් වෙනවා විතරක් නොවෙයි, බොහොම උදාසීන ආකාරයෙන් මේ කටයුත්ත කිරීම සම්බන්ධව අපි ඉතාම කනගාටු වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.42]

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ නායක ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා නියඟය පිළිබඳව; නියඟයට ලක් වූ උදවියට රජය සහනාධාර ලබා දීම පිළිබඳව සභාව කල්තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. දැනට අපි මේ නියං සහනාධාර වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර සති ගණනාවක් වෙනවා. ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් තීන්දු කර, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව වාගේ ප්‍රදේශවලට ගිය සතිය වෙනකොට ඒ සහනාධාර ලබා දී තිබෙනවා. අපි දන්නවා, හැම දාම අපි යමක් ආරම්භ කරන විට ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුවට ඇවිත් මහ ලොකුවට යෝජනා ඉදිරිපත් කරලා, රජය ගෙනයන ඒ වැඩ පිළිවෙළ ඒ ගොල්ලන්ගේ යෝජනාවක් හැටියට ක්‍රියාත්මක කරන්නට උත්සාහ කරන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සහනාධාර ගැන කථා කරනකොට නියං සහනාධාර විතරක් නොවෙයි. අපේ රජය බලයට පත් වුණාට පස්සේ සමෘද්ධි මුද්දරය එකට තුනකින් වැඩි කර තිබෙනවා. අපේ රජය බලයට පත් වෙනකොට, සමෘද්ධි මුද්දරයෙන් රුපියල් දාහක ප්‍රතිලාභ ලැබූ උදවිය අද රුපියල් තුන්දාහක ප්‍රතිලාභයක් ලබනවා. ඒ වාගේම අපේ ප්‍රදේශයේ වයස අවුරුදු 70 ඉක්මවා ගිය අය අද රුපියල් දෙදහක ප්‍රතිලාභයක් ලබනවා. ඒ වාගේම අපේ රජය බලයට පත් වෙනකොට අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කවල වකුගඩු රෝගයෙන් පීඩාවට පත් වෙලා හිටි උදවියට රුපියල් පන්සියයි පසුගිය රජය දී තිබුණේ. දැන් අපි ඒ මුදල රුපියල් පන්දාහ දක්වා වැඩි කර තිබෙනවා. එකට දහයකින් වැඩි කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල නියඟයට අසු වෙච්ච ජනතාවට ඒ අවස්ථාවේදී රුපියල් දහ දාහක මුදලක් ලබා දුන්නා. ඒ රුපියල් දහ දාහෙන් ලබා දී තිබෙන්නේ රුපියල් අටදහස් හයසියයි. රජයේ ප්‍රතිපත්තියක් තිබෙනවා. නියඟයෙන් වගා හානි වුණු ගොවීන්ට ඒ හානි සඳහා මුදල් ලබා දෙන්නේ කෘෂි රක්ෂණ මණ්ඩලයෙන්. එතකොට කෘෂි රක්ෂණ මණ්ඩලයට වගාවන් වෙනුවෙන් අය විය යුතු මුදලක් තිබෙනවා. ඒ මුදල අඩු වුණාම ඉතිරි වෙන්නේ, රුපියල් අටදහස් හයසීයයි. රක්ෂණ වන්දියක් ගෙවන්න අපේ රටේ නීතියක් තිබෙනවා. වගාවකට හානියක් වුණාම ඒ හානියට වන්දි ගෙවන්නේ කෘෂි රක්ෂණ මණ්ඩලයෙන්. කෘෂි රක්ෂණ මණ්ඩලය මඟින් වාරික හැටියට ඒ මුදල් ගෙවා ගෙන යනවා. තව වාරික කිහිපයක් ඉතිරි වෙලා තිබෙනවා. ඒවාත් රජය මඟින් ඉදිරියේදී ගෙවන්නට කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපට රටක් හැටියට, රජයක් හැටියට විවිධ ව්‍යසනවලට මුහුණ දෙන්නට සිද්ධ වුණා. ඉතිහාසයේ කවදාවත් බලාපොරොත්තු නොවුණු දේවල් තමයි ඒ. නමුත් අපි ඒ ව්‍යසනවලට ගොදුරු වෙච්ච සෑම තැනකටම; ඒ වාගේ ගෙවල් දොරවල් නැති වෙච්ච උදවියගේ නැති වෙච්ච ගෙවල් දොරවල් යථා තත්ත්වයට පත් කරන්න රජක් හැටියට කටයුතු කර තිබෙනවා.

ගරු සේමසිංහ මන්ත්‍රීතුමා කිව්වා, "ඇයි, පිට රටින් ලංකාවට සහල් ගෙන්වන්නේ?" කියා. "දැන් පිටි කෑම වැඩි වෙලා" කියා එතුමා කිව්වා. තවදුරටත් එතුමා කිව්වා, "කන්න හතරක් වගා පාළු වුණා." කියා. කන්න හතරක් වගා පාළු වුණාට පස්සේ පිට රටින් සහල් ගෙන්වන්නේ නැතිව මොකක්ද අපි කරන්නේ? රජයක් හැටියට අපිට අවශ්‍ය වෙලා තිබෙනවා, මේ රටේ බත් කන අයට; බත් කන්න පුරුදුවෙලා තිබෙන අයට; සහල් පරිභෝජනය කරන අයට සහල් තිබෙන රටවලින් සහල් ගෙනැවිත් ඒ සහල් ලබා දෙන්න. කන්න හතරක් පාළු වුණේ එක්සත් ජාතික පක්ෂයේ වැරැද්දකින් නොවෙයි. ලෝකයේ සෑම රටකටම බලපාන කාලගුණ විපර්යාසවල එක තත්ත්වයකට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. එතුමාගේ කථාවේදී එතුමා කිව්වා, බොන්න වතුර නැහැ කියලා.

අපි දැක්කා, පසු ගිය දින කිහිපයේ අතිගරු ජනාධිපතිතුමා ආපදා කළමනාකරණ ඇමතිතුමා එක්ක සම්බන්ධ වෙලා ආපදාවෙන් විපතට පත් වුණු ප්‍රදේශයට ජල බවුසර 100කට වැඩි ප්‍රමාණයක් බෙදා දුන් බව. ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ වාගේම ප්‍රාදේශීය සභාවලට ජල බවුසර් බෙදා දුන්නා. අපේ ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරු සහ දිස්ත්‍රික් ලේකම්වරු මේ වෙනකොට ඒ ජල බවුසර ප්‍රමාණවත් නොවන නිසා තවත් ජල බවුසර කුලියට අරගෙන ජලය බෙදාදීමේ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම විශේෂයෙන්ම මෙතැනදී මම සඳහන් කරන්න ඕනෑ, අපි දැකපු දෙයක් එක් දෙයක්. ඒ තමයි මේ රටේ ආණ්ඩුව යමක් කරනකොට විපක්ෂයේ අය -විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ,- එය විවේචනය කරලා, අපහාස කරලා, ඒවාට නින්දා කරන බව. අපි දැන් මේ වැඩකටයුත්ත ආරම්භ කරලා නියඟයෙන් හානියට පත්වුණු උදවියගේ අවශ්‍යතා ඉෂ්ට කරගෙන යනකොට මේ අය මෙතැනට පැනලා ඒවා විවේචනය කරන්න කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම කියන්න කැමැතියි, පොළොන්නරු දිස්ත්‍රික්කයේ නියඟය පැවැතුණත් පසුගිය සති කිහිපයේදී පොළොන්නරු දිස්ත්‍රික්කයට හොඳ වර්ෂාපතනයක් ලැබුණු බව. නියඟය නිසා ඉතාම භයානක තත්ත්වයකට මුහුණ පාන්න ඉඩ තිබුණද, වර්ෂාව නිසා අපි ඒ

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

තත්ත්වයෙන් යම් තරමකින් බේරුණා. එතුමා කිව්වා, දේශපාලන වශයෙන් මේ සහනාධාර ප්‍රතිලාභීන් තෝරනවා කියලා. එහෙම කරන්නේ නැහැ. මෙතැන කිසි දේශපාලනයක් නැහැ. මේ සහනාධාර ලැබිය යුතු පුද්ගලයන් තෝරන්නේ ගමේ තිබෙන කමිටුවකින්. ඒ කමිටුවට ග්‍රාම නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, කෘෂි පර්යේෂණ නිලධාරි සහ ගමේ ස්වේච්ඡා සංවිධානවල එක් නිලධාරියෙක් ඇතුළත් වෙනවා. මේ අය එකතුවෙලා තමයි සහනාධාර ලැබිය යුතු අය තෝරන්නේ. මොකද, සහනාධාර ලැබිය යුතු අය ලෙසට සියලුදෙනා තෝරන්න බැහැ. විවිධ ආදායම් මට්ටම්වල අය ඉන්නවා. ග්‍රාම සේවා වසමක් ගත්තොත්, ඒ ග්‍රාම නිලධාරි වසමේ ආදායම් මට්ටම උස් පහත් අය ඉන්නවා. මේ තේරීමේ කටයුත්ත කිසිම දේශපාලන වටපිටාවකින් තොරව අපේ ප්‍රදේශයේ සිදු කරන්න කටයුතු කරලා තිබෙනවා. සමෘද්ධි සංවර්ධන නිලධාරි, කෘෂි පර්යේෂණ නිලධාරි, ග්‍රාම නිලධාරි සහ ගමේ ස්වේච්ඡා සංවිධානවල නිලධාරියෙක් නැත්නම් දෙදෙනෙක් එකතු වෙලා තමයි මේ රුපියල් 5,000ක සහනාධාරය ලබාදිය යුතු අය තෝරන්නේ. ඒ නිසා විශ්වාසවන්ත විධියට, ජනතාවාදී විධියට නියං සහනාධාර ලබා දීමට අපි කටයුතු කරගෙන යන බව කියමින් අද මට අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

[අ.භා. 4.49]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම භයානක ආකාරයට රටේ දිස්ත්‍රික්ක 15කට වැඩි ගණනාවක් නියඟයට ගොදුරු වෙලා තිබෙන මේ වේලාවේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මේ වාගේ යෝජනාවක් සාකච්ඡාවට ගැනීම පිළිබඳව මා සතුටු වෙනවා. ඒ වාගේම නියඟයෙන් පීඩාවට ලක් වෙච්ච ලක්ෂ 15කට වැඩි ජනතාවට යම් ආකාරයක සහනයක් ලබා දීමට මේ යෝජනාව ඉවහල් වනු ඇතැයි කියාත් අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම උතුර, උතුරු මැද, වයඹ, දකුණ වැනි පළාත්වල බරපතළ ආකාරයේ නියං තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ නිසා විශේෂයෙන්ම කෙටි කාලීන බෝග, වී වගාව සහ හේන් වගාව සම්පූර්ණයෙන් කරගත නොහැකි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. බහු වාර්ෂික බෝග හැටියට කෙසෙල් වගාව බරපතළ ආකාරයේ අනතුරකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම වැවිලි බෝග හැටියට සැලකෙන පොල් වගාවත් බරපතළ අනතුරකට මුහුණ දී තිබෙනවා. ඊයේ ජනමාධ්‍ය හරහා වාර්තා කරලා තිබෙනවා මම දැක්කා, ඵලදාව ලබන අවුරුදු 25, 30 පැරණි පොල් ගස් දසදහසකට වඩා විනාශ වෙලා තිබෙනවා කියලා. මේ තත්ත්වය තුළ රටේ ආහාර සුරක්ෂිතතාවට බරපතළ තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා වාගේම නියඟයට ගොදුරු වුණු පළාත්වල දැඩි ආහාර හිඟයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසාම සමස්ත රටම මේ වනකොට දැඩි ආහාර අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. මොකද, බෝග වගාවන් කෙරෙන ප්‍රදේශවල වගාවන් නැති වුණාට පසුව රටේ අනෙකුත් පළාත්වලට ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාවක් කිසිසේත්ම නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මෙය ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

මීට මාස දෙකකට පමණ ඉස්සෙල්ලා රටේ තවත් පළාත් කිහිපයක් දැඩි ආකාරයට ගංවතුර තර්ජනයට ලක් වුණා. එක පැත්තක ගංවතුර, අනෙක් පැත්තේ දැඩි නියඟය. ස්වභාව ධර්මය පවා මේ වනවිට අපේ රටේ පැවැත්ම, සාමාන්‍ය ජන ජීවිතය කඩාකප්පල් වන ආකාරයට ඉතාම නරක ආකාරයෙන් බලපා තිබෙනවා. ඒ නිසා ජන ජීවිතය සම්පූර්ණයෙන් කඩාගෙන වැටිලා. මේ වේලාවේ අපි රජයෙන් ඉල්ලා සිටින්නේ, වග කිව යුතු රජයක් හැටියට කටයුතු කරන්න කියන එකයි. "මේ නියඟය නවත්වන්න කටයුතු කරන්නේ නැහැ" කියා ආණ්ඩුවට චෝදනා කරන්න බැහැ. මොන ආණ්ඩු තිබුණත් නියඟය එනවා; වර්ෂාව එනවා; එම කටයුතු සිද්ධ වෙනවා. හැබැයි, එවැනි දේවල් සිදු වෙන කොට, එම තත්ත්වයෙන් පීඩාවට පත් වෙන ජනතාවට යම් කිසි ආකාරයක සහනයක්, සහනාධාරයක් ලබා දීමට රජයට යම් කිසි වැඩ පිළිවෙළක් තිබිය යුතුයි.

ගරු ජනාධිපතිතුමා පසුගිය දිනෙක ප්‍රකාශ කළා, "මාස හතරක නියං සහන එක මාසයක රුපියල් 10,000 ගණනේ එක්වරම ලබා දීමට අපි කටයුතු කරනවා"ය කියලා. ඒක ලබා දුන්නා නම් හොඳයි. හැබැයි, මේ වෙනතෙක් ඒ මුදල තවම ලැබී නැහැ. මෙවැනි ප්‍රශ්නයකට මුහුණ දුන් ජනතාව ඉස්සහරට ගිහිල්ලා "මේ කටයුත්ත අපි මේ ආකාරයෙන් කරනවා" කියලා තාවකාලිකව ඔවුන් සතුටට පත් කරනවා වාගේම, ඒ ප්‍රශ්නය සඳහා පිළිතුරක් ලබා දීමත් සිදු විය යුතුයි. ඒ ප්‍රමාදවීම තුළ නියඟයට මුහුණ දුන් ජනතාව බරපතළ ආකාරයෙන් පීඩනයට ලක් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තමයි රටේ හැම තැනින්ම වාර්තා වෙන්නේ. අර කොටදෙනියාවේ සේයා සදෙව්මි දැරිය ඉතාම අමානුෂික ආකාරයට දූෂණය කර මරා දැම්මාට පසුව මේ පාර්ලිමේන්තුවේ දැනට නියෝජ්‍ය ඇමතිවරුන් වශයෙන් සිටින අය එදා කෑ ගහලා ලොකුවට කිව්වා, "අපි වහාම මරණීය දණ්ඩනය නීතිගත කරනවා, අපි වහාම මේ ඔක්කොම එල්ලා මරනවා" කියලා. මේ විධියට පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවකුත් ගෙනාවා. ලජ්ජයි කියන්න. ඒ ඇමතිවරයාත් නැහැ, නියෝජ්‍ය ඇමතිවරයාත් නැහැ. කොණ්ඩයා ගෙදර ගියා, කොණ්ඩයාගේ අයියා හිරේ ගියා. එල්ලා මරා දැම්මාද? ඒ විධියට ප්‍රශ්නයක් වුණාට පසුව එම ප්‍රශ්නයට ක්ෂණික විසඳුම් හැටියට කුමන ප්‍රකාශයක් හෝ කරලා ඇඟ බේරා ගැනීමේ "සංජය බෙල්ලට්ඨිපුත්ත න්‍යාය" තමයි මේ ආණ්ඩුව අනුගමනය කරන්නේ. ප්‍රශ්නවලට සැබෑ විසඳුමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ වන විට ඇති වී තිබෙන මේ නියං තත්ත්වයට මුහුණ දෙන්න දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්, විද්‍යාත්මක වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවට තිබෙනවා නම්, මේ වේලාවේ කළ යුතු වෙන්නේ තාවකාලිකව ඒ අයට යම් යම් සහනාධාර ලබා දෙමින් ජීවිතය ආරක්ෂා කර ගැනීමට ඒ අයට උදවු උපකාර කරනවා වාගේම, දීර්ඝ කාලීන විසඳුම් හැටියට, වියළී ගිය, සම්පූර්ණයෙන් හිඳිලා ගිය මේ වැව් අමුණු වාරි පද්ධතිය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහා මුදල් ආයෝජනයක් කරලා මේ වාරි කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ කටයුත්තක් කරන එකයි. මොකද, වැව් හැම දාම හිඳෙන්නේ නැහැ. වැව් හිඳෙන කාලයට එම වැව් ටික ගොඩ දමා ගන්නා වැඩ පිළිවෙළක්වත් මේ ආණ්ඩුවට තිබෙනවාද කියන එක පිළිබඳව අපි නම් දැක්කේ නැහැ. අද වනවිට උතුරු මැද පළාතේ, උතුරු පළාතේ, වයඹ පළාතේ සහ දකුණු පළාතේ මේ ආකාරයට හිඳිලා, වේළිලා ගිහින් තිබෙන වැව් ටිකේ රොන් මඩ නියමිත පරිදි අයින් කරලා නැවත වර්ෂා කාලයට වතුර පිරෙන්න පුළුවන් මට්ටමට හදා ගත්තොත්, ඉදිරි කාලයේදී හෝ එන නියං තත්ත්වයට මුහුණ දීමේ වැඩ පිළිවෙළක් අපට හදා ගන්න පුළුවන්. හැබැයි, ආණ්ඩුවට එවැනි විද්‍යාත්මක වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක පිළිබඳව අපට පෙනෙන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ. කිසිම වැඩ පිළිවෙළක් නැතුව ආණ්ඩුව ඉබාගාතෙ ඇවිදිනවා.

කෘෂිකර්ම අමාත්‍යාංශයක් තිබෙනවා. ගොවියා හානියට පත් වෙලා. කෘෂිකර්ම ඇමතිතුමා ඉන්නේ අනුරාධපුරයේ. උතුරු මැද පළාත සම්පූර්ණයෙන්ම වේළිලා ගිහින්. හැබැයි, තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ඇත්තටම අද එම පළාත්වල ඉන්නා ජනතාව ජීවත් වීම සඳහා දවසකට එක වේලක් සඳහාවත් ආහාර සපයා ගත නොහැකි මට්ටමින් ඉතාම දිළිඳුභාවයට පත් වෙලා. සියලු අස්වනු ඉවරයි, අටුකොටු ඉවරයි, සතා සීපාවාට බොන්න වතුර ටිකක් නැහැ. වනජීවී දෙපාර්තමේන්තුව යටතේ තිබෙන උද්‍යානවල සිටින සතුන් මැරෙනවා. පසුගිය දවස්වල මාධ්‍ය හරහා ඒවා පෙන්වූ ආකාරය අපි දැක්කා. මනුෂ්‍යයාට පමණක් නොවෙයි, සිව්පා සතුන්ට, තිරිසනුන්ට පවා වතුර නැතුව මැරී ගිහිල්ලා. ගොවීන්ගේ සත්ව පාලන කටයුතු සම්පූර්ණයෙන් ඇන හිටලා; කිරි අස්වැන්නක් ගන්න බැරි මට්ටමට පත් වෙලා. අද ගව පට්ටි පිටින් මසට විකුණන මට්ටමට රටේ සත්ව පාලනය කඩා ගෙන වැටිලා. මෙන්න මෙවැනි තත්ත්වයක් පවතින විටදී, මේ සඳහා රජය යම් කිසි ක්‍රියාමාර්ගයක් වහාම ගත යුතුයි. එහෙම නැතුව "ඊයේ නම් ටිකක් වැස්සා, දැන් වැව් ටික පිරීගෙන එනවා, හෙටත් වැස්සොත් නියඟය ඉවර වෙයි" යනුවෙන් කියන්න බැහැ. ඔය උත්තරය නොවෙයි, මේ ප්‍රශ්නයට තිබෙන විසඳුම.

නියං සහනාධාර දීම කෙසේ වෙතත්, පසු ගිය දවස්වල රුපියල් කෝටි-ප්‍රකෝටි ගණනක මහා විශාල මුදලක් වැය කරලා මේ ආණ්ඩුව විසින් මුළු රට පුරාම සමෘද්ධි සහනාධාර පිළිබඳ සමීක්ෂණයක් සිදු කළා. එය, ඉතාම විද්‍යානුකූල සමීක්ෂණයක්. සමීක්ෂණය කෙරුවා, රුපියල් කෝටි ගණනක් ඒකට වැය කෙරුවා. හැබැයි, එම මුදල හෝ සහනාධාර හැටියට මේ මිනිසුන්ට දුන්නා නම් යම්තම් හෝ ජීවිතය ගැට ගහ ගන්න තිබුණා.

අද සිදු වෙලා තිබෙන්නේ "ගහෙන් වැටුණ මිනිහාට ගොනා ඇන්නා වාගේ" ස්වභාව ධර්මය හරස්වෙලා, ළිං, ඇළ, වේළි පොකුණු සියල්ල සිඳිලා යාමයි. ඒ වාගේම දැන් වගා විනාශවෙලා ඉන්න මිනිස්සුන්ගේ සමෘද්ධි සහනාධාරය කපා හැරීම සඳහාත් සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. නියං සහනාධාර සඳහා මුදල් දෙනවා කිව්වා වාගේම දැන් ඒකටත් කියනවා, නැහැ, අපි සමෘද්ධිය කපන්නේ නැහැයි කියලා. ජනවාරි මාසය වන තෙක් මේක කියනවා. හැබැයි, ජනවාරි මාසය වන විට හෙමින් සැරේ නොදැනීම ඒකට තට්ටු කරලා දමනවා. මේ වාගේ ප්‍රශ්නවලට අත ගාන විසඳුම්; පැලැස්තර විසඳුම් තමයි රජය සතුව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වගාවන් විනාශ වුණා වාගේම අමාරුවෙන් හරි නිෂ්පාදනය කරන; හඳා ගන්න භෝග වර්ගවල අස්වැන්නට මේ රටේ මිලක් ගත නොහැකි ආකාරයට; මිලක් ගන්න බැරි තත්ත්වයට පත් කර තිබෙනවා. වර්ෂාව නැති නිසා අස්වැන්න අඩු වුණා. හැබැයි, අපේ පළාත්වල, රත්නපුර දිස්ත්‍රික්කයේ එක්තරා කොටසකට, උඩවලව කලාපයට නියඟය බලපා තිබෙනවා. රත්නපුර කලාපයට නියඟය බලපාලා නැහැ. හැබැයි, රත්නපුර මෙහා පැත්තේ, වර්ෂාව තිබෙන කාලයට ගොවියා විසින් නිෂ්පාදනය කරන ගම්මිරිස් ටිකට අද ලැබෙන්නේ තුට්ටු දෙකයි.

පසුගිය කාලයේ, 2014 අවුරුද්දේ 2015 මුල් වගා කන්නය තුළ රුපියල් 1,450ට විකුණපු ගම්මිරිස් කිලෝව - ගම්මිරිස් ගැන ඇමති කෙනකුත් ඉන්නවා. ඒ ඇමතිතුමාට තිබෙන්නේ ඒ දෙපාර්තමේන්තුව විතරමයි. - අද රුපියල් 650යි. මොකක්ද, මේ විගඩම? ලෝක නිෂ්පාදනයෙන් සියයට 5.6යි, ලංකාවේ නිෂ්පාදනය කරන්නේ.

ලෝකයේ ඉතාම වටිනාම, වැඩිම ඉල්ලුමක් තිබෙන ගම්මිරිස් නිෂ්පාදනය කරන්නේ අපේ රට තුළයි. හැබැයි, මේ ගම්මිරිස් ටික අද විකුණා ගන්න බැහැ. රුපියල් 1,400ට තිබුණු ගම්මිරිස් කිලෝව අද වන විට රුපියල් 550ට, 600ට බැහැලා තිබෙනවා. ගොවීන් සුසුම්ලනවා. මේ ගම්මිරිස් ටික විකුණා ගන්න බැරි ප්‍රශ්නය නිසා සුසුම්ලනවා විතරක් නොවෙයි, ආණ්ඩුවට ශාප කරනවා. ඒ ගැන ඇහුවාම කියනවා, "අපි පිට රටින් ගම්මිරිස් ගෙනාවේ නැහැ"යි කියලා. හැබැයි, මහ බැංකුවෙන් ලබා ගත් සංඛ්‍යා ලේඛන අපි ළඟ තිබෙනවා. ඒ අනුව 2017 වර්ෂයේ මුල් කාර්තුව තුළ වියට්නාමයෙන් ගම්මිරිස් ටොන් 500ක් ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ඒ ගෙනා ගම්මිරිස් අද ඈත එපිට ගම්මානවලටත් ගිහිල්ලා තිබෙනවා. කවුරු හරි එහෙම නැහැයි කියනවා නම් කිලෝව රුපියල් 500 ගණනේ වියට්නාම් ගම්මිරිස් ගෝනියක් මම හෙට ගෙනැල්ලා පෙන්වන්නම්. වියට්නාමයෙන් ගෙනා ගම්මිරිස් රට පුරාම තිබෙනවා. මෙන්න ගම්මිරිස් ගොවියාට ගහලා තිබෙන ආකාරය. මේවා ආණ්ඩුව විසින් කෘත්‍රිමව මවාපාපු ප්‍රශ්න. ආණ්ඩුව විසින් ආණ්ඩුවේ යම් කිසි පුද්ගලයන් කිහිප දෙනකුට - පුද්ගලයකුට හෝ දෙදෙනකුට- තමන්ගේ පෞද්ගලික වාසිය සඳහා; ලාභ ප්‍රයෝජන සඳහා; තමන්ගේ ව්‍යාපාර සඳහා රාජ්‍ය අනුග්‍රහය ඇතිව ගම්මිරිස් වියට්නාමයෙන් ලංකාවට ගෙනැල්ලා ලංකාවේ ගම්මිරිස් ගොවියා විනාශ කළාය කියන චෝදනාව අපි ආණ්ඩුවට කරනවා. ආණ්ඩුවේ කිසිම බලධාරියෙක් මේ සම්බන්ධයෙන් පැහැදිලි උත්තරයක් දෙන්නේ නැහැ. වහාම මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙස අපි ජනාධිපතිතුමාගේ අවධානයට මේ ප්‍රශ්නය යොමු කරනවා. මේ රටේ දහස් ගණනක් ගොවීන් අත මිට සරු ගොවි ජනතාවක් විධියට ජීවත් වුණේ මේ ගම්මිරිස් වගා කරන කලාපවලයි. ලංකාවේ දිස්ත්‍රික්ක 18ක ගම්මිරිස් වගා කරනවා. වර්තමාන රජය යටතේ මේ හැම ගොවියාම බරපතළ විධියේ ආදායම් කඩා වැටීමකට, නැත්නම් අසාධාරණයකට ලක්වෙලා තිබෙනවා. එක පැත්තකින් නියඟය.

අනෙක් පැත්තෙන් ගංවතුර. මේ පැත්තෙන් අස්වනු විකුණා ගන්න බැරිව ගොවීන් අමාරුවේ වැටී තිබෙනවා. තව පැත්තකින් සහනාධාර කපා හරිනවා. අර ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ තත්ත්වය තුළ අද රට එකම විශාලා මහනුවරක් බවට පත්වෙලා තිබෙනවා. නියඟයට ලක් වී තිබෙන ප්‍රදේශවල ගොවි ජනතාවට සහනාධාර ලබා දීමේදී යම් කිසි දේශපාලන කෝණයකින් බලලා කටයුතු කරනවා නම් ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මේ රජයේ නායකයන්ගෙන්, ඒ අමාත්‍යාංශ භාර ඇමතිවරුන්ගෙන් අපි ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ විධියේ දුෂ්ට ආකාරයෙන් හැසිරෙන්න එපා, මේ විපතට පත් ජනතාව ලාංකීය පුරවැසියන් ලෙස හිතලා බලලා කටයුතු කරන්නය කියලා. එහෙම නොවුණහොත් ගොවි ජනතාව නිරාහාරව මැරෙන තත්ත්වයක් තමයි ඇතිවෙලා තිබෙන්නේ. මේවාට දීර්ඝකාලීන විසඳුම් අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බරපතළ ආකාරයට අද රටේ ආහාර සුරක්ෂිතතාව බිඳවැටිලා. මේ රට තුන් වේල බත් කාපු රටක්; ඉදිරි මාස හයකට වී අස්වැන්න ගබඩා කර තිබුණු රටක්; වී ගබඩා පිරී ඉතිරී ගිය නිසා ගුවන් තොටුපොළේත් වී ගබඩා කළ රටක්. අද ගුවන් තොටුපොළේ වීත් නැහැ; ගුවන් යානාත් නැහැ; ලබන මාසය වන විට ගුවන් තොටුපොළත් නැති වෙනවා. මෙන්න, ආණ්ඩුවේ අවුරුදු දෙකක කෙරුවාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව තුළින් ආණ්ඩුව අපහසුතාවට පත් කිරීමක්, පහර

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

ගැසීමක් නොවෙයි අපි කරන්නේ. මේ තත්ත්වය ගැන හරියට සොයලා බලලා, හිතලා බලලා, අපහසුතාවට පත් වුණු ලක්ෂ 15කට වැඩි ගොවි ජනතාවට ජීවත් වීම සඳහා වහාම ක්ෂණික ආහාර සහනාධාර ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඉදිරි කාලයේදීත් ඇති විය හැකි නියඟය සහ ගංවතුර තත්ත්වයන්ට මුහුණදීම සඳහා දීර්ඝ කාලීන විද්‍යාත්මක සැලසුමකට යා යුතුයි. එවැනි වැඩ පිළිවෙළක් අවශ්‍ය බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව සලසා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)
"ගරු වේලු කුමාර් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. LUCKY JAYAWARDANA left the Chair, and THE HON. VELU KUMAR took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 5.02]

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

නියඟය සම්බන්ධව අද මේ පවත්වන විවාදයේදී නොයෙකුත් තර්ක-විතර්ක මේ ගරු සභාවට ඉදිරිපත් වුණා. නියඟය පැවතුණත්, ජල ගැල්ම ආවත්, කුණු කඳු කඩා වැටුණත්, ඒ දේවල් පසුගිය කාලයේ සිදු වුණේ නැති විධියට තමයි සමහර අය කරුණු ඉදිරිපත් කළේ. ඒ සියලු දේටම වග කියන්න ඕනෑ අපේ රජය විසින්ය කියන කාරණය සමහර අයගෙන් ප්‍රකාශ වුණා. පසුගිය කාලය තුළ මධ්‍යම කඳුකරයේ වතුවල තිබුණු විශාල ගස් කොළන් කපලා විනාශ කරලා ඒවා සම්පූර්ණ කාන්තාර බවට පත් කළා. මහවැලි ගඟ බලංගොඩ කෙළවරේ සිට වේරගංතොට පාලම දක්වා මධ්‍යම පළාතට පහළට ගලා බසිනවා.

අනෙක් පැත්තෙන්, නල්ලතන්නියේ සිට කැලණි මිටියාවත දක්වා කැලණි ගඟ ගලා බසිනවා. මේ ගංගා දෙක ආශ්‍රිතව විශාල වශයෙන් රජයේ නිලධාරින් ඉන්නවා; සංවර්ධන නිලධාරින් ඉන්නවා. ඒ ප්‍රදේශය නාය යාමට ලක් වන ප්‍රදේශයක්. ඒ නිසා මේ අය එකට එකතු වෙලා, අඩුම තරමින් රුක් රෝපණ වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ කියන්නේ එක උණ පැළයක්, ඒ වාගේම එරමුදු පැළයක් සිටුවීම වැනි වැඩ පිළිවෙළක් ඇති කරලා නැහැ. එම නිසා ඒවා සියල්ලම වැහි කාලයට විනාශ වෙනවා. පායන කාලයට විශාල වශයෙන් පැවුම නිසා ඒ පළාතම විනාශ වෙලා යනවා. ඒ වාගේම, ගල් කඳු නිසාත් ඒ ප්‍රදේශ විනාශ වෙනවා. ගල් කඳු රත්වීමෙන් එහි තිබෙන තේ වතු, ගස් කොළන් විනාශ වෙනවා. ඒ වාගේම, ගස් කොළන් කපා දැමීමේදී එහි තිබෙන කුඩා ගස් සියල්ලම විනාශයට පත් වෙනවා. මෙවැනි නියඟ ඇති වෙන්න ප්‍රධාන හේතු මේවායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මැණික් කර්මාන්තය සඳහන් කරන්න පුළුවන්. එය කර්මාන්තයක් වශයෙන් කරන අය බලපත්‍ර අරගෙන ප්‍රමිතියට කරනවා. ඒ වාගේම හොරෙන් මැණික් කර්මාන්තය කරන අයත් සිටිනවා. එසේ කිරීම තුළ කෙහෙල්ගමු ඔය, කොත්මලේ ජලාශය, මාඋස්සාකැලේ ජලාශය මේවා සියල්ලම රොන් මඩවලින් පිරී ඉතිරී පවතිනවා. එම නිසා වැහි කාලයට මේවායේ වතුර රඳා හිටින්නේ නැහැ. මේවා ඒ ඒ අමාත්‍යාංශවලට අප මතක් කර දී තිබෙනවා. ටෙන්ඩර් මඟින් ඒවායේ තිබෙන වැලි ටික ගොඩ දමා ගන්නවා; රොන් මඩ ටික ඉවත් කරනවා. ඒ නිසා විශාල වශයෙන් ඒවායේ වතුර රඳා හිටිනවා. ඒ ආකාරයට වතුර රඳා හිටීම තුළ වැහි කාලය තුළ පහළට එන ජල කඳ නතර වෙනවා. එම නිසා ගංවතුරෙන් සිදු වන හානිය විශාල වශයෙන් අවම වෙනවා. පසුගිය කාලයේ ඒවා පෙන්වා දුන්නත්, ඒවාට වැඩ පිළිවෙළක් යෙදුවේ නැහැ කියන එක මම විශේෂයෙන්ම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැව් ගැනත් කථා කළ යුතුයි. රජරට ප්‍රදේශයේ තිබෙන කුඩා වැව් ප්‍රතිසංස්කරණය කරනවා නම්, අඩුම තරමින් අවුරුද්දකට කුඩා වැව් පහක් පමණ ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීතුමාට ප්‍රතිසංස්කරණය කරන්න පුළුවන්. එහෙම කළොත් මේ ප්‍රශ්නයට මුහුණ දීමේදී ගැටලුවක් ඇති වන්නේ නැහැ. මෙතැනදී "ගොවීන්" කියලා සියලුම අය එකට එකතු කරනවා. හේන් ගොවීන් ගත්තත් මේ හැම කෙනෙක්ම ගොවීන් තමයි. ගම්මිරිස් ගොවීන් ගැනත් අපේ මන්ත්‍රීතුමෙක් කථා කළා. මේ හැම ගොවියෙකුටම ප්‍රශ්න තිබෙනවා තමයි. ඒ ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කර ගන්න ඕනෑ. මේක අද-ඊයේ ආපු ප්‍රශ්නයක් නොවෙයි; කාලාන්තරයක් මුළුල්ලේ ආපු ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්න විසඳා ගන්න වැඩ පිළිවෙළ සකස් කරන්න ඕනෑ. එම නිසා තමයි අපේ රජය විසින් යම් කිසි සහනාධාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙන්නේ. සහනාධාර දීමේදී, නිකම්ම දෙන වැඩ පිළිවෙළක් තමයි හැම දෙනාම යෝජනා කරන්නේ. නමුත්, ඒවාට ආදායම ලැබෙන්නේ කොහොමද, ඒවා ලබා ගන්නා ක්‍රමවේදය මොකක්ද, ඒවායින් වැඩිදියුණු වෙන්නේ කොහොමද, අස්වැන්න

තිබෙන කාලයට ඒවා රැස් කර ගෙන ඒවායින් අනාගතයට මුහුණ දෙන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

පසුගිය කාලය තුළ ගංවතුර ආවා; පැවිල්ල - නියඟ- ආවා. ඒ අවස්ථාවලදී ජනතාව නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දුන්නා. ජනතාව ඒ ප්‍රශ්නවලට මුහුණ දීපු අවස්ථාවලදී ඒ ඒ රජයන්වලින් එක එක පිළියම් යොදලා අවශ්‍ය කටයුතු කළා. නමුත් මේ රජය තුළින් තමයි මේ විධියට සහනාධාර ලබා දෙන වැඩ පිළිවෙළක් ඇති කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
"රුපියල් දහදාහක් දෙනවා. රුපියල් පන්දාහක් දෙනවා. අරයාට ලැබුණේ නැහැ. මෙයාට ලැබුණේ නැහැ. ඒ ගොවියාට දුන්නේ නැහැ. මේ ගොවියාට දෙනවා" කියලා දැන් කිව්වා. නමුත්, ඒ විධියට වර්ග කරන්නේ නැතිව දිය යුතු පුද්ගලයන්ට සහනාධාර දෙන වැඩ පිළිවෙළක් තමයි තිබෙන්නේ. ඒ වැඩ පිළිවෙළට අනුව සහනාධාර දීලා තිබෙනවා. සල්ලි තිබෙන එක්කෙනාටත්, නැති එක්කෙනාටත් නොව, ආධාරයක් දිය යුතු පුද්ගලයන්ට දෙන වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. හැම දාම මේ නියං තත්ත්වය තිබෙන එකක් නැහැ.

කැලෑ විනාශය වැළැක්වීමට වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ බව විශේෂයෙන් කියන්න ඕනෑ. ගස් කොළන් කපලා වනය විනාශ කරන කැලෑ හොරුන්ගෙන් මේ රට ආරක්ෂා කර ගත්තොත් මේ නියං තත්ත්වයට විසඳුමක් ලබා ගන්න පුළුවන්.

විශේෂයෙන්ම අපි රුක් රෝපණ වැඩසටහන් ආරම්භ කළ යුතුයි. අවුරුද්දට එක දිනයක් නොවෙයි, රුක් රෝපණය වෙනුවෙන් අවුරුද්දට දින කීපයක් වෙන් කරලා මන්ත්‍රීවරුන්ට ලැබෙන්නා වූ විමධ්‍යගත අරමුදලින් යම්කිසි මුදලක් ඒ වෙනුවෙන්ම වෙන් කරලා රුක් රෝපණ වැඩසටහන් ඇති කළොත් ජල පෝෂිත ප්‍රදේශවල තිබෙන ජල මූලාශ්‍ර ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන්. ඒවා ඔක්කෝම විනාශයට පත් කරලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී කියන්න කැමතියි. විශේෂයෙන්ම, මධ්‍යම කඳුකරයේ ඒවා විනාශ වී තිබෙන බවත් මේ අවස්ථාවේදී මතක් කරනවා. මට කථා කරන්න කාල වේලාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.08]

**ගරු තාරානාත් බස්නායක මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Tharanath Basnayaka - Deputy Minister of Telecommunication and Digital Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට දැඩි නියං තත්ත්වයකට පත්වෙලා තිබෙන අවස්ථාවේ ඒ කාරණය සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වනවා. නියඟය සහ ගංවතුර කියන ස්වාභාවික විපත් ස්වභාව ධර්මයත් එක්ක ඇති වෙන දෙයක්. පහු ගිය ඉතිහාසය තුළ අවස්ථා කීපයකදී ගංවතුර, නියඟය, සුළි සුළං කියන තත්ත්වයන්ට අපේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. එවැනි තත්ත්ව ඇති වුණු අවස්ථාවලදී පැවතුණු රජයට ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. වර්තමාන රජයටත් ගංවතුර සහ නියඟ වැනි තර්ජනවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉතිහාසයේ ඉඳලාම ස්වාභාවික විපත් සිදු වෙලා තිබෙනවා වාගේම, පවතින රජයට ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන්නත් සිද්ධ වනවා.

ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගෞරවනීය මන්ත්‍රීතුමන්ලා මේ නියං තත්ත්වය සහ ගංවතුර පිළිබඳව නොයෙකුත් අදහස් ඉදිරිපත් කළා. ලෝකයේ තිබෙන රටවල් අතරින් අපේ රට සුන්දර වුත්, ඉතාම ලස්සන, අලංකාර රටක්. ස්වභාව ධර්මයත් එක්ක බද්ධ වෙච්ච, ස්වභාව ධර්මයත් එක්ක බොහොම සමීපව, ළෙන්ගතුව ඇසුරු කරන ජන කොට්ඨාසයක් තමයි අපේ රටේ ජීවත් වන්නේ. පසුගිය රජයන්වලටවත්, වර්තමානයේ පවතින රජයටවත් විතරක් නොවෙයි මේ ගැටලුව තිබෙන්නේ. රජයක් වුණාම මේ තිබෙන ප්‍රශ්නවලට මුහුණ දෙන්න ඕනෑ. මේ රජය සහනාධාර ලබා දීමේදී අනුගමනය කරන සමහර කරුණු කාරණා සියයට සියයක්ම ක්‍රියාත්මක වන්නේ නැහැ. නමුත් යම් ප්‍රමාණයකින් ඒ අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක වෙනවා. රජයක් ඒ විධියට වැඩ කටයුතු ක්‍රියාත්මක කරනකොට පෞද්ගලික අංශ වාගේම සමාජයේ තිබෙන සිවිල් සංවිධානත් ස්වේච්ඡාවෙන් එකතුවෙලා අවශ්‍ය කටයුතු කරනවා. නමුත් ඒ වැඩ කටයුතු සියයට සියයක් සාර්ථක වෙන්නේ නැහැ. මේ රජයට විතරක් නොවෙයි, පැවති සෑම රජයකටම ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වනවා. විවිධ අය මේ සම්බන්ධයෙන් විවිධ චෝදනා, විවිධ කරුණු ඉදිරිපත් කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඒ චෝදනාවල යම් සත්‍යතාවක් තිබෙනවා. නමුත් ඒ චෝදනා සියයට සියයක්ම සත්‍යයයි කියලා කියන්නත් බැහැ. මොකද, මේවා ස්වභාව ධර්මයත් එක්ක ඇති වෙච්ච ගැටලු නිසා. මේ ප්‍රශ්න දිහා අපි බලන්න ඕනෑ මීට වඩා තව ටිකක් එහාට ගිහිල්ලායි. අපි මෙතැනින් එහාට කල්පනා කරන්න ඕනෑ, රජයක් හැටියට ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ පිළිබඳවයි. පසුගිය කාලයේ පැවති හැම ආණ්ඩුවක්ම -හැම රජයක්ම- මේ ප්‍රශ්නවලට මුහුණ දුන්නා වාගේම, ඉදිරියේදී මොන ආණ්ඩුවක් බලයට ආවත් මේ විධියටම තමයි මෙම ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වන්නේ.

මේ නියං තත්ත්වයට, මේ ගංවතුර තත්ත්වයට රටක් හැටියට අපි කොයි විධියටද මුහුණ දෙන්න ඕනෑ? මා දකින විධියට ඒ සඳහා අනිවාර්යයෙන්ම පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍යයි. පරිසරය රැකගෙන, පරිසරය ආරක්ෂා කරගෙන තිරසර සංවර්ධනයකට යෑම තමයි ඒ සඳහා මා දකින විසඳුම. අපි මේ විධියට ගියොත් මේ රජයට විතරක් නොවෙයි, අනාගතයේ පත් වන සෑම රජයකටම මේ ප්‍රශ්නය බලපානවා. අද නියං තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා; අපි සහනාධාර දෙනවා. ඒවා එතැනින් ඉවරයි. පසුගිය ආණ්ඩු පැවති කාලයේත් නියං තත්ත්ව ඇති වුණා; සුනාමියක් ඇති වුණා. අපි ඒවාටත් ආධාර දුන්නා. ඒවා එතැනින් ඉවරයි. පසුගිය කාලයේ ගංවතුර ඇති වුණා. එතකොටත් අපි සහනාධාර දුන්නා. ඒ අවස්ථාවේ රජය හැටියට අවශ්‍ය සම්පත් ලබා දීලා ඒ අයගේ ජන ජීවිතය ශක්තිමත් කරන්නට උදවු උපකාර කළා. ඒ වාගේම සිවිල් සංවිධාන ඇතුළු පුද්ගලයන් ස්වේච්ඡාවෙන්ම ඒ කටයුතුවලට මැදිහත් වුණා. නමුත් අපි එතැනින් එහා වැඩ පිළිවෙළකට යා යුතුයි. විශේෂයෙන්ම අපි මේ පරිසරය සුරක්ෂිත කර ගැනීමට සහ අපේ ජල සම්පත් සුරක්ෂිත කර ගැනීමට කටයුතු කරන්නට ඕනෑ. ඒ සඳහා නීතියක් අවශ්‍යයි; ක්‍රමවේදයක් අවශ්‍යයි.

අද මේ රටේ දැඩි නියං තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද මේ නියඟය දිස්ත්‍රික්ක 13කට බලපා තිබෙනවා. විශේෂයෙන්ම මා

[ගරු තාරානාත් බස්නායක මහතා]

නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව දැඩි ලෙස මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කය, අනුරාධපුරය දිස්ත්‍රික්කය, පුත්තලම දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය යනාදී දිස්ත්‍රික්ක 13ක ජනතාව අද මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. මේක ජනතාවගේ වැරැද්දක්වත්, රජයේ වැරැද්දක්වත් නොවෙයි. මෙතැන තිබෙන්නේ අපි ස්වභාව ධර්මයත් එක්ක ගනු-දෙනු කරන ක්‍රමයට අදාළ ප්‍රශ්නයක්. ජීවත් වන හැම පුද්ගලයකුටම මේ රට උතුම් රටක්. ස්වභාව ධර්මය ඒ එක එක්කෙනාට වෙන් වෙන් වශයෙන් ආදරය කරන්නේ නැහැ. ස්වභාව ධර්මය මේ රටේ ජීවත් වන හැම කෙනාටම එක හා සමානව ඒ ආදරය ලබා දෙනවා. අපි ඒ ආදරය ලබා ගන්න නම් මේ පරිසරය ආරක්ෂා කර ගන්නට ඕනෑ; ජල සැපයුම් ටික, ජල උල්පත් ටික ආරක්ෂා කර ගන්න ඕනෑ. අපි ඒ සඳහා අනිවාර්යයෙන්ම වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පවතින නියං තත්ත්වය නිසා අද සමහර ප්‍රදේශවල ගොවි ජනතාව කියන්නේම වතුර නැහැ කියලා. ඒ අයගේ ජීවනෝපාය කෘෂි කර්මාන්තය. ඒ අය අතුරු භෝග වගාවත් කරනවා. ඒ අය ඉස්සෙල්ලාම කියන්නේ ඒ අයගේ ගොවිතැන කර ගන්න ප්‍රමාණවත් වතුර නැහැ කියලා. අතුරු භෝග වගාව සඳහා වතුර නැහැ කියනවා. ටිකෙන් ටික නියං තත්ත්වය වැඩි වෙනකොට එදිනෙදා කටයුතු සඳහා වතුර නැහැ කියනවා. අන්තිමට කියනවා බොන්න වතුර ටික නැහැ කියලා. අද මේ නියඟය නිසා ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය, ඇහැටුවැව, නිකවැරටිය, රස්නායකපුර සහ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශත්, පුත්තලම් දිස්ත්‍රික්කයේ ආනමඩුව, කලුවරගස්වැව සහ රිදීගම වාගේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන, මැදවච්චිය, කැබිතිගොල්ලෑව වාගේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශත්, පොළොන්නරු දිස්ත්‍රික්කයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමහර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශත්ත් අද දැඩි නියං තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. මේ ප්‍රදේශවල බහුතරයක් ජනතාවගේ ජීවනෝපාය තමයි කෘෂි කර්මාන්තය. එම නිසා අද ඒ ජනතාව සඳහා සම්පත් අවශ්‍යයි; වැඩ පිළිවෙළක් අවශ්‍යයි. කෘෂි කර්මාන්තයට වුවමනා ජලය ආරක්ෂා කර ගැනීම සඳහා අපට කුමක් හෝ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඒ සඳහා ක්‍රියාමාර්ගයකට යා යුතුයි. ඒ වාගේම, ජලය ආරක්ෂා කර ගන්නට, ජල උල්පත් රැක ගන්නට වැඩ පිළිවෙළක් ඕනෑ. සමහර අය ස්වේච්ඡාවෙන්, තම හදවතින්ම මේ සම්පත් ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනවා. නමුත් තවත් සමහර අයට ඒ සඳහා වුවමනාවක් නැහැ, ගණන් ගන්නේ නැහැ. එම නිසා තමයි අද මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දින කිහිපයකට පෙර අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ නායකයා හැටියට, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කළ අත්දැකීමක් තිබෙන ගොවියකු හැටියට, පරිණත භාවයක් තිබෙන නායකයකු හැටියට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශ බලන්න ගියා.

අතිගරු ජනාධිපතිතුමා නියඟය තිබෙන කැබිතිගොල්ලෑව, මැදවච්චිය වැනි ප්‍රදේශවලට ගියාම එම ප්‍රදේශවල ජනතාවට අත්‍යවශ්‍ය මොනවාද කියලා එතුමා දැක්කා. එම ප්‍රදේශවල තිබෙන පිපාසාව දැක්කා. එම නිසා එතුමා ඉතා ඉක්මනින්ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ප්‍රමුඛ අනෙකුත් අමාත්‍යාංශවලට උපදෙස් දුන්නා, මේ ප්‍රදේශවල ජීවත් වන ජනතාවට ඉදිරි මාස කීපය සඳහා අවශ්‍ය සහනාධාර ලබා දෙන්න කියලා.

අද ගරු මන්ත්‍රීතුමකු සඳහන් කළා, මේ සහනාධාර ලබා දීමේදී හරියට ක්‍රියාත්මක වෙලා නැහැයි කියලා. රුපියල් 10,000ක සහනාධාරයක් ලබා දෙනවා කියලා තිබුණා. නමුත්, මා දන්නා ආකාරයට කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 102,400කට ආසන්න ප්‍රමාණයකට මේ රුපියල් 10,000ක සහනාධාරය අත්‍යවශ්‍ය වෙලා තිබුණා. මේ වනකොට රුපියල් මිලියන 886ක මුදල් ප්‍රමාණයක් එම සහනාධාරය වෙනුවෙන් ඒ අයගේ ගිණුම්වලට නිදහස් කර යවා තිබෙනවා. රුපියල් 10,000ක සහනාධාර මුදල එම ගොවීන් සඳහා අද අපි ලබා දීලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳව උපදෙස් දුන්නේ ඒවා අනිවාර්යයෙන්ම කළ යුතු නිසායි. එම ගොවි ජනතාවගේ අවශ්‍යතා, ගොවි ජනතාවගේ හැඟීම, දැනීම එතුමා දන්නා නිසායි. එතුමා විශේෂයෙන්ම මේ පිළිබඳව නියෝග දීලා; උපදෙස් දීලා කිව්වා, මේවා අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි, එම නිසා මේ සහනාධාර ඉක්මනින්ම ගොවි ජනතාවට ලබා දෙන්න කියලා. මාසයකට රුපියල් 5,000ක දීමනාවක් වරකට රුපියල් 2,500ක් බැගින් වාරික දෙකකින් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්නත් එතුමා උපදෙස් දුන්නා. ඒ, එතුමා මේ තත්ත්වය දැකපු නිසායි. මේ වනකොට එම සහනාධාරය ලබා දෙන්න අදාළ අමාත්‍යාංශවලට එතුමා උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයට මේ වනකොට රුපියල් මිලියන 400ක මුදලක් යවා අවසන්. අද ඒ කටයුත්ත ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවා. ඒ පිළිබඳව අපි සතුටු වන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳව ඉතා කඩිනමින් නිලධාරින්ට උපදෙස් ලබා දීම නිසා අද ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න හැකියාව ලැබී තිබෙනවා.

ඒත් එක්කම, මේ නියඟයෙන් විපතට පත් වෙලා; දැඩි ලෙස අසරණ වෙලා සිටින ගොවි ජනතාවට අතිගරු ජනාධිපතිතුමා ලබා දෙන්න කියපු සහනාධාර පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. මා නියෝජනය කරන දිස්ත්‍රික්කය තුළත් දැඩි ලෙස නියඟය පවතිනවා. එම ප්‍රදේශවල ජනතාවට සහනාධාර ලබා දෙන්න කියලා චක්‍රලේඛ එනකොට අද විවිධ වූ කරුණු කාරණා එම චක්‍රලේඛයේ සඳහන් කරලා ඒ තුළින් ගොවියා තවත් අසරණ තත්ත්වයට පත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොසතාද, දුප්පතාද, අතරමැදියාද, මධ්‍යම පාන්තිකයාද කියලා නැහැ, මේ නියඟය හැම කෙනාටම බලපානවා. නියඟයෙන් හැමෝම බැට කනවා. ඒ නියඟය බලපා තිබෙන ආකාරය, ඒ නියඟය ක්‍රියාත්මක වන ආකාරය දිහා අපි බලන්න ඕනෑ.

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉතාමත් දිළිඳු ජනතාවක් ජීවත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්. ඊළඟට, දොඩන්ගස්ලන්ද ආසනයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වැනි ප්‍රදේශවලට ගිහිල්ලා බැලුවාම ඒ ප්‍රදේශවල මිනිස්සු ජීවත් වන්නේ කොහොමද කියන එක අපට තේරුම් ගන්න පුළුවන්. එම නිසා චක්‍රලේඛන එවනකොට මේ පිළිබඳව සැලකිලිමත් වන්න ඕනෑ. සමහර චක්‍රලේඛවල සඳහන් කරලා තිබෙනවා, රාජ්‍ය සේවය හැර, පෞද්ගලික අංශය හැර, රට ගිය අය හැර, ව්‍යාපාරයක් කරනවා නම්, ඒ අය හැර අනෙකුත් අයට මේ සහනාධාරය ලබා දෙන්න කියලා. රාජ්‍ය සේවයේ නියුත් පවුලක් නම් කමක් නැහැ, ඒක අත්හරින්න පුළුවන්. හැබැයි, පෞද්ගලික අංශයේ වැඩ කරනවා නම්, ඒ වාගේම පවුලේ කවුරු හරි රට ගිහිල්ලා ඉන්නවා නම්, ඒ වාගේම පවුලේ යම් කිසි කෙනෙකු වාහනයක් අරගෙන තිබෙනවා නම්, යම් සුළු ව්‍යාපාරයක් කරනවා නම්, ඒ අයට මේ සහනාධාරය දෙන්නේ නැහැ. මේ කාරණාවට මම එකඟ වන්නේ නැහැ. පෞද්ගලික අංශයේ වැඩ කරන කෙනෙක් ගත්තාම, ඒ අය මොන විදියේ පෞද්ගලික රස්සාවක්ද කරන්නේ, ඒ රස්සාවේ ස්වභාවය මොකක්ද කියන එක අපි හඳුනා ගන්න ඕනෑ. මෙහෙන් ඉහළ පෙළේ අපේ ලේකම්තුමන්ලා, අදාළ බලධාරින් මේ සඳහා

යෝජනා හදලා දිස්ත්‍රික් ලේකම්තුමාට අවශ්‍ය උපදෙස් යැව්වාම, දිස්ත්‍රික් ලේකම්තුමා ඒවා ප්‍රාදේශීය ලේකම්තුමාට යවනවා. ප්‍රාදේශීය ලේකම්තුමා ඒ අනුව ගම් මට්ටමේ සිටින ග්‍රාම නිලධාරින්, සමෘද්ධි නිලධාරින්, සංවර්ධන නිලධාරින් ලවා මේ සහනාධාර ලැබිය යුත්තන් කවුද කියලා පරීක්ෂා කර බලනවා. එතකොට චක්‍රලේඛන අනුව ඒ නිලධාරින් ක්‍රියාත්මක වනවා. මම මේ කාටවත් චෝදනා කරනවා නොවෙයි. මේක ඉහළින්ම හරි ක්‍රමවේදයකට හැදෙන්න ඕනෑ. පෞද්ගලික අංශය කිව්වාම එහි නොයෙක් ස්වභාවයන් තිබෙනවා. ගමේ මනුස්සයෙක් අයිස්ක්‍රීම් පෙට්ටියක අයිස්ක්‍රීම් විකුණනවා නම්, ඒකත් පෞද්ගලික අංශයේ රැකියාවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
මම විනාඩි 15ක් ඉල්ලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්. විනාඩි 15න් තව විනාඩි 2යි තිබෙන්නේ.

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
මට තව විනාඩි 3ක් දෙන්න.

අයිස්ක්‍රීම් විකුණන ව්‍යාපාරිකයා - ඒ තරුණයා - එම රැකියාව පටන් ගත්තේ ඔහුට වෙන ආදායම් මාර්ගයක් නැති නිසායි. හැබැයි, ඔහුගේ දවසක ආදායම රුපියල් 500යි, නැත්නම් රුපියල් 600යි. මේ ප්‍රශ්නත් එක්ක බැලුවාම එම මුදලින් ඔහුගේ පවුලට ජීවත් වන්න බැහැ. හැබැයි, මෙම සහනාධාරය ලැබිය යුතු කණ්ඩායමෙනුත් ඔහු ඉවත් කරනවා.

ගමේ අහිංසක මනුස්සයෙක් three-wheeler එකක් තියාගෙන ඒකේ වාරික ගෙවා ගන්න බැරිව අසරණ වෙලා ඉන්නවා. "ඔයාට මේ ආධාරය දෙන්න බැහැ" කියා ඒ මනුස්සයාත් එම කණ්ඩායමෙන් අයින් කරනවා. පවුල ගොඩනගාගන්න බැරි නිසා තමයි ගෙදරක බිරිඳ හෝ ස්වාමිපුරුෂයා විදේශගත වන්නේ. රට ගිහින් මාස දෙකයි. තවම මාසයේ පඩියවත් ගෙදරට එවා නැහැ. නමුත්, ඒ පවුලත් එම ලැයිස්තුවෙන් අයින් කර තිබෙනවා. මේ ක්‍රමවේදය වෙනස් වෙන්න ඕනෑ. මේ නිසා අද ගම්වල ජනතාව ලොකු අපහසුතාවකට, දැඩි පීඩනයකට ලක්වෙලා ඉන්නවා. එම නිසා මේ ක්‍රමවේදය වෙනස් වෙන්න ඕනෑ. මේ ආදායම් ලබන තැන් පිළිබඳව ඔබතුමන්ලා හරියට බලන්න.

Garment factory එකකට යන තරුණිය ගන්න ආදායම ගැන හිතලා ඒ පවුල ගැන සෑහීමකට පත් වෙන්න පුළුවන්ද? සමහර පවුල් තිබෙනවා, ඒ පවුලේ ඉන්න හත් අටදෙනාම නඩත්තු කරන්න ඕනෑ ඒ තරුණිය හෝ තරුණයා විසිනුයි. ඒ ලැබෙන ආදායමෙන් මුළු පවුලම නඩත්තු කරන්න පුළුවන්ද? අන්න ඒකයි අපි බලන්න ඕනෑ. එහෙම බලන්නේ නැතිව, අපි මෙතැන ඉඳලා එක පාරටම පෞද්ගලික අංශයේ ව්‍යාපාරයක් කරනවා නම් මෙහෙමයි කියා ඒ අය අයින් කරන්නේ කොහොමද? එම නිසා මෙම මේ ක්‍රමවේදය ඉතාම ඉක්මනින් වෙනස් කළ යුතුයි. ඒ ප්‍රදේශයට ගැළපෙන විධියට, ප්‍රදේශයේ පවුල්වලට මේක බලපාන්නේ කොහොමද කියන කරුණු සලකා බලා මේ ක්‍රමය නිවැරදිව ක්‍රියාත්මක කළොත් තමයි සාධාරණ වන්නේ කියා මම බොහොම ඕනෑකමින් කියන්න කැමැතියි.

අපේ ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාත්, රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමාත් අදහස් ඉදිරිපත් කළා. "මේ වැව් හරි ක්‍රමවේදයට හැදිලා නැහැ, ඒවායේ රොන් මඩ ඉවත් කරන්න වැඩ පිළිවෙළක් තාක්ෂණික අතින් ක්‍රියාත්මක වෙලා නැහැ" කියා එතුමන්ලා කිව්වා. ඒ කාරණය මම පිළිගන්නවා. මෑත කාලයේ -අවුරුදු 15ක්, 20ක් ඇතුළත- අප නියෝජනය කරන ප්‍රදේශවල තිබෙන වැව්වලත් රොන් මඩ ඉවත් කර නැහැ. මේ වැව්වල රොන් මඩ ඉවත් කරන්න; වැව් ගැඹුරු කරන්න මේ වර්ෂය තුළ රුපියල් මිලියන 500ක් කුරුණෑගල දිස්ත්‍රික්කයට වෙන් වෙලා තිබෙනවා. මේ කටයුත්ත කරන්න අවශ්‍යයි. වැව්වල ජලය ආරක්ෂා කරගන්න නම් මුලින්ම කළ යුත්තේ රොන් මඩ ඉවත් කිරීමයි. වැව ගැඹුරු කරගන්න ඕනෑ. එතකොට තමයි ජලය ආරක්ෂා වන්නේ; පවතින්නේ; නියඟයක් එනකොට අපට ඒ සඳහා මුහුණ දෙන්න හැකි වන පරිදි ජලය තිබෙනවාද කියා බලන්න පුළුවන් වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී මහ කන්නය එන කොට බිත්තර වී අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
"අද බිත්තර වී හොයාගන්න නැහැ" කියා අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. බිත්තර වී තිබෙනවා. ගොවි ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයන් විධියට අප කීපදෙනෙක් මේ පිළිබඳව අපේ අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කළා. "ඉස්සරහට එන මේ වැඩ පිළිවෙළට බිත්තර වී අවශ්‍යයි, ඒ වාගේම වැව්වල රොන් මඩ ඉවත් කරලා ඒවායේ වතුර ආරක්ෂා කරගන්න වැඩ පිළිවෙළක් අවශ්‍යයි" කියා අතිගරු ජනාධිපතිතුමාට අපි කිව්වා. එතුමන්ලා ඒ පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කළා. ඉදිරියේදී ආණ්ඩුව ගොවීන්ගෙන්ම බිත්තර වී මිලදී ගන්නත් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියං තත්ත්වය නිසා ඒ මිනිසුන් දැඩි ලෙස පීඩාවට පත්වී සිටිනවා. ඔවුන් අහිංසකයි; අසරණයි. සමහර අයට තේරෙන්නේ නැහැ. සමහර අය දන්නේ නැහැ. එම නිසා මේ පිළිබඳව ඉහළින් -අමාත්‍යාංශ මට්ටමින්- කටයුතු කරලා, අපේ ලේකම්තුමන්ලා සහ නිලධාරි මහත්වරු හරහා මේ ක්‍රමවේදය තව ටිකක් පුළුල් කරලා ගමට යවන්න. අප ඒ නිලධාරීන්ගෙන් ඇහුවාම, "අපට කරන්න දෙයක් නැහැ, ඉහළ අය දැනුවත් කරන්න" කියා ඒ අයම කියනවා. ඒ නිසා අප ඔබතුමන්ලාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලන්නේ මේ ක්‍රමවේදය තව ටිකක් පුළුල් කරන්න කියායි. එතකොට මේ තිබෙන ගැටලු අඩු කර ගන්න පුළුවන්. යම් සහන දීමක් කරගෙන යනවා. ඒ පිළිබඳව අප අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු රජයටත්, සියලුම ගරු ඇමතිතුමන්ලාටත්, අමාත්‍යාංශ ලේකම්තුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා. මේ ක්‍රමවේදය තව ටිකක් පහසු කළොත්, ඒ ජනතාවගේ පැත්තෙන් තව ටිකක් සහන ලැබෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KURMAR *left the Chair and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[பி.ப. 5.25]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று JVPயினரால் கொண்டுவரப்பட்ட வரட்சி தொடர்பான சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையின்மீது பேசக்கிடைத் தமையிட்டு மகிழ்ச்சியடைகின்றேன். அன்று ஒரு நாள் இரவு பெய்த மழைமூலம் ஏற்பட்ட வெள்ளத்தினால் இரத்தினபுரி, களுத்துறை, காலி, மாத்தறை போன்ற மாவட்டங்களில் பல நூற்றுக்கணக்கான உயிர்கள் காவுகொள்ளப்பட்டன மற்றும் பல கோடி ரூபாய் பெறுமதியான சொத்துக்கள் அழிவடைந்தன. இதனை அறிந்தவுடன் திருமலை, மட்டக்களப்பு, அம்பாறை மாவட்ட மக்கள் வரட்சியினால் பாதிக்கப்பட்ட தங்களுடைய வயல் நிலங்களுக்கு அல்லது செய்கை நிலங்களுக்கு நட்டஈடு வேண்டும் என்ற கோரிக்கையை மாற்றி, அனர்த்தத்தால் பாதிக்கப்பட்ட தென்புல மக்களின் துன்பத்தில் பங்குகொண்டார்கள்.

எனினும், இவ்வனர்த்தம் ஏற்பட்டபோது நாங்கள் ஒரு புதுமையான விடயத்தைக் கண்டோம். அதாவது, எதிரணியிலே இருக்கின்ற ஒரு குழுவினர், இயற்கையாக ஏற்படுகின்ற அனர்த்தத்தால் பாதிக்கப்பட்ட அந்த நிலைமையிலும்கூட, தங்களது அரசியலுக்காகப் பேசுகின்ற நிலைமையைக் கண்டோம். எனினும், இந்த ஆட்சி மாற்றம் ஏற்படுவதற்கு முன்னர் இப்படிப்பட்ட ஒரு நிலைமை உருவாகியபோது பல நாடுகள் - ஐரோப்பிய நாடுகள் மட்டுமல்ல, தென்கிழக்காசிய நாடுகளும் - பல நூறு கோடி ரூபாயை எமது மக்களின் இழப்புக்களை ஈடுசெய்வதற்காக அள்ளித் தந்ததை யாரும் மறந்துவிடமுடியாது. புற்றீசல் போன்று வெளிப்பட்டு இனத்துவேசத்தைக் கக்கி, இந்த நாட்டின் பிரதம அமைச்சரையும் ஆட்சியாளர்களையும் தூசித்த 'பொதுபலசேனா' போன்ற அமைப்புக்களுடைய ஆக்ரோஷங்கள் அந்த ஒரு நாள் அனர்த்தத்திலே அமுங்கிப்போயின. இதற்காக நாங்கள் இறைவனுக்கு நன்றி கூறவேண்டும். ஏனென்றால், அந்த அனர்த்தத்தின்போது இந்த நாட்டின் சிறுபான்மைச் சமூகமும் சமூக அமைப்புகளும் வரிந்துகட்டிக்கொண்டு, தங்களால் இயன்ற உதவிகளைப் பாதிக்கப்பட்ட தென்புல - களுத்துறை, மாத்தறை, காலி, இரத்தினபுரி - மக்களுக்குச் செய்தார்கள். அவர்களுடைய துன்பத்தில் பங்குகொண்டு பல தியாகங்களைச் செய்தார்கள். இதனால், இந்த இனத்துவேசிகள் அனைவரும் மழுங்கிப்போயினர்; காணாமற்போயினர். இவர்கள் என்ன நினைத்தாலும் பரவாயில்லை. இந்த விடயத்தை நான் ஏன் ஞாபகமூட்டுகின்றேன் என்றால், எங்களுக்கென்றொரு கோட்பாடு இருக்கின்றது. யாராவது எம்மை, எமது சமூகத்தினைப் பாதிப்படையச் செய்ய நினைக்கின்ற நேரத்திலே, நாங்கள் இறைவனிடமே உதவியைத் தேடுவோம். அப்படித்தான் தென்புல அனர்த்தத்தினால் ஒரு நாள் இரவிலே அவர்களுடைய ஆக்ரோஷங்கள் எல்லாம் அடங்கிப் போய்விட்டன.

இன்று இந்த அரசாங்கத்தின்மீது, அதாவது இந்த நாட்டினுடைய மேதகு ஜனாதிபதி அவர்கள் மீதும் கௌரவ பிரதமர் அவர்கள் மீதும் வெளிநாடுகள் வைத்திருந்த நம்பிக்கையின் காரணமாக எமக்குப் பல உதவிகளைச் செய்தன. தற்பொழுது எமது அரசு 1,755 மில்லியன் ரூபாயை இந்த வரட்சியினால் பாதிக்கப்பட்டவர்களுக்கு நிவாரணம் வழங்குவதற்காக ஒதுக்கியுள்ளது. அதற்காக 20 மாவட்டங்களைத் தெரிவுசெய்துள்ளது. குறிப்பாக, கிழக்கு மாகாணத்திலே திருகோணமலை மாவட்டத்திலே 7 பிரதேச செயலாளர் பிரிவுகளிலும் மட்டக்களப்பு மாவட்டத்திலே 9 பிரதேச செயலாளர் பிரிவுகளிலும் அம்பாறை மாவட்டத்தில் 11 பிரதேச செயலாளர் பிரிவுகளிலும் பாதிக்கப்பட்டோர் தெரிவுசெய்யப்பட்டுள்ளனர். அம்பாறை மாவட்டத்திலே 16,300 குடும்பங்களில் கிட்டத்தட்ட 57,248 பேரும் திருகோணமலையிலே 6,182 குடும்பங்களில் கிட்டத்தட்ட 19,000 பேரும் மட்டக்களப்பு மாவட்டத்திலே 19,714 குடும்பங்களில் 65,000க்கு மேற்பட்டவர்களும் இந்த வரட்சியின் கொடுமைக்கு ஆளாக்கப்பட்டுள்ளார்கள். அவர்களுக்கான நிவாரணங்கள் வழங்கப்பட்டுக் கொண்டிருந்தபோதுதான் இந்தத் தென்பகுதி அனர்த்தம் ஏற்பட்டது. இந்தச் சிறிய நாட்டிலே தென்புலத்திலே மழையினால் ஏற்பட்ட அனர்த்தத்தினால் மக்கள் பாதிக்கப்பட்டபோது 20 மாவட்டங்களில் வரட்சியினால் மக்கள் பாதிக்கப்பட்டனர்.

இந்த மாதம் எமது கிண்ணியா DS Division இலே செம்பிமோட்டை, வட்டமடு, மானாறு போன்ற பிரதேசங்களிலும் அதேபோன்று குச்சவெளியிலே யான் ஓயா, ஆலங்குளம் போன்ற பகுதிகளிலும் விவசாயம் செய்த விவசாயிகளின் பாதிப்புக்காக வெள்ளிக்கிழமைக்கிடையிலே முதற் கொடுப்பனவு கொடுக்கப்பட இருப்பதாக நாங்கள்

அறிகின்றோம். அதற்காக அரசாங்கத்திற்கு நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். அதுமட்டுமல்ல, 3 பிள்ளைகளுக்கு மேல் இருக்கின்ற குடும்பங்களுக்கு 5,000 ரூபாயும் 2 பிள்ளைகளுக்குக் கீழ் இருக்கின்ற குடும்பங்களுக்கு 4,000 ரூபாயும் வரட்சி நிவாரணமாக வழங்க அரசாங்கம் முயற்சி செய்துகொண்டிருப்பதனையிட்டும் வரட்சியினால் பாதிக்கப்பட்ட எமது பிரதேசத்திற்குக் கடந்த மாதமும் water supply - நீர் விநியோகம் செய்வதற்கென 10க்கு மேற்பட்ட 'பவுசர்'களைத் தந்துதவியமைக்காகவும் அரசுக்கு நன்றிகூறக் கடமைப்பட்டிருக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, please wind up your speech now.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னும் இரண்டு நிமிடங்கள் தாருங்கள்!

கடந்த வாரம் எங்களுடைய மாவட்டத்துக்கு வருகைதந்த கௌரவ அமைச்சர் றவுப் ஹகீம் அவர்களிடம் 457 கிலோமீற்றர் தூரமான இடங்களுக்கு அங்கு நீர் விநியோக இணைப்புக் கொடுக்கப்பட வேண்டும் என்ற விடயம் சொல்லப்பட்டபோதும், திருகோணமலை மாவட்டத்திலே ஒரு கிலோமீற்றர் அளவுக்குக்கூட இணைப்பு வழங்கப்படவில்லை. இதனால், 16,000க்கு மேற்பட்ட குடும்பங்கள் தண்ணீர் வசதி பெற முடியாமல் இருக்கின்றன. இதனை கௌரவ அமைச்சர் அவர்கள் தன்னுடைய கவனத்திற்கொண்டு, அவர் எமது மாவட்டத்திற்கான விஜயத்தை மேற்கொண்டதன் பிரதிபலனாக எங்கள் மக்களுக்கான நிவாரணத்தை வழங்கவேண்டும். அதுமட்டுமல்ல, வரட்சியினால் பாதிக்கப்பட்ட திருகோணமலை மாவட்டத்திலுள்ள 7 பிரதேச செயலாளர் பிரிவுகளிலும் விவசாயிகளுக்கான முதற் கொடுப்பனவான குறைந்தபட்ச தொகையான 8,000 ரூபாயை உடனடியாக வழங்குவதற்குரிய நடவடிக்கையை முழுமையாக நிறைவேற்றுவதற்கு ஆவன செய்யவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

மேலும், பொலனறுவை மாவட்டத்தை இன்று பாருங்கள்! அங்கு வரட்சியினால் 49 குடும்பங்களைச் சேர்ந்த 178 பேர் மட்டும்தான் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஏனென்றால், சி.பி. டி சில்வா அவர்களின் காலம் தொடக்கம் எங்களுடைய மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களின் காலம் வரை அங்கே நீர்ப்பாசனத் திட்டங்கள் ஒழுங்காக மேற்கொள்ளப்பட்டுள்ளன. பொலநறுவையிலிருக்கின்ற 3 குளங்களான மின்னேரியா, கவுடுல்ல, பொலநறுவை போன்றவை உரிய முறையில் நீர்ப்பாசன வசதிகள் செய்யப்பட்டிருக்கின்றன. திருகோணமலை மாவட்டத்திலே நீர்ப்பாசனம் செய்வதற்கு வடிகால்கள் அல்லது பாய்ச்சல்கள் ஒழுங்காகச் செய்யப்படவில்லை. ஒருநாள் மழையினால் வெள்ள அனர்த்தத்தைக் காண்கின்றோம். ஒரு மாத வெயிலினால் வரட்சி அனர்த்தத்தைக் காண்கின்றோம். எனவே, எமது மாவட்டம் ஒழுங்குபடுத்தப்பட வேண்டும். அதற்கான நிதியினை எமது மாவட்டத்துக்குக் கூடுதலாக ஒதுக்கி வரட்சியிலிருந்தும் வெள்ளத்திலிருந்தும் அதனைப் பாதுகாக்க வேண்டும் என்று அரசைப் பணிவாக வேண்டி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. The next speaker is the Hon. S. Shritharan.

[பி.ப. 5.53]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாடு பூராவும் நிலவும் வரட்சி நிலைமை தொடர்பாக இன்றைய தினம் 'ஜனதா விமுக்தி பெரமுன' - மக்கள் விடுதலை முன்னணியின் தலைவர் அநுரகுமார திஸாநாயக்க அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகிறேன். பெரும்பாலும் இந்த நாட்டின் ஒவ்வொரு மாவட்டத்திலும் இவ்வாறான வரட்சிப் பிரச்சினை பாரிய அளவிலே இருக்கின்றது. குறிப்பாக, கிளிநொச்சி மாவட்டமானது, வடக்கு மாகாணத்திற்கான நெல்லுற்பத்தியிலே பிரதான பாத்திரத்தை வகிக்கின்றது; இலங்கையிலே காணப்படுகின்ற பெரிய சமுத்திரம் போன்ற குளங்களுள் விரல்நீட்டிச் சொல்லக்கூடிய இரணைமடுக் குளத்தைத் தன்னகத்தே கொண்டிருக்கின்றது. இரணைமடுவில் காணப்படும் வரட்சி காரணமாக அங்கு கடந்த மூன்று ஆண்டுகளுக்கு மேலாக நீர் கிடைக்காததாலும் அந்தக் குளத்தினுடைய கட்டுமான வேலைகள் ஆரம்பிக்கப்பட்ட காரணத்தால் அங்கே நீரைத் தேக்க முடியாத ஒரு சூழ்நிலையிலும் இரணைமடுக் குளத்தின் கீழ்ப் பிரதேசத்திலுள்ள சுமார் 42 ஆயிரம் ஏக்கர் காணிகளில் பயிர்ச்செய்கையில் ஈடுபட்டுவந்த பல விவசாயக் குடும்பங்கள் கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. குறிப்பாக, இரணைமடுக் குளத்தின் கீழ்ப் பிரதேசத்திலே மானாவாரியாகவும் நீர் பாய்ச்சுகின்ற அடிப்படையிலும் பயிர் செய்யப்படுகின்ற 42 ஆயிரம் ஏக்கர் நிலப் பகுதிகள் காணப்படுகின்றன. இதிலே 22 ஆயிரம் ஏக்கர் நிலங்கள் காலபோகத்திலே இரணைமடுக்குளத்தின்கீழ் நீர்ப்பாசனம் பெறுகின்றன. அந்த 22 ஆயிரம் ஏக்கர் நிலங்களுள், ஆக 910 ஏக்கர் காணிகளில் மட்டும்தான் இவ்வருடம் சிறுபோகம் செய்கை பண்ணப்பட்டது. அதுகூட தண்ணீர் இல்லாமல் இறுதி நேரங்களில் அழிந்துபோன நிலையிலே விதைநெல்லைக்கூடத் தேடுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைக்கு இன்று அந்த விவசாயிகள் தள்ளப்பட்டிருக்கின்றார்கள்.

இதனைவிட கிளிநொச்சி மாவட்டத்திலுள்ள பல்வேறுபட்ட குளங்கள் வரட்சி காரணமாக வற்றிப்போன நிலையில் அந்த மாவட்டம் பெருமளவிலே பாதிக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக கிளிநொச்சி மாவட்டத்தின் பூநகரிப் பிரதேச செயலாளர் பிரிவானது, வருடத்தின் முழுப் பகுதியுமே குடிதண்ணீருக்காக அலைகின்ற கிட்டத்தட்ட 6,800 குடும்பங்களைக் கொண்ட பெரிய, பாரம்பரிய நிலப்பரப்பாகும். அந்த 6,800 குடும்பங்களில் 1,000 குடும்பங்களைத் தவிர மிகுதியானவர்கள் ஒவ்வொரு வருடமும் அலைந்து திரிந்துதான் குடிதண்ணீரைப் பெறுகின்ற துர்ப்பாக்கிய நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். பூநகரிப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள கறுக்காய்தீவு, குமுழமுனை, பாலாவி, இரணைமாதா நகர், வலைப்பாடு, பள்ளிக்குடா, நாலாங்கட்டி, செட்டியாகுறிச்சி, ஆலங்கேணி, நல்லூர் போன்ற இடங்களும் குமுழமுனையோடு சேர்ந்த பகுதியிலே காணப்படுகின்ற முழங்காவில் பிரதேசத்திலே இருக்கின்ற செம்மண்குன்று, நாச்சிக்குடா, முழங்காவில்,

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

கரடிக்குன்று, அன்புபுரம், சோலை, பல்லவராயன்கட்டு, கரியாலை, நாகபடுவான் போன்ற பகுதிகளும் இந்த வரட்சி காரணமாகக் கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்ற பகுதிகளாகும். ஆகவே, இது மிக மிக முக்கியமாகக் கவனத்திலே எடுக்கப்பட வேண்டும்.

2008 - 2009ஆம் ஆண்டு காலப்பகுதியில் தமிழர்கள்மீது மேற்கொள்ளப்பட்ட இன அழிப்பு ரீதியான யுத்தம் காரணமாக பூநகரிப் பிரதேசத்திலுள்ள கரியாலை, நாகபடுவான் குளப்பகுதிகளிலே விதைக்கப்பட்ட கண்ணிவெடிகள் இதுவரை அகற்றப்படவில்லை. அதன் காரணமாக அந்தக் குளத்துக்கு வரும் மிகப் பிரதானமான ஆறான முடக்கன் ஆறு வருகின்ற பாதையில் நான்கு இடங்களில் கண்ணிவெடி அகற்றும் பிரிவினால் மறிப்பு ஏற்படுத்தப்பட்டுள்ளது. அதனால் கரியாலை, நாகபடுவான் குளத்திற்கான தண்ணீர் இம்முறையும் வரத்தில்லாத காரணத்தால் அங்குள்ள விவசாயிகள் 500 ஏக்கர் சிறுபோக நெற்செய்கையைச் செய்கைபண்ண முடியாத ஒரு சூழ்நிலைக்குத் தள்ளப்பட்டார்கள். அதனால் அவர்களுடைய விவசாயச் செய்கை பாதிக்கப்பட்டுள்ளது. அந்த வகையில் அக்குளத்தின்மூலம் பயிர் செய்கின்ற விவசாயிகள் இவ்வாறு மிகக் கடுமையான வரட்சியை எதிர்கொண்டிருக்கின்றார்கள்.

இதனைவிட, பூநகரிப் பிரதேசத்திலே காணப்படுகின்ற இன்னொரு நீர்ப்பாசனக் குளமான சின்னப்பல்லவராயன்கட்டுக் குளமும் இம்முறை கடும் வரட்சியால் பாதிக்கப்பட்டுள்ளது. அந்தக் குளத்தை நம்பி 100 ஏக்கர் காணிகளில் சிறுபோகம் விதைத்த விவசாயிகள் நெல்லை அறுவடை செய்ய முடியாமல் முழுமையான அழிவுக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். ஆகவே, இந்த மாவட்டத்திலே பூநகரிப் பிரதேச செயலாளர் பிரிவிலே இருக்கின்ற மக்கள்தான் இவ்வாறான கடும் வரட்சியை மிகமிகக் கூடுதலாக அனுபவிக்கின்றார்கள். இவர்களைவிட கண்டாவளை பிரதேச செயலாளர் பிரிவில் காணப்படுகின்ற கல்லாறு, சுண்டிக்குளம், தர்மபுரம் கிழக்கு, புளியம்பொக்கணை, தட்டுவன்கொட்டி, உமையாள்புரம், கண்டாவளைக் கிராமத்திலுள்ள மானடித்தகுளம், மாவரம்சாட்டி, தேவன்பிட்டி, கோணன்குளம் போன்ற பகுதிகளிலே உள்ள மக்களும் இவ்வாறான கடுமையான வரட்சிக்கு முகம்கொடுத்து வருகின்றார்கள்.

இந்தக் கடும் வரட்சியானது பல்வேறு விதத்தில் பலரைப் பாதித்திருக்கிறது. குறிப்பாக, நன்னீர் மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்றவர்களைப் பாதித்திருக்கிறது. இரணைமடுக் குளத்துக்குக் கீழே சாந்தபுரம் என்ற கிராமத்திலே வசிக்கின்ற, இரணைமடுக் குளத்தையே நம்பி நன்னீர் மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்ற கிட்டத்தட்ட 184 குடும்பங்கள் இந்த வரட்சி காரணமாக முற்றுமுழுதாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. இவர்கள் மீன்பிடித் தொழிலிலே ஈடுபடமுடியாதளவுக்கு அக்குளத்தில் தண்ணீர் வற்றிக் காணப்படுகின்றது. இவர்களுக்கு நிவாரணம் வேண்டி நான் மீன்பிடித்துறை அமைச்சருக்குக்கூட கடிதம் எழுதியிருந்தேன். அவர் அதனை தன்னுடைய துறைசார்ந்த தலைவருக்கு அனுப்பியிருந்தார். ஆனால், இதுவரை அவர்களுக்கு எந்த நிவாரணமும் கிடைக்கவில்லை. இவர்களைப்போலவே வன்னேரிக்குளம், அக்கராயன்குளம், கல்மடுக்குளம் போன்றவற்றில் நன்னீர் மீன்பிடியில் ஈடுபடுகின்ற மீனவர்களும் கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கிறார்கள்.

இவற்றுக்கு அப்பால், கிளிநொச்சியின் நகரப் பகுதிக்கு அண்மையில் இருக்கின்ற பாரதிபுரம், மலையாளபுரம், கிருஷ்ணபுரம், விவேகானந்த நகர், விநாயகபுரம் போன்ற கிராமங்களைச் சேர்ந்த மக்களும் கிளிநொச்சி நகரிலிருந்து உயர்ந்த பகுதிகளில் வாழ்வதனால் கடுமையான வரட்சிக்கு உள்ளாக்கியிருக்கிறார்கள். இது பாரியதொரு வரட்சி. கடந்த நான்கு ஆண்டுகளாக கிளிநொச்சி மாவட்டத்தில் மட்டுமல்ல, ஒட்டுமொத்தமாக வடக்கு, கிழக்கில் பருவ மழை பொய்த்திருக்கிறது. அதிலும் சென்ற ஆண்டு பருவ மழை முழுமையாகப் பொய்த்திருந்தது. அந்த மழை கிடைக்காத காரணத்தினால்தான் இவ்வாறான கடும் வரட்சிக்கு அவர்கள் முகம்கொடுத்திருக்கிறார்கள். இங்கு கௌரவ அநுரகுமார திசாநாயக்க அவர்களால்கூட, வரட்சியினால் பாதிக்கப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை சொல்லப்பட்டது. அந்த எண்ணிக்கையைவிட அதிகமான குடும்பங்கள் இந்த மாவட்டங்களில் காணப்படுகின்றன. இது அந்த மக்கள் எதிர்கொண்டிருக்கின்ற பாரிய விளைவாகும்.

இதேபோலவே, யாழ்ப்பாணத்தின் தீவகப் பகுதியில் காணப்படுகின்ற பல பிரதேசங்களில் வாழுகின்ற மக்களும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். யாழ்ப்பாண மாவட்டத்தின் மிக முக்கிய தேர்தல் தொகுதியான ஊர்காவற்றுறையை மையமாகக்கொண்ட நெடுந்தீவு, அனலைதீவு, எழுவைதீவு, புங்குடுதீவு, நயினாதீவு, வேலணை, சரவணை, மண்டைதீவு, ஊர்காவற்றுறை, நாரந்தனை, சுருவில், தம்பாட்டி, பருத்தியடைப்பு, மெலிஞ்சிமுனை போன்ற கிராமங்களில் வாழுகின்ற மக்கள் நாளாந்தம் தண்ணீருக்காக அலைகின்ற நிலைமை காணப்படுகின்றது. அண்மையில் நெடுந்தீவிலே நடந்த ஒருங்கிணைப்புக் குழுக்கூட்டத்தில் கடல்நீரைச் சுத்திகரித்துத்தான் அவர்களுடைய நூறுவீத தண்ணீர்த் தேவையில் 40 வீத தேவையைப் பூர்த்திசெய்கிறார்கள் எனக் குறிப்பிடப்பட்டது. அந்த மக்கள் குடிநீருக்காக அலைந்து திரிகின்றார்கள். இதேபோல, 12 கிராம அலுவலர் பிரிவுகளைக் கொண்ட ஒரு பாரிய கிராமமான புங்குடுதீவில் மக்கள் குடிதண்ணீருக்காக அலைந்து திரிகின்ற மிக மோசமான ஒரு நிலைமை ஏற்பட்டிருக்கிறது. இதனைவிட, எழுவைதீவுக் கிராமத்தில் அறவே தண்ணீரில்லாமல் வாழுகின்ற மக்கள் அதற்காக எக்காலமும் ஏங்கியிருக்கின்ற சூழல் காணப்படுகின்றது. இவ்வாறு யாழ்ப்பாண மாவட்டத்தில் இருக்கின்ற தீவுப்பகுதிகள் எந்த நேரமும் குடி தண்ணீருக்காக ஏங்குகின்ற பிரதேசங்களாகக் காணப்படுகின்றன.

குறிப்பாக, வடக்கு மாகாணத்திலே அரசாங்கத்தினால் ஆரம்பிக்கப்பட்டுள்ள கடல் நீரைச் சுத்திகரித்து நன்னீராக்கி வழங்குகின்ற திட்டம் நெடுந்தீவிலே ஓரளவு வெற்றிபெற்றிருக்கின்றது. இதனை இன்னும் கொஞ்சம் அதிகமாகச் செயற்படுத்த வேண்டிய, அதாவது, அதனுடைய Plant இனுடைய எண்ணிக்கையை இன்னும் அதிகரிக்கவேண்டிய தேவையிருக்கின்றது. அதேபோன்று ஏனைய தீவுகளிலும் இவ்வாறு கடல் நீரைச் சுத்திகரித்து நீர் வழங்கக்கூடிய வகையிலே செயற்றிட்டங்கள் வகுக்கப்பட்டால், அந்த மக்களுடைய குடிதண்ணீர்ப் பிரச்சினைக்கான தீர்வை எட்டமுடியும் என்பது எங்களுடைய கருத்து.

இதனைவிட, இந்தத் தீவகத்திலே வாழ்ந்த மக்களில் பெரும்பாலானவர்கள் கடற்றொழிலை நம்பி வாழ்ந்தார்கள்; மிகுதிப்பேர் அங்கே விவசாயத்தை நம்பி வாழ்க்கை நடத்தினார்கள். இவர்களுடைய விவசாயத்திலே பிரதானமானது புகையிலைச் செய்கை. இவ்வாறு

புகையிலைச் செய்கையிலே ஈடுபட்ட இவர்கள் அரசாங்கத்தினது தடை காரணமாகத் தொடர்ந்து அந்தச் செய்கையிலே ஈடுபட முடியாமலிருக்கின்றார்கள். அறுவடை செய்த புகையிலையை விற்க முடியாமலிருக்கின்றார்கள். புளியங்கூடல் கிராமத்திலே வாழ்கின்ற மக்களை நான் அண்மையிலே சந்தித்தபோது, அவர்கள் கண்ணீரோடு எனக்கு இந்த விடயத்தை முன்வைத்தார்கள். இவர்களைப்போன்று தீவுப் பகுதியில் பல இடங்களிலே வாழ்கின்ற மக்கள் புகையிலையைப் பிரதான பணப்பயிராகக் கொண்டு அதன் உற்பத்தியில் ஈடுபட்டிருந்தார்கள். ஆனால், அவர்களுக்கான எந்த மாற்றுத் திட்டங்களும் அரசாங்கத்தினால் முன்வைக்கப்படவில்லை. அதனால் அவர்கள் அந்த இடங்களிலே தொடர்ந்து வாழ முடியாமல் இயல்பாகவே இடப்பெயர்வுக்குள்ளாக வேண்டிய ஒரு சூழ்நிலைக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். இது இந்த நாட்டிலே ஒரு பக்கமிருக்கின்ற அனர்த்தம்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையிலே தென்பகுதியிலே வெள்ளம் காரணமாக மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அவர்களுக்கான நிவாரணங்கள், திட்டங்கள் அறிவிக்கப்படுகின்றன. ஆனால், வரட்சி காரணமாகத் தீவுப் பகுதியிலே இருக்கின்ற மக்கள் எவ்வளவுதூரம் பாதிக்கப்படுகின்றார்கள் என்பதை அனர்த்த முகாமைத்துவ அமைச்சின் அதிகாரிகள் நாங்கள் தெரிந்துகொள்ளவேண்டும். நான் நினைக்கின்றேன், இங்கு அந்த அமைச்சினுடைய வருகை தந்திருப்பார்களென்று. தீவகத்தினுடைய வரட்சி சம்பந்தமாக அவர்கள் தனியான ஒழுங்கமைப்பொன்றை மேற்கொள்ள வேண்டிய நிர்ப்பந்தத்திற்கு உள்ளாக்கப்பட்டிருப்பார்கள் என்று நான் கருதுகின்றேன். காரணம், அந்தப் பகுதி மக்களுடைய எதிர்காலம் பற்றிய நம்பிக்கைகள் உருவாக்கப்பட வேண்டும்.

குறிப்பாக, இந்த வரட்சிக்கான காரணங்களை ஆராய்கின்றபொழுது, இருக்கின்ற குளங்கள் தூர்ந்துபோயிருக்கின்றன அல்லது குளங்களிலே சேர்க்கப்பட்டிருக்கின்ற கழிவு மண் தூர்வாரப்படவில்லை. அந்தக் குளங்கள் தூர்வாரப்பட்டிருந்தால், ஆழமாக்கப்பட்டிருந்தால், மழை நீரைச் சேமிக்கக்கூடிய வாய்ப்பு அதிகமாக இருந்திருக்கும். ஆனால், அவ்வாறான நிலைமைகள் அங்கு மேற்கொள்ளப்படவில்லை. இது ஒரு மிக மோசமான நிலைமை. ஆகவே, இதற்கு நாங்கள் ஒரு திட்டத்தைக் கொண்டுவருவது மிக நல்லதாக இருக்குமென நான் கருதுகின்றேன். குறிப்பாக ஒவ்வொரு கிராமங்களுக்கும் 'கிராமத்திற்கொரு குளம்' என்ற அடிப்படையில், ஒரு கிராமத்திலே ஒரு குளத்தைப் புனரமைத்து, அல்லது ஒரு குளத்தை அமைத்து, அந்தக் குளத்தினூடாகத் தண்ணீரைப் பெற்றுக்கொள்கின்ற, அந்தக் குளத்தினூடாக நிலத்தடி நீரைப் பெற்றுக்கொள்கின்ற ஒரு வாய்ப்பை ஒவ்வொரு கிராமங்களுக்கும் உருவாக்கவேண்டும். அந்தத் திட்டம் மிக மிக நன்மையானதாக அமையும். நான் நினைக்கின்றேன், இந்தியாவிலே இன்றைய இந்தியப் பிரதமர் கௌரவ நரேந்திர மோடி அவர்கள் குஜராத்திலே ஒரு கிராமத்திற்கு ஒரு குளம் என்று கொண்டுவந்த திட்டம், இன்று அந்த மாநில மக்கள் அவரைக் கடவுளாகப் பார்க்கின்ற ஒரு சூழலை உருவாக்கியிருக்கின்றது. கிராமத்திற்கொரு குளம் என்ற அடிப்படையில் நீரை நோக்கிய, மழை நீரைக் கடலுக்குப் போகவிடாமல் அதனை நிலத்தடி நீராக மாற்றுகின்ற சூழலை உருவாக்குகின்ற திட்டங்கள் அமுல்படுத்தப்படுகின்றபோது தான் நாட்டிலே வரட்சியினுடைய தாக்கம் குறையும்.

இதனைவிட, மரங்கள் தறிக்கப்படுகின்றன. ஆனால், தறிக்கப்படுகின்ற மரங்களுக்குப் பதிலாகப் புதிய மரங்கள் நாட்டப்படுவதில்லை. ஆகவே, மக்களிடையே மரம் நாட்டுகின்ற பழக்க வழக்கங்களை அதிகரிப்பதனூடாக, இயற்கையினுடைய அந்தப் பசுமையைப் பேணுவதனூடாக, நாங்கள் இந்த வரட்சியை நீக்க முடியும் என்பது என்னுடைய கருத்து. இந்த அடிப்படையிலே கிளிநொச்சியிலும் தீவகத்திலும் நாட்டினுடைய ஏனைய பகுதிகளிலும் நிலவுகின்ற வரட்சிக்கு ஒரு நல்ல முடிவு எட்டப்பட வேண்டும். இந்த மக்கள் கவனிக்கப்பட்டு, வரட்சியை எதிர்கொள்கின்ற அவர்களுடைய துன்பகரமான நிலைமைக்கு மாற்றீடு காணப்படவேண்டும் என்பதைக் குறிப்பிட்டு, நிறைவுசெய்கின்றேன்.

[අ.භා. 5.45]

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ විවාදයට ලක් වන්නේ අපේ රටේ දිස්ත්‍රික්ක 20කට පමණ බලපා ඇති නියඟය සම්බන්ධවයි. සභාව කල් තැබීමේ යෝජනාවේ සඳහන් වන විධියට, පවුල් 340,000කට ආසන්න ප්‍රමාණයක් නියඟයෙන් පීඩාවට පත් වෙලා සිටිනවා. විශේෂයෙන් උතුර, උතුරු නැඟෙනහිර, උතුරු මැද, ඌව හා මධ්‍යම පළාත්වලට අයත් මොණරාගල, අම්පාර, හම්බන්තොට, බදුල්ල, පොළොන්නරුව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මුලතිව්, වවුනියාව හා යාපනය ඇතුළු දිස්ත්‍රික්ක 20ක් -දිස්ත්‍රික්ක වැඩි ගණනාවක්- නියඟයකට පත් වෙලා තිබෙන වෙලාවක තමයි අපි ඒ සම්බන්ධයෙන් විවාදයකට ලක් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියඟය නිසා පීඩාවට පත්වූවන් පිළිබඳ තොරතුරු අපට ලැබී තිබෙනවා. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ තොරතුරු අනුව මේ මොහොත වන කොට ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය, කුරුණෑගල, පුත්තලම, කිලිනොච්චිය, වවුනියාව, මුලතිව්, යාපනය, මන්නාරම, රත්නපුර, මොණරාගල, බදුල්ල, මාතලේ, මහනුවර, ගම්පහ, කෑගල්ල සහ හම්බන්තොට කියන දිස්ත්‍රික්කවල පවුල් 369,354ක් මේ නියඟය හේතුවෙන් අනාථ වෙලා, පීඩාවට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම පීඩාවට පත්වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව 1,270,673ක් කියලා මෙහි සඳහන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා මේ දිස්ත්‍රික්කවලට ලබා දුන්නු ප්‍රතිපාදන ප්‍රමාණයත් මෙහි සඳහන් වෙලා තිබෙනවා. දැනට දිස්ත්‍රික්ක 8ක් සඳහා වියළි ආහාර සලාකත් ලබා දෙනවා කියලා මෙහි සඳහන් වනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියඟය නිසා පීඩාවට පත් වෙලා ඉන්න ගොවි පවුල් සංඛ්‍යාව 369,354යි කියන මේ සංඛ්‍යාව නිවැරදිද කියලා මම දන්නේ නැහැ. මොකද, අගෝස්තු 6වන ඉරිදා නිකුත් වූ පත්තරයක තිබෙනවා, "නියඟය රටෙන් තුනෙන් එකක් ගිලියි. පන්ලක්ෂ තිස්තුන්දහස් දෙසිය දහතුනක් නියඟයෙන් පීඩාවට" කියලා. එතකොට නිවැරදි මේ පත්තරේ තිබෙන සංඛ්‍යාවද, නැත්නම් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සංඛ්‍යාවද? මේ පත්තරයටත් තොරතුරු ලැබෙන්න ඇත්තේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් නේ. මේ දත්ත දෙකෙන් මොකක් නිවැරදිද කියන එක අපි දන්නේ නැහැ. හැබැයි මේ ප්‍රවෘත්තියේ කියනවා, "පන්ලක්ෂ තිස්තුන්දහස් දෙසිය දහතුනක් නියඟයෙන් පීඩාවට පත් වෙලා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි මාසයේ 8වැනි දා පැවැති මැතිවරණයෙන් මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

එස්.බී. දිසානායක මැතිතුමාගේ අමාත්‍යාංශයෙන් මේ රටේ සමෘද්ධිලාභීන් පිළිබඳව සමීක්ෂණයක් කළා. ඔබතුමා දන්නවා, සමෘද්ධිලාභී පවුල් වැඩි සංඛ්‍යාවක් ඉන්නේ මේ නියඟය පවතින වියළි කලාපයේ දිස්ත්‍රික්කවල බව. සමෘද්ධිලාභීන්ගෙන් ලක්ෂ 3කට වඩා වැඩි ප්‍රමාණයක් දැන් නියඟයෙන් පීඩාවට පත් වෙලා, බැට කාලා ඉන්න වෙලාවේ පසුගිය කාලයේ කරපු සමීක්ෂණයේ ප්‍රතිඵලයක් හැටියට මේ වන කොට ඒ සමෘද්ධිලාභී පවුල්වලට සමෘද්ධිය කප්පාදු කිරීමේ අනතුරක් ඇවිල්ලා තිබෙනවාය කියන එක සඳහන් වෙලා තිබෙනවා.

එස්.බී. දිසානායක මහත්මයා 2015 ඔක්තෝබර් මාසයේ 20වැනි දා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "කී දෙනෙක් සමෘද්ධි ආධාර ලැබීමට සුදුසුද, කී දෙනෙක් සමෘද්ධි ආධාර ලැබීමට නුසුදුසුද, සමෘද්ධි ආධාර හරියටම දිය යුත්තේ කාටද කියලා සමීක්ෂණයක් කරනවා. අපි මේ සම්බන්ධව විශේෂයෙන් සොයා බලනවා." කියලා. දැන් ආණ්ඩුව කලබල වෙලා තිබෙනවා. මොකද, මේ සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ආවා. ප්‍රදේශීය ලේකම් කාර්යාල දැන් නාම ලේඛන විස්තරගත කරලා තිබෙනවා. ඒ අනුව මේ රටේ සමෘද්ධිලාභී ජනතාව පසු ගිය දවස්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වටලමින් කියන්න ගත්තා, "අපට ජීවත් වෙන්න විධියක් නැහැ. තිබුණු එකම සහනාධාරය මේ යහ පාලන ආණ්ඩුව කැපුවා" යි කියලා. මේ නියඟය නිසා පීඩාවට පත්වූ ජනතාව තවත් පීඩාවට පත් වූ පැත්තක් ගැනයි මම ඒ සඳහන් කළේ. සමෘද්ධි සහනාධාරය කිසිම කප්පාදුවක් නොකර සමෘද්ධිලාභී පවුල්වලට හරියටම ලබා දෙන්න කියලා, අපි මේ වග කිවයුතු පාර්ලිමේන්තුවෙන් ඉල්ලනවා. එස්.බී. දිසානායක මහත්තයා කිව්වේ, "මේ, කම්පියුටර්වල ප්‍රශ්නයක්, කම්පියුටර් ජිල්මාට් එකක්, data feed කිරීමේදී ඇති වූ ප්‍රශ්නයක්" කියලා. එහෙමයි උන්නැහේ කිව්වේ. 2015 වසරේ ඔක්තෝබර් මස 20වැනි දින එතුමා කිව්වේ, 2016 අය වැයට කලින් මේ ප්‍රතිඵලය රටට කියලා, මේ සම්බන්ධව සමෘද්ධි කප්පාදුවක් කරන්නේ නැහැ කියලායි. දැන්, 2017 ඒක ඇවිල්ලා. ඒ විතරක් නොවෙයි, සමෘද්ධිය සම්බන්ධව සමීක්ෂණය කරපු form එක මා සතුව තිබෙනවා. ඒ form එක සකස් කරලා තිබුණේ නැවත කිසිම කෙනෙකුට සමෘද්ධි ආධාරයක් නොලැබෙන විධියටයි. මේ form එක ගම්වලට යවලා තමයි සමෘද්ධිලාභීන්ට තට්ටු කරන ඒ වැඩසටහන ආවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, මේ නියඟය සම්බන්ධව එක්තරා වැදගත් කාරණාවක් මම මේ වෙලාවේ කියන්න ඕනෑ. මෙම නියඟය නිසා මේ රටේ ගොවියා අද කබලෙන් ළිපට වැටිලා කියලා අපි දන්නවා. එක පැත්තකින් වී ගොවියාට ලැබිය යුතු පොහොර සහනාධාරය නිසි කලට ලැබිලා නැහැ. "මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි" කියන රටේ ඒ ගොවියා කුඹුර සීසානකොට සල්ලි ටික නැත්නම්, දින හතේදී පොහොර ටික දමන්න මුදල් ටික ලැබිලා නැත්නම්, දින 21දී පොහොර ටික දමන්න අවශ්‍ය මුදල් ලැබිලා නැත්නම්, දින 45දී පොහොර ටික දමන්න අවශ්‍ය මුදල ලැබිලා නැත්නම් ගොයම් කපලා බැත හුළං කළාට පස්සේද, ඒ සහනාධාරය ගොවියාට ලැබෙන්නේ කියලා අපි විෂය භාර ඇමැතිතුමාගෙන් -කෘෂිකර්ම ඇමැතිතුමාගෙන්- අහන්න කැමැතියි. ඒකත් මේ නියඟය ඇතුළේ තිබෙන එක බරපතළ ප්‍රශ්නයක්. අපේ රටේ ගොවි ජනතාව එක පැත්තකින් නියඟයෙන් පීඩා විඳිනවා. වතුර නැතිව වැව් අමුණු ගණනාවක් හිඳිලා ගිහින්. අනුරපුරේ, රජරට ප්‍රදේශයේ වැව් තුන්දහස් ගණනක් හිඳිලා කියලා පසුගිය දවස්වල පත්තරේ තිබුණා. ඒකෙන් පීඩා විඳින ගොවියාට මේ පොහොර සහනාධාරය හරි වෙලාවට ලැබෙන්නේ නැහැ. කන්නය ඉවර වෙනකොට ගොවියා ණය වෙලා. ගොවියා ණය තුරුස්වලින් පිරිලා ඉන්නේ. අවසානයේ ගොයම් කපලා බැත හුළං කරලා හාල් ටික ගෙදරට එනකොට ඒ ගොවියා සම්පූර්ණයෙන් ණයකාරයෙක් බවට පත් වෙලා ඉවරයි. ඉන් පසුව තමයි ගොවියාට සහනාධාරය ලැබෙන්නේ. ඔන්න පොහොර සහනාධාරයේ තත්ත්වය! එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ නිසි වේලාවට, නිසි කලට, නිසි මොහොතේ පොහොර සහනාධාරය ගොවියාට ලැබුණා. සීසාන කොට දින 7 පොහොර ටික දමන්න, දින 45න් පොහොර ටික දමන්න හරියට පොහොර සහනාධාරය ලැබුණා. අද ගොවියට ඒක ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. වී ගොවියා ඒ විධියට පීඩා විඳනවා වාගේම, අද ගම්මිරිස්වලටත් හොඳ මිලක් නැහැ. අද කිරි ගොවියාටත් හොඳ මිලක් ලැබෙන්නේ නැහැ. පසුගිය දවස්වල රබර් ගස් ටික දරට කපන්න සූදානම් වුණා. මොරණාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර වාගේ ප්‍රදේශවල රබර් වගාවෙන් ඉතා විශාල ආදායමක් ලබපු මිනිසුන් රබර්වලට මිලක් නැති නිසා ඒ පැත්තෙන් කබලෙන් ළිපට වැටිලා තිබෙනවා. ලංකාවේ රබර්වලට මිලක් නැහැ; කිරිවලට මිලක් නැහැ. ඒ කාලයේ ගම්මිරිස්වලට තමයි වැඩිම ආදායම තිබුණේ. ඒකත් දැන් ආදායමක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැව් ගැන සමහර මන්ත්‍රීවරු කියූ කරුණු සම්බන්ධව මට වැදගත් කාරණාවක් කියන්න තිබෙනවා. අනාදිමත් කාලයක් තිස්සේ උතුරු මැද පළාතේ රජරට ප්‍රදේශයේ, උතුරු ප්‍රදේශයේ, නැඟෙනහිර පළාතේ නියඟය පැවති බැවින් වැව් බැන්දා. ඒ ආකාරයට නැඟෙනහිර දීඝවාපිය දක්වා පැවති මාගම රාජධානිය පාලනය කළ කාවන්තිස්ස රජ සමයේ, ගැමුණු මහරජ මේ රට බේරා ගැනීමේ සටනට යන වේලාවේ සද්ධාතිස්ස කුමාරයා දීඝවාපිය දක්වා වැව් අමුණු දස දහසක් හදලා ඌව වෙල්ලස්ස දීඝවාපිය, ඌව වෙල්ලස්ස බින්තැන්න කලාපය සශ්‍රීක කළා කියලා කියනවා. වැව් දසදහසක් නිම කර කුඹුරු දසලක්ෂයක් අස්වැද්දුවා කියලා අපි අහලා තිබෙනවා. එදා වැව කිව්වේ ටැංකියකට නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමැති ලෙස විජිත් විජයමුණි සොයිසා මැතිතුමා මගේ දිස්ත්‍රික්කයේ -ඌව වෙල්ලස්සේ- ජාතික ලැයිස්තුවෙන් පත් වෙලා ඇවිත් ඉන්නවා. එතුමාගෙන් මට වැදගත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඒ තමයි මේ නියඟයට මුහුණ දෙන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුව අරගෙන තිබෙන පියවර මොකක්ද කියන ප්‍රශ්නය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

අද හැම දිස්ත්‍රික්කයකම තිබෙන වාරිමාර්ග, වැව්, අමුණු ටික කපනවා; හාරනවා. වැලි හොරකමේ යෙදෙනවා. මොණරාගල දිස්ත්‍රික්කයේ, එහා පැත්තේ අම්පාර දිස්ත්‍රික්කයේ අපේ වාරි ව්‍යාපාරය වන රඹකැන්ඔය ජලාශයේ රඹකැන් ඔය පැත්තට වැලි හොරු ටික ගිහින් කියලා ආරංචි වෙලා තිබෙනවා. මනම්පිටිය ගඟටත් වැලි හොරු බෝ වෙලා. මහවැලි ගඟේ වැලි හොරුන්ට, හැම ගංගාවකම සිටින වැලි හොරුන්ට, වැලි ජාවාරම්කාරයන්ට ඉඩ දෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියලා එකක් වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ තිබෙනවා.

අප අහන්නේ මේකයි. ඉතිහාසයේ වැව් හැදුවා කියන්නේ කොහොමද? වැවට පෝෂක ප්‍රදේශයක් තිබුණා; ඉහත්තාවක් තිබුණා. මහවැවට එන රොන් මඩ නැවැත්තුවේ කොහොමද? කුළු වැව් ටික ආරක්ෂා කරලායි. මින්නේරිය වැවට අක්කර ලක්ෂ ගණනක පෝෂක ප්‍රදේශයක් තිබුණා. ඔබතුමන්ලා දුන්න computer එක දැන් මා ළඟ තිබෙනවා. ඒකෙන් මම තොරතුරු සොයා බැලුවා. අම්පාර දිස්ත්‍රික්කයේ සේනානායක සමුද්‍රයේ පෝෂක ප්‍රදේශයේ ධාරිතාව එහි සඳහන් වෙනවා. ඊළඟට, මින්නේරිය වැවට හෙක්ටෙයාර විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ විධියට හැම වැවක්ම මහා පරිමාණ පෝෂක ප්‍රදේශයක් රැකගෙන තිබුණා. අද ඒ වැව්වල පෝෂක ප්‍රදේශයේ ඉහත්තාව ගැන මධ්‍යම පරිසර අධිකාරිය බලනවාද? වාරිමාර්ග දෙපාර්තමේන්තුව අහලා බලනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගියා. මේ දවස්වල වැව් ටික හාරනවා. නියඟයෙන් පීඩා විඳිනවා කියා හිතලා තමයි මේ වැව් ටික හාරන්නේ. මාලිගාවිල වැව හාරනවා, රාත්‍රී කාලයේදී. අඩි පහක් හාරනවා. රොන් මඩ ගන්න අඩි පහක් හාරන්නේ මොකටද? රොන් මඩ එහෙම අයින් කරන්න පුළුවන්කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වාරි විශේෂඥයින්ගෙන් අහන්න, රොන් මඩ එහෙම ගන්න පුළුවන්කමක් නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අද වැව් පතුලටම හාරනවා.

ඒ විතරක් නොවෙයි. කටුගහගල්ගේ වැව, සද්ධාතිස්ස වැව, මීගහපිටිය වැව ආදී මොණරාගල දිස්ත්‍රික්කයේ හාරන හැම වැවක්ම හාරන්නේ වැලි හොරකමට. පස් හොරකමට වැව් ටික හාරනවා. එහෙම කරලා රජවරුන්ට වැඳගෙන හිටියාට, අහසට වැඳගෙන හිටියාට, වැස්ස වලාහක දෙවියන්ට වැඳගෙන හිටියාට වැවේ වතුර පිරෙන්නේ නැහැ. උඩින් වැටෙන වතුර ටික ගොවියාට ප්‍රයෝජනයට ගන්න ලැබෙන්නේ නැහැ. අපි ඉතා වගකීමෙන් කියනවා, මේ වන විට ලංකාව පුරාම වැව් ප්‍රතිසංස්කරණයෙන් මේ රජය කරලා තිබෙන්නේ වැව් හාරා වැලි ජාවාරමක යෙදීමක් බව; පස් ජාවාරමක යෙදීමක් බව. ඒ නිසා වැව්වල ජලය **පතුලටම හිඳිලා. වැව්වල ජලය පතුලටම හිඳීම නිසා, මේ නියඟය නිසා** ගොවි ජනතාව පීඩා විඳිනවා. වැව මරා දැමීම නිසා අනාගත වාරි ශිෂ්ටාචාරයත් මියැදෙනවා. ඒවාට පිළියම් යොදන තාක්කල් මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ නැති බවත් මතක් කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 5.58]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எமது நாடு எதிர்நோக்கியிருக்கின்ற வரட்சியினது பாதிப்பை முன்வைத்து நடைபெற்றுக்கொண்டிருக்கின்ற இந்த விவாதத்திலே எனது கருத்துக்களைக் கூறுவதற்கான வாய்ப்பைத் தந்தமைக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். குறிப்பாக, நாட்டிலுள்ள 20 மாவட்டங்களிலே வரட்சியின் பாதிப்பு இருக்கின்றபோது நான் பிரதிநிதித்துவம் செய்கின்ற கண்டி மாவட்டத்திலே இதனுடைய பாதிப்பு மிகக் குறைந்த மட்டத்திலேயே காணப்படுகின்றது. அவ்வாறிருந்தாலும், அந்த வரட்சியினுடைய பாதிப்பின் சில அங்கங்களை இங்கே சுட்டிக்காட்டவேண்டி இருக்கின்றது.

குறிப்பாக, கண்டி மாவட்டம் உட்பட மத்திய மலையகப் பகுதியை எடுத்துப்பார்க்கின்றபோது, அங்கே பெரும்பாலான பகுதிகள் தேயிலைத் தோட்டங்களாகக் காணப்படுகின்றன. இந்த மலை சார்ந்த பிரதேசங்களிலுள்ள நீரேந்து பகுதிகளிலிருந்து அதனைச் சுற்றியிருக்கின்ற கிராமங்களுக்கும் நகரங்களுக்கும் குடிநீரானது பெற்றுக்கொடுக்கப்படுகின்றது. ஆனால், எங்களுக்குத் தெரியும், இந்தத் தோட்டப் பகுதிகளிலே நீரேந்து பகுதிகள் இருந்தாலும் நீரூற்றுக்கள் காணப்பட்டாலும் அங்கு இயற்கையாக வருகின்ற நீரூற்றுக்களிலிருந்துதான் அவர்களுடைய தண்ணீர்த் தேவையானது பூர்த்தி செய்யப்படுகின்றது என்று. அந்த மக்களுக்கெனத் திட்டமிடப்பட்ட நீர் வழங்கல் திட்டமொன்று இதுவரை சரியாகக் கட்டியெழுப்பப்படவில்லை. அதன்காரணமாக இன்றிருக்கின்ற இந்த வரட்சியினால் பாரிய ஒரு பாதிப்பினை இந்தத் தோட்டப் பகுதியிலிருக்கின்ற மக்கள் எதிர்நோக்கியிருக்கின்றனர்.

குறிப்பாக, கண்டி மாவட்டத்தில் புசல்லாவைப் பகுதியிலே இருக்கின்ற சோகம, களுகல, சங்குவாரி போன்ற தோட்டங்களிலே பாரிய குடிநீர்ப் பிரச்சினை இருக்கின்றது. ஆனால், அதற்கு அண்மித்த பகுதியிலிருந்து தேவையான தண்ணீர் சேகரிக்கப்பட்டு, அதனைச் சுற்றியிருக்கின்ற நகரங்களுக்கும் கிராமங்களுக்கும் கொண்டுசெல்லப் படுகின்றது. அதேபோன்று, நாவலப்பிட்டி பிரதேசத் திலிருக்கின்ற இம்புல்பிட்டிய, பாரண்டா, கடியன்லேன போன்ற பகுதிகளிலே பாரிய குடிநீர்ப் பிரச்சினை இருக்கின்றது. ஆனால், அந்தப் பகுதிக்கு அண்மையிலே அமைக்கப்பட்டிருக்கின்ற குடிநீர்த் திட்டங்களிலிருந்து நகரங்களுக்குத் தண்ணீர் கொண்டுசெல்லப்படுகின்றது. அந்த வகையில், தண்ணீர் நீரூற்றுக்கள் இருக்கின்ற, நீரேந்துப் பிரதேசமாக இருக்கின்ற தங்களுடைய பிரதேசத்தில் அமைக்கப்பட்டிருக்கின்ற குடிநீர்த் திட்டங்களை மையப்படுத்தி நகரப் பகுதிகளுக்குத் தண்ணீரைக் கொண்டுசெல்வதனைத் தோட்ட மக்கள் பார்த்துக்கொண்டிருக்கின்றனர். ஆனால், அத்திட்டங்களிலிருந்து அவர்களுடைய தேவைகளுக்கான குடிநீரைப் பெற்றுக்கொள்ள முடியாத துர்ப்பாக்கிய நிலை இன்று தோன்றியிருக்கின்றது. இதன்காரணமாக எதிர்வரும் காலப்பகுதியிலே, இந்தத் தோட்டப் பகுதியிலே இருக்கின்ற மக்களுக்குத் திட்டமிடப்பட்ட வகையில் குடிநீர்த் திட்டங்களை அமைத்து, அவர்களுடைய தண்ணீர்த் தேவையைப் பூர்த்தி செய்வதற்குரிய நடவடிக்கை எடுக்கவேண்டியிருக்கின்றது.

இன்று நாட்டிலே தொடர்ச்சியாக நாங்கள் காலநிலை தொடர்பான மாற்றங்களைக் காண்கின்றோம். இந்த மாற்றங்களோடு இந்த நீரேந்து பகுதிகளிலும் மாற்றங்களைக் காண்கின்றோம். இயற்கையாக வடிந்துசெல்கின்ற, இயற்கையாக ஓடுகின்ற தண்ணீருடைய பற்றாக்குறையை நாங்கள் காண்கின்றோம். இவை இந்தத் தோட்டங்களிலே வாழ்கின்ற மக்களுக்கு மிகுந்த நெருக்கடியான தன்மையினை ஏற்படுத்தியிருக்கின்றது. ஆகவே, குடிநீர் வழங்கல் தொடர்பாக அமைச்சினூடாகத் திட்டமிடப்பட்ட வகையில் குடிநீர்த் திட்டங்கள் ஏற்படுத்தப்பட்டு, தோட்ட மக்கள்

[ගරු වේලු කුමාර් මහතා]

அவற்றிலிருந்து பயன்பெறும் வகையில் அவை சரியாக முன்னெடுக்கப்பட வேண்டும் என்பதனை இந்த அவையிலே ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

அதேபோன்று, இந்த வரட்சியினால் தேயிலைத் தோட்டங்களிலே பெறப்படுகின்ற கொழுந்துகளது விளைச்சலானது மிகக் குறைந்த மட்டத்தையடைகின்றது. இவ்வாறு குறைந்த மட்டத்தையடைகின்றபோதும் தோட்ட நிர்வாகமானது, அந்த மக்களைக் குறிப்பிட்டளவு கொழுந்து பறிக்கவேண்டுமென, அதாவது 18 கிலோகிராம், 20 கிலோகிராம், 22 கிலோகிராம் எனக் கட்டுப்பாடுகளை விதித்து, அந்தளவு கொழுந்தை ஒரு நாளில் பறித்தால்தான் அவர்களுக்குரிய நாள் கூலியைப் பதிவுசெய்யலாம் என்ற நெருக்கடியை ஏற்படுத்துகின்றது. இவ்வாறான சூழ்நிலையிலே, அங்கே கொழுந்தினது விளைச்சல் இல்லாத சந்தர்ப்பத்தில், அதனைப் பெற்றுக்கொள்ள முடியாத நெருக்கடித் தன்மைக்கு இந்த மக்கள் ஆளாகின்றார்கள். ஆகவே, இந்தத் தோட்டப் பகுதியில் கொழுந்துகளினது விளைச்சல் குறைவு காரணமாக அவர்களுடைய வேலை நாட்கள் குறைக்கப்பட்டிருக்கின்றன. அந்த வேலை நாட்களைக் குறைக்கின்றபோது அவர்களுடைய மாதாந்த வருமானம் குறைகின்றது. ஆகவே, அவர்கள் தொடர்பான புள்ளிவிபரங்களை எடுத்து, அவர்களையும் வரட்சி நிவாரணம் தொடர்பான இந்தத் திட்டத்திற்குள் உள்வாங்கவேண்டும் என்பதனை இந்த அவையிலே நான் தெரியப்படுத்த விரும்புகின்றேன்.

இறுதியாக, எமது நாட்டில் நிலவுகின்ற இந்த வரட்சி நிலை தொடர்பில் எமது அரசாங்கம் முற்போக்கான செயற்பாட்டினை எடுத்திருக்கின்றது; வரட்சி நிவாரணங்கள் வழங்கலை முற்போக்காக மேற்கொள்கின்றது. அவ்வாறு மேற்கின்ற நிலையிலே, இந்த மலையகத் தோட்டப் பகுதியில் இருக்கின்றவர்களின் உண்மை நிலையை அறிந்து, அவர்களுக்கும் தகுந்த நிவாரணத்தைப் பெற்றுத்தரவேண்டும் எனக்கோரி, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 6.03]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டில் இயற்கையின் சீற்றத்தால் ஏற்பட்டிருக்கும் வரட்சி நிலை பற்றி இன்று இங்கே குறிப்பிடுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். தற்போது நாட்டின் பல பாகங்களிலும் நிலவும் வரட்சியால் மக்கள் சொல்லொண்ணாத் துன்பத்தை அனுபவித்துவருவதை இச்சபையின் கௌரவ உறுப்பினர்கள் அனைவரும் நன்கு அறிவர். அண்மைக்காலமாக நிலவிவரும் வரட்சியினால் புத்தளம், குருநாகல், கிளிநொச்சி, யாழ்ப் பாணம், முல்லைத்தீவு, வவுனியா, மன்னார், அனுராதபுரம் போன்ற 19 மாவட்டங்கள் பெரிதும் பாதிக்கப் பட்டுள்ளன. விசேடமாக நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களில் நிலவும் கடும் வரட்சியால் விவசாயிகள், பாடசாலை மாணவர்கள், பல்கலைக்கழக மாணவர்கள் என்று பொதுமக்கள் பல தரப்பினரும் தமது அன்றாட அத்தியாவசியத் தேவைகளை நிறைவேற்றுவதற்குக்கூட நீரின்றிப் பெரிதும் சிரமப் படுகின்றனர்.

வரட்சியால் பாதிக்கப்பட்ட மக்களின் பிரச்சினைகளை நேரில் கண்டறிவதற்காக அண்மையில் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் எமது மாவட்டத்தின் பக்கத்துக் கிராமமான கெபித்திகொல்லாவப் பிரதேசத்திற்கு விஜயம் மேற்கொண்டார். அங்குள்ள நிலைமைகளை நேரில் கண்டறிந்து, உரிய அதிகாரிகளுக்கு ஆலோசனை வழங்கியதற்கேற்ப, பாதிக்கப்பட்ட மக்களுக்கு உலருணவு வழங்குதல், குடிதண்ணீர் வழங்குதல் மற்றும் ஏனைய நலன்புரிச் சேவைகளை நிறைவேற்றுதல் போன்ற பல்வேறு செயற்றிட்டங்கள் அமுல்படுத்தப்பட்டு வருவது வரவேற்கப்பட வேண்டிய விடயமாகும். மேதகு ஜனாதிபதி அவர்கள் இவ்விடயத்தில் ஆர்வம் காட்டுவதையிட்டுப் பாதிக்கப்பட்ட மக்களின் பிரதிநிதி என்ற வகையில் நான் அவருக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரட்சி நிவாரணப் பணிகள் தொடர்ச்சியாக இரண்டு மாதங்களுக்கு நடைபெறவிருப்பதாக எமக்குக் கிடைக்கின்ற தகவல்கள்மூலம் அறிகிறோம். அதேநேரம் மழை கிடைக்கும்வரை இந்நிவாரணங்கள் தொடர்ந்தும் வழங்கப் படுவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்று அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன். தொடர் வரட்சி காரணமாக வன்னிப் பிரதேசத்திலுள்ள மூன்று மாவட்டங்களும் கடுமையாகப் பாதிக்கப்பட்டுள்ளன. அதாவது வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மூன்று மாவட்டங்களிலும் ஓர் இலட்சம் குடும்பங்களைச் சேர்ந்த சுமார் 3,50,000 பேர் கடுமையாகப் பாதிக்கப்பட்டுள்ளார்கள். இது அந்த மக்களின் எண்ணிக்கையில் கிட்டத்தட்ட 80 சதவீதமாகும்.

இன்று இப்பிரதேச நீர்நிலைகள் குளங்கள் மற்றும் கிணறுகள் முழுமையாக வற்றியுள்ளன. மக்கள் குடிநீரைப் பெற்றுக் கொள்வதற்காகச் சில கிலோ மீற்றர் தூரம் நடந்துசெல்ல வேண்டியிருக்கின்றது. இதனால் அதிகம் பாதிக்கப்படுபவர்கள் பெண்களேயாவர். 90 வீதமான மக்கள் விவசாயம் மற்றும் கால்நடை வளர்ப்பைப் பிரதான ஜீவனோபாயமாகக் கொண்டு வாழ்க்கை நடத்தும் இந்த வன்னிப் பிரதேசத்தில் நெல் மற்றும் ஏனைய மேட்டு நிலப்பயிர்கள் அழிந்ததன் காரணமாக நாளாந்த உணவுத் தேவையைக்கூடப் பூர்த்தி செய்துகொள்வதில் அவர்கள் பாரிய நெருக்கடிகளை எதிர்கொள்கின்றனர். அங்கு 75 வீதமான மக்கள் தொழில்வாய்ப்புக்களை இழந்துள்ளனர். பிரதான விவசாயிகள் மாத்திரமன்றி வயல் நிலங்களிலும் உழுந்துத் தோட்டங்களிலும் மரக்கறித் தோட்டங்களிலும் கூலி வேலை செய்கின்ற ஆயிரக்கணக்கான மக்களும் வருமானங்களை இழந்துள்ளனர்

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த மக்கள் யுத்தம் காரணமாகப் பல வருட காலம் பாதிக்கப்பட்டபோதிலும் அவர்கள் மிக அண்மையில், போதிய அடிப்படை வசதிகளின்றி மீளக் குடியமர்த்தப்பட்டதனால் மிக மோசமாகப் பாதிக்கப்பட்டுள்ளனர். இவர்களுக்குரிய உட்கட்டமைப்பு வசதிகள்கூடச் சரியாகச் செய்து கொடுக்கப்படவில்லை. அதேநேரம் இவர்களுக்குரிய வளமான நிலங்கள் திட்டமிட்டுப் பறிக்கப்பட்டுள்ளன. அதாவது, வன சீவராசிகள் திணைக்களம் போன்ற பல நிறுவனங்களால் அவர்களுக்குரிய இடங்கள் வர்த்தமானி அறிவித்தல்மூலம் திட்டமிட்டுப் பறிக்கப்பட்டுள்ளன. இவர்களின் இடங்கள்

இல்லாமல் போனமையால் அவர்கள் மேலும் கூடுதலாகப் பாதிக்கப்பட்டுள்ளார்கள். இதனால், எமது பகுதியில் பாதிக்கப்பட்ட மக்கள் தமது சொந்தக் கிராமத்திற்கு மீண்டும் வருகின்ற நிலைமையைத் தவிர்த்து வருகின்றார்கள். தற்பொழுது ஏற்பட்டிருக்கின்ற வரட்சி காரணமாக அந்த மக்கள் தங்களது அடிப்படைத் தேவைகளைப் பூர்த்தி செய்வதற்காக தமது தாலிக் கொடிகளையும் பரம்பரை நகைகளையும் ஈடுவைத்துப் பணம் பெறவேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கிறது. அதுமாத்திரமன்றி, அவர்கள் பெற்றுக் கொண்ட விவசாயக் கடன்களைக்கூடத் திருப்பிச் செலுத்த முடியாத ஓர் இக்கட்டான நிலைமைக்குள் தள்ளப் பட்டிருக்கிறார்கள். இவ்வாறு எமது மக்களின் பிரச்சினைகள் இன்றும் தொடர்ந்தவண்ணம் இருக்கின்றன.

அங்கு யுத்தத்தால் பாதிக்கப்பட்ட பகுதிகளிலுயள்ள பல குளங்கள் இன்றும் புனரமைப்புச் செய்யப்படாமலும் அங்குள்ள நீர்நிலைகள் பராமரிப்பின்றியும் இருப்பதனால்தான் எமது மக்கள் வரட்சியினால் மிகவும் பாதிக்கப்படக்கூடிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. இதனை ஈடுசெய்வதற்காக அவர்கள் கடற்றொழிலுக்குச் செல்ல நினைத்தால், அங்கும் பிரச்சினை! இன்று கடற்கரையோரங்கள் எல்லாம் பறவைகள் சரணாலயங்கள் என்று வர்த்தமானி அறிவித்தல்மூலம் பிரகடனப்படுத்தப்பட்டு வருகின்றன. இதனால், அவர்கள் அங்கும் செல்ல முடியாத நிலைமை காணப்படுகின்றது. எனவே, அங்கு வரட்சியினால் விவசாயம் பாதிக்கப்படும் பொழுது, அவர்கள் மீன்பிடித் தொழில் மூலமாவது தங்களுடைய வாழ்க்கையைக் கொண்டுசெல்வதற்குரிய சூழ்நிலைகளும் இதன்மூலம் மறுக்கப்படுகின்றது. இவைகளை உணர்ந்து அந்தப் பகுதியில் நல்லதொரு வேலைத்திட்டத்தை உருவாக்கவேண்டும்.

ஆரம்பத்தில் மகாவலி கங்கையை வட மாகாணத்துக்குத் திருப்புவதாகக் கூறப்பட்டது. எனினும், அத்திட்டம் தற்பொழுது கைவிடப்பட்டிருக்கின்றது. எனவே, அத் திட்டத்தை மிகவும் விரைவாகச் செயற்படுத்தி, எமது மக்களுடைய நீர்த்தேவையைப் பூர்த்திசெய்ய வேண்டும். அதுமாத்திரமன்றி, அங்கு பாரிய குளங்கள் காணப்படுகின்றன. அத்துடன், ஒவ்வொரு கிராமத்துக்கும் ஒரு குளம் என்ற அளவுக்கு அங்கு குளங்கள் காணப்படுகின்றன என்று நான் நினைக்கின்றேன். ஆனால், அவற்றில் நீர் இல்லை. எனவே, அதற்குரிய நீரைப் பெறுவதற்காக பாரிய சில வேலைத்திட்டங்களைச் செய்யவேண்டியிருக்கின்றது. அந்த வகையில்தான், இன்று கீழ் மல்வத்து ஓயா நீர்த்தேக்கத் திட்டம் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அந்த அடிப்படையில், கீழ் மல்வத்து ஓயா நீர்த்தேக்கத் திட்டம் ஆரம்பிக்கப்படவிருக்கின்றது. அதிலும் பல தடங்கள் காணப்படுகின்றன. எனவே, மிக விரைவாக அத்திட்டத்தை ஆரம்பித்து எமது பகுதி மக்களுடைய நீர்த் தேவையை நிவர்த்தி செய்யவேண்டும். அத்துடன், குளங்கள் மேலும் தோண்டப்பட்டு அவற்றில் நீர் சேகரிக்கும் அளவு அதிகரிக்கப் படல் வேண்டும். இவ்வாறான சில வேலைத்திட்டங்கள் மிகவும் துரிதமாகச் செய்யப்படல்வேண்டும். அவ்வாறே, எமது பகுதியில் வாழுகின்ற யுத்தத்தால் மிகவும் பாதிக்கப்பட்ட மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்கும் வகையில், உரிய செயற்பாடுகள் மேற்கொள்ளவேண்டும்.

எமது பகுதியின் அபிவிருத்திக்காக எந்த வகையிலாவது பாரிய வேலைத்திட்டங்களைச் செய்யவேண்டிய சூழ்நிலை காணப்படுகின்றது. இல்லாவிட்டால் குறிப்பிட்ட காலத்துக்குப் பிறகு அங்கு அவர்கள் வாழக்கூடிய சூழல்கூட இல்லாமல் போகும். எனவே, அரசாங்கம் இந்தப் பிரச்சினைகளை நன்கு உணர்ந்து செயற்படவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், அங்கு கடல் வளமுள்ள பகுதிகளும் திட்டமிட்டுப் பறிக்கப்பட்டுள்ளன. எனவே, அவற்றை மீளவும் அந்த மக்களுக்கு வழங்கும் வகையில் செயற்பாடுகளை மேற்கொள்ள வேண்டும் என்று கேட்டவனாக, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 6.12]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
අඋඃදූ බිල්ලාහි මිනශ්ශෙයිතානිර් රජීම්. බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නියඟය සම්බන්ධව කථා කරන්න ලැබීම ගැන මා විශාල සතුටක් ලබනවා. අද සමස්ත ලංකාවේ දිස්ත්‍රික්ක 19ක 1,200,000ක් ජනතාව -පවුල් 369,000ක් - නියඟය නිසා පීඩනයට පත්වෙලා සිටිනවා. මගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 120,000ක් පමණ ජනතාව නියඟය නිසා පීඩාවට පත්වෙලා සිටිනවා. අනුරාධපුරේ විතරක් නෙවෙයි, පොළොන්නරුව, වව්නියාව, මන්නාරම, යාපනය, අම්පාර, මොණරාගල, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්ක 19ක ජනතාවට තමයි දැනට මේ ප්‍රශ්නයට මුහුණ දී සිටින්නේ.

විශේෂයෙන් ගත්තොත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන, ගලෙන්බිඳුණුවැව, කහටගස්දිගිලිය, මැදවච්චිය, පදවිය, කැබිතිගොල්ලෑව, රඹෑව, නොච්චියාගම, මහවිලච්චිය, මධ්‍යම නුවරගම් පළාතේ විතරක් නොවෙයි, පළාගල, රාජාංගණය, හබරණ, මනුප, තිරප්පනේ, මිහින්තලේ වාගේ ප්‍රදේශවල ජනතාව තමයි වැඩි වශයෙන් පීඩාවට පත් වී සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමා පසුගිය දවස්වල මැදවච්චියට ගියා. එතුමාට අපි කිව්වා, "ගරු ජනාධිපතිතුමනි, අපේ ජනතාව කන්න තුනක් ගොවිතැන් නැතුව ඉන්නවා. ඒ විතරක් නොවෙයි. වතුර නැති නිසා මාළු අල්ලන්නත් බැහැ. ඒකත් අපට බලපා තිබෙනවා. එළවලු, බඩ ඉරිඟු ආදී කිසිම භෝගයක් වගා කරන්න අපේ ජනතාවට බැරිවෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරලා, ගරු අගමැතිතුමා එක්ක කථා කරලා, කැබිනට් මණ්ඩලයේදී ඇමතිවරු එක්ක කථා කරලා, අවශ්‍ය කටයුතු කරලා දෙන්න." කියලා. අපි ඒ ඉල්ලීම කරපු වෙලාවේ අපේ අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් විශේෂයෙන් මුදල් වෙන් කරලා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, සමස්ත ලංකාවේම පීඩනයවට පත් වූ ජනතාවට සහන ලබා දෙන බව අපට දකින්න තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සහන දෙනකොට යම්කිසි ප්‍රශ්නයකුත් ඇති වෙලා තිබෙනවා. අපේම රජයෙන් චක්‍රලේඛයක් එවලා තිබෙනවා. මම ඒ ගැන අපේ වජිර අබේවර්ධන ඇමතිතුමා එක්කත් කථා කළා. එතුමාත් කිව්වා, "යම්

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

කිසි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, අපි ඒක නිවැරදි කරන්න ඕනෑ." කියලා. ඒක ප්‍රයෝජනයට අරගෙන සමහර නිලධාරින් - සියයට 100ක් කියලා මම කියන්නේ නැහැ. සියයට 1ක්, 2ක්, 3ක් වාගේ පිරිසක්- තමුන්ගේ දේශපාලන වැඩ පිළිවෙළක් කරන බව අපට දකින්න තිබෙනවා.

එක පැත්තකින් ගංවතුර, එක පැත්තකින් නියඟය වාගේ ප්‍රශ්න තිබියදීත් මේ යහපාලන රජය බොහොම අමාරුවෙන් මුදල් ටික එකතු කරගෙන ගම් මට්ටමින් බෙදලා දෙන්න යන කොට සමහර නිලධාරින් එක්කෙනකු, දෙදෙනකු -සියයට සියයක් නොවෙයි- මේ තුළින් තමන්ගේ දේශපාලන වැඩ පිළිවෙළවල් කරගෙන යන ආකාරයක් අපට ගම්වල දකින්නට තිබෙනවා. ගරු ජනාධිපතිතුමනි, ගරු අගමැතිතුමනි, ගරු ඇමතිවරුනි, ඒ නිසා මේ ගැන විශේෂයෙන් සොයා බලන්න කියා ඉල්ලීමක් කරනවා. එහෙම නැති වුණොත් ගම්වල ඉන්න නිලධාරිනුත් මෙවැනි කටයුතු තුළින් තමන්ගේ දේශපාලන වැඩ පිළිවෙළවල් දිගින් දිගටම කරගෙන යන ආකාරයක් අපට දකින්නට ලැබේවි.

මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව මහා විශාල පීඩනයකට පත් වෙලා තිබෙනවා. අනුරාධපුරය කියන්නේ ගොවිතැන් කරන ප්‍රදේශයක්, මාළු අල්ලන ගම්මානයක් විතරක් නොවෙයි, එළවලු වගා කරන ප්‍රදේශයක් කියන එක සමස්ත ලංකාවම දන්නවා. මේ ජනතාවට එකපිට අවුරුදු තුනක්, කන්න තුනක් ගොවිතැන් කර ගන්න බැරි වීම තුළ තමන්ගේ ජීවන කටයුතු කර ගන්න බැරිව විශාල ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී මේ වාගේ වැඩ පිළිවෙළවල් සඳහා සැලසුමක් සකස් කරන්න ඕනෑ. සමහර අයට බොන්න වතුර නැහැ; නාන්න වතුර නැහැ; තමන්ගේ එදිනෙදා කටයුතු කර ගන්න විධියක් නැහැ.

අපේ ගරු රවුෆ් හකීම් ඇමතිතුමා විශේෂ ව්‍යාපෘති කිහිපයක් අනුරාධපුරයට හඳුන්වා දී තිබෙනවා. එතුමා ඒකට මුදල් වෙන් කරලා තිබෙනවා. එතුමාටත් මා කියන්නේ, මේ මුදල් වෙන් කෙරුවා කියලා නොසලකා ඉන්නේ නැතිව මෙය විශේෂ විධියට සලකා, ගරු ජනාධිපතිතුමා එක්කත්, ගරු අගමැතිතුමා එක්කත් කථා කරලා මේ අවුරුදු දෙක තුන ඇතුළත මේ ප්‍රශ්නවලට ස්ථිර විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියලායි. නැත්නම් හැමදාම නියඟයක් එනකොට, හැමදාම ගංවතුර එනකොට, එම ප්‍රශ්නවලට තාවකාලිකව ක්ෂණික විසඳුම් දීලා වැඩක් නැහැ. එයට ස්ථිර විසඳුමක් ලබා දෙන්න ඕනෑ. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව මේ දවස්වල බොන්න වතුර නැතිව, නාන්න වතුර නැතිව තමන්ගේ ජීවන කටයුතු කර ගන්න බැරිව මහා විශාල ප්‍රශ්නයකට මුහුණ පා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මා විශේෂ ඉල්ලීමක් කරනවා. මේ රටේ ආර්ථිකයට මහා විශාල ශක්තියක් දෙන අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාවට යම් කිසි සහනයක් මේ මාසයේ විතරක් නොවෙයි, ලබන මාසයේත් ලබා දීලා, ඊළඟ මාසයේත් ලබා දෙන්න කියලා ගරු ජනාධිපතිතුමාගෙනුත්, ගරු අගමැතිතුමාගෙනුත්, ගරු ඇමතිවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා. ගරු වජිර අබේවර්ධන ඇමතිතුමා එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට වතුර බවුසර් ලබා දීලා තිබෙනවා. ඒ ගැන එතුමාට මා විශේෂයෙන් ස්තුති කරනවා. අපේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික් ජනතාව විඳින පීඩාව ගැන එතුමා එක්ක සාකච්ඡා කරපු නිසා එතුමා ඒ අයට විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමා මට විනාඩි දෙකක් ලබා දුන්නා. එතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[பி.ப. 6.19]

**ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා**
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வரட்சி காரணமாகப் பாதிக்கப்பட்டுள்ள விவசாயிகளுக்கும் ஏனையோருக்கும் நிவாரணங்களைப் பெற்றுக்கொடுக்கும் நோக்கில் கொண்டுவரப்பட்டிருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணை தொடர்பாக என்னுடைய கருத்துக்களையும் கூற வாய்ப்புத் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நாடு பூராவுமுள்ள பாதிக்கப்பட்ட விவசாயிகளைக் கொண்ட மாவட்டங்களிலே அம்பாறை மாவட்டம் பிரதானமானது என்பதில் மாற்றுக் கருத்து இருக்க முடியாது. அம்பாறையிலே காணப்படுகின்ற காணிகளிலே 52 வீதமானவற்றில் மாத்திரம்தான் விவசாயத்தை மேற்கொள்ள அனுமதி வழங்கப்பட்டிருந்தது. 48 வீதமான விவசாயக் காணிகளில் வேளாண்மை செய்வதற்கு அனுமதிக்கப் படவில்லை. இதனால் ஏறக்குறைய 30 ஆயிரத்துக்கும் மேற்பட்ட விவசாயக் குடும்பங்கள் வருமான வழியின்றி நட்டாற்றிலே விடப்பட்டிருக்கின்றன. அதேநேரம் விவசாயம் செய்வதற்கு அனுமதிக்கப்பட்ட காணிகளில் விவசாயம் செய்தவர்களில் பெரும்பாலானோரும் நஷ்டமடைந்திருக் கின்றார்கள் என்றுதான் அறிக்கைகள் கூறுகின்றன. விவசாயம் மேற்கொள்ளப்பட வேண்டிய காணிப் பரப்பினுடைய அளவை அறிவிப்பதிலே அல்லது தீர்மானம் எடுப்பதிலே ஏற்பட்ட தாமதம் காரணமாக விவசாயிகள் சரியான - பொருத்தமான காலத்திலே விவசாயத்தை மேற்கொள்ள முடியவில்லை. அதனால் தமது பயிர்ச்செய்கை பல்வேறு பீடைகளுக்கும் நோய்களுக்கும் முகம்கொடுக்க வேண்டி நேர்ந்ததாக அந்த விவசாயிகள் முறையிட்டு வருகின்றனர். அவ்வாறு விவசாயம் மேற்கொண்ட விவசாயிகள் மாத்திரமல்ல, விவசாயத்தை மேற்கொள்ள முடியாமல் வருமான வழியில்லாமல் இருக்கின்ற விவசாயி களும் நிவாரணம் பெற்றுக்கொள்வதற்காக இந்த அரசாங்கத்தை - நல்லாட்சியை நம்பிக்கொண்டிருக்கின் றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, now, wind up please!

**ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා**
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
Sir, please, give me one more minute.

அரசாங்கம் இவ்வாறு நஷ்டமடைந்திருக்கின்ற விவசாயி களுக்கு உலருணவு வழங்குவதற்கு தீர்மானம் எடுத்திருப்ப தாகவும் அந்த உலருணவுக்காக விவசாயக் குடும்பத்தைச் சேர்ந்த ஒருவர் வாரம் ஒரு நாள் வேலை செய்ய வேண்டும் என்பதாகவும் அதற்கான தகவல்கள் திரட்டப்படுவதாகவும் அறிகின்றேன். அரசாங்கத்துக்கு அதற்காக நன்றி சொல்கின்ற அதேவேளை, நிச்சயமாக, இந்த நிவாரணத்தொகை தொடர்பாக மீளாய்வு செய்து, பாதிக்கப்பட்டிருக்கின்ற சகல விவசாயிகளுக்கும் நஷ்டஈட்டுத் தொகையைத் தாராளமாக வழங்க வேண்டும். பாதிக்கப்பட்டிருக்கின்ற சகல விவசாயி களுக்கும் ஆகக்குறைந்தது உர மானியத் தொகையையாவது அரசாங்கம் வழங்க முன்வர வேண்டும் என்று கேட்டுக் கொண்டு, என்னுடைய பேச்சை முடித்துக் கொள்கின்றேன். நன்றி.

[අ.භා. 6.22]

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් අද දින ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාවට අදාළව මේ රටේ පවතින නියං තත්ත්වය පිළිබඳව අද දවස පුරා අදහස් ප්‍රකාශ වුණා. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මා, මේ ගරු සභාවේ කථා කළ බොහෝ මන්ත්‍රීවරුන්ගේ අදහස් උදහස්වලට ඇහුම්කන් දුන්නා. මට මුලින්ම කියන්නට තිබෙන දේ තමයි, රට පුරා පවතින මේ තත්ත්වය ඉතාම සංවේදී තත්ත්වයක්ය කියන එක. මිනිසුන්ට පානීය ජලය නැහැ, ඒ වාගේම තමන්ගේ භෝග වේළිලා. අස්වැන්න වේළුණු තත්ත්වය ගැන පුළුල්ව බැලුවාම ලෝකයේ රටවල් ගණනාවක මේ තත්ත්වය උද්ගත වෙලා තිබෙන බව දකින්න පුළුවන්. එක පැත්තකින් නියඟය, අනෙක් පැත්තෙන් අධික වර්ෂාව. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා මේ වනකොට ලෝකයේ බොහෝ රටවල මේ තත්ත්වය පවතිනවා. ඉන්දියාව, පාකිස්තානය, බුරුමය, බංග්ලාදේශය වැනි ආසියාතික කලාපයේ රටවලට පමණක් නොවෙයි, මේ වනකොට අප්‍රිකාව හා යුරෝපා රටවලටත් මේ තත්ත්වය උදාවෙමින් පවතිනවා. මා කියන්න කැමැතියි, අපේ ලංකාවේ පවතින මේ තත්ත්වය වර්තමාන රජය නිසා සිදු වුණු ක්‍රියාදාමයක් නොවෙයි කියලා. ගෝලීය උෂ්ණත්වය නිසා අපටත් මේ තත්ත්වය බලපානවා. හැබැයි වග කිව යුතු රජයක් හැටියට අපේ රජය මේ වනකොට වග කීමෙන් කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් යම් තැන්වල තිබෙන දුර්වලතාවන්, යම් යම් තැන්වල තිබෙන අඩු පාඩු පෙන්වා දීමට විපක්ෂයට අයිතියක් තිබෙනවා. ඒ අඩු පාඩු පෙන්වන තත්ත්වය තුළ තමන්ගේ දේශපාලන මට්ටමෙන් එක් එක් අර්ථ කථන ඉදිරිපත් කරපු ආකාරය මා දැක්කා. සාමූහිකව ගත් කල ඒ පිළිබඳව විපක්ෂය විවේචනාත්මක ඇහැකින් දකින එක ඉතාමත් ශෝචනීයයි; කනගාටුදායකයි. මා එහෙම කියන්නේ මේ නිසායි. වර්තමාන රජය විවේචනය කරවීමේ ඉතාමත් පටු පරමාර්ථයකින් මෙවර පත් වුණු විපක්ෂයේ ළා බාල මන්ත්‍රීවරුන් කණ්ඩායමක් යුද පිටිය ඉදිරියට එවා තිබෙනවා මා දැක්කා.

ජනතා විමුක්ති පෙරමුණේ නායක අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවලිය සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පැහැදිලි කරන්න මා කැමැතියි. මේ නියං තත්ත්වය පිළිබඳව රජයක් වශයෙන් ගත් ක්‍රියා මාර්ග ගැන ඉතාම කෙටියෙන් මේ ගරු සභාව දැනුවත් කිරීම මගේ යුතුකමක් වනවා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හැටියට මා මතක් කරනවා, මේ තත්ත්වය දිස්ත්‍රික්ක 21ක පවතින බව. 2017 අගෝස්තු මාසයේ 23වන දා වනකොට නියං තත්ත්වය නිසා පවුල් 4,27,000කට ආසන්න ප්‍රමාණයක් මේ තත්ත්වයෙන් අපහසුතාවට පත්වෙලා තිබෙනවා. පුද්ගලයන් වශයෙන් බැලුවාම ලක්ෂ 14ක පමණ ප්‍රමාණයක් අපහසුතාවට පත්වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ නිලධාරිවරුන් මේ දිස්ත්‍රික්ක 21කම තත්ත්වය හොඳාකාරව අධීක්ෂණයකට ලක් කරමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, එහි ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ එම කාර්යාලවල සිටින අපේ නියෝජිතයන් හරහා ග්‍රාමීය මට්ටමේ තත්ත්වය ගමේ සිට දිස්ත්‍රික් කාර්යාලයටත්, දිස්ත්‍රික් කාර්යාලයේ සිට අපේ අමාත්‍යාංශය දක්වාත් නිරන්තරයෙන්ම අධීක්ෂණයට ලක් කරමින් කටයුතු සිද්ධ කරනවා. ඒ විතරක් නොවෙයි. උතුරු නැඟෙනහිර කලාපවල දූපත්වල ජල උල්පත් සිඳී යාම, දූපත්වල ජලය අඩු වීම නිසා එම ජනතාවට මුහුණ පාන්න සිදු වුණු දුෂ්කරතාවන්ට විසඳුම් සෙවීම සඳහා අපි ගත්ත ක්‍රියා මාර්ග ගැන මා ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පස් වරු 6.30ට සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න නියමිත නිසා කෙටි කාලයකුයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දිස්ත්‍රික්ක 21ක් පුරා මේ තත්ත්වය උදා වෙන කොට අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි, ජල බවුසර් 200කට අධික සංඛ්‍යාවක් අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා මේ වන කොට රට පුරා බෙදා දීමට කටයුතු සිද්ධ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි මේ වෙන කොට දිස්ත්‍රික්ක 24ක ඒ ගම්මානවලට පානීය ජලය ලබා දීමට ජල ටැංකි දහදාහකට ආසන්න ප්‍රමාණයක් රට පුරා බෙදා දීලා තිබෙනවා.

ඒ වාගේම, පානීය ජලය බෙදාදීමේදී, විශේෂයෙන්ම ජල බවුසර් ප්‍රවාහන කටයුත්තේදී රියදුරන්ට, රියදුරු සහායකවරුන්ට, ඉන්ධනවලට, ජල මූලාශ්‍ර පිළිසකර කර ගැනීමට අපි මේ වෙනකොට මහා භාණ්ඩාගාරය හරහා රුපියල් මිලියන 100කට වැඩි මුදලක් වැය කරලා තිබෙන බව මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම අපි ඒ රුපියල් මිලියන 100න් රුපියල් මිලියන 62ක් මේ වෙනකොට ව්‍යාප්ත කරලා -විහිදුවලා- තිබෙනවා. ඒ වාගේම මේ වෙනකොට අපි රට පුරා පානීය ජල බවුසර් 347ක් බෙදාහැර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය දැන් අවසන්.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
කෘෂි රක්ෂණ මණ්ඩලය හරහා රුපියල් 10,000 දීමනාව ලබාදීමට අපි මහා භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන 5ක්

[ගරු දුනේෂ් ගන්කන්ද මහතා]

වෙන්කර තිබෙන බවත් මම මතක් කරන්න කැමැතියි. මේ වෙනකොට එයින් රුපියල් බිලියන 4.1ක් අපි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට ව්‍යාප්ත කර ලබා දී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද රැස්වීම් පස් වරු 6.30ට නවත්වන්න ඕනෑ. දැන් වේලාව පස් වරු 6.30යි.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
මෙහි සත්‍ය තත්ත්වය පැහැදිලි කරන්න පුළුවන්. නමුත් කාලවේලාව ඉක්ම ගොස් තිබෙන නිසා ඒ සියලු විස්තර සභාගත කරන්න ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, සභාගත කරන්න.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
හොඳයි, ඒ සියලු විස්තර ඇතුළත් මගේ පිළිතුරු කථාවේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

01. නියඟය හේතුවෙන් පීඩාවට පත් වී සිටින උතුරු පළාත් ජනතාවට වහාම සැලසිය හැකි සහන ක්‍රියාමාර්ග:

I. මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන්කරවාගෙන ඇති අතර දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම් පරිදි පානීය ජලය බෙදාහරින බවුසර් රථවල ඉන්ධන, ඒවායෙහි සේවය කරන රියදුරු / රිය සහායක අතිකාල දීමනා, ජලය සඳහා ගෙවීම්, ජල මූලාශ්‍ර පිරිසිදු කිරීම, පරිපාලන වියදම් ආදිය සඳහා ප්‍රතිපාදන ලබාදීම. මේ වන විට පහත පරිදි ප්‍රතිපාදන ලබා දී ඇත.

| # | දිස්ත්‍රික්කය | ලබා දී ඇති මුදල රු. |
|---|---|---|
| 1 | මුලතිව් | 2,171,000.00 |
| 2 | කිලිනොච්චි | 3,000,000.00 |
| 3 | වවුනියාව | 350,394.00 |
| 4 | යාපනය | 4,889,492.80 |
| එකතුව | | 5,521,394.00 |

II. තව ද ජනාධිපති ලේකම් කාර්යාලය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථාන හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පානීය ජලය බෙදාහැරීම සඳහා ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් රථ පහත පරිදි ලබා දී ඇත.

| | දිස්ත්‍රික්කය | ට්‍රැක්ටර් බවුසර් ප්‍රමාණය | ලොරි බවුසර් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | යාපනය | 13 | 1 |
| 2 | මුලතිව් | 8 | - |
| 3 | කිලිනොච්චි | 11 | - |
| 4 | මන්නාරම | 5 | - |
| 5 | වවුනියාව | 8 | - |
| එකතුව | | 45 | 1 |

III. පානීය ජලය ගබඩා කිරීම සඳහා 2016 හා 2017 වර්ෂය තුළ ජල ටැංකි මිලදී ගෙන පහත පරිදි ඒ ඒ දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇත. දිස්ත්‍රික්ක වලින් ලැබෙන ඉල්ලීම් පරිදි තවදුරටත් අවශ්‍ය ජල ටැංකි ලබා දීමට කටයුතු කෙරේ.

| # | දිස්ත්‍රික්කය | ජල ටැංකි ප්‍රමාණය |
|---|---|---|
| 1 | මුලතිවු | 90 |
| 2 | කිළිනොච්චිය | 190 |
| 3 | වවුනියාව | 100 |
| 4 | මන්නාරම | 185 |
| 5 | යාපනය | 85 |
| එකතුව | | 650 |

02. ජලය දුම්රිය මඟින් ප්‍රවාහනය කිරීමට අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීම පිළිබඳව අදාළ ආයතන හා සාකච්ඡා කළ යුතු අතර එහි දී ජලය ප්‍රවාහනය කළ හැකි දුම්රිය ටැංකි සකසා ගැනීම හා ප්‍රමාණවත් ජලය ලබා ගත හැකි ප්‍රදේශ පිළිබඳ කරුණු සැලකිල්ලට ගෙන මෙය ක්‍රියාවට නැංවීමේ ඇති හැකියාව පිළිබඳ ඉදිරියේ දී තීරණය කරනු ඇත.

03. නැගෙනහිර, වයඹ හා උතුරු මැද ප්‍රදේශවල පීඩාවට පත් ජනතාවට ලබා දිය හැකි සහන ලෙස

1. පානීය ජලය බෙදාහරින බවුසර් රථවල ඉන්ධන, ඒවායෙහි සේවය කරන රියදුරු / රිය සහායක අතිකාල දීමනා, ජලය සඳහා ගෙවීම්, ජල මූලාශ්‍ර පිරිසිදු කිරීම, පරිපාලන වියදම් ආදිය සඳහා ප්‍රතිපාදන ලබාදීම

3. ජලය බෙදාහරින බවුසර් රථ ලබා දීම

04. ආපදා කළමනාකරණ අමාත්‍යතුමා හා අදාළ නිළධාරීන් යාපනය දිස්ත්‍රික්කයේ නිරීක්ෂණ චාරිකාවක් සිදු කළ අතර එහි දි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු ප්‍රධාන නිළධාරීන් සමඟ වියළි කාලගුණික තත්ත්වයෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම පිළිබඳව ප්‍රගතිය හා තවදුරටත් සහන සැලසීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කරන ලදී.

දිස්ත්‍රික්කයට බලපා ඇති ආපදා සම්බන්ධයෙන් ගත යුතු කෙටි කාලින හා දිගු කාලීනව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අදාළ නිළධාරීන් සමඟ සාකච්ඡා කර ගත් තීරණ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

***එකල්හි වේලාව අ.භා. 6.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2016 මාර්තු 08වන දින සභා සම්මතිය අනුව, 2017 අගෝස්තු මස 24වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2017 ஆகஸ்ட் 24, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 10.30 a.m. on Thursday, 24th August, 2017 pursuant to the Resolution of Parliament of 08th March, 2016.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts
Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.